# භූත දඩයම



WASANA PUBLICATIONS

**තුෂාන්ත තිලකරත්න**

# භූත දඩයම



ECUADOR

ක්‍රිෂාන්ත තිලකරත්න

**භූත දඩයම**

© පී. එම්. නිහාල් කුමාර

ප්‍රථම මුද්‍රණය - 2005

ප්‍රකාශනය හා බෙදාහැරීම

**වාසනා ප්‍රකාශකයෝ**

**දන්කොටුව**

මුද්‍රණය : වාසනා මුද්‍රණ, දන්කොටුව

2005 නොවැම්බර්

## පොත පිළිබඳව

"The invisible intruder" නැන්සි ඩ්‍රිව් කතා මාලාවට අයත් කෘතියකි. මේ කතා මාලාව ලෝකය පුරාම පාඨක අවධානය ඉතා ඉහළින්ම දිනා ගත්තකි. මේ තුළින් මතු කරන වීර්යය, නොපසුබට උත්සාහය මෙන් ම අයුක්තියට, අසාධාරණයට විරුද්ධව කටයුතු කිරීමත් ළමා සිත් මෙන් ම වැඩිහිටියන් ද මේ කතා වස්තුව කෙරෙහි ඇද බැඳ තබා ගැනීමට සමත් වේ.

අපගේ රහස් පරීක්ෂිකාව සහ මිතුරු පිරිස මෙවර මුහුණ දෙන්නේ ඉතා කූට ප්‍රයෝගකාරී සොරුන් කණ්ඩායමකට ය. හොල්මන්, භූතයින් මෙන් ම ඉතා දරුණු සියුම් උගුල් රාශියක් ළමුන්ට විරුද්ධව ක්‍රියාත්මක ය. මේ ආකාරයේ අබිරහස් පහක් විසඳීම සඳහා ඔවුන් දරණ උත්සාහය සෑම මොහොතකම ඇඟ කිලිපොලා යන සිද්ධීන් ගෙන් ගහන ය.

මේ කාර්යයේදී මා දිරිමත් කළ හේරත් ජයසුන්දර හා අරුණ ජයසුන්දර මහතුන් ද මාගේ අපැහැදිලි අත් අකුරු අපහසුවෙන් කියවා අත් පිටපත ලියා දුන් මනෝරි ප්‍රනාන්දු ගුරු මහත්මිය හා අමන්දා තාමරසී රූපසිංහ සිසු දියණිය ද, මට නිරතුරුව සහාය දෙන දයාබර බිරිඳ නිමාලි හා ක්‍රිමාෂා, හිරුෂ දරු දෙදෙනා ද, සෝදුපත් බැලීමෙන් සහාය වූ ධම්මිස්සර ජාතික පාසලේ නියෝජ්‍ය විදුහල්පති ජයතිලක සෙනෙවිරත්න ගුරු පියාණන් ද, සුදුසු පොතක් තෝරා දී පරිවර්තනය සඳහා මා දිරිගන්වා ප්‍රකාශන කටයුතු බාරගත් දන්කොටුව වාසනා ප්‍රකාශන අධිපති නිහාල් කුමාර මහතා ද, මුද්‍රණ කටයුතු ඉක්මනින් හා මනාව කරදුන් වාසනා ප්‍රකාශන ආයතනයේ මනෝජ් සියඹලාපිටිය සොහොයුරා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනා ද, මාගේ "බිහිසුණු වන මැද" කෘතිය කියවා මා දිරිමත් කළ සියලු දෙනා ද ස්තූති පූර්වකව ආදරයෙන් සිහිපත් කරමි.

**ක්‍රිෂාන්ත තිලකරත්න**

"ක්‍රිමාෂා"
පැතුම් මාවත,
ඉ/තබබෝව,
දූන්කන්නාව.

2005.10.20

## පිදුම

අපගේ දිවිය ආලෝකමත් කරනු සඳහා
කැප කරන ඔබ දිවිය වෙනුවෙන්,
මා පිය තෝමන් තිලකරත්න
මා මව් සිසිලි මාග්‍රෙට් ජයසූරිය
මෙන් ම,
දයාබර මාමණ්ඩිය හා නැන්දණිය
පීටර් ජනවාරියුස් ප්‍රනාන්දු, මැලින් ප්‍රනාන්දු
ආදරණීය මාපියවරුණි,
ඔබට උපහාරයක් කොට පිළිගන්වමි.



# 01

"මට මෙච්චර කාලෙකට ලැබුණ පුදුම සහගත ම ආරාධනා පත්‍රය තමයි මේක" නැන්සි විස්මයෙන් කෑ ගැසුවා ය.

රුමත්, අක්බඹරු වන් කෙස් ඇති නැන්සි තම පියා වන මනා පෙනුමැති කාසන් ඩ්‍රිව් වෙත කඩදාසි කොළයක් පෑවා ය. ඇගේ පියා වෘත්තියෙන් නීතිඥයෙකි. ඔහු ගෙළයනේ උස රෝස පඳුරු අසල සැප පහසුවට වාඩිවී සිටියේ ය.

"ඒක ඉතා ම සුවිශේෂී ආරාධනයක් වෙන්න ඇති" ඔහු සිනාසෙමින් කීවේ ය. "ආරාධනා පත්‍රය දැකලා ඔයාගේ නිල්පාට ඇස් දීප්තියෙන් බැබලෙනවා ආයේ දෙකක් නෑ. ඔයාගේ හිතට මේ ගැන තදින් වැදිලා තියෙනවා"

මේ ලිපිය ඇයට ඇගේ ඉතාම සමීප මිතුරියක් වන හෙලන් ආචර් එවා තිබුණු බවත් ඇගේ මිතුරෙකු වන ජිම් කියවා තිබුණු යම් යම් කරුණු කිපයක් ලිපියේ සඳහන්ව තිබෙන බවත් කීවා ය. ජිම්ට ලැබුණු ලිපිවල සඳහන්ව ඇත්තේ භූත මන්දිර කිහිපයක් ගඟේ ඉහළට වන්නට ඇති බවත් ඒ පිළිබඳව දූෂමාන ආරංචි මේ ප්‍රදේශය පුරා ම පැතිර ඇති බවත් ය. නැන්සි ලිපියේ අඩංගු කරුණු තම පියාට විස්තර කළා ය.

"එයාලා කල්පනා කරනවා ගිම්හාන කාලයේ දී චාරිකාවක් යොදා ගෙන මේ කාරණා ඇත්ත ද බොරු ද කියලා ගවේෂණයක් කළොත් සැහෙන විනෝදයක් ලබන්න පුළුවන් කියලා. භූත දඩයමට එයාලා මටයි, බෙස්ටයි, ජෝර්ජ්ටයි ආරාධනා කරලා තියෙනවා."

"තව කවුද මේ ගමනට සහභාගි වෙන්නේ?" ඩ්‍රිව් මහතා විමසුවේ ය. "මොකද මේ වගේ ගමනකදී වැඩි ආරක්ෂාවක් ලැබෙන්නේ සහභාගී වෙන පිරිස වැඩි වෙන තරමටයි."

නැන්සි සිනාසුණාය. "අපි නෙඩ්ටත් මේ ගැන කිව්වා" නෙඩ්

නිකල්සන් නැන්සිගේ සමීප මිතුරෙකි. නෙඩ් මේ ගමනට සහභාගී වීම ඩ්‍රිව් මහතාගේ සතුටට කරුණකි.

"බ්‍රෙට්වයි, ඩේව්වයි එක්ක යනවද?"

"ඔව් එයාලටත් ආරාධනා කරලයි තියෙන්නේ"

බ්‍රෙට් එඩිල්සන්, ඩේව් එවන්ස්, නැන්සි, බෙස් මාවින් හා ජෝර්ජ් ජේන් සමීප මිතුරු මිතුරියෝය.

මේ පිරිසට අමතරව තවත් ගැහැනු පිරිමි ළමයි දහතර දෙනෙකුගේ නම් ලැයිස්තුවක් ද නැන්සි පියාට ඉදිරිපත් කළා ය.

"තාත්තා මේ ගමනට අවසර දෙනවද?" නැන්සි පියාගෙන් විමසුවා ය.

"මම මේ ලියුම කියවලා බලනකම් ටිකක් ඉන්න" කියූ ඔහු ලිපිය අතට ගත්තේ ය. "ම් ! මේ ලියුමේ කියන විදිහට හෙලන්වත් ගමනට සහභාගී වෙන අනිත් අයවත් මේ අබිරහස විසඳන්නේ කොහොමද කියලා දන්නේ නෑ. ඒ නිසා එයා කියන්නේ ඔයාට මේ ගමනේදී කණ්ඩායමේ මූලිකත්වය ගන්න කියලයි. ඒ නිසා ඔයාට මේ වැඩෙන් ඉවත් වෙන්න පුළුවන් වෙන පාටක් මට නම් පෙන්නේ නෑ."

"තාත්තාට බොහොම ස්තුතියි."

ඉක්මනින් ම දුරකථනය වෙත දිවගිය නැන්සි, හෙලන්ව ඇමතුවා ය. "ඔයාගේ ආරාධනාව නම් විශිෂ්ටයි" ඇය කීවා ය. "මම නම් හරිම කැමතියි මේ ගමනට. අනිත් කට්ටියත් එක පයින් ම කැමති වෙයි. මම ඒ අයටත් කතා කරලා දැන ගන්නම්. හෙලන්, අද හවසට අපේ ගෙදරට කට්ටිය ම එකතු වුණාම ඔයාට පුළුවන් ද ඔයාගේ වැඩපිළිවෙළ අපට විස්තර කරන්න?"

ජිම් සහ ඇය නැන්සිගේ මිතුරු මිතුරියන් සමග "භූත දඩයම" පිළිබඳව සාකච්ඡා කිරීමට ඉතා ම කැමති බව හෙලන් කීවා ය. එහෙත් ගමනට සහභාගී වන අනිත් පිරිස දැනටමත් මේ ගැන සියලුම තොරතුරු දන්නා නිසා ඒ අයව කැඳවීමේ අවශ්‍යතාවක් නැති බව ඇය තවදුරටත් කීවා ය.

ඔවුන් පැමිණීමට පෙර, ගමනට අවශ්‍ය ඇඳුම් පැළඳුම් ලැයිස්තුවක් සකස් කිරීමේ බලාපොරොත්තුවෙන් නැන්සි උඩු මහලට පිය නැඟුවා ය.



"හැනා මේ ගමන ගැන මොනවා කියයිද කියලා මට හිතා ගන්නවත් බෑ" ඇය තමාට ම කියා ගත්තා ය. සුන්දර සිනහවක් ඇගේ මුහුණේ ඇඳී ගියේ ය.

හැනා ග්‍රෑන් මීට වසර පහළොවකට පමණ පෙර නැන්සිගේ මව මිය ගිය දා සිටම නිවසේ සියලු ම කටයුතු කරමින් නිවසේ භාරකාරිය ලෙස කටයුතු කරන්නී ය. ඇය ඉතා ම කාරුණික කාන්තාවකි. මේ වෙලාවේ හැනා නිවසේ නොසිටි අතර ඇය නගරයේ සිටින තම නෑදෑයන් මුණගැසීමට ගොස් සිටියා ය.

දුරකථනය නාදවන්නට පටන් ගත් අතර නැන්සි රිසීවරය අතට ගත්තා ය. මිනිසෙකුගේ ගොරෝසු කටහඬක් තර්ජනාත්මක ස්වරූපයෙන් ගලා ආවේ ය.

"ඒයි .... නැන්සි .... මම උඹට හොඳින් කියන්නේ, ජීවිතයට ආදරයක් තියෙනවා නම් භූත දඩයමෙන් අයින් වෙයං"

"ඔය .... කවුද? ඔය?" නැන්සි එසේ අසන විටත් තර්ජනය කළ පුද්ගලයා රිසීවරය තබා හමාර ය.

රිසීවරය තැබූ ඈ, හිස් බැල්මෙන් යුතුව සිවිලිම දෙස බලා සිටියා ය. කාට හෝ තමා බියට පත්කර භූත දඩයමට එක් වීමෙන් වළක්වා ලීමට අවශ්‍යව ඇත. නමුත් ඒ කාටද? නාඳුනන පුද්ගලයා අපගේ ගමන පිළිබඳව දැන ගත්තේ කෙසේද? තමන් ගෙළයනේ දී පියාට ගමනේ සැලසුම් පිළිබඳව විස්තර කළ බව ඇයට සිහි විය. ඒ අනුව කවුරුන් හෝ රෝස පඳුරු අස්සේ සැඟවී සිට ඔවුන්ගේ කතාවට රහසින් කන්දී ඇති බව ඇයට පැහැදිලි ය.

"එයාට මාව බය කරලා භූත දඩයමෙන් අයින් කරන්න ලේසි වෙන්නේ නෑ. හොඳයි බලමුකො." ඈ තමාට ම කියා ගත්තා ය. "මේ තර්ජනය නිසා භූත දඩයමේ තියෙන සිත්ගන්නා සුලු බව තවත් වැඩි වෙනවා. සමහර විට ගමන දෙගුණයක් භයානක වෙන්නත් පුළුවන්" ඇය කල්පනා කළා ය. "කොහොම වුණත් මට ටිකක් පරිස්සමින් කටයුතු කරන්න වෙයි වගේ ...."

රාත්‍රී අටට පමණ හෙලන් හා ජිම් පැමිණියහ. හෙලන් තවත් ලස්සන වී ඇති අතර උස, කැපී පෙනෙන පෙනුමක් ඇති ඇගේ මිතුරා ඉතා ප්‍රීතියෙන් සිටියේ ය. ටික වේලාවකින් බෙස් සහ ඩේව් පැමිණියහ.

තරමක් මහත දුඹුරු පැහැති කෙස් හා රෝස පැහැති කම්මුල් ඇති බෙස් ඉතා හොඳ ක්‍රීඩිකාවක් වුවත් ඇගේ එක ම දුර්වලතාව වූයේ තරමක් බියසුලු බවයි. "සුබ සැන්දෑවක් හැම දෙනාට ම" ඇය සුභ පැතුවා ය. "මේ ගමන ටිකක් භයානකයි වගේ. අපරාධකාරයෝ අල්ලලා පොලිසියට භාරදීම එක විදිහක වැඩක් නමුත් භූතයින් දඩයම් කිරීම ගැන නම් ටිකක් කල්පනා කළ යුතු දෙයක් හැටියටයි මට නම් පේන්නේ"

හෙලන් පුදුමයෙන් බෙස් දෙස බැලුවා ය. "ඔයාට මේ වැඩෙන් අයින් වෙන්න ඕනෑ නම් ඒකට තාමත් ඉඩ තියෙනවා" ඩේව් ඇය වෙනුවෙන් පිළිතුරු දීමට ඉදිරිපත් විය. ඔහු කෙට්ටු උස් සිරුරක් ඇති අයෙකු වූ අතර ඔහුට කොළ පාට ඇස් තිබුණි. ඔහු උද්‍යෝගිමත් සිනහවක් පා මෙසේ කීවේ ය.

"ඔයාලා හොඳින් ම දන්නවා බෙස් එහෙම පස්සට යන කෙනෙක් නොවන වග. එයා අබිරහසක් විසඳන්න ලැබෙනවා නම් ඒ අවස්ථාව කොහොමවත් පැහැර හරින්නේ නෑ. ඇත්ත වශයෙන් ම මමත් එහෙමයි. නමුත් බෙස් යන්නේ නැත්නම් මමත් යන්නේ නෑ."

"ඔයාල හැමෝම හැමදේම ලොකුවට හිතනවා. මම බය බව පෙන්නුවේ බොරුවටයි." බෙස් කීවා ය.

කිසිවෙක් පිළිතුරු දීමට පෙර ජෝර්ජ් හා බ්‍රෙට් කාමරයට ඇතුළු වූහ. ජෝර්ජ්, බෙස්ගේ ඥාති සොහොයුරිය වුවත් ඇය බෙස්ට වඩා සම්පූර්ණයෙන් වෙනස් ගති ගුණ ඇත්තියක වූවා ය. ඇය ඇයට ලැබී තිබුණු පිරිමි නම ගැන ආඩම්බර වූවා ය. කෙස් ඉතා කොටට කැපූ ඇ සැහැල්ලු ඇඳුම් ඇඳීමට ප්‍රිය කළා ය. ඕනෑ ම අබිරහසක් විසඳීමට නැන්සිට උදව්දීමට ඕනෑ ම වේලාවක සූදානමින් සිටියා ය. සෑම කෙනෙක් ම ඕනෑ ම අවදානමකට මුහුණදීමට ඇය දැක්වූ නිර්භීතභාවය අගය කළහ.

බ්‍රෙට් හොඳ මලල ක්‍රීඩකයෙකි. එමෙන් ම ඔහු ඩේව්ට හා නෙඩ්ට වඩා මිටි වුවත් ඔවුන්ට වඩා ශක්තිවන්තයෙකි. මේ තිදෙනා ම පාසලේ පාපන්දු කණ්ඩායමේ සාමාජිකයෝ වූහ.

අවසානයට පැමිණියේ නෙඩ් නිකල්සන් ය. "සුභ සන්ධ්‍යාවක්" යනුවෙන් සියලු දෙනාට ම සුබපැතූ ඔහු "මම පරක්කු වුණාට කනගාටුයි." කියමින් තම කනගාටුව පළකර සිටියේ ය.



අනතුරුව ජිම් සහ හෙලන් දෙසට හැරුණු ඔහු "බොහෝම ස්තූතියි, භූත දඩයමට මාවත් ඇතුළු කර ගැනීම ගැන" යනුවෙන් කීවේ ය.

නෙඩ් කණ්ඩායම තුළ ඉතා ම විනෝදජනක කෙනෙක් ලෙස සැලකුම් ලැබුවේය. අන් අය සමග සැහැල්ලුවෙන් කටයුතු කළ ඔහුට සෑම අයෙක් ම ප්‍රිය කළහ. එමෙන් ම ඔහු මෙවැනි අවදානම් ගමන් වලදී ඉතා දක්ෂ ලෙසත්, ප්‍රායෝගික ලෙසත් වගකීම් කරපිට පටවා ගෙන කටයුතු කිරීමේ හපනෙකි.

ඒ ගිම්හාන සන්ධ්‍යාව ඉතා උණුසුම් එකක් වූ නිසා නැන්සි සියලු දෙනාට ම ලෙමනේඩ්වලින් සංග්‍රහ කළා ය. ඉන්පසු පිරිස ඇමතූ ඇ මෙසේ කීවා ය. "දැන් ඔයාල හැමෝම මෙහාට ඇවිල්ලා ඉන්න වෙලාවේ මේ ගමන ගැන විශේෂ කාරණයක් ඔයාලා හැමෝටම මට කියන්න තියෙනවා."

මෙසේ පැවසූ ඇ තමාට දුරකථනය ඔස්සේ ලැබුණු අනතුරු ඇඟවීම පිළිබඳව විස්තර කළා ය.

නෙඩ් කටින් විසිල් ශබ්දයක් පිට කළේ ය. "ඒ කියන්නේ අපි අත ගහලා තියෙන්නේ අවදානම් සහිත වැඩකට කියන එකයි."

"මට ඒක තේරුණා !" බෙස් විස්මය පළ කළා ය. "ඒකනේ මම කලින් ම කිව්වේ"

බ්‍රෙට් විරිත්තුවේය. "මෙතන ඉන්න කාටහරි ඕනෑද බයගුල්ලෝ වගේ පැනලා දුවන්න"

සියලු දෙනා ම "නෑ" යනුවෙන් එක හඬින් කෑ ගැසූහ. බෙස් තරමක් ප්‍රමාද වී "නෑ" යනුවෙන් හෙමින් කීවා ය. ඉන්පසු හෙලන් සහ ජිම් භූත දඩයමේ සැලැස්ම පැහැදිලි කිරීමට පටන් ගත්හ.

"අපි පළමුවෙන් නවතින්නේ" හෙලන් පැහැදිලි කළා ය. "සෙවනි විල ඉවුරේ තියෙන පයින් ග්‍රෝව් කඳවුරේ. ඒක හරිම සිත් ඇදගන්නා සුලු තැනක්. එතැන ඔයාලට බෝට්ටු සවාරි යන්න පුළුවන්, ඇති තරම් පිහිනලා විනෝද වෙන්නත් පුළුවන්"

"කොහෙද භූතයොයි, හොල්මනුයි ඉන්නේ?" නෙඩ් ඇසුවේ ය. ජිම් පිළිතුරු දුන්නේ ය. "එහේ අවතාරයක් නෑ. නමුත් භූතාවේශ වෙච්ච ඔරුවක් තියෙනවා."

"භූතාවේශ වුණු ඔරුවක්" ජෝර්ජ් විස්මය පළ කළා ය. "කොහොමද ඔරුවකට භූතයෙක් ආවේශ වෙන්නේ ?"

"ඔයා මේක විශ්වාස කරන එකක් නෑ." ජිම් කිවේ ය. "නමුත් ඔරුව කවුරුවත් පදවන්නේ නැතිව ඒක ගමන් කරනවා."

බ්‍රෙට් හිස දෙපැත්තට වැනුවේ ය. "ඒක නම් වෙන්න පුළුවන් දෙයක් කියලා මට හිතෙන්නේ නෑ. කවුරුහරි ඒක ගමන් කරවනවා ඇති"

"ඒ තමයි හොල්මන්" හෙලන් පිළිතුරු දුන්නා ය. "මම දැන් ඔයාලට කියන්නම් අපිට ඊළඟට විසඳන්න තියෙන අබිරහස මොකක්ද කියලා" ඒක තියෙන්නේ භූතාවේශයෙන් සාස්තර කියන දේවාලෙ. මිනිස්සු කියනවා එතැන භූත සභාව රැස්වන දවස්වල එතැන මහ හඬින් අකුණු පුපුරනවා කියලා."

"ඔයා කියන්නේ එතැන කුණාටුවක් ඇති වෙනවා කියල ද?" බෙස් ඇසුවා ය. හෙලන් සහ ජිම් උරහිස් හැකිළුහ. "නෑ" හෙලන් පිළිතුරු දුන්නා ය. "ඇතුළේ ඉන්න මිනිසුන්ට අකුණු ගහන සද්දේ ඇහෙනවා."

බෙස් විමතියෙන් එකිනෙකාගේ මුහුණු බැලුවා ය. "මම මේ කටයුත්ත ගැන ඒ තරම් සතුටු නෑ" ඇය අවසානයේ දී කීවා ය.

ඉදිරියේ දී සිදුවීමට ඇති අද්භූත ජනක දේවලින් සිත පුරවාගත් නැන්සි කිසිවක් නොකීවා ය. ඇය එකවර ම හෙලන්ට සහ ජිම්ට ඔවුන්ගේ කතාව දිගට ම කියාගෙන යන ලෙස ඉල්ලුවා ය. "අපි කී තැනකට යන්න බලාපොරොත්තු වෙනවා ද?"

"ඔක්කොම ස්ථාන පහයි" හෙලන් පිළිතුරු දුන්නා ය. "තුන්වෙනි තැන "රෙඩ් බාන්" තානායම. මිනිස්සු කිප දෙනෙක් දැකලා තියෙනවා අශ්ව අවතාරයක් තණ පිටිය මැදින් දුවනවා. උගේ පිටි පස්සේ අශ්වාරෝහක අවතාරයක් දුවගෙන ගිහින් තියෙනවා."

ඩේව් එක්වර ම මහ හයියෙන් සිනාසුණේ ය. "ඒක තමයි මම දකින්න කැමති ම දේ. අශ්වාරෝහකයාව බිම දාපු අශ්ව අවතාරෙ."

සැම කෙනෙක් ම සිනාසෙන්නට පටන් ගත් අතර ටික වේලාවකින් කවුරුත් ගොළු වූයේ හතර වන ස්ථානය කඳුමුදුනේ තානායම බව ඇසීමෙනි. "ඉස්සර ඒක බලකොටුවක්, හිරකාරයින්ගේ



භූතාත්ම ඒක ඇතුළේ ගැවසෙනවා කියලා ආරංචි පැතිරිලා තියෙනවා" ජිම් පැවසී ය.

ජෝර්ජ්ගේ ඇස් දීප්තියෙන් බැබළුණේ ය. "මේ ගවේෂණය එන්න එන්න ම පුදුම සහගත වෙනවා. දැන් අපි අහමු පස්වෙනි ස්ථානය ගැන. ඒක මම හිතන හැටියට නිදහස් තැනක් වෙන්න ඇති."

එම ස්ථානය පෞද්ගලික වාසස්ථානයක් නිසා එහි නවාතැන් නොගන්නා බව හෙලන් කිවා ය. "ඒකෙ අයිතිකාරයා හිස් කබල්, සිප්පි කටු වගේ දේවල් එකතු කරන්නෙක්. ලොකු වතුයායක් මැද්දේ තියෙන මන්දිරයක් ඒක. එතැනදි අපිට රැයක් ඇර රැයක් මන්දිරය ඇතුළේ නොපෙනෙන අකුණු හැර වෙනත් දෙයක් දක්නට ලැබෙන එකක් නෑ"

"නොපෙනෙන අකුණු" බ්‍රෙට් ඇසුවේ ය.

යළිත් වතාවක් භූත දඩයමේ මූලිකයෝ දෙදෙනා උරහිස් හැකිළුහ. "අපිට තියෙන්නේ මේ අබිරහස් ටික විසඳන්නයි" හෙලන්ගේ පිළිතුර විය. "ඉතිං මේ හැම දෙනෙක් ම තාමත් මේ ගමන යන්න කැමතිද?"

"ඕනෑවටත් වඩා කැමතියි." නැන්සි ඉක්මනින් ම කෑගැසුවා ය. "හැමදෙයක් ම හරියට සිද්ධ වුණොත් එක ගවේෂණයකින් අබිරහස් පහක් විසඳන්න පුළුවන්"

"ඒක ඇත්ත" හෙලන් කීවා ය. "ඔයාලට සඳුදා හවසට ලෑස්ති වෙන්න පුළුවන් ද?"

සියලු දෙනා ම ඊට එකඟ වූ අතර නැන්සිගේ කාරයෙන් ආචර් යුවලගේ නිවසට යාමට කතිකා කර ගත්හ.

* * * * * * *

දින දෙකකට පසු මුළු කණ්ඩායම ම ආචර් නිවසට රැස්වී සිටි අතර නැන්සි හා ඇයගේ මිතුරෝ බැබ්, ඩොන්, රීටා, රොඩ්, ඈන් සහ බිල් යන අයට හඳුන්වා දෙනු ලැබූහ. නැන්සි මේ සියළු දෙනාට ම ඉතා ම කැමැත්තක් දැක්වූ අතර ඔවුන් සමග ඉතා ඉක්මනින් කුලුපග වූවා ය.

"හෙලන් අපිට කිව්වා ඔයාට කවුද තර්ජනය කළා කියලා" බැබ් කිවේ ය. "ඔයාට යන්තමවත් හිතාගන්න බැරිද ඒ කවුද කියලා"

"බෑ"

"මට හිතෙන්නේ අනතුරු ඇඟවීමක් කියලයි. මොනාටත් අපිට හොඳ අවදියෙන් ඉන්න වෙයි." ඈත් සිය අදහස ඉදිරිපත් කළා ය.

භූත දඩයක්කරුවෝ සවස් වනවිට සෙවනි විල් ඉවුරට පැමිණියහ. එය කොයිතරම් උණුසුම් සන්ධ්‍යාවක් වුවාදැයි නැන්සි, බෙස්, ජෝර්ජ් සහ බ්‍රෙට්ට තමා සමග "පයින් ග්‍රෝව්" කඳවුර අසල ජැටියේ දිය නෑමට එන ලෙස නෙඩ් යෝජනා කළේ ය.

"ගැහැනු ළමයි ඇඳුම් මාරුකරගෙන ජැටිය ළඟදී ඔයාලට එකතු වෙනවා" නැන්සි කීවා ය. "අපි බඩු අස් කර කර ඉන්නේ නෑ ඉක්මනට එනවා."

ගැහැනු ළමුන්ට කාමර දෙකක් වෙන්වී තිබුණු අතර පිරිමි ළමෝ කාමර දෙකක නවාතැන් ගත්හ. සුළු මොහොතකට පසුව සියලු දෙනා ම දියෙහි ගිලෙමින් පිහිනමින් විනෝද වනු දක්නට ලැබුණි. බියසුලු බෙස් පවා ඉතා සතුටින් ජලයේ කිමිදෙනු කාහටත් දැකගත හැකිවිය.

"මට නම් හිතාගන්නවත් බෑ මෙතන අවතාර, හොල්මන්, භූතයෝ ඉන්නවා කියලා" ඈ කීවා ය.

නමුත් ටික වේලාවකින් මහත් භීතියකින් මරහඬ දුන්නේ ද ඇයයි.

"අර බලන්න ..... අර එහා පැත්තේ .... ඒ ඔරුව නිකම්ම හබල් වැදිලා යාත්‍රා කරනවා."

අනිත් පිරිස ඉක්මනින් ම විලේ එහා ඉවුර දෙස බැලූහ. දිග, දිලිසෙනසුලු බඳෙහි කොළපාට තීරුවක් තීන්ත ආලේප කර ඇති ඇලුමිනියම් ඔරුවක් ස්වයංක්‍රිය හබල් ගාමින් දියමත යාත්‍රා කරයි.

"අපි පිහිනලා ගිහිල්ලා ඒක අල්ල ගමු" නැන්සි කෑ ගැසුවා ය.

එසේ කී ඈ තද හුස්මක් ගෙන අතිමහත් ජවයකින් දිය යටින් පිහිනන්නට පටන් ගත්තා ය. නෙඩ්, ජෝර්ජ් හා බ්‍රෙට් ඇය පසුපසින් වැටුණෝය.



## 02

තරගයට මෙන් පිහිනන හතර දෙනා අතරින් නෙඩ් පෙරමුණ ගැනීමට සමත් විය.

"මම ඕනෑ ම ඔට්ටුවක් අල්ලන්නම් ඔය ඔරුවට යටින් දක්ෂ විහිළුකාරයෝ දෙන්නෙක් ඉන්න බවට" ඔහු කීවේ ය.

ඔහු සහ බ්‍රෙට් ඔරුවට ළඟාවූ සැණින් ම දිය යට ගිලුණහ. ඔවුන් පුදුමයට පත් කරවමින් ඔරුවට යටින් කිසිවෙක් සිටියේ නැත. ඔරුව දිගටම දිය මත ඇදී යන්නට විය.

"මේක නම් මහ පුදුම දෙයක්"

දිය මතුපිටට ආ ළමයි දෙදෙන වේගයෙන් දියෙහි හැපෙන හබල්වලින් අල්ලා ඔරුව නැවතීමට තීරණය කර ඉදිරියට පීනූහ. එහෙත් වේගවත් ගැස්සීමක් සමග ම ඔරුව එය ලුහුබඳින්නන් වෙතින් මිදී ඈතට ඇදී ගියේ සියලු දෙනා පුදුමයට පත් කරවමිනි.

මේ අතර නෙඩ් හා බ්‍රෙට් සිටි තැනට හති දමමින් ළඟා වූ නැන්සි හා ජෝර්ජ් ඔරුව ඈතට ඇදී යන ආකාරය පුදුමයෙන් බලා සිටින පිරිමි ළමයින් දෙදෙනා දුටුවෝ ය.

ලැජ්ජාවෙන් මඳ සිනාවක් පෑ නෙඩ් මෙසේ පැවසී ය. "ඔරුවෙ යට කවුරුවත් හිටියේ නෑ. මම හිතන්නේ ඔරුව භූතාවේශ වුණු එකක් කියලයි."

මේ පැහැදිලි කළ නොහැකි සිදුවීම නිසා වෙහෙසට පත්වූ ළමුන් තිදෙනාට ඔවුන්ගේ කොඳු නාරටිය දිගේ සියුම් විදුලි සැරයක් ගමන් කරනවාක් වැනි භීතියක් ඇතුණි.

මේ අද්භූත සිදුවීම පැහැදිලි කළ හැකි කිසිවෙක් මේ ලෝකයේ නැත.

“අපි ඉක්මනට ම ජැටියට පීනලා ගිහිල්ලා මෝටර් බෝට්ටුවක් ගමු” නැන්සි යෝජනා කළා ය. “අපිට සමහර විට ඔරුව අල්ල ගන්න පුළුවන් වෙයි.”

ඔවුන් ජැටියට ළඟාවන විට බෙස් හා ඩේව් ඉවුරේ ඔවුන් එන තුරු නොඉවසිල්ලෙන් බලා සිටිනු දක්නට ලැබුණි.

“අබිරහස විසඳුව ද?” බෙස් ඉතා උනන්දුවෙන් ඇසුවා ය. “නෑ,” නැන්සිගේ පිළිතුර විය. ඉන්පසුව ඈ ඔරුව පදවන්නෙකු නැතිව එය ම හබල් ගසමින් පැදයන ආකාරය විස්තර කළා ය.

“අපි හදන්නේ මෝටර් බෝට්ටුවක ගිහිල්ලා ඔරුව ගැන සොයා බලන්නයි. ඔයාලත් එනවද?”

“ඔව්, ඇත්ත වශයෙන් ම” ඩේව් උත්තර දුන්නේ ය.

නෙඩ් ඉක්මනින් ම ප්‍රධාන ගොඩනැගිල්ලේ ලොබිය වෙත දිව්වේ බෝට්ටුවක් පාවිච්චි කිරීමට අවසර ලබා ගැනීමට හා බෝට්ටුවක යතුරක් ලබා ගැනීමටත් ය. ස්වල්ප වේලාවකින් මුළු විල පුරා ම ඔරුව සෙවීමේ මෙහෙයුම ආරම්භ විය. සෑම අස්සක් මුල්ලක්ම පීරා බැලුවත් ඔරුව පිළිබඳව සලකුණක්වත් සොයා ගැනීමට ඔවුහු අසමත් වූහ.

“ඔයා හිතනවද කවුරු හරි ඒක කාර් එකක් උඩ තියලා බැඳගෙන යන්න ඇති කියලා?” ජෝර්ජ් ඇසුවා ය.

“වෙන්න පුළුවන්” බ්‍රෙට් පිළිතුරු දුන්නේ ය. “සමහර විට ලොරියක වෙන්නත් පුළුවන්.”

ජෝර්ජ් දිගට ම කතා කළා ය. “කවුරු හරි එහෙම වැඩක් කළා කියමු ඒත් ඔරුව කොහොමද කිසි කෙනෙක්ගේ උදව්වක් නැතිව විලේ යාත්‍රා කළේ? ඒකට හේතුවක් තියෙන්න ඕනෑ”

ඊට කිසිවෙක් පිළිතුරු දුන්නේ නැත. එහෙත් යම් අදහසක සේයාවක් නැන්සිගේ සිතේ මතුවෙමින් තිබුණි. ඇය එම අදහස සියලු දෙනා ඉදිරියේ කියා පෑමට මැලිවූවා ය. මන්ද මේ මොහොතේ එය ඇදහිය නොහැකි අදහසක් බව අත් අය සිතිය හැකි බැවිනි.

“සමහර විට ඒක හරියන්න ඉඩ තියෙනවා.” ඇය තමාට ම කියා ගත්තා ය.



මේවන විට ගවේෂකයෝ සයදෙනා කඳවුරට ළඟා වී සිටි අතර රාත්‍රී ආහාරය සඳහා ඇඳුම් ලා ගැනීමට ඔවුහු යුහුසුලු වූහ. රාත්‍රී ආහාරය සඳහා සීනුව දැනටමත් නාදකර අවසන් ය. කෑම කාමරයේ හරි මැද්දට වන්නට විශාල රවුම් මේසයක් භූත දඩයම්කරුවන් වෙනුවෙන් පිළියෙල වී තිබුණි.

ඔවුන් වාඩි වූ වහා ම “මට දැනගන්න ලැබුණා ඔයාලා ඔරුව පදවන අවතාරේ අල්ලන්න ගියා කියලා” යනුවෙන් බැබ් පැවසී ය.

නැන්සි සිනාසුණා ය.“එතන අවතාර දෙකක් තියෙන්න ඕනෑ. එකක් ඉස්සරහ, එකක් පිටි පස්සේ. මොකද හබල් දෙක ම ඉතා වේගයෙන් වැඩ කළා.”

“එහෙනම් කතාව ඇත්ත” රීටා කතාවට හවුල් වූවා ය. “ඔයාලා හොල්මන් අවතාර ගැන විශ්වාස කරන්න කැමති නෑ. නමුත් මම නම් ඒවා විශ්වාස කරන බව කියන්න ලැජ්ජා වෙන්නේ නෑ.”

රොඩ් සිනාසුණේ ය. “ඒ ගැන එච්චර හිතන්න එපා. එයා අද්භූත විද්‍යාව ගැන හදාරණ ශිෂ්‍යාවක් වුණත් තාමත් එයාගේ හොල්මන් ගැන තියෙන බය නම් ටිකක්වත් අඩුවෙලා නෑ”

අනෙක් පිරිස සිනාසුණු අතර ඒ ගැන කිසිවක් නොකීවේ ආපනශාලාවේ සේවකයා ආහාර ඇණවුම කුමක් දැයි විමසා සිටි හෙයිනි.

“අද තියෙනවා බැදපු හරක් මස්” ඔහු කීවේය. “කොහොමද ඔයාලා කන්න කැමති”

ගැහැනු ළමෝ මධ්‍යම ප්‍රමාණයේ මස් හොඳින් බැද ආහාරයට ගැනීමට කැමති වූ අතර පිරිමි සිහින්ව කපා බදින ලද මස්වලට කැමති බව කියා සිටියහ. “භූත දඩයක්කරුවන්ට බාගෙට බැදපු මස්” බ්‍රෙට් විරිත්තුවේ ය.

“ඔයාලා හොල්මන්වලට විරුද්ධව කරන සටන ජයගන්න නම් හොඳට කෑම කන්න ම ඕනෑ” ජෝර්ජ් විස්තර කළා ය.

“නෑ, අපිට දැන් ඕනෑ නැන්සි ඩ්‍රිව්ගේ අදහස්” නෙඩ් සිනහවක් පාමින් කීවේ ය. ඔහු ඇය විසඳූ බොහෝ අබිරහස්වල දී ඇය සමග කටයුතු කර තිබුණි. ඒනිසා ඇය කොතරම් දක්ෂ ද යන්න දැන සිටියේ ය. “මේ වැඩේ අනිත් ඒවාට වඩා බොහොම ගැටලු සහගතයි කියලා මට නම් හිතෙන්නේ” ඔහු කල්පනාවෙන් බරව කීවේ ය.

හෝජන ශාලාවේ තව අමුත්තන් කිහිප දෙනෙක් පමණක් සිටි අතර හෙලන් මෙසේ කීවා ය. "මම ලේකම්වරයාගෙන් මෙහෙ නවාතැන් ගන්න ඉල්ලුම් කරපු අයගේ ලේඛනය ඉල්ලගෙන බැලුවා. මේ ග්‍රීෂ්ම ඍතුවට කවුරුවත් මෙහෙ නවාතැන් ඉල්ලුම් කරලා නෑ. භූතාවේෂ වුණු ඔරුව ගැනයි මෙහෙ සිද්ධවෙන අනෙකුත් අද්භූත දේවලුයි නිසා මිනිස්සු කවුරුවත් මෙහෙ එන්නවත් විලේ විනෝද වෙන්නවත් බයයි"

"ඒක නම් ලැජ්ජාවට කරුණක්" බෙස් කතාවට එක් වූවාය. "නමුත් මම ඒ අයට දොස් කියන්න යන්නෙ නෑ. හෙලන් ඔයා දකින්න ඇති ඔරුව ස්වයංක්‍රියව හබල්ගාමින් විලේ ගමන් කරනවා. හරියට තරගයකට සහභාගී වෙලා වගේ."

ජිම් මෙහිදී අලුත් කතාවක් කීවේ ය. "මටත් ඒක දැනගන්න ලැබුණා නම් කොච්චර හොඳ ද? මේ කඳවුරේ අයිතිකාරයා වන ලෙපර්ට් මහත්මයා කියනවා එයා මේ සිත් ගන්නාසුලු ස්ථානය දියුණු කිරීමට සෑහෙන මුදලක් වැය කළ බව. මේ කරදර නිසා එයත් සෑහෙන අමාරුවකයි වැටිලා තියෙන්නේ. එයා කියන විදිහට දිගට ම මෙහෙම වැඩ සිද්ධ වුණොත් මේ ස්ථානය විකුණලා දාන්න එයාට සිද්ධ වේවි."

"නමුත් දැන් මෙතන මිලදී ගන්න කැමති වෙන්නේ කවුද? මොකද මේ ස්ථානය මිලදී ගන්නා කෙනාටත් මේ ප්‍රශ්නවලට ම මුහුණ දෙන්න සිද්ධ වෙන නිසා."

මෙහි දී ඈන් කතා කළා ය.

"අපි මේ අබිරහස විසඳමු. එතකොට සෑම දෙයක් ම හරියාවි"

"නොදැනිම ලේසියෙන් ම මේ ප්‍රශ්නය විසඳලා ඉවරවෙලා දෙවෙනි අබිරහසට අත ගහන්න පුළුවන් වෙයි කියලා. එහෙම නේද නැන්සි? බිල් කීවේ ය.

"මම හිතන්නෙ නෑ ඒක ඒ තරම් ලේසිවෙයි කියලා" ඇය පිළිතුරු දුන්නා ය.

සියලු දෙනා ආහාර ගෙන අවසන් වූ පසු බෙස් සුසුමක් හෙළමින් මේසයෙන් නැගිට්ටා ය. "මම හිතන්නේ ඔයා හරි නැන්සි. මොකද භූත යාත්‍රිකයා අපි හිතනවාට වඩා බුද්ධිමත්"

සෑම කෙනෙක් ම භෝජනාගාරයෙන් පිටතට පැමිණියහ.



සැන්දෑව ඉතා ම සීතල එකක් වූ අතර කඳවුරේ අයිතිකරුවා වූ ලෙපර්ට් මහතා ලොබියේ කෙළවරකට වන්නට විශාල ගිනි මැලයක් දැල්වූවේ ය. භූත දඩයක්කරුවෝ ගිනි මැලය වටා නිහඬව වාඩිවූයේ ඔවුන් මුහුණ දී සිටින අබිරහස පිළිබඳව සාකච්ඡා කිරීමට ය. ඔවුන්ගේ මුහුණ කල්පනාවෙන් බරව් තිබුණි. සෑම දෙනෙකුගේ ම මුහුණේ තිබුණේ විසඳාගත නොහැකි ගැටලුවකට මුහුණ දී සිටින කෙනෙකුගේ දක්නට ලැබෙන අඳුරු පෙනුමකි.

සෙවනි විලේ අබිරහස පිළිබඳව සාකච්ඡා කිරීම පසෙක තබා වෙනත් දෙයක් ගැන කතා කිරීම සුදුසු බව ජෝර්ජ් මෙහිදී ප්‍රකාශ කළා ය.

"කවුරු හරි හොඳ විහිළු කතාවක් කියනව ද?" ඈ ඇසුවා ය.

"හරි මම පටන් ගන්නම්" ජිම් ආචර් කීවේ ය. "ඔයාලා කවදාහරි අහලා තියෙනවද වැඩියෙන් ම පිදුරු හොයා ගත්ත ගොපලු කොලුවාගේ කතාව?" කිසිවෙකුට එය විසඳාගත නොහැකි විය.

"එයාට පිදුරු තියෙන තැන කීවේ වැස්සියක්. එයා වැස්සිගෙන් හරකුන්ගේ භාෂාව ඉගෙන ගෙන තමයි රහස දැන ගත්තේ."

"ඒක නම් මාරයි" ඩොන් විරිත්තමින් කීවේ ය.

"ඊට වඩා හොඳ කතාවක් කවුරුවත් දන්නව ද?" ජිම් ඇසුවේ ය.

"ඔව් ඇත්තෙන් ම, හඳට උඩින් පැනලා අහස් ගඟ දිගේ ආපහු ආව හරකගෙ කතාව"

ඒ සමග ම ඇති වන්නට තිබුණු මහ සිනා හඬ එක්වර ම නැවතී ගොළු වී ගියේ මහ හඬක් නංවමින් ලොබියේ දොර "දඩාස්" හඬින් විවරවී මහා සුළඟක් ඒ තුළට කඩා වැදීම නිසා ය. ඒ සමග ම කඩදාසි කොළ කැබලි හා දූවිලි වලාවක් නංවමින් ලොබිය පුරා ම විසිර ගියේ ය. සියලු දෙනාගේ ම කටවල් ඇරී, ඇස් දොර වෙත ඇදී ගියේ හදවතේ ගැස්ම වැඩි කරවමින් ය.

තද සුළං පහර කොතරම් වේගයෙන් ගිනි මැලය වෙත එල්ල වුණේ ද යත් ගිනි පුපුරු, අළු කාමරය පුරාම විසිරී ගියේය. පැතිරෙන්නා වූ ගිනි පුපුරුවලින් බේරීමටත්, විසිරී ගිය කොළවලට ගිනි ඇවිළීම වළක්වා ගැනීමටත් ළමා පිරිස අතර ඇති වූයේ උමතු පොරයකි. ඔවුන් කෑ කෝ ගසමින් ඒ මේ අත පැන්නේ රෙදිවල ඇලුණු ගිනි පුපුරු අතින් පිසදමමිනි.

"මේක හරිම භයානකයි" බෙස් කෑ ගැවා ය.

සුළඟ කඩා වැදුණු වේගයෙන් ම එහි වේගය බාල වී ගියේ ය. නැන්සිගේ සිතේ මහත් සැකයක් ඇතිවූ හෙයින් ඈ වේගයෙන් දොර වෙත දිව ගියා ය. එය හඳ එළියෙන් දීප්තිමත් ව තරු අහසේ බබළන නිහඬ රාත්‍රියකි. අවට පරිසරය සඳ එළියෙන් නෑවී තිබුණි. පුදුමයකි! පිටත පරිසරයේ වේගවත් සුළඟක සේයාවක්වත් නැත.

"කවුරු හරි උවමනාවෙන් ම මේ සුළං පහර ඇති කරලා තියෙනවා" මෙසේ සිතූ ඈ පිටතට දිව ගියා ය.

වනය දෙසට වේගයෙන් දිවයන මිනිස් රුවක් යාන්තමින් දැක ගැනීමට ඇයට හැකි විය. ඔහුගේ කිහිල්ලේ විශාල යම් කිසිවක් රැඳී තිබුණු බව යන්තම් දැක ගැනීමට නැන්සි සමත් වූවා ය.

"නෙඩ්, හැමෝ ම එක්ක ඉක්මනට දුවලා එන්න" නැන්සි මොර දෙමින් ම වනය දෙසට දුවන්නට පටන් ගත්තා ය.

නෙඩ් ඉක්මනින් ම ඇයට ළඟා වූ අතර සිදුවූයේ කුමක් දැයි ඇයගෙන් ඇසුවේ ය. ඇය ඉක්මනින් ම ඇය දුටු දේ ඔහුට විස්තර කළ අතර දෙදෙනා ම නැවතත් ලුහුබැඳීම ඇරඹූහ.

"ඔහු මොන වගේ ද?"

"ඔහු උස බව හැරෙන්න මම කිසිම දෙයක් දැක්කේ නෑ"

ගස් අතරින් සඳ එළිය පෙරී ආවත් පලා යන කෙනෙකු පසු පස පන්නා යාමට වනය තුළ අඳුර වැඩිය. මිනිත්තු කිහිපයකින් පලා යන්නා ගස් අතර නොපෙනී ගියේ ය.

ඈතින් මෝටර් රියක එන්ජිම පණ ගැන්වෙන හඬ ඇසුණු හෙයින් නෙඩ් හා නැන්සි එක්වර ම නතර වූහ. "එයා කොහොම හරි පැන ගත්තා" නැන්සි බිඳුණු ස්වරයකින් කීවා ය.

ජෝර්ජ්, බෙස් හා අනෙක් පිරිස පණ යන තරමට හති දමමින් එතැනට ළඟා වූහ.

"මොකද වුණේ?" නැන්සිගෙන් ඔවුහු ප්‍රශ්න කළහ.

සිදුවූ දෙය විස්තර කළ ඈ මෙසේ ද කීවා ය. "මිනිහා විශාල දෙයක් උස්සගෙනයි දිව්වේ. අපි ඔහුගේ පස්සෙන් පන්නන බව දැන ගත්තම ඉක්මනින් දුවන්න ඕනෑ නිසා ගෙනිච්ච දේ කොහේ හරි



දාලා දුවන්න ඇති. අපි මේ පාර දිගේ ටිකක් හොයා බැලුවොත් ඒක අපිට හොයා ගන්න පුළුවන් වෙයි."

සියලු ම දෙනා ප්‍රවේශමෙන් සෙමෙන් සෙමෙන් වනය පරීක්ෂා කරමින් ඉදිරියට ඇදෙන්නට වූහ. මිනිත්තු කිහිපයකට පසු නැන්සි ගසක් ළඟ වැටී තිබුණු විශාල දෙයක් අසලට ආවා ය. එය විශාල මයිනහමක් බව පරීක්ෂා කිරීමේදී දැක ගත හැකිවිය.

"ඔහෝ ! එහෙනම් මේකෙන් තමයි ලොබිය ඇතුළේ සුළි සුළඟක් ඇති කළේ. මේ මිනිහට නම් පිස්සු වෙන්න ඇති. නැත්තම් මොකට ද මේ වගේ වැඩක් කළේ?" ජෝර්ජ් අප්‍රසාදය පළ කරන බැල්මකින් යුතුව කීවා ය.

බෙස් නැවතත් සුළි සුළඟක් ඇති කරවන තරම් විශාල සුසුමක් හෙළුවා ය. "අපිව තරහ අවුස්සන්න. මිනිහ කවුරු වුණත් එයාට ඕනෑ කරලා තියෙනවා අපිව මෙතනින් පන්න ගන්න."

"ඒ මොකටද?" ඩේව් ඇසුවේ ය. "භූතාවේෂ ඔරුවයි, මේ මිනිහයි අතර මොකක් හරි සම්බන්ධයක් තියෙනව ද?"

රීටා මෙහි දී කතාවට හවුල් වූවා ය. "අපිට ඒ ගැන කිසිම හෝඩුවාවක් නෑ. නමුත් මම හිතන්නේ භූතාවේෂ වුණු ඔරුව නම් සොබාදහම ඉක්මවා යන දෙයක් කියලයි."

"මට හිතෙන්නේ මේ හඳ එළිය නිසා ඔයා මෝහනය වෙයි කියලයි. රීටාගේ හොල්මන් භූතයෝ ගැන විශ්වාසෙත් එක්ක අපිට මේ වැඩේ කරන්න අමාරුයි. අපි ආපහු ගිහිල්ලා මේ ඔක්කොම අමතක කරමු" රොඩ් කීවේ ය.

උදේ කාලයේ දී භූතාවේෂ වුණු ඔරුව හා මයිනහම රැගෙන දිවූ අමුත්තා පිළිබඳව තව දුරටත් පරීක්ෂා කර බැලීම සුදුසු බව නැන්සි යෝජනා කළ පසු මිතුරෝ "සුභ රාත්‍රියක්" යනුවෙන් එකිනෙකාට සුභ පතමින් නින්දට ගියෝ ය.

"මට නම් සතියකට ඇතිවෙන්න මහන්සියි. අර මිනිහා පස්සෙන් පන්නලා" බෙස් ඇඳේ දිගා වෙමින් කීවා ය.

පාන්දර දෙකට පමණ නැන්සි නින්දෙන් අවදි වූවා ය. පයින් ගස්වල මුනුමුනුව හැර සියලු දේ ම ගැඹුරු නිහඬතාවක ගිලී පැවතුණි. මුදු සුළඟක් පරිසරය සුමුදු ලෙස පිස දමමින් හමා ගියේ ය. අවට පරිසරයේ නිහඬතාවෙන් විස්මයට පත්වූ නැන්සි ඇඳෙන් බැස

ජනේලය ළඟට ගොස් එය විවර කළා ය. ජනේලයෙන් ඉවත බලා ගෙන ඇය පරිසරයේ අලංකාරය සිතින් විඳින්නට පටන් ගත්තා ය. සඳ එළියෙන් නැවී පරිසරය අයස්කාන්ත සිරියාවක් මවා පෑවේ දිව්‍යලෝකය මහපොළොව මත පහළ වූවාක් මෙනි. පයින් ගස් තාලයකට සිලිසිලි හඬක් නැගුවේ ය. සඳ එළියෙන් දීප්තිමත්ව බැබළෙන විලේ ජල තලය මත අපූරු සිතුවම් ඇඳී යන ආකාරය නැන්සි, සුළඟින් නැළවෙන පඳුරු අතරින් ආශාවෙන් බලා සිටියා ය.

මෙසේ වැඩි කාලයක් ගත කිරීමට ඇයට ඉඩ ලැබුණේ නැත. දෙදෙනෙකු අතර සිදුවන රහස් කෙඳිරීමක් ඈ සිටි ජනේලයට මඳ දුරකට එහායින් නැගෙනු ඇයට ඇසුණි. ඇයව අවදි කළේ මේ රහස් කෙඳිරීම ද? නැත්තම් හඳ එළියේ ඇවිදින්නට ගිය තම මිතුරන් දෙදෙනෙකුගේ සාකච්ඡාවක් ද? ඇය දෙවෙනි අදහස එක්වර ම ඉවත දැමුවා ය. ඇගේ කණ්ඩායමේ සාමාජිකයෝ සෑම දෙනෙක් ම දවල් කාලයේ අධික ලෙස වෙහෙස වීම නිසා තද නින්දේ පසුවෙති. ඔවුන්ගෙන් කිසිවෙකු මේ රාත්‍රියේ දී අවදි වී පිටත නොයන බව ඇයට සහතික ය.

"මට සැකයි මයිනහම අරන් දුවපු මිනිහා තවත් සගයෙක් එක්ක ආපසු ඇවිල්ල ද කියලා" ඇය තමාට ම කියා ගත්තා ය.

මේ පිළිබඳව පරීක්ෂා කර බැලීමට සිතූ ඈ රාත්‍රී ඇඳුමට උඩින් ලෝගුවත් දමා ගෙන සෙරෙප්පු ජෝඩුව ද පැළඳ ගත්තා ය. කාමරයෙන් ඉවතට හඬ නොනැගෙන සේ පා තැබූ ඈ රහස් මිමුණුම ඇසුණු දිසාවට නිහඬව ම පියවර තබන්නට වූවා ය.

හඬ ඇසුණු බිත්ති මුල්ලට ළඟාවීමට පෙර නැන්සි හොඳින් ඇහුම්කන් දීමට මොහොතක් ප්‍රමාද වූවා ය. ඒකාකාරී හඬකින් එක දිගට ම මෙසේ කියන හඬක් ඇගේ සවන් පත්වල වැකුණි.

"සෙවනි විල අයිති භූතයින්ටයි. අනතුරක් සිදුවීමට පෙර පණ බේරා ගෙන පලා යනු"



## 03

නැන්සි එකතැන ම ගල් ගැසී නතර වූවා ය. ඒකාකාරී කටහඬ, ගායනය නැවැත්වී ය. මේ මීට පෙර දුරකථනයෙන් අනතුරු ඇඟවූ පුද්ගලයාම ද? දිගට ම නිහඬව පා තබමින් කාමරයේ මුල්ලට ළඟා වූ ඈ එහා පැත්තට එබී බැලුවා ය. එහි කිසිවෙක් පෙනෙන්නට නැත. ඈ කාමර පේළිය දිගේ ඉදිරිය බැලුවා ය. ඉක්මනින් ඊළඟ මුල්ලට දිව ගියා ය. එතැනින් එබී බැලුවත් එහි ද කිසිවෙක් නැත. කිසිම තැනක කිසිවෙක් නැත.

බැබළෙන හඳ එළියේ ඇය කාගේ නමුත් ඉලක්කයක් විය හැකි බව හදිසියේ ම ඇයට වැටහී ගියාය. "මම ටිකක් මුල්ලකට වෙලා හැංගෙන එක හොඳයි." ඇය තමාට ම කියා ගත්තා ය.

එහායින් තිබූ කාමර පේළියේ හෙවණැල්ල නිසා ඇයට ආරක්ෂාව සැලසී තිබුණි. එතැනට ඉක්මනින් ම පැනගත් නැන්සි ගොරෝසු බිත්තිය තදින් අල්ලාගෙන අමුතු කටහඬ ඇසුණු දිශාවට දෙනෙත් යොමු කළා ය.

හරියට ම මේ මොහොතේ දී සුදුපාට ඡායාවක් වැනි රුවක් වනය තුළින් පාවී ආවේ ය. එම රුව සුදුපාට එල්ලා වැටෙන ඇඳුමක් හැඳ සිටි අතර කාන්තාවකගේ අවතාරයක් බව පෙනෙන්නට තිබුණි.

මෙය මායාකාරී රූවටිල්ලක් ද? නැත්තම් සෙවනි විලේ අවතාර හා භූතයින් පිළිබඳ කතාව සත්‍යයක් ද? රහස් පරීක්ෂිකාවගේ හදවත වේගයෙන් ගැහෙන්නට පටන් ගත්තේ ය. ඈ නළලේ නැගී ආ දහඩිය අතින් පිස දැමුවා ය.

"එය මුණගැසීමට මා යා යුතු ද?" නැන්සි තමාට ම කියා ගත්තා ය. "නැත්තම් අවතාරය මා වෙත ඒවි ද?"

මේ අතර නැන්සි විවර කළ ජනෙල් පතෙන් වැටුණු දීප්තිමත්

හඳ එළිය නිසා බෙස් තිගැස්සී අවදි වූවා ය. හඳ එළියෙන් වැළකීමට අනිත් ඇලයට හැරුණ ඈ නැන්සි ඇඳේ නොසිටින බව දුටුවා ය.

"එයා කොහේ ගිහිල්ලද මන්දා" බෙස් කල්පනා කළා ය. "එයා වටපිටාව පරීක්ෂා කර බලන්න යන්න ඇති. මම ගිහිල්ලා එයා කොහේ ද ගියේ කියලා හොයා බැලුවොත් හොඳයි."

බෙස් ජනේලය වෙතට ගොස් පිටත බැලුවා ය. ඒ වන විට අවතාරය සිටියේ ජනේලය වෙතට ළඟාවෙමිනි. එය හෙමින් පා වෙමින් ඇය සිටින දෙසට එයි. බෙස් යටිගිරියෙන් මරහඬ දී කෑගැසුවාය.

එම ශබ්දය තද නින්දේ පසු වූ ජෝර්ජ් අවදි කරවීමට සමත් විය. උඩ ගොස් ඇඳෙන් බිමට වැටුණු ජෝර්ජ් "මොක ද? ....... මොක ද?" යනුවෙන් ඇසුවා ය. නැන්සිගේ ඇඳ හිස් බව දුටු ඈ මහත් සේ බියට පත්ව "කෝ නැන්සි" යනුවෙන් ඇසුවා ය.

"මං .......... මං දන්නේ නෑ"

බෙස්ට තව දුරටත් කතා කර ගත නොහැකි විය. ඈ අවතාරය දෙසට තම වෙව්ලන ඇඟිල්ල දිගු කළා ය.

ජෝර්ජ්ගේ කටේ කෙළ සිඳුණාය. හදවත වේගයෙන් ගැස්සෙන්නට පටන් ගති. ඉක්මනින් ම බිය මැඩ පවත්වා ගත් ඈ "අපි එළියට ගිහින් බලමු ඒ මොකක් ද කියලා" යනුවෙන් කීවා ය.

"අනේ ! පණට ආදරයක් තියෙනවා නම් යන්න එපා !" බෙස් ඉල්ලා සිටියා ය. එහෙත් එවිට ම ඇයට නැන්සි පිළිබඳ ව සිහියට නැගුණි.

"අපි නැන්සිව හොයා ගන්න ඕනෑ. එයාට අර ..... අර ...... අවතාරෙන් කරදරයක් වෙන්න පුළුවන්"

සුළු මොහොතකින් මුළු කඳවුර ම කැලඹී ගිය අතර සියලු ම භූත දඩයම්කරුවෝ තම තමන්ගේ කාමරවලින් එළියට ආහ. ඔවුහු මහත් කලබලයෙන් එකිනෙකා හා කතා කරන්නට පටන් ගත්හ.

"මොක ද වෙලා තියෙන්නේ ?"

"කවුද මර හඬ දුන්නේ ?"



බෙස් සියල්ල ඔවුන්ට පැහැදිලි කළ අතර ඔවුහු සැකයෙන් වටපිට බැලූහ. අවතාරය පලා ගොසින් ය.

"ඔයාට හොඳට ම විශ්වාස ද ඔයා දැක්කේ හීනයක් නෙමෙයි කියලා ?" ඩේව් ඇසුවේ ය.

"ඇත්තට ම හීනයක් නෙමෙයි." බෙස් ස්ථිර කටහඬකින් කීවා ය.

එවිට ම නැන්සි පිරිසට එක්වූ අතර ඇගේ විස්තරය ඇසූ සියලු දෙනාගේ ම සිරුරු වෙව්ලා ගියහ. තමන් මුහුණ දී සිටින මේ බිහිසුණු තත්ත්වය පිළිබඳ ව ඔවුන් තුළ මහත් බියක් ඇති විය. ඔවුන් කිසිවෙක් කතා කිරීමට අපොහොසත් වූහ.

"මට නම් හොඳට ම විශ්වාසයි ඒක කිසි ම අස්වාභාවික දෙයක් නෙමෙයි කියලා. කවුරු හරි අපිට විහිළුවක් කරනවා" ඇය ප්‍රකාශ කළා ය.

"විහිළුවක් !" බෙස් විස්මයෙන් රාවයක් පිට කළා ය. "ඔයා එහෙනම් අර අනතුරු ඇඟවීම ගණන් ගන්නේ නැත්ද?"

නැන්සි සිය අත බෙස්ගේ කරවටා දමා ගත්තා ය. "නෑ, කවුද නැත්නම් මොකක් ද මේ වැඩේට වගකිව යුත්තේ කියල දැනගන්නකම්, මම අනතුරු ඇඟවීම එච්චර ගණන් ගන්නේ නෑ. අපිට ඒ ගැන යමක් හොයාගන්න පුළුවන් වෙයි. මට ඉස්සර වෙලාම ගැහැනු අවතාරය දකින්න ලැබුණු කැලෑව පැත්ත පරීක්ෂා කළොත් හොඳයි !"

ඈ ඇගේ මිතුරනුත් සමග මයිනහමත් ගෙන මිනිසා දිව ගිය කැලෑව ප්‍රදේශය වෙත දිවගියා ය.

ටික වේලාවකින් බ්‍රෙට් කෑගැසුවේ ය.

"නැන්සි, ඔන්න ඔයා දිනුවා. මේ ඉන්නේ අවතාරේ"

ඔහු පඳුරක් ළඟින් සුදුපාට දුහුල් රෙදි ගොඩක් ඉහළට ඔසවා පෙන්වීය. රීටා බලාපොරොත්තු කඩ වූ ආකාරයෙන් ඒ දෙස බැලුවා ය.

"අපි කොහොම ද හරියට ම කියන්නේ මේක තමයි අවතාරෙ කියලා" ඇය කලකිරුණු ස්වරයකින් කීවා ය.

"අපිට හරියට ම කියන්න බෑ" නැන්සි පිළිතුරු දුන්නා ය. "නමුත් අපේ සැකය නිවැරදි බව මට නම් හිතෙනවා. අපි කාමරයට ගිහින් මේක හොඳට පරීක්ෂා කරලා බලමු."

ඔවුන් දොර ළඟට එනවිට කාමරය අගුළු ලා තිබුණි. එහෙත් ඔවුන් එන ශබ්දය ඇසුණු ලෙපර්ට් මහතා දොර විවර කිරීමට පැමිණියේ ය.

"මම හිතන්නේ මට කවුරු හරි යටිගිරියෙන් කෑ ගහන ශබ්දයක් ඇහුණා." ඔහු කීවේ ය. "ඔබලාට මොකක් හරි හිරිහැරයක් වුණාද?"

ඔවුන් කණ්ඩායම කාමරවලට ඇතුළු වන අතරතුරදී නැන්සි ඔහුට සිදුවූ සියල්ල විස්තර කර දූහුල් රෙදි ගොඩ ද ඔහුට පෙන්නුවා ය.

"හරිම පුදුමයක්" ලෙපර්ට් මහතා ඔහුගේ මවිතය පළ කළේ ය.

"මෙහෙ සිද්ධවෙන අමුතු දේවල්වලට තවත් අලුත් පරිච්ඡේදයක් එකතුවෙලා එහෙනම්"

"මට මේක හොඳින් පරීක්ෂා කරන්න ඕනෑ"

එසේ කියූ නැන්සි දූහුල් රෙදිවල රැළි එකින් එක ඔසවා බලන්නට පටන් ගත්තා ය. රැලිවලට යටින් ම විශාල දිග බැලුමක් තිබෙන බව දක්නට ලැබුණි.

"මට හිතෙන්නේ මේ බැලුම් පිම්බුවහම ගැහැනු කෙනෙකුගෙ හැඩය මේ දූහුල් රෙදි ගොඩට ලැබෙනවා කියලයි." බ්‍රෙට් කීවේ ය. ඔහු එය තුරුළු කරගෙන අනිත් අය දෙස බලා ඇසක් වසමින් "මගේ අලුත් බෝනික්කි" යැයි පැවසුවේ ය. පිරිසේ සිටි සියලු දෙනාට ම සිනහව නවතා ගත නොහැකි විය. ජිම් බැලුම පිම්බුවේය. නැන්සි ප්‍රවේශමෙන් බෝනික්කාගේ ඇඳුම්වල රැලි සකස් කර වේලය හිසට ඉහළින් පැළඳුවා ය. කාමරය මැද සුදු ඇඳගත් අවතාරයක් පාවෙමින් තිබෙන ආකාරය කාටත් පෙනුණි.

"මම දැකපු දේත් මේකම තමයි" ඇය කීවා ය.

"මමත් දැක්කේ මේකම තමයි." බෙස් අදහස සනාථ කළාය.

"මේක හරියට ම අවතාරයක් වගේ නෙමේද? නමුත් ඒක ඇවිද ගෙන ආවේ කොහොමද?"

"සමහරවිට," නැන්සි කල්පනාකාරීව මෙසේ කීවා ය.

"සමහරවිට මයිනහම ගෙනිච්ච මිනිහා සුළඟක් ඇති කරලා මේක මෙහාට එවන්න ඇති."



එක්වර ම නැන්සිට මෙතෙක් ඩේව්ගෙන් හෝ නෙඩ්ගෙන් කිසිම අදහසක් ඉදිරිපත් නොවූ බව සිහි විය. වටපිට බැලූ ඇයට ඔවුන් දෙදෙනා කාමරයේ නොසිටින බව වැටහුණි. ඈ එයින් මහත් පුදුමයට පත් වූවා ය.

"නෙඩුයි, ඩේව්යි අපිත් එක්ක ආපහු ආවේ නැද්ද?" "නෑ," ජිම් පැවසුවේ ය. "මම දැක්කා එයාලා කැලේ කඩාගෙන දුවනවා. මම හිතන්නේ එයාල අපි නොදැක්ක වැදගත් දෙයක් දකින්න ඇති කියලයි."

යම් කිසිවෙක් මේ ආකාරයට වංචාකාරී ලෙස අවතාරය බිම දමා පලා ගොස් සැඟවී සිට පිටුපසින් පන්නා එන අයට අනතුරක් කිරීමට ඉඩ ඇතිබව නැන්සි අවධාරණය කළාය."අපි එළියට ගිහින් ඒ අය ගැන සොයා බලන්න ඕනෑ කියලා ඔයා හිතනව ද?" බෙස් විමසුවා ය.

නමුත් එසේ කිරීම අවශ්‍ය නොවූයේ නෙඩ් සහ ඩේව් ඒ මොහොතේ ම කාමරයට ඇතුළු වූ හෙයිනි. ඔවුහු තිගැස්සී බ්‍රෙට් ඔසවාගෙන සිටි මායාකාර රූපය දෙස බැලූහ.

"එතකොට මේකද අවතාරය ?" නෙඩ් පුදුමයෙන් ඇසුවේය.

සෑම අයෙක්ම හිස් වැනූහ. "ඇයි ඔයා දැක්කේ නැද්ද බිම වැටිලා තිබුණු සුදුපාට දූහුල් රෙදි ගොඩ?" ජෝර්ජ් ප්‍රශ්න කළාය.

ඔහු හිස දෙපසට වනා ඔහු නොදුටු බව ඇඟෙව්වේ ය. ඔහු ඇතින් සෙලවෙන එළි දෙකක් දැක තිබුණි. ඔහුට ඒ කුමක් දැයි දැන ගැනීමට අවශ්‍ය වූ හෙයින් ඒ ගැන පරීක්ෂා කිරීමට යාමට ඩේව් කැඳවා ඇත.

"මම ඩේව්ට අඬ ගැහැව්වා මාත් එක්ක යන්න"

"ඔයාලට මොනවා හරි දැක ගන්න ලැබුණද" ඒ නැන්සිගේ විමසිලිමත් හඬයි.

ඩේව් පිළිතුරු දුන්නේ ය. "අපිට කාවවත් අල්ල ගන්න බැරිවුණා. නමුත් අපි දැක්කා මිනිස්සු දෙන්නෙක්ව. ඒ අයගේ අතේ විදුලි පන්දම් තිබුණා. ඒ දෙන්නා පිස්සු හැදිලා වගේ කැලේ බිඳගෙන විල දිහාට දිව්වා. අපි ළංවෙන්න කලින් ඒ අය ඔරුවකට නැගලා මර බයෙන් පැද ගෙන ගියා."

"ඒ මිනිස්සු කොයි වගේද?" නැන්සි විමසුවා ය.

"මට කියන්න පුළුවන් ඒ මිනිස්සු දිග කලිසම් ඇඳලා ස්වෙටර් දාගෙන හිටි බවත් රැළි ගැහුණු කෙටි කොණ්ඩයක් ඒ අයට තිබුණු බවත් විතරයි. අපි දන්නේ නෑ ඒ ගැනු ද මිනිස්සු ද නැත්නම් ගැහියෙකුයි මිනිහෙකුයි ද කියලා" නෙඩ් පිළිතුරු දුන්නේ ය.

නැන්සි, බ්‍රෙට්ගෙන් අවතාර බෝනික්කා ඉල්ලාගෙන හොඳින් එය පරීක්ෂා කළේ යම් කිසි හඳුනාගත හැකි සලකුණක් එහි තිබේද යන්න දැක ගැනීමේ බලාපොරොත්තුවෙනි. වියැකී ගිය සලකුණක් වම් පාදයේ යටි පතුලේ තිබෙනු දක්නට ලැබුණි. ඈ එය එළියට අල්ලා හොඳින් පරීක්ෂා කර බැලුවා ය.

නැන්සි බැලුම බිම අතුරා එහි නම ශබ්ද නගා කියෙව්වා ය. "ජේ.බී. නිව්ටන්" "ඔයාලා කවුරු හරි ඒ නමින් තියෙන බැලුම් සමාගමක් ගැන කවදාවත් අහලා තියෙනව ද?"

කිසිවෙක් එවැනි නමක් අසා නොතිබූ නමුත් ලෙපර්ට් මහතා කතා කළේ ය. "සෙවෙනි නගරයේ ජේ.බී.නිව්ටන් කියන මහත්මයෙකුට අයිති ලිපි ද්‍රව්‍ය සාප්පුවක් තියෙනවා. සමහර විට මේ බැලුම මිලදී ගන්න ඇත්තේ ඒ සාප්පුවෙන් වෙන්න ඇති."

නැන්සි තම අත් ඔරලෝසුව දෙස බැලුවා ය. ඒ වන විටත් වේලාව පාන්දර තුන වී තිබුණි. සෑම කෙනෙකුගේ ම මුහුණේ වූයේ දැඩි විඩාපත් බවකි.

"මම හිතන්නේ නෑ, අද රෑට ආයෙත් වෙන කිසිම සිද්ධියක් සිද්ධවෙයි කියලා" ඇය කීවා ය. "එහෙනම් අපි දැන් නින්දට යමු."

"ඒක නම් කදිම අදහසක්" ඇනුමක් හරිමින් බෙස් කීවා ය.

අද තව කරදර කිසිවක් සිදු නොවනු ඇතැයි තමා ද සිතන බව ලෙපර්ට් මහතා විශ්වාසය පළ කළේ ය.

"මම හිතනවා ඔබලා හැමෝම ටිකක් පරක්කු වෙලා උදේ කෑම ලැබුණොත් සතුටුවෙයි කියලා"

"අපි හැමෝම එකඟයි" බිල් ඉක්මනින් ම කීවේ ය.

"එහෙනම් උදේ අට හමාරට?"



නැන්සි තම කාමරය කරා පිය මනින අතර දී නෙඩ්ට මෙසේ කීවාය. "අපි අට හමාරට උදේ කෑම මේසයේ දී මුණ ගැහෙමු. උදේ කෑමෙන් පස්සේ කෙළින් ම නගරයට ගිහිල්ලා ජේ.බී.නිව්ටන් මහත්තයා මුණ ගැහිලා කතා කරමු. ඔයා පිරිමි ළමයිව කැන්දගෙන එන්න. මම ගැහැනු ළමයින්ව කැන්දාගෙන එන්නම්. එහෙනම් හරි නේද?"

* * * * * * *

නැන්සි, බෙස් හා ජෝර්ජ් නිව්ටන් මහතාගේ සාප්පුව විවෘත කර මඳ වේලාවකින් තම මිතුරන් සමග එහි ළගාවූහ.

"මගෙන් මොනවා හරි උදව්වක් අවශ්‍යද?" කාරුණික සාප්පු හිමියා ඇසුවේ ය.

මඳ සිනහවකින් ඔහුට සංග්‍රහ කළ නැන්සි තමාට ජේ.බී. නිව්ටන් යන නම සඳහන්ව ඇති කාන්තාවකගේ හැඩරුව ඇති බැලුමක් ලැබුණු බව ඔහුට කීවා ය.

"මම හිතන්නේ ඒක ඔබේ සාප්පුවෙන් මිලදී ගත්ත එකක් කියලයි. නිව්ටන් මහත්මයා කරුණාකරලා මට මේකේ අයිතිකාරයා කවුද කියලා හොයා ගන්න උදව් කරන්න. පුළුවන් ද? මේ බැලුම වික්කේ ඔබලාගේ සාප්පුවෙන් ද?"

"මට සහතිකයි එහෙම කියලා" තරබාරු, විනෝදකාමී පෙනුමක් ඇති නිව්ටන් මහතා පිළිතුරු දුන්නේ ය.

"කරුණාකරලා මට කියන්න පුළුවන් ද ඒක මිලදී ගත්තේ කවුද කියලා" මෙහිදී නිව්ටන් මහතා සිනාසුණේ ය. "මට ඒ කෙනාව හොඳට මතකයි. සතියකට විතර කලින් ජෝඩුවක් ආවා. ඔවුන් විවිධ රූපවලට අනුව හදපු සුදුපාට බැලුම් පෙට්ටියක්ම අර ගත්තා. ඒ අය කිව්වා ළමයින්ට ලොකු සාදයක් පවත්වන්ට යනවා කියලා."

"ඒ අය මේ ප්‍රදේශයේ පදිංචිකාරයෝ ද?"

නැන්සි ඇස් කුඩාකර විමසිලිමත්ව ඇසුවා ය.

"නෑ. මොකද මේ ප්‍රදේශයේ පදිංචි හැම කෙනෙක්ම මාත් එක්ක ගනුදෙනු කරන නිසා මම ඒ අයව හොඳට අඳුනනවා. ඒ ජෝඩුව නිවාඩුවක් ගත කරන්න ආපු අය වගෙයි පෙනුණේ. ඒ ගොල්ලෝ සෙවනි විල පැත්තෙන් කුඩා ගෙයක් කුලියට අරගෙන

ඇති. ඒ ගැන දැනගන්න හොඳම කෙනා තමයි ජේන් ටාජේ මහත්මිය. එයාගෙ ව්‍යාපාරය ඉඩම් ගනුදෙනු, ගෙවල් කුලියට සොයාදීම වගේ දේවල්. මේ පාර දිගේම ගිහාම ඔබට ඇගේ කාර්යාලය හම්බවෙයි."

"මම එහෙම කරන්නම්" නැන්සි එකඟ වූවා ය. "ඔබට මේ ජෝඩුවගේ නම් දැනගන්න ලැබුණ ද?"

"ඒ ගොල්ලො නම් කිවේ නැති උනත් මට පුළුවන් ඒ දෙන්නා මොන වගේද කියලා ඔයාට කියන්න. මිනිහා උස හීන්දෑරි කෙනෙක්. මිනිහාගේ ඇස් තමයි පුදුම ඇස්. ඇතුළට ගිලා බැහැපු ඒ ඇස් අපි දිහා බලනකොට හරියට අපිව විනිවිද යනවා වගෙයි තේරෙන්නේ. මම කියන්නේ මිනිහා කිසිම කමකට නැති මිනිහෙක් කියලයි. කිසිම කෙනෙක් ඒ වගේ මිනිහෙක් එක්ක හැප්පෙන්න යන්න හොඳ නෑ" කියූ නිව්ටන් මහතා සිනාසුණේ ය.

නැන්සි ද සිනහ වූ අතර ඔහු තව දුරටත් කාන්තාවගේ හැඩරුව විස්තර කළේ ය."ඒ කාන්තාව තරමක් මිටියි. ඒ වගේම ඇගේ තිබුණේ තද ගති පෙන්වන ලස්සනක්. ඒවගේම දෙන්නටම තිබුණා තද කළුපාට රැළි සහිත කෙටි කොණ්ඩයක්"

තවදුරටත් සාප්පු හිමියා කියා සිටියේ එම කාන්තාව ඇය සමග සිටි මිනිසාට ඉතා බය පක්ෂපාත කමින් හැසිරුණු බවත්, ඇත්ත වශයෙන්ම ඇ ඔහුට විශාල බියකින් පසුවන බව කීම වඩාත් සත්‍යයක් බවත් ය.

නැන්සි තමන්ට ලබා දුන් තොරතුරුවලට නිව්ටන් මහතාට ස්තුති කර කණ්ඩායමේ අනිත් මිතුරු මිතුරියන් සමග ටාජේ මහත්මියගේ ඉඩම් කාර්යාලය වෙත ගමන් කළා ය. ජේන් ටාජේ මහත්මිය මැදිවියේ සිටි ප්‍රසන්න, එමෙන් ම කතාවේ ඉතා චතුර බවක් දැක් වූ කාන්තාවක් වූවා ය.

තමන් පයින් ග්‍රෝව් කඳවුරේ ග්‍රීස්ම නිවාඩුව ගත කිරීම සඳහා නවාතැන් ගෙන සිටින බවත්, කිසියම් යුවළක් නොබෝදා මේ ප්‍රදේශයේ නිවසක් කුලියට ගත්තා දැයි දැන ගැනීම පිණිස පැමිණි බවත් ටාජේ මහත්මියට නැන්සි තම අරමුණ පැහැදිලි කළා ය.

"එක් ජෝඩුවක් විතරයි" ටාජේ මහත්මිය ඉක්මනින් ම පිළිතුරු දුන්නා ය. "ළමයි අට දෙනෙක් ඉන්න ජෝඩුවක් ගෙයක් හොයාගෙන



මෙහාට ආවා. මම ඔවුන්ට පිළියෙල කරලා දීපු නිවස හරියට ම ඔබලාගේ නවාතැනට ඉදිරිපසින් විලේ අනිත් පැත්තට වෙන්න තියෙන්නේ. කොහොම හරි මට මතකයි ඒ මහත්මයා ඇහැව්වා පයින් ග්‍රෝව් කඳවුර එහෙම විකුණන්න අලා තියෙනව ද කියලා. මම එය විකුණන්න අලා නැති බව කිව්වහම එයා "මම ඒ ගැන බලා ගන්නම්" කියලා මුමුණනවා මට හොඳට ම ඇහුණා."

"කරුණාකරලා ඔයාට පුළුවන්ද මට ඒ අයගේ නම් කියන්න. මොකද මම කඳවුර ළඟදි දෙයක් ඇහින්දා. මම හිතනවා. ඒක එයාලට අයිති දෙයක් කියලයි. එතකොට මට පුළුවන් එයාලට ඒක බාර දෙන්න." නැන්සි තම අරමුණ පැහැදිලි කළා ය.

"එහෙනම් මම ඉතාම සතුටෙන් එයාලගේ නම් ඔබට කියන්නම්. ඒ අය නම් දීලා තියෙන්නේ විල්බට් සහ බියට්‍රිස් ප්‍රීට්සර් යුවල කියලයි." ඇ මේසය මත වූ ලේඛනයක් පරීක්ෂා කොට බලා කිවා ය.

"ඔයාට ඒ ජෝඩුවගේ ළමයින්ව එහෙම දකින්න ලැබුණ ද?" නැන්සිගෙන් තවත් පැනයක් නැගුණේ ය.

කාන්තාව හිස වැනුවා ය. "නෑ, එයාලා පෙරේදා ආපහු ගමට ගියා ළමයින්ව මෙහාට එක්ක එන්න."

නැන්සි ටාජේ මහත්මියට මුව නොසෑහෙන සේ ස්තුති කර කණ්ඩායම සමග නැවත පාරට පිළිපන්නා ය.

ඔවුන් මහා මාර්ගයට පැමිණි විට, "ඉතින් ඊළඟට කොහාට ද?" යනුවෙන් ජෝර්ජ් ප්‍රශ්න කළා ය.

නැන්සි සිනහවක් පා, "මම යෝජනා කරනවා දැන් ප්‍රීට්සර් යුවළගේ ගෙදර ගියොත් හොඳයි කියලා. මට සැකයක් තියෙනවා එයාලට දරුවෝ අට දෙනෙක් නැති බවටත්, එයාලා කිසිම සාදයක් පවත්වන්නට නොයන බවටත්. හොඳයි ! අපි ගිහිල්ල ම ඒ ගැන සොයා බලමු."

# 04

"හායි !" පිටුපසින් නැගුණු කටහඬක් නැන්සි හා පිරිස ඇමතිය. "කොහෙද මේ රංචුව ම යන්නේ?"

ඒ බැබ් හාකට්ගේ කටහඬයි. ඇය සහ අනෙක් භූත දඩයක්කරුවෝ ඔවුන් සාප්පු සවාරියක් සඳහා නගරයට පැමිණි බව පැවසූහ.

"ඔයාලා මොකද මෙහෙ?"

"ඒයේ රෑ අවතාරෙ ගැන අපිට හෝඩුවාවක් හොයා ගන්න පුළුවන් වුණා" නැන්සි ඔවුන්ගේ මීළඟ සැලසුම පිළිබඳව විස්තර කළා ය. "අපි බලාපොරොත්තු වෙනවා ප්‍රීට්සර් එක්ක මේ ගැන කතා කරන්න."

"අනේ ! දෙවියනේ නැන්සි" බිල් සිනහවක් සමගින් කීවේ ය. "ඔයා වැඩකට අත ගහපුවම ඒක ඉවර කරගන්නකම් ඔයාට නින්ද යන්නේ නෑ නේද? ඉතාම ඉක්මනින් මේ අබිරහස් ඔක්කොම ඔයා විසඳයි වගේ, අපිට එක භූතයෙක්වත් ඉතුරු නොකරම."

නැන්සි මඳ සිනහවක් පෑවා ය. "ඔයාලට කිසිම අවස්ථාවක් නෑ. කොහොමද දැන් අපිත් එක්ක ඇවිත් සැකකරුවන් ගෙන් ප්‍රශ්න කරන්න අපිට උදව් කළොත් හොඳ නැද්ද?"

සියලු දෙනාම එක්වර ම "ඔව්" යනුවෙන් පැවසූහ. ටික වේලාවකින් සියලු ම පිරිස නංවා ගත් මෝටර් රථ තුනක් නැන්සිගේ මෝටර් රථය පසුපසින් විල දෙසට වැටී ඇති පහළ වීදිය දිගේ ඇදී යනු දක්නට ලැබුණි.

විලත්, මහ පාරත් අතරින් ඇතුළට වන්නට, වන ගහනයෙන් යුතු ප්‍රදේශයක පිහිටා තිබුණු ප්‍රීට්සර්ගේ නිවස සොයා ගැනීම පහසු කාර්යයක් නොවී ය. සෑහෙන වේලාවක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිවස සොයා ගැනීමට පිරිස සමත් වූහ.



"මෙතන තෝරාගෙන තියෙන්නේ හොඳට හිතලා මතලා බව පේනවා" බැබ් කීවා ය.

වටපිටාවේ කිසිවෙක් පෙනෙන්නට නොසිටි අතර දොරට තට්ටු කරන්නේ කවුදැයි කියා බැලීමට මහලු මිනිසෙක් පැමිණියේ ය.

"මේ ප්‍රීට්සර් මහත්මයාගේ නිවස ද?" නැන්සි ඇසුවා ය. ඔහු හිස වනා ළමුන් පිරිසට ඇතුළට එන ලෙස ආරාධනා කළේ ය. ඔවුන් ඇතුළට ගොස් වාඩි වූ අතර පුටුවල ඉඩ නොමැති වූ හෙයින් සමහරු බිම වාඩි වූහ. ඉහළ රසඥතාවයකින් යුතුව එහෙත් චාම් ලෙස සරසා තිබුණු විසිත්ත කාමරය නැන්සිගේ විමසිලිමත් දෑසට හසු විය. උදුනට ඉහළින් තබන ලද රාක්කයක තොටිල්ලක හැඩය ඇති සුන්දර සිප්පි කටුවක් තබා තිබුණි.

"මම ඒක ගැන පස්සේ මෙයාගෙන් අහන්න ඕනෑ" නැන්සි තමාට ම කියා ගත්තා ය. ප්‍රීට්සර් මහත්තයයි, නෝනයි ගෙදර නැද්ද? එයාලා ඉක්මනට ම ඒවිද?"

"එයාලා එන්නේ ඉඳලා හිටලා. මේ ගේ කුලියට ගත්තේ මා වෙනුවෙන්" මහලු මිනිසා පිළිතුරු දුන්නේය. "මම ප්‍රීට්සර් මහත්මයාගේ තාත්තා"

"ආ ! ඇත්තද?" නැන්සි අවධානයෙන් කීවා ය. "මේ ලස්සන වටපිටාව නිසා එයාලා මේ ග්‍රීස්ම ඍතුව ම මෙහේ ගත කරන්න එයි නේද? විශේෂයෙන් ම එයාලගෙ දරුවෝ මෙතනට හුඟක් කැමති වෙයි"

"එයාලගේ ළමයි" මහලු ප්‍රීට්සර් මහතා පුදුමයෙන් කීවේ ය. "එයාලට දරුවෝ නෑ" ඔහු මුදු සිනහවක් පෑවේ ය.

නැවත කතා කළ නැන්සි මහලු ප්‍රීට්සර් මහතාගෙන් ඔහුගේ පුතා කුමන ආකාරයක ව්‍යාපාරයක යෙදී සිටින්නේ දැයි විමසුවා ය.

"ඔය එහෙත් මෙහෙත් ඉඩම් ගනුදෙනු කරනවා" ඔහුගේ පිළිතුර විය. "විල්බටුයි, බ්‍රියට්‍රිසුයි ඔය ඉඩම් ගනුදෙනුවලට හැම වෙලාවෙ ම ගමනෙම තමයි."

ටාජේ මහත්මිය, විල්බට් ප්‍රීට්සර් පයින් ග්‍රෝව් කඳවුර ගැන උනන්දුවක් දැක්වූ බව ප්‍රකාශ කළ අයුරුත්, දැනට කඳවුරේ ව්‍යාපාරික කටයුතු ඇනහිට ඇති ආකාරයත් ඒ තත්ත්වය මත පයින් ග්‍රෝව්

කඳවුර විකුණා දැමීමට සිදුවිය හැකි බවත් එක්වර ම නැන්සිගේ සිතේ මතු වී ආවේය. ඇය තවදුරටත් ප්‍රශ්න ඇසීමට ඉදිරිපත් නොවූයේ මහලු මිනිසාගේ සැකය ඇවිස්සේවි යැයි බියට පත් වූ හෙයිනි.

බැබ් විමසුවේ ඔහුට තනිව සිටීමේ දී පාළුවක් නොදැනේ ද යන්නයි. "අපෝ නෑ මං ළඟ පොත් ගොඩක් තියෙනවා. මම ඒවා කියවනවා. ඒ ඇරත් මට මගේ සිප්පි කටු තියෙනවා." ඔහු පිළිතුරු දුන්නේ ය.

"අර රාක්කය උඩ ඉතා ම ලස්සන සිප්පි කටුවක් තියෙනවා" බැබ් මෙහි දී කීවා ය. "මම ළඟට ගිහිල්ලා බලන්නද?"

මහලු ප්‍රිට්සර් මහතා නැගිට සිප්පි කටුව ගැනීමට රාක්කය වෙත ගියේ ය. "ඔයාලා දන්නවද මේ සිප්පි කටුව හදන්නේ මොන සතා ද කියලා" රාක්කයට අත තබා ඔහු විමසුවේ ය.

බැබ් සිනාසුණා ය. "බූවල්ලා" ඇය පිළිතුරු දුන්නා ය.

"හරියට ම හරි, ඔයා සිප්පිකටු එකතු කරන්නෙක් ද?"

"ඔව්, ඇත්ත වශයෙන් ම. ඒත් මම හිතන්නේ මේ බූවල්ලාගෙ කතාව ඒවා ඔක්කෝටම වඩා සිත් ගන්නාසුලුයි කියලයි. ඒ ගැන තොරතුරු අපිට කරුණාකරලා කියලා දෙන්න."

"ඉතා ම සන්තෝෂයෙන්," මහලු මිනිසා කිවේ ය.

"සමහර අවස්ථාවල දී බූවල්ලාගේ ගැහැනු සතා බිත්තර ජාල හතළිහක් විතර මේ තොටිල්ලක් වගේ සිප්පි කටුවක තැන්පත් කරනවා. ඒ බිත්තර විනිවිද පෙනෙනසුලු අතර ඉතා ම සියුම්. ඊළඟට ඈ ඇගේ අත් බිත්තර පොකුරට ඉහළින් වනනවා. එතකොට කරදිය බිත්තර අතර හොඳින් ගමන් කරනවා"

"බිත්තර බිඳිලා පැටව් එළියට එන්න මාස දෙකක් විතර ගත වෙනවා. ඒ කාලය පුරා ම ගැහැනු බූවල්ලා බිත්තර ළඟින් ඉවතට නොයා ඒවා ආරක්ෂා කරනවා. ඈ ඒ කාලයේ දී කෑම කටක්වත් කන්නේ නෑ."

"ඕ !" බ්‍රෙට් කිවේ ය. "මම සතුටු වෙනවා. මම බූවළු මවක් නොවීම ගැන. එහෙම වුණානම් දෙමාසයක් ම කෑම නැතිව ඉන්න වෙනවා."

මේ කතාව ඇසූ සියලු දෙනා අතර මහත් සිනාවක් පැතිර ගියේ ය.



"බිත්තර බිඳුණම පැටව් මොන වගේද?" නැන්සි ඇසුවා ය.

ප්‍රිට්සර් මහතා පිළිතුරු දුන්නේ ය. "පැටව් ඉතා ම කුඩා බූවල්ලො. නමුත් උන් ඉතා වේගයෙන් වර්ධනය වෙනවා. උන් ලොකු වුණාම බොහෝ විට අඩි දහයක් විතර විශාලයි.:"

"බූවල්ලා හරිම ඥානවන්ත සතෙක්. ඔබලා සමහරවිට දන්නවා ඇති උන්ගේ කකුල් අටෙන් පීනන්න වගේම ඇවිදින්නත් පුළුවන්. ඔහු දිගටම කියාගෙන ගියේ ය. "උගේ ඇඟේ තියෙන එක ම තද කොටස තමයි හොට. ඒකෙන් තමයි ඌ කකුළුවන්, ඔයිස්ටර් වගේ සතුන්ව කඩාගෙන කන්නේ. ඌ සතුන්ගේ කටුවත් එක්ක ම. සෑම කොටසක්ම කනවා"

"කොහොමද උන් එහෙම කරන්නේ?" ජෝර්ජ් ඇසුවා ය.

"බූවල්ලා ගොදුරු සියල්ල ම උරා බොනවා. කොහොම වුණත් බූවල්ලට හදවත් තුනක් තියෙනවා."

"ඕ .... ඔහෝ !" බෙස් කිවා ය. "ඌ මොනවාද දන්නෑ හදවත් තුනකින් කරන්නේ."

මහලු ප්‍රිට්සර් මහතා සිනාසුණේ ය. "මම හිතන්නේ ඒවායින් තමයි උගේ කකුල් අටට රුධිරය සැපයුම කරන්නේ"

මහලු මිනිසා කතාව නතර කළවිට බැබ් තවත් අදහසක් ඉදිරිපත් කරමින් බූවල්ලාට සතුරන්ගෙන් තර්ජනයක් එල්ල වූ විට ඌ තීන්ත වලාවක් පිටකර ආරක්ෂාව සලසා ගන්නා බව කීවා ය.

"මෝරෙ ආඥා තමයි බූවල්ලන්ට ඉන්න ස්වාභාවික සතුරා"

ඔහුගේ ඉතිරි සිප්පි කටු එකතුව දැක ගැනීමට හැකි දැයි බැබ් ඇසුවා ය.

"මගේ බැග් ගෙනාපු විදිහටමයි." "තාම බඩු ඇසුරුම් කඩලා නෑ. නමුත් මා ළඟ තව අනර්ඝ බෙල්ලන් කීප දෙනෙක් ම ඉන්නවා."

ඔවුන් අතර වූ සාකච්ඡාවේ අවසානය දක්වමින් මහලු මිනිසා නැවත ඉඳ ගන්නේ නැතිව සිටගෙන ම සිටියේ ය. ඔහුගේ ඉරියව්වලින් තව දුරටත් කතාව පවත්වා ගෙන යාමට ඔහු තුළ වූ අකමැත්ත තේරුම් ගත් ළමයි පිරිස ඔහුගේ ඉතා ප්‍රයෝජනවත් අදහස්වලට ස්තුතිය පළ කරමින් නිවසින් පිටවූහ. නෙඩ් සහ නැන්සි, මහලු මිනිසා තමුන්ට නැවත ඔහුගේ නිවසට පැමිණීමට ආරාධනා නොකළ බව ක්ෂණිකව ම තේරුම් ගත්හ. ඔවුන් මේ කරුණ අනිත් පිරිසට අවධාරණය කළෝ ය.

"ඔහු ටිකක් අමුතුයි වගේ" බැබ් අවධාරණය කළා ය. "බොහෝමයක් සිප්පි කටු එකතු කරන්නෝ එකතුව අනිත් අයට පෙන්වන්නත්, ඒ ගැන කතා කරන්නත් හරිම කැමතියි."

භූත දඩයක්කරුවන් නැවත පයින් ග්‍රෝව් කඳවුරට පැමිණි විගස, "අපි විලේ ඉවුරට ගිහිල්ලා ටිකක් විවේකයෙන් ගත කරමු." යනුවෙන් බෙස් යෝජනා කළා ය.

"භූතයින් දඩයම් කිරීම අතහැරලා දාලද?" ජෝර්ජ් විමසුවාය.

"අපි හැම වෙලාවෙ ම වැඩ කරන එක විතර ද කරන්න ඕනෑ. ටිකක් විනෝද වුණාම මොකද?" බෙස් දැඩි ස්වරයකින් කීවා ය.

ජෝර්ජ්, රීටා වෙත හැරී "ඔයාට අනාවැකි කියන්න පුළුවන් කියලා මට දැනගන්න ලැබුණා" යැයි කීවා ය.

රීටා මඳ සිනාවක් පා "අපේ ගවේෂණය ගැන අනාවැකි මොනවා හරි අහන්න අවශ්‍යද?" යනුවෙන් ඇසුවා ය.

බෙස්ට විල ඉවුරේ විනෝද වීම අමතක විය. "අනේ කරුණාකරලා කියන්න" ඈ රීටාගෙන් ඉල්ලා සිටියා ය.

භූත දඩයක්කරුවෝ බිම වාඩි වී නිශ්ශබ්දව සිටියහ. රීටා හිස බිමට නැඹුරු කර ගෙන කිසිම හැඟීමකින් තොරව මිනිත්තු කිහිපයක් සිටියා ය. ඉන් අනතුරුව හිස එසවූ ඈ දෙනෙත් විවර කළා ය.

"මගේ මනසින් මට පෙනෙන දේ අපිට ඒ තරම් සුබ දෙයක් නෙමේ. ඒ ගැන කියලා ඔයාලව නිකරුණේ කලබල කරවන එකත් ඒ තරම් හොඳ දෙයක් නෙමෙයි."

"අපි මේ වැඩේ සෑහෙන දුරකට ඇවිල්ලා තියෙනවා" එක්වරම ජෝර්ජ් කීවා ය. "ඒක නිසා ඕනෑම භයානක දෙයක් අහන්නත් අපි බය නෑ. කරුණාකරලා ඔක්කොම විස්තර අපිට කියන්න."

"මට පෙනෙනවා ඉතා ම ළඟදී දිනයක අපේ සාමාජිකයෝ දෙන්නෙක් දරුණු බෝට්ටු අනතුරකට මුහුණ පානවා. මට අඳුන ගන්න බෑ කවුද කියලා. නමුත් මට ලැබෙන පණිවිඩය නම් ඒකෙන් අපේ ගමන අවසන් කරන්න අපට සිද්ධවෙනවා කියලයි."

"ඕ !" බැබ් රාවයක් පිට කළා ය. "අපි ඔක්කොම දෙනා මේ ටික කාලෙදි බෝට්ටුවල ගමන්වලින් වැළකෙන්න ඕනෑ"

අනාවැකියත් අනතුරු ඇඟවීමක් ලෙස මිස බාධාවක් කර



නොගත යුතු බව සිතූ නැන්සි කිසිදු අදහසක් පළ නොකළා ය. වෙන කිසිවෙකු අදහසක් පළ කළේ ද නැත. නෙඩ් අසීරු නිහඬතාවය බිඳිමින් දැන් කාමරවලට ගොස් නාන ඇඳුම් ඇඳ ගැනීම සුදුසු බව යෝජනා කළේ ය.

ටික වේලාවකට පසුව ඔවුන් ජැටියට ළඟා වූ විට නෙඩ් නැන්සිට කතා කරමින් "ඔයා රීටාගේ අනාවැකිය ගැන බය වුණාද?" යැයි ඇසුවේ ය. "අපි ඔරුවක ගිහිල්ලා පරීක්ෂාවක් දාමුද?"

නැන්සි සිනාසුණා ය. "ඔයා දන්නවනේ මම මොකටවත් බය නැති බව. හොඳයි අපි ගිහිල්ලා බලමු."

නෙඩ් හොඳ පෙනුමක් ඇති රතු පැහැති ඇලුමිනියම් ඔරුවක් හා ශක්තිමත් හබල් යුවළක් තෝරා ගත්තේ ය. ඔහු ඔරුවේ පසුපස සිට හබල්ගෑමට කැමති බව කිවේ ය. ඉදිරිපස සිට හබල්ගෑමට ඇගේ අකමැත්තක් නැති බව නැන්සි ප්‍රකාශ කළා ය.

එය ඉතා සුන්දර දිනයක් වූ අතර මඳ හිරුරැස් විල් තලය මත සුවදායි උණුසුමක් ඇති කළේ ය.

ඔවුන් මීටර් පන්සියයක් පමණ පැද යනවිට, "නෙඩ් අර බලන්න භූතාවේෂ වුණු ඔරුව අපිට ටිකක් එහායින් !" යනුවෙන් නැන්සි කෑ ගැසුවා ය.

නෙඩ් ආපසු හැරී අද්භූත යාත්‍රාව පැමිණි දිසාව දෙස බැලුවේ ය. එය ඇත්තෙන් ම පෙර දින දුටු යාත්‍රාවම ය.

ඔහු සහ නැන්සි හැකි තරම් වේගයකින් එය පසුපස ලුහුබඳින්නට වූහ. "අපි ඒකට කිට්ටු කරනවා" ඔහු සතුටින් කෑගැසුවේ ය.

ඔරුව ගමන් මඟ වෙනස් කර ආවරණය වූ කුඩා පඳුරු සහිත ප්‍රදේශයක් කරා ගමන් කරන්නට පටන් ගත්තේ ය. නැන්සි සහ නෙඩ් වේගයෙන් තම ඔරුව ඒ පසුපස පැන්නුවේ මෙවර නම් කෙසේ හෝ අද්භූත යාත්‍රාව සැඟවෙන ස්ථානය සොයා ගත හැකිවේය යන බලාපොරොත්තුවෙනි. එම බලාපොරොත්තුව ඔවුන්ගේ ශක්තිය වැඩි කළාක් මෙනි.

එක්වර ම නැන්සිට හා නෙඩ්ට ඔරුව හබල් ගෑම අසීරු කරුණක් බව හැඟී ගියේ ය. යම් කිසිවෙක් තදින් තමන්ව පසුපසට තල්ලු කරන්නාක් මෙන් ඔරුවේ වේගය මඳින් මඳ අඩුවී යන්නට පටන්

ගති. දෙදෙනාට තමන්ගේ ශක්තිය සිඳී යන බවක් දැනෙන්නට පටන්ගත් අතර තම උපරිම ශක්තිය යොදා හබල් ගැවත් ඔරුව ඉදිරියට පැදවීම අපහසු විය.

"මේ ඔරුවට මොකද වෙලා තියෙන්නේ" නැන්සි තම කෝපය පළ කළා ය.

"මට තේරෙන්නේ නෑ" නෙඩ් කීවේ ය.

"අපි මුළු ශක්තිය ම යොදලා හබල් ගෑවත් ඔරුව කළුගලක් වගේ. එකතැනමයි හෙලවෙන්නෙවත් නෑනේ."

ඔහු සහ නැන්සි හබල් තව තවත් දිය තුළට දමමින් වෙර දැරුවත් ඔවුන්ගේ උත්සාහ නිෂ්ඵල එකක් විය. ඔවුන් දෙදෙනා දුර්මුඛව කඩා වැටුණු බලාපොරොත්තුවලින් යුතු දෑසින් එකිනෙකා දෙස බැලුවෝ ය. "ඔවුන්ගේ ඉදිරි ගමන වළක්වාලන අදෘශ්‍යමාන බලවේගය කුමක්ද?"

තම සිතේ ඇතිවූ අදහස් වචනයට පෙරළීමට ඔවුන් සූදානම් වත්ම නිමේෂයකින් ඔවුන්ගේ ඔරුව යටිකුරුව පෙරළී ගියේ ය. කිසිවක් සිතා ගැනීමටත් පෙර දෙදෙනා ම ගැඹුරු ජලයේ ගිලී ගියෝ ය.

නැන්සි සිහි එළවා ගැනීමට හැකිවූ පළමු තත්පරයේ ම දනි පනි ගසා බොහෝ වීරිය කර දිය මතුපිටට පැමිණීමට සමත් වූවා ය. දිය මතුපිටට පැමිණි ඇ පළමුව නෙඩ්ට කුමක් සිදුවී ඇත්දැයි හාත්පස බැලුවත් ඔහු පිළිබඳ කිසිම සලකුණක් නොවී ය.

තත්පර කිහිපයක් ගතවී ගියත් ඔහු ගැන සටහනක් නොවූ බැවින් ඇ මහත් සේ භීතියට පත් වූවා ය. ඔහුට කුමක් සිදුවූවා දැයි සිතේ ඇතිවූ තිගැස්මත් සමග ම ඇ කල්පනා කළා ය. ඔරුව පෙරළීමේදී එහි බඳ හිසේ වැදීමෙන් ඔහු සිහිසුන් වූවාවත් ද?

ඇ නැවත දියයට කිමිදී බැලුවා ය. දිය යට දී ඔහු සිටින බවක් දැකීමට ඇයට නොහැකි විය. ඇය නැවත දිය මතුපිටට පැමිණි විට ඔහු දැක ගැනීමට ඇයට හැකි විය. එම දර්ශනය දුටු ඇයගේ සිරුර කිලිපොළා ගියා ය.

සිහිසුන් බවට පත්වී සිටින බව පැහැදිලිව දක්නට ලැබුණු නෙඩ් කිසිවෙක් විසින් ඉවුරට අදිනු ලබන බව දිස් විය. නැන්සි ඇස්වලින් වතුර පිස දමා නැවත බැලුවා ය. මහත් පුදුමයකි ! ඔහුව ඉවුර දෙසට අදිමින් තිබුණේ බූවල්ලෙකුගේ යෝධ අත්වලිනි.



## 05

නෙඩ්ගේ ආරක්ෂාව පිළිබඳ සන්ත්‍රාසයෙන් යුතුව නැන්සි නෙඩ් හා ඔහුගේ ග්‍රාහකයා වෙත සිරුරේ තිබූ ශක්තිය අන්තිම බිංදුව දක්වා යොදමින් උපරිම වේගයෙන් පිහිනුවා ය. ඔහු ඉවුරට අදිමින් සිටියේ සත්‍ය වශයෙන් ම බූවල්ලෙක් ද නැත්නම් බූවල්ලෙකු ලෙස වෙස් වලාගත් වංචාකාරයෙක් ද?

ලුහුබැඳීම කෙළවරක් නැති සේ පෙනී ගියේ ය. තදින් දෙතොල් සපාගෙන උපරිම ශක්තිය යොදමින් නැන්සි ඉවුර දෙසට පීනුවා ය.

"ඔහුව අතඇරපං !" ඇය පිහිනන අතර ම යටිගිරියෙන් කෑගැසුවා ය. ඇය බූවල්ලා වෙත ළඟා වෙනවාත් සමග ම ඌ එක්වරම නෙඩ් අතහැර දියට පැන කිමිදුනේ ය. ඇයට දැන් අලුත් තර්ජනයක් මතුවී ඇති බව හැඟී ගියේය. බූවල්ලා නෙඩ් අත් හැරියේ ඇයට පහර දීමට ද?

එම සිතුවිල්ල මනසින් අතුගා දැමූ නැන්සි අවසන් පීනුමක් සමග ම නෙඩ් වෙත ළඟා වූවා ය. නෙඩ්ගේ සිරුරට අතතැබූ ඇ ඉවුර දෙස බැලුවා ය. වාසනාවකට මෙන් ඉවුර තිබුණේ ඔවුන්ට වැඩි ඈතකින් නොවේ. නෙඩ් ඇද ගෙන ඉවුර වෙත පිහිනීමට ඇයට හැකිවේ ද?

පෙනෙන්නට තිබුණු ආකාරයට ආක්‍රමණිකයා නැවත පහරදීමට පැමිණෙන බවට සලකුණක් නොවී ය. ඌ නැවත පෙනෙන්නට නොආ අතර සෑහෙන වෙහෙසකින් පසු නෙඩ්ව වියළි බිම් කඩක් වෙත ඇද ගෙන ගිය නැන්සි ඔහුට ප්‍රථමාධාර ලබා දීම ආරම්භ කළා ය. නෙඩ් ඇසිපිය හෙළමින් "බූවල්ලාව අල්ල ගන්න" යනුවෙන් කෙඳිරීමට පටන් ගත් නිසා ඔහුගේ පෙනහලු තුළට ජලය ඇතුළු වී නැති බව නැන්සි අවබෝධ කර ගත්තා ය.

ටික වේලාවකින් පියවි තත්ත්වයට පැමිණි ඔහු සිදුවූ දේ විස්තර

කිරීමට විය. "අපිව වතුරට විසිවුණු වෙලාවේ බූවල්ලා මාව අල්ල ගත්තා. ඌ උගේ එක අඬුවකින් මගේ ඔළුවට දුන්න පාරට මාව වතුරේ ගිලුනා. දෙන්නම වතුර උඩට මතු වෙනකම් හුස්ම අල්ලගෙන ඉන්න තරම් මට සිහිය තිබුණා. අමාරුවෙන් ඔළුව උඩ අතට තියාගන්න මට පුළුවන් වුණා. මට හිතෙන්නේ ඒ වෙලාවේ තමයි ටික වෙලාවකට මට සිහිය නැති වුණේ"

ඒ අද්භූත සත්ත්වයා දියට පැන නොපෙනී ගිය බව නැන්සි පැවසුවා ය. "ඔයාට මොකක් හරි අදහසක් තියෙනව ද, ඌ කවුද නැත්නම් මොකක්ද කියලා?"

නෙඩ් තමාට ඒ පිළිබඳ පැහැදිලි අදහසක් නැතිබව දක්වමින් හිස සැලුවේ ය. "මට හොඳට ම විශ්වාසයි බූවල්ලෝ මේ විලේ ජීවත් වෙන්නේ නැති බව. ඒ නිසා ඌ කොහෙන් හරි මෙහාට ගේන්න ඇති කියලා අපිට හිතන්න වෙනවා."

"මට නම් හිතෙන්නේ බූවල්ලෙක් විදිහට වෙස්වලා ගත් මිනිහෙක් කියලමයි" නැන්සි සිය අදහස පළ කළා ය. "ඒකෙන් තව දුරටත් ඔප්පු වෙනවා කවුරු හරි මේ අද්භූත දේවල් සියල්ල ම කරන්නේ අපිව බය ගන්නලා පයින් ග්‍රෝව් කඳවුරෙන් පන්න ගන්න අදහසින් කියලා. මට සැකයක් තියෙනවා මේ භූතයා විල්බට් ප්‍රිට්සර් වෙන්න පුළුවන් කියලා."

"ඔයා හුඟක් දුරට නිවැරදියි." නෙඩ් සිය එකඟතාව පළ කළේය. "හොඳයි, එහෙනම් අපි ආපහු කඳවුරට යමුද?"

ඔවුන් ආපසු බලන විට භූතාවේශ වූ ඔරුව හෝ ඔවුන්ගේ ඔරුව හෝ දිය මතුපිට නොවී ය.

"මම කිමිඳිලා බලන්නම් අපේ ඔරුව ගිලිලද කියලා" නැන්සි යෝජනා කළා ය.

දියෙහි ගිලුණු ඇය මතුපිටට පැමිණි විට ඔරුව දුටුවා දැයි ඇසුවේය.

"තවම නෑ" යනුවෙන් පැවසූ ඇ නැවත දියයට කිමිදී මිනිත්තුවක් පමණ ඔරුව තිබේ දැයි පරීක්ෂා කළා ය.

"ඇත්තෙන් ම අපේ ඔරුව තියෙන බවක් මට පෙනෙන්නේ නෑ" ඇ සංවේගයෙන් තමාට ම කියා ගත්තා ය. මඳ විවේකයකින් අනතුරුව නැවත දිය යට පරීක්ෂා කළා ය.



ඇගේ මෙවර උත්සාහය ද ප්‍රතිඵල රහිත ය. නෙඩ් සහ නැන්සි ඔවුන්ගේ ඔරුව "බූවලු මිනිසා" විසින් සොරකම් කළ බවට නිගමනය කළහ.

"ඔයාට ඇවිදගෙන යන්න පුළුවන් ද?" නැන්සි ඔහුගෙන් ඇසුවා ය.

"ඔව්, පුළුවන්. අපිට විල වටෙන් ඇවිදගෙන යන්න වෙයි කඳවුරට යන්න" ඔහු තරමක් අපහසුවෙන් නැගිටිමින් කිවේ ය.

"මටත් එහෙම හිතෙනවා"

කණ්ඩායමේ සාමාජිකයෝ සියලු දෙනා ම නැන්සි හා නෙඩ් ආපහු එන විටත් ජැටිය අසල රැඳී සිටියහ. නැන්සි සිදුවූ දේ විස්තර කළ විට ඔවුහු මහත් සේ පුදුමයටත් බියටත් පත්වූහ.

රීටා කෙළින් ම සිය අදහස් ඉදිරිපත් නොකළ නමුත් ඇගේ මුහුණේ වූ අමුතුම සිනහව කියා පෑවේ "මම ඔය ටික වෙන බව කලින් ම කිව්වනේ" වැනි අදහසකි.

එන්ජිමක් සහිත බෝට්ටුවක නැගී නැතිවූ ඔරුවත්, භූතාවේෂ වුණු ඔරුවත් බූවල්ලාත් පිළිබඳ සොයා බැලිය යුතු බවට ඩේව් හා බ්‍රෙට් කතිකා කරගත්හ.

"ඔය ස්වයංක්‍රිය ඔරුවයි, බූවල්ලයි අතර මොකක් හරි සම්බන්ධකමක් තියෙන්න ම ඕනෑ" ඔවුන් පිටත් වන විට ම නැන්සි කීවා ය.

නැන්සි හා නෙඩ් හොඳින් විවේක ගත යුතු බවට බෙස් අදහස් කළා ය. ඔවුන් ඊට එකඟ වූවත් ඊට පෙර ලෙපර්ට් මහතාට නැතිවූ ඔරුව පිළිබඳව වාර්තා කිරීමටත් සිදුවූ අද්භූතජනක දේවල් පිළිබඳව විස්තර කිරීමටත් ඔව්හු කාර්යාල කාමරය අසල මඳකට නතර වූහ. ලෙපර්ට් මහතා සිටියේ ලිපිකරුවා සමග කතා කරමින් ය.

රොනි නම් ලිපිකරුවා ඔවුන්ගේ විස්තරයට සවන් දෙද්දී ඔහුගේ දෑස් මහත් භීතියකින් විශාල වී යනු කා හටත් දැකගත හැකිවිය. "මටත් අද්භූත සතෙක් විලේ ගැවසෙනවා කියන ආරංචිය ලැබුණා" ඔහු කීවේ ය. "නමුත් මම මේ වෙනකම් ඒ කතාව විශ්වාස කළේ නෑ. අද ඉඳලා මටත් ඒ කතාව විශ්වාස කරන්න වෙනවා."

මෙහි දී ලෙපර්ට් මහතා අතමිට මොළවා වැරෙන් මේසයට පහරක් දී කෝපයෙන් ගිගුරුවේ ය. "ඔක්කොම විනාශයි ! මම මේ කඳවුර විකුණලා දානවා. මේ වැඩේ දුරදිග ගියා හොඳට ම වැඩියි. අද උදේ මේ කඳවුර මිලදී ගන්න කෙනෙක් ඉදිරිපත් වුණා. මම ඒ ගාණට එකඟ වෙනවා. තව දුරටත් මගේ සල්ලි විනාශ කරගන්නේ නැතිව"

ඔහු වේගයෙන් සුසුම් හෙළන්නට පටන් ගත් අතර නැන්සිගේ සිතට ආවේ අපූරු අදහසකි.

"මොකක් හරි විදිහකින් ඔබ ඔය කියන කඳවුර මිලදී ගන්න ඉදිරිපත් වුණ කෙනාගේ නම ප්‍රීට්සර් වෙන්න පුළුවන් ද?" ඇය ලෙපර්ට් මහතාට ළංවී ඇසුවා ය.

ලෙපර්ට් මහතා තිගැස්සී ඇය දෙස බැලුවේය. ඔහු පුදුමයෙන් මෙසේ ඇසුවේ ය. "මොනවා ඒක තමා ඔහුගේ නම. ඔයා කොහොමද ඒක දැන ගත්තේ?"

නමුත් ඉඩම් විකිණීමේ නියෝජිතවරිය වන ටාජේ මහත්මිය හමුවීමට ගිය ආකාරයත්, එහි දී විල්බට් ප්‍රීට්සර් නම් මිනිසෙක් පයින් ග්‍රෝව් කඳවුර ගැන උනන්දුවෙන් කතා කළ අයුරු ටාජේ මහත්මිය ඔවුන්ට ප්‍රකාශ කළ බවත් නෙඩ් සහ නැන්සි විස්තර සහිතව ඔහුට පැහැදිලි කර දුන්හ.

"කරුණාකරලා ලෙපර්ට් මහත්මයා තව ටික දවසක් ඉවසන්න." නැන්සි ඉල්ලා සිටියා ය. "අපිට මේ අබිරහස ඉක්මනින් ම විසඳන්න පුළුවන් වෙයි කියලා මට ලොකු විශ්වාසයක් තියෙනවා. ඒ කොහොම වුණත් ඔහු මේ කඳවුර මිල දී ගන්න පොරොන්දු වුණු මුදල මෙහි වටිනාකමට වඩා ඉතාම සුළු මුදලක් බව මට සැක නැතිව ම කිවහැකියි. එහෙම නේද ලෙපර්ට් මහත්මයා?"

"ඔව්, ඒක නම් එහෙම තමා" ලෙපර්ට් මහතා පිළිතුරු දුන්නෙ ය. "ඉතින් කරුණාකරලා තව ටික දවසක් ඉවසන්න" නැන්සි යළිත් වරක් ඔහුට ආයාචනා කළා ය.

ලෙපර්ට් මහතා එසේ කරන බවට එකඟ විය. නැන්සි එහි දී සැනසුම් සුසුමක් හෙළුවා ය. ඔහු තම පොරොන්දුව ප්‍රකාශ කර අවසන් වෙනවාත් සමග ම දුරකථනය නාද වූ අතර එය අතට ගත්තේ ය. ටික වේලාවකින් ඔහු "ඔව් ප්‍රීට්සර් මහත්මයා" යනුවෙන් දුරකථනයට පිළිතුරු දුන්නේ ය.



නැන්සි හා නෙඩ් එකිනෙකාගේ මුහුණ බලා ගත්හ. ඉන් අනතුරුව පයින් ග්‍රෝව් කඳවුර තමන්ට විකිණීම සඳහා ලෙපර්ට් මහතා එකඟ කරවා ගැනීමට විල්බට් ප්‍රීට්සර් සමත් වේ දැයි යන දෙගිඩියාවෙන් යුතුව ඔවුහු සංවාදයට ඇඩි සේ සවන් යොමා ගෙන සිටියහ. නමුත් අයිතිකරුවා ප්‍රීට්සර්ගේ අදහසට එකඟ වූයේ නැත.

"මට හිත හදාගන්න දවස් කීපයක් අවශ්‍යයි" ඔහු කීවේ ය.

මේ වචනවලින් අනෙක් පසින් අමතන්නා ඇඩි සේ කෝපයට පත්වූ බව පෙනුනේ නැන්සි හා නෙඩ්ට පවා ඇසෙන තරම් හඬින් ඔහු බෙරිහන් දෙන්නට පටන් ගත් හෙයිනි. ප්‍රීට්සර් බොහෝ දේ කීමෙන් ලෙපර්ට් මහතා එකඟ කරවා ගත නොහැකි වූ විට බිය වැද්දීමෙන් හෝ කඳවුර විකිණීමට ඔහුව පොළඹවා ගැනීමට උත්සාහ කළේ ය. සංවාදයේ එක්තරා අවස්ථාවක ලෙපර්ට් මහතා එකඟතාව පළ කිරීමට ඉඩ ඇති බව පෙනී ගිය හෙයින් නැන්සි හිස වනමින් අතින් සංඥා කරමින් තීරණය කල්දමා ගැනීමට අවශ්‍ය ශක්තිය ඔහුට ලබා දුන්නා ය.

"මෙක තමයි මේ වෙලාවේ මට දෙන්න පුළුවන් අවසාන උත්තරේ." ලෙපර්ට් මහතා විල්බට් ප්‍රීට්සර්ට පැවසුවේ ය. "ටික දවසකින් මම ඔබට මගේ තීරණය දැන ගන්න සලස්වන්නම්"

ප්‍රීට්සර් මහහඬින් මොර ගසත්දීම "මට හුගක් වැඩ තියෙනවා, ඔබට සුබ සන්ධ්‍යාවක් වේවා" යනුවෙන් පවසා රිසීවරය තැබුවේ ය.

අනිත් භූත දඩයක්කරුවන් ද කාමරයට පැමිණි අතර අලුත් ම තත්ත්වය පිළිබඳව ඔවුහු දැනුවත් කරනු ලැබූහ. කඳවුර විකිණීමේ තීරණය කල් දැමීමට ලෙපර්ට් මහතා පොලඹවා ගැනීමට නැන්සිට හැකිවීම ගැන සියලු ම දෙනා ඇයට ප්‍රශංසා මුඛයෙන් කතා කළෝ ය. දිවා ආහාරය සඳහා පිරිස වෙන්ව යාමට සූදානම් වත් ම ජැටියේ ඇති අනතුරු හැඟවීමේ සීනුව මහ හඬින් නොනවත්වාම නද දෙන්නට පටන් ගත්තේ සියලු දෙනාගේ ම සිත්වල බිය මුසු කලබලයක් ඇති කරවමිනි. සැමදෙනම ජැටිය කරා යුහුසුලුව දුවන්නට පටන් ගත්හ.

"මොකක් හරි අනතුරක් වෙලා" ලෙපර්ට් මහතා බෙරිහන් දුන්නේ ය.

ඒ වන විටත් නැන්සි කාමරයේ දොරෙන් එළියට පැන සැහෙන දුරක් දිවගොස් හමාර ය. බෙස් හා ජෝර්ජ් ද ඇය අසලින් ම වූහ.

කඳවුරෙන් ලබාගත් මෝටර් බෝට්ටුවේ බ්‍රෙට් හා ඩේවි සිටගෙන සිටියහ. මිතුරු පිරිස ජැටියට ළඟාවෙත් ම බ්‍රෙට් බෝට්ටුවෙන් බූවල්ලෙක් ඔසවා ගත් අතර උගේ අඬු අට ම බිහිසුණු ලෙස ඒ මේ අත පැද්දුනේ ය.

"ඔන්න බලාගෙන !"

කෑ ගැසීමක් සමග ම ඔහු තමා වෙත දිව එන භූත දඩයක්කරුවන් වෙත බූවල්ලා විසි කළේ ය. මර ලතෝනියක් සමග ම බෙස් ආපසු හැරී දුවන්නට වූවා ය. ජෝර්ජ් සහ අනෙක් අය ඉදිරියට පැන බූවල්ලාව මෙල්ල කර ගත්තෝ ය. උගේ අඬු හතර පැත්තට වැනුවත් බූවල්ලා පලා යාමට උත්සාහ කළේ නැත. බ්‍රෙට් සහ ඩේවි මහ හඬින් සිනාසෙන්නට වූහ.

"කැත වංචාකාරයො" නැන්සි විරිත්තුවා ය. "ඔයාලා කොහෙන්ද මේ රබර් බූවල්ලාව හොයා ගත්තේ? මොකෙන්ද ඌව ක්‍රියා කරවන්නේ?" ඈ මහත් වික්ෂිප්තභාවයකින් යුතුව ඇසුවා ය.

"අපි ඒක හොයා ගත්තේ නෙඩ් පහර කාපු තැන තිබිලයි" ඩේවි පිළිතුරු දුන්නේ ය.

මෙය නෙඩ්ට මහත් ප්‍රහේලිකාවකි. "මට පහර දුන්නේ මූ නම්, මිනිහෙක් මේ රබර් බූවල්ලා ඇතුළේ ඉන්න ඕනෑ"

"ඒ මිනිහාගේ බලාපොරොත්තුව අනිත් මිනිසුන්ව බය කිරීම නම් මොකද එයා මේ රබර් බූවල්ල දමලා ගියේ?" නැන්සි නැවතත් පැනයක් නැගුවා ය.

"සමහර විට ඔහුගේ හිතේ කිසිම අදහසක් නොතිබෙන්න ඇති. මේක අත් හැරලා යන්න". ජෝර්ජ් පැහැදිලි කළා ය. "නමුත් නැන්සි පස්සෙන් පීනගෙන ආපු නිසා ඔහුට මේක අලා පැනලා යන්න සිද්ධවෙන්න ඇති."

විල ඉවුරේ තිබී කෘත්‍රිම බූවල්ලා තමන්ට මුණ ගැසුණු බව ඩේවි කිවේ ය. හොඳින් පිරික්සා බැලීමේ දී ඔවුන්ට රබර් බූවල්ලා ජලයේ ගමන් කරවීම සඳහා ඊට සවිකර තිබූ උපකරණය සොයා ගැනීමට හැකි විය. ටික වේලාවකින් කුඩා මෝටරය නැවතී ගිය අතර ඒ සමග ම බූවල්ලාගේ අඬු සෙලවීම ද අවසන් විය.

ජැටියේ කෙළවරට ගිය නැන්සි මෝටර් බෝට්ටුවට තබා ගැට



ගසන ලද ඔරුවක් දුටුවා ය. "මේකද කඳවුරට අයිති ඔරුව" ඈ විමසුවාය.

"ඔව්" යනුවෙන් හඟවමින් ඩේවි හිස වැනුවේ ය. "මේක විලේ ඈත කෙළවරට වෙන්න පඳුරක් අස්සේ තිබුණේ. කොහොම වුණත් අපිට භූතාවේෂ වුණු ඔරුව නම් හොයා ගන්න බැරිවුණා"

ඇලුමිනියම් ඔරුව ගොඩට ඇදගත් නෙඩ් එය හොඳින් පරීක්ෂා කර බැලීමට පටන් ගත්තේ ය. "අපි කොච්චර උත්සාහ කළත් අපිට ඔරුව ඉස්සරහට පදින්න බැරිවුණා. ඒ කියන්නේ මේක ඇතුළේ මොකක් හරි උපකරණයක් හයි කරලා ඇති."

බෙස් නැවතත් බියට පත්වූ සෙයක් දැක්වූවා ය. "ඔයා කියන්නේ කවුරු හරි හිතලමතල ම දුර ඉඳන් ඔරුව පාලනය කරන්න පුළුවන් උපකරණයක් ඔරුවෙ සවි කළා කියල ද?"

"මට එහෙම සැකයක් තියෙනවා" එසේ කියූ නෙඩ් ඔරුව තුළ හොඳින් පරීක්ෂා කර බැලුවත් කිසිවක් සොයා ගැනීමෙහි අපොහොසත් විය. "ඒ උපකරණය ගලවලා" ඔහුගේ මුවින් පිට විය.

ඔහු නැගිටින විට ම ජෝර්ජ් මෙසේ කිවා ය. "යම්කෙනෙක් අනතුරක් සිදු කරන්න උත්සාහ කළා නම් එයාට පුළුවන්කම තියෙන්න ඕනෑ විලට එන ඕනෑම ඔරුවකට ඒක කරන්න. ඒ නිසා ජැටියේ තියෙන අනිත් ඔරුවලටත් මොනවා හරි කරලා ඇති?"

"හරියට ම හරි" නෙඩ් සිය එකඟතාව පළ කළේ ය. "අපි අනිත් ඔරුත් පරීක්ෂා කරලා බලමු. හොඳයි යාළුවනේ අපි යමු" කියමින් ඔහු නැගිට්ටේ ය.

අනිත් ඔරු පරීක්ෂා කිරීමේදී සෑම ඔරුවක ම පසුපස අසුන යට රේඩියෝ තරංග මගින් දුර සිට ක්‍රියා කරවිය හැකි උපාංග සවිකර ඇති බව සොයා ගත හැකි විය. විලේ ඉවුරේ සැඟවුණු ස්ථානයක සිට ඔරුවල ක්‍රියාකාරීත්වය එමගින් පාලනය කළ හැකි ය.

"මට දැන් හැම දෙයක් ම පැහැදිලියි" නැන්සි කිවා ය.

"අර භූතාවේෂ වුණු ඔරුවත් ක්‍රියා කරවලා තියෙන්නේ රේඩියෝ තරංගවලින්. ක්‍රියා කරවන්නා ඉවුරේ හැංගිලා ඉඳගෙන ඔරුව ඇමක් විදිහට යොදා ගෙන තියෙනවා. නෙඩ්, ඔයයි, මමයි ඇම ගිල්ලා"

ඔහු හිස වැනුවේ ය. "අපි සෑහෙන දුරකට ආවාහම අපේ ඔරුව රේඩියෝ තරංගවල බලයෙන් කණපිට පෙරළුවා. ඊට පස්සේ ඔහු හරි වෙන කෙනෙක් හරි වතුරට පැනලා මට පහර දුන්නා. ඒකයි එහෙනම් කතාව ?" අනිත් අයට පැහැදිලි වන සේ ඔහු සිද්ධිය නියමාකාරයෙන් ගළපා කීවේ ය.

"මම නම් කියන්නේ බූවලු මිනිහා එහෙම නැත්තම් කණ්ඩායම හරි හොඳට පුහුණුව ලබපු ඉංජිනේරුවෝ කියලයි" ජිම් කතාවට එක් වෙමින් කීවේ ය.

"නමුත් පිස්සො කට්ටියක්" ජෝර්ජ් ප්‍රකාශ කළේ කෝපයෙන් යුතුව ය.

ඔරුවල සවිකර තිබූ උපාංග ගලවා ඉවත් කරන ලද අතර ඒවා ලෙපර්ට් මහතා වෙත යැවිණි. ඔහු පොලිසියට මේ පිළිබඳව පැමිණිලි කළ අතර පොලිස් නිලධාරීහු පසුව පැමිණ ඒවා රැගෙන ගියහ. ඔවුන් පැමිණි විට මේ උපාංග සවිකර ලෝකයම මුලාකර ඇති ආකාරය දැක තම විස්මය පළ කළහ.

පසුදින උදෑසන නැන්සි අනෙක් මිතුරු පිරිස අමතමින් කීවේ, "අපි දැන් ගිහිල්ලා මහලු ප්‍රීට්සර් මහත්මයාගෙන් මේ ගැන විමසීමක් කළොත් හොඳයි. ඒ වගේ ම අපිට පුළුවන් ඔහුට මේ ඔරුව ගැනයි බූවල්ලගෙ කතාවයි කියන්න එයා අපේ කතාව ඇහැව්වහම හැසිරෙණ විදිහෙන් අපිට පුළුවන් වෙයි එයාගේ පුතා මේ වැඩේට සම්බන්ධ ද නැද්ද කියලා දැන ගන්න."

බැබ් නැවතත් මහලු ප්‍රීට්සර් මහතාගේ සිප්පි කටු එකතුව දැක ගැනීමට දැඩි ආශාවක් දැක්වූවා ය. ඩොන්, බ්‍රෙට් හා නෙඩ් ඇය සමග ගමනට එකතුවීමට කැමැත්තක් දැක්වූවත් කණ්ඩායමේ ඉතිරි පිරිස සිය කැමැත්තෙන් ම කඳවුරේ නතර වූහ.

"ඔයාලා ගිහිල්ලා ඇවිල්ලා අපිට විස්තරේ කියන්න" ඈන් සිනහවක් පා කීවා ය.

මෝටර් රථයේ නැගුණු ඔවුහු පිටත් වූහ. හොඳින් හිරු එළිය වැටී තිබුණු අතර, කුරුල්ලන්ගේ කිචිබිචිය සංගීත නාදයක් සේ ඇසිණි. නෙඩ් ගීයක් ගයන්නට වූ අතර අන් අය ඊට අත්වැල් ඇල්ලූහ. අබිරහසට සම්බන්ධ සියලු දෙනා අද කොටු කර ගත හැකි වෙතැයි යන අදහසින් යුතුව සතුටු සිතින් ඔවුහු ප්‍රීට්සර්වරුන්ගේ නිවෙස වෙත රිය පැදවූහ.



නැන්සි සහ මිතුරන් රියෙන් බැස දොරට තට්ටු කළත් ඊට පිළිතුරු දීමට කිසිවෙකු ආවේ නැත. මිතුරු පිරිසගේ සිත්වල සැකයක සාංකාවක් ඇදී ගියේ ය. ජනේලයට මුහුණ තබා ඇතුළත බැලූ විට නිවසේ සෑම අස්සක් මුල්ලක් ම හොඳින් දැක ගැනීමට ඔවුන්ට හැකි විය. නිවස තුළ කිසිවෙක් සිටියේ නැත. නැන්සි ඉක්මනින් ම ජනේලය තුළින් පෙර දින මහලු ප්‍රීට්සර් මහතා ඔවුන්ට පෙන්වූ අති අනර්ඝ සිප්පි කටුව උදුනට ඉහළින් රාක්කයේ ඇද්දැයි බැලුවා ය. විස්මයෙන් ඇගේ දෑස් මෙන් ම කට ද ඇරී ගියේ ය. එය අතුරුදහන් වී ඇත !

"උන් පැනලා ගිහිල්ලා" නැන්සි ශබ්ද නගා කීවා ය.

"අපිට දොර කඩාගෙන ඇතුළට යන්නත් බෑනේ" බැබ් කීවාය. "අනේ මට දුක අර ලස්සන සිප්පි කටු ටික නොදැක ආපහු කඳවුරට යන්න සිද්ධවෙන එක ගැනයි."

එවිට ම නිවස දෙසට එන කාන්තා රුවක් පාරේ ඈතින් ඔවුන්ට පෙනිණි. ඇය අත් විසි කරමින් බාගෙට දුවමින් මෙන් ඉතා ඉක්මනින් ගමන් කළා ය. ඇගේ හිසකෙස් අවුල් වී තිබුණු අතර මහත් කලබලකාරී පෙනුමක් ඇගේ නෙත්වල දිස්විය. ඈ මහත් වික්ෂිප්ත භාවයෙන් යුතුව කිසිවක් තේරුම් ගත නොහැකි ආකාරයෙන් වටපිට බැලුවා ය.

"මට හොඳට ම විශ්වාසයි එයාට පිස්සු" ඩොන් කීවේ ය.

"මේ අර ඉඩම් කාර්යාලේ ටාජේ මහත්මිය නේද?" නැන්සි ඇය හඳුනා ගැනීමට සමත් වූවා ය.

ටාජේ මහත්මිය කුණාටුවක් මෙන් කඩා වැදුණු අතර එක්වර ම එතන සිටි කිසිවෙකු හඳුනා ගැනීමට ඇයට නොහැකි විය.

"ඔබලා හොයන්නේ මෙතන හිටිය තක්කඩි රැළ නම්" ඈ වියරු හඬකින් පැවසුවාය. "උන් පැනලා ගිහිල්ලා"

"පැනලා ගිහිල්ලා !" නැන්සි ඇගේ වදන් ප්‍රතිරාවය කළා ය.

"ඔයා කියන්නේ එයාලා මෙතනින් ගිහිල්ලා කියල ද?"

"මම කියන්නේ ඊට වැඩිය දෙයක්" ටාජේ මහත්මිය තරහින් කඩා පැන්නා ය. "උන් උන්ගේ බෑග් මලුයි, අඩුම කුඩුමයි අරන් ගිහින් විතරක් නෙමේ උන් මට දීලා තියෙන්නේ හොර චෙක් එකක්" මෙසේ කී ටාජේ මහත්මිය පපුවට අත තබා හති ඇරියා ය.

"ඒකෙන් පේන්නේ ඔවුන් ගියා කියන එක හොඳට ම ඔප්පු

වෙන බවයි. ගිය දේ ගියාවේ. ඔයාට පුළුවන් මේ ගේ වෙන කෙනෙකුට කුලියට දෙන්න." ජෝර්ජ් සිය අදහස් කිවා ය.

"කුලියට දෙන්න පුළුවන් වෙන්නත් පුළුවන්. සමහර විට බැරි වෙන්නත් පුළුවන් මේ වෙන දේවල්වල හැටියට" ඇය තරමක් නිවුණු ස්වරයෙන් කිවා ය. ඉන් අනතුරුවයි ඇයට නැන්සි සහ මිතුරු පිරිස හඳුනා ගැනීමට හැකි වූයේ.

ඇ නැන්සිගේ අතින් අල්ලා ගත්තා ය. "ඔබ නේද දරුවා එදා මගෙන් ප්‍රීට්සර්ලා ගැන ඇහැව්වේ?" ඇය නැන්සිගෙන් විමසුවා ය.

නැන්සි එසේ බව හඟවමින් හිස වැනුවාය.

"එහෙනම් ප්‍රීට්සර්ලා ගැන අමුතු දෙයක් ඔයාට ආරංචි උනා ද?" ඈ නැවතත් ඇසුවාය.

නැන්සි ඇයට එදා දැක ගැනීමට හැකි වූ දේ කෙටියෙන් කිවාය. විශේෂයෙන් ප්‍රීට්සර්ලාට දරුවන් නොසිටින බව කීමට ඈ අමතක කළේ නැත.

"මට නම් හරිම කනගාටුයි මහලු ප්‍රීට්සර් මහත්මයා ගැන. එයාගෙ පුතයි ලේලියි කරන දේවල්වලට එයාට දොස් කියන එක සාධාරණ නෑ" බෙස් කිවා ය.

මහලු මිනිසාට අනුකම්පාවක් හිමිවිය යුතු බවට නැන්සි තුළ තිබුණේ සැකයකි. ඇය කල්පනා කළේ ඔහුත් මේ වංචාවේ කොටස්කරුවෙකු ලෙසට ය.

"මහලු ප්‍රීට්සර් කිව්වා එයා ළඟ වටිනා සිප්පි කටු එකතුවක් තියෙන බව. මට හරිම ආසයි ඒවා බලන්න" බැබ්ට ඇගේ ආශාව සඟවා සිටීමට නොහැකි විය.

"උන් ළඟ එහෙම දෙයක් තියෙනවා නම් ඒවාත් හොරකම් කරපු ඒවා වෙන්න ඇති. පල් හොරු !" ටාපේ මහත්මිය හිස ගස්වමින් කිවා ය.

"හොරකම් කරපුවා" බැබ් විස්මයෙන් යුතු රාවයක් පිට කළා ය.

"ඇයි ඔයා අද උදේ ප්‍රවෘත්ති ඇහැව්වේ නැද්ද?"



# 06

"මොකක්ද ප්‍රවෘත්තිය" නැන්සි ඇසුවා ය.

මීට එහායින් ඇති ෂෙල්ඩොන් නගරයේ සිටින සිප්පි කටු එකතු කරන්නෙක් තම නිවසින් පිටත සති දෙකක නිවාඩුවක් ගත කිරීමට ගොස් ඇති බවත්, ඔහු ආපසු එන විට ඔහුගේ වටිනා සිප්පි කටු එකතුව කිසිවෙකු විසින් සොරකම් කර ඇති බවත් එම ප්‍රවෘත්තියෙන් කියවුණු බව ටාපේ මහත්මිය කිවා ය.

"මේ සිප්පි කටුවල වටිනාකම ඉතා ම ඉහළයි. ඒ වගේ ම ඒවායින් සමහරක් ඉතා ම දුර්ලභ ඒවා. ඒවා අතර 'මියුරෙක්ස්' නමින් හැඳින්වුණු බ්‍රැන්ඩරිස් වර්ගයේ සිප්පි කටුවකුත් තිබිලා තියෙනවා. ඒක පැරණි අධිරාජ්‍යයෙකුට අයිති වෙලා තිබුණු එකක්. ඔහු ජීවත් වුණු කාලයේ බ්‍රැන්ඩරිස්ගේ ඇගේ කහ පාට රහස් දියරයක් ඇති බව සොයා ගෙන තියෙනවා. දියරය පිරිසිදු කරලා ගත්තහම එයින් තද දම් පාට සායම් වර්ගයක් සාදන්න පුළුවන්. ඒ දම් පාට සායම් පොවපු ඇඳුම් අඳින්න ඒ කාලේ අවසර තිබුණේ රජවරුන්ටත්, අධිරාජ්‍යයින්ටත් විතරයි" ටාපේ මහත්මිය නැතිවූ සිප්පි කටු තොගයේ වටිනාකම ගෙන හැර දක්වමින් කතා කළා ය.

"මොනතරම් ආකර්ෂණීය ද?" බැබ් ඇසුවා ය. "දැන් මට වටහාගන්න පුළුවන් හොරකම් කරපු සිප්පි කටු එකතුව හොරෙකුට මෙතරම් වටිනා දෙයක් වුණේ ඇයි කියලා"

විලේ අබිරහස විසඳීමට යම් හෝඩුවාවක් නිවස තුළින් සොයා ගත හැකි වේ ඇයි සිතූ නැන්සි නිවස තුළට යාමට කැමැත්ත පළ කළා ය.

"සමහර විට ප්‍රීට්සර්ලා ගිය දිහාව ගැනත් අපිට අදහසක් ලබා ගන්න පුළුවන් වෙයි. මොකද අපි ඇතුළට ගිහින් බලමු ද ටාපේ මහත්මිය?"

"ඔව්, මම හිතනවා මේ තක්කඩියන්ව අල්ල ගන්න මට උදව් වෙන විදිහේ දෙයක් හොයාගන්න ඔබලාට පුළුවන් වෙයි කියලා" ඈ සිය එකඟතාව පළ කරමින් දොර විවර කළා ය.

කණ්ඩායම නිවසට ඇතුළු වී ඉක්මනින් ම පරීක්ෂා කිරීම ආරම්භ කළෝ ය. ජෝර්ජ් විසිත්ත කාමරයේ මුල්ලක තිබූ පත්තර හා සඟරා තොගය එකින් එක පෙරළා බැලුවා ය. ඒවා ප්‍රාදේශීය පුවත් පත් වූ අතර ඒවායින් කිසිදු හෝඩුවාවක් සොයා ගත නොහැකි විය. නමුත් පුවත් පත් ගොඩේ අවසානයට වන්නට තිබුණු ජ්ලොරිඩා පුවත් පතකට ඇගේ විමසිලිමත් ඇස් යොමු විය.

ඇඩි අවධානයකින් ඒ දෙස බැලූ ඈ නැන්සිට කතා කර එය පෙන්වා, "මේකේ මොකක් හරි සැක කටයුතු දෙයක් තියෙනවා වගේ, කරුණාකරලා මේකෙ තියෙන හැම ලිපියක් ම කියවන්න මට උදව් වෙන්න"

ගැහැනු ළමෝ දෙදෙන ඉතා පරීක්ෂාවෙන් කියවා බැලුවත් ප්‍රීට්සර් ගැන සඳහන් කිසිවක් සොයා ගැනීමට ඔවුන්ට නොහැකි විය. අවසානයේ දී අන්තිම පිටුවට පෙර පිටුවේ තිබුණු ලිපියකට නැන්සිගේ අවධානය යොමු විය.

## සිප්පි කටු සොරකම තවමත් අබිරහසක්

ප්‍රවෘත්තියෙන් කියවුණේ බලහත්කාරයෙන් ඇතුළු වූ අයෙකු මිල කළ නොහැකි තරම් වටිනා සිප්පි කටු එකතුවක් සොරකම් කර ඇති බවයි. ඒවායින් සමහරක් තිබී ඇත්තේ ඒවායේ අයිතිකරුවා නිදා සිටි කාමරයේ ය.

"නැන්සි ඔයා හිතනව ද මෙච්චර වටිනා වස්තුවක් ගන්න බලහත්කාරයෙන් ඇතුළු වුණු කෙනා ප්‍රීට්සර් වෙන්න ඇති කියලා?"

"සමහරවිට මහලු ප්‍රීට්සර් වෙන්නත් පුළුවන්"

මේ වන විට අනෙක් පරීක්ෂකයින් කිසිම වටිනා සාක්ෂියක් සොයා ගත නොහැකි වීමෙන් අධෛර්යයට පැමිණ උත්සාහය අත්හැර දමා තිබුණි.

"මේ බලන්න" බෙස් අන් අයට ප්‍රවෘත්තිය පෙන්වූවා ය.

ටාපේ මහත්මිය වෙත ගිය නැන්සි, "මේ ගෙදර අට්ටාලයක් හරි පොළොව යට කාමරයක් හරි තියෙනව ද?" යනුවෙන් විමසුවා ය.



පොළොව යට කාමරයක් නම් නෑ. ඒත් අට්ටාලයක් නම් තියෙනවා. සිවිලිමේ එක කොටසක් අයින් කරපුවහම ඔයාට ඒකට නගින්න පුළුවන්"

"අපි ඒකත් පරීක්ෂා කළොත් හොඳයි" නැන්සි එසේ කීවිට ටාපේ මහත්මිය එකඟ වූවා ය. "පිරිමි ළමයෙක් නැගලා බැලුවොත් වැඩිය හොඳයි"

නැන්සි නෙඩ්ගෙන් සිවිලිමට නැගීමට හැකිදැයි විමසූ විට ඔහු ඊට කැමැත්ත පළ කළේ ය. කවුරුත් බලා සිටිය දී බ්‍රෙට්ගේ උරහිස් උඩ නැගුණු නෙඩ් සිවිලිමේ කොටසක් ඉවත් කළේ ය. ඉන්පසු ඔහු අට්ටාලයට නැගුණේ ය. පහළ සිටි අය කුතුහලයෙන් යුතුව බලා සිටියහ. අට්ටාලයේ ලෑලි නෙඩ් එහා මෙහා ඇවිදින විට "කිරි.. කිරිස්.." හඬක් නැංවී ය.

"ලෑලි එච්චර හයිය පාටක් නෑ" බෙස් නැන්සිට ළංවී කොඳුරා කීවා ය.

"ඔව්, ඒ වගේ තමා" නැන්සි හිස වනා එය අනුමත කළා ය. කවුරුත් නිහඬතාවයෙන් යුතුව ඊළඟට කුමක් සිදුවේද යන අදහසින් යුතුව අට්ටාලය දෙස බලාගත් වනම සිටියහ. නිහඬතාවය එක්වර ම බිඳී ගියේ නෙඩ්ගෙන් නැගුණු මහ හඬත් සමගිනි. "අබිරහස විසඳුණා" ඔහු අට්ටාලයෙන් එබී කෑ ගැසුවේ ය.

"ඔයාට මොනවද හම්බ වුණේ?" නැන්සි ඇසුවා ය.

"ඔරුව !, භූතාවේෂ වුණු ඔරුව"

"මොන තරම් පුදුමයක් ද?"

සැමදෙනා ම විස්මයෙන් යුතුව කෑ ගැසූහ.

නැවතත් නෙඩ් කෑ ගැසුවේ ය. "මම මේ සිදුරෙන් ඔරුව පහළට එවන්නම්. ඔයාලා අල්ල ගන්න."

ගැහැනු ළමුන් එතැනින් ඉවත් වූ අතර පිරිමි ළමෝ අට්ටාලයට ඇතුළු වන විවරය යටින් සිට ගත්හ.

"ඔන්න එනවා" නෙඩ් කෑ ගසා කීවේ ය.

ඔහු ඔරුව විවරය දිගේ පහත් කරත්ම මහ හඬින් යමක් බිඳී ගියේය. ඒ සමගම විවරයේ එක් පැත්තක් කඩා වැටුණේය. නෙඩ් සමග ම ඔරුව පහළට වැටෙන්නට විය.

බ්‍රෙට් හා ඩේව්, නෙඩ්ව අල්ලා ගැනීම සඳහා ඉදිරියට පැන්න අතර ජෝර්ජ් හා නැන්සි ඉදිරියට පැන්නේ ඩොන්ට ඔරුව පාලනය කර බිම වැදීමෙන් වළක්වා ගැනීමට උපකාරී වීමට ය. නෙඩ්ව පරිස්සමින් අල්ලා ගනු ලැබුණු අතර ඔරුව යන්තම් බිම වදිනවාත් සමග ලොකු හානියකින් තොරව රැක ගැනීමට හැකි විය.

මෙතෙක් වේලා පුදුමයෙන් ගල් ගැසී සිටි ටාජේ මහත්මිය "වෙලා තියෙන දේවල් මදිවට මට ඊළඟට සිවිලිම අලුත් වැඩියා කරන්නත් සිද්දවුණා" යැයි කිවා ය.

මේ කිසිවක් නැසුණා සේ ළමෝ ඇඩි උනන්දුවකින් යුතුව ඔරුව පරීක්ෂා කරන්නට වූහ. නෙඩ් තරමක් පැටලිලි සහගත ලෙස ඔරුවේ ඉදිරිපස හා පසුපස ආසන යට සවිකර ඇති උපකරණ පෙන්වී ය. එක් මෝටරයක් ඉදිරිපස හබල් ක්‍රියා කරවීම සඳහා ද අනෙක පසුපස හබල ක්‍රියා කරවීම සඳහා ද යොදා තිබුණි. දෙක ම එකට ඈඳා ස්ථිර ලෙස සවිකර තිබුණි. තව දුරටත් රේඩියෝ සංඥා ලබා ගැනීම සඳහා යන්ත්‍රයක් ද සවිකර තිබුණි.

"මේක හැබැවට ම විශිෂ්ට නිර්මාණයක්" ඩොන් කීවේ ය. එවිට ම ඔවුන්ට පිටතින් කටහඬවල් දෙකක් ඇසුණු අතර පොලිස් නිලධාරීහු දෙදෙනෙක් විවර කර තිබූ දොරෙන් ඇතුළු වූහ. බොරු වෙක් පත් පිළිබඳව ටාජේ මහත්මියගේ පැමිණිල්ල විභාග කිරීම සඳහා නිවස පරීක්ෂා කිරීමට ඔවුහු පැමිණ සිටියහ.

ටාජේ මහත්මිය ඔවුන් පොලිස් නිලධාරීන්ට හඳුන්වා දුන්නා ය.

"මට හිතෙන්නේ මේ නිර්භීත ළමයි රංචුව සෙවනි විලේ අවතාර පිළිබඳ අබිරහස විසඳලා ඉවරයි" පොලිස් නිලධාරීහු පැවසූහ.

ඇය නිලධාරීන්ට අට්ටාලය මත ප්‍රීට්සර්ලා පිළිබඳ යම් හෝඩුවාවක් තිබෙන්නට පුළුවන් බවට නැන්සි තුළ වූ සැකයත් ඉන් පසුව පරීක්ෂා කිරීමේ දී ඔරුව හමුවූ ආකාරයත් පැහැදිලි කළා ය.

නැන්සිට සිනහවකින් සංග්‍රහ කළ ඔවුහු, "ඔයාට හරිම තීක්ෂණ බුද්ධියක් තියෙනවා. ඔයා අපිව කරදර ගොඩකින් බේර ගත්තේ" යනුවෙන් පැවසූහ.

බෙස් ප්ලොරිඩා පුවත්පත පෙන්වූ අතර ඔවුහු එය හා ඔරුව ප්‍රීට්සර්වරුන්ට එරෙහිව සාක්ෂියක් වශයෙන් යොදා ගැනීම පිණිස



ගෙන යාමට තීරණය කළහ. මේ නිවස තුළ හූත දඩයක්කරුවන්ට වෙනත් කාර්යයක් නොතිබුණු හෙයින් ආපසු කඳවුර කරා යාම සුදුසු බව නැන්සි යෝජනා කළා ය. ඔවුන් සමුගන්නා විට ටාජේ මහත්මියත් පොලිස් නිලධාරීනුත් ඔවුන්ගේ ධෛර්යය හා උත්සාහය පිළිබඳව ස්තුතිය පළ කර සිටියහ.

* * * * * * *

කන්ද නගිමින් මෝටර් රථය වෙත ආපසු එන ගමනේ දී, "මට හරි සතුටුයි මේ ප්‍රශ්නේ විසඳලා ඉවර වීම ගැන. දැන් ඉතිං අපිට ඊළඟ වැඩේට අත ගහන්න පුළුවන්. ඒක මේකටත් වඩා අන්තරාදායක වෙන්න පුළුවන්" යනුවෙන් බෑබ් කිවා ය.

"ඔයා කියන්නේ හූතාවේෂ වුණු ගැහැනිය ඉන්න කූඩාරමෙන් ඇය මළවුන් සමග සම්බන්ධ වෙන සෑම අවස්ථාවක ම අකුණු හඬ පිටවෙනවා කියල ද?" ඩොන් ඇසුවේ ය.

"ඔව්"

අද්භූත යාත්‍රාවත්, ප්‍රීට්සර්ලා මවා පාන්නට උත්සාහ කළ අමනුෂ්‍ය බලවේගයත් බොරු බව ඔප්පු කළත් ඔවුන් අල්ලා ගැනීමට තමන්ට තවමත් නොහැකි වූ බව නැන්සි ඔවුන්ට සිහිපත් කළා ය.

"අපි කාගේ හරි හොල්මන් වැඩ බොරුයි කියලා ඔප්පු කළාට පස්සේ ඒ තක්කඩින්ව අල්ලන්නත් ඕනෑ. නැන්සි කවදාවත් ප්‍රශ්නයක් බාගෙට විසඳලා නවතින්නේ නෑ."

"ඒක හරි. මම ඕනෑ ඔට්ටුවක් අල්ලනවා නැන්සි, ප්‍රීට්සර්ලාව අල්ලන බවට" නෙඩ් සිනාසී කීවේ ය.

කඳවුරට ළඟා වූ විට සිදුවූ සියල්ල නැන්සි ලෙපර්ට් මහතාට විස්තර කළා ය. ඒ ඇසීම ලෙපර්ට් මහතාට සැනසිල්ලක් ගෙන දුන්නේ ය. විශේෂයෙන් ප්‍රීට්සර් නගරයෙන් පලා යාම පිළිබඳව ඔහු ඉතා සතුටට පත් වූයේ ය.

"දැන් මෙහාට ඕනෑ තරම් සංචාරකයො එයි. මේ කඳවුර අමුත්තන්ගෙන් පිරෙයි. ඔබලාට ස්තුති කරන්න මා ළඟ වචන නෑ" ඔහු කීවේ සතුටින් පිම්බී ගිය මුහුණින් යුතුව ය.

"නැන්සි ඔයයි යාළුවොයි ටික දවසක් මෙහෙ නතර වෙලා විනෝද වෙන්න, මම ඔයාලගෙන් කිසිම මුදලක් අය කරන්නේ නෑ"

එහෙත් එසේ නැවති සිටීමට නොහැකි වීම පිළිබඳව ඇයත් මිතුරනුත් ඉතා ම කනගාටුවට පත්වන බව නැන්සි කිවා ය. "මේ සුන්දර ස්ථානය හැර යාමට සිදුවීම ගැන අපිට හරිම කනගාටුයි ලෙපර්ට් මහත්මයා. නමුත් අපිට, කරන්න තවත් වැදගත් වැඩක් තියෙනවා. අපි හැකි ඉක්මනින් ඔබව බලන්න නැවත එන්නම්."

අන් පිරිසගෙනුත් විමසනු ලදුව පසුදින පාන්දරම කඳවුරෙන් පිටත්වීමට සෑම දෙන ම එකඟ වූහ. ඔවුන්ගේ මීළඟ ගමනාන්තය වූයේ "වර්නෝවයිල්ය". ඔවුන් එහි ළඟා වූ විට ලැගුම් ගැනීම පිණිස ඉතා සිත්ගන්නා සුලු තනි මහලේ අවන් හලක් ජිම් සහ හෙලන් විසින් පිළියෙල කර තිබුණි. ඔවුන් පරීක්ෂා කර ඇතුළට කැඳවාගෙන ආ විගස ම පිළිගැනීමේ නිලධාරිණිය වූ ඇඩිලේඩ් මෙනවියගෙන් භූතාවිෂ්ට කාන්තාව පිළිබඳවත් විමසුවා ය. ඇය ප්‍රාදේශික සිදුවීම් සටහන් කර ඇති දින දර්ශනය බලා මෙසේ කීවා ය. "අද හවස 'ටැරෙන්ටෙලා' මළවුන්ගේ ආත්ම සමග සම්බන්ධ වෙනවා. නමුත් ඊට සහභාගි කර ගන්නේ ගැහැනු අයව විතරයි. පිරිමින්ට ඇගේ කුඩාරමට ඇතුළු වෙන්න තහනම්. ඊට පෙර ඈ ගැටලු තියෙන ආත්ම එක්ක සාකච්ඡා කරනවා."

මේ කතාව ලොකු විහිළුවක් සේ ජෝර්ජ්ට පෙනී ගියා ය. දෙපා ඇත් කරමින් අත් ඉණ මත තබාගෙන විහිළු ඉරියව්වක් මවා ගත් ඈ නාසයට බර වූ ස්වරයකින් "නැන්සි, බෙස් අපි හැමෝම ලොකු කරදරේක වැටිලා ඉන්නේ. එහෙම නේද?" යනුවෙන් පැවසුවා ය.

අනිත් ගැහැනු ළමයින්ට සිනහව නවත්වා ගැනීමට නොහැකි විය. ක්‍රමයෙන් ප්‍රකෘති තත්ත්වයට පැමිණි ඔවුහු දිවා ආහාරයෙන් පසුව කෙළින් ම භූතාවේෂණිය ටැරෙන්ටෙලාගේ කුඩාරමට යාමට තීරණය කර ගත්හ. එකිනෙකා ගොස් වෙන් වෙන්ව ඇයව මුණ ගැසීමට නියමිත විය. අනෙක් භූත දඩයක්කාර කාන්තාවෝ මළවුන්ගේ සභාව දැකීමට යාමටත්, වේලාසනින් ගොස් පෞද්ගලිකව ඇය මුණ නොගැසීමටත් තීරණය කළහ.

"මට හරිම පුදුමයි හොල්මන් අවතාර ගැන කිසිම විශ්වාසයක් නැති ඔයා පළමුවෙන්ම ඇයව මුණගැහෙන්න තීරණය කිරීම ගැන" රීටා නැන්සිට කිවා ය.

"මම එහාට යන පළමුවෙනි ම කාරණය තමයි ඇයවයි ඇගේ කුඩාරමයි හොඳින් පරීක්ෂා කර බැලීම" නැන්සි සිනහවක් පාමින් කීවා ය.



බාලිකාවන් තිදෙනා නැන්සිගේ රියෙන් ගමන් කරද්දි එය කොතරම් සුන්දර සන්ධ්‍යාවක් දැයි ජෝර්ජ් පළ කළා ය. කඳු අතර හිරු බැස යමින් තිබුණු අතර මලානික රන්වන් හිරුරැස් තුරු මුදුන්වල අමුතු ම කාන්තියක් ඇති කළේ ය.

"මේ වගේ දවසක, ලස්සන රාත්‍රියක මළවුන්ගේ ආත්ම එක්ක කතා කරන කොට අකුණු පුපුරනවා නම් ඒ සම්පූර්ණයෙන් ම කෘත්‍රිම දෙයක්. මම හිතන්නේ ඒක භූතාවිෂ්ට කාන්තාව මිනිසුන් බය කරන්න යොදන උපක්‍රමයක් කියලයි."

මිනිත්තු කිහිපයකදී නැන්සි "අනාවැකි කීම" යනුවෙන් සඳහන් ලෑල්ලක් එල්ලා තිබූ ලීයෙන් සාදන ලද කුඩාරමෙන් ඉදිරියට රිය පැදෙව්වාය. වටපිටාවේ තිබුණු කුඩා ගෙවල් කිහිපය අතර මේ නිවස විශේෂාකාරයකින් ස්ථානයට නොගැළපෙන බවක් ඉසිලුවේ ය.

"මට හිතෙන්නේ අපි තමයි ඉස්සර වෙලා ම ඇවිල්ලා තියෙන්නේ" ජෝර්ජ් රියෙන් බසිමින් කිවා ය.

අභිගුණ්ඨිකයෙකු මෙන් සැරසුණු මිනිසෙක් ගැහැනු ළමුන්ව පිළිගෙන පසුපස කාමරයට කැඳවාගෙන ගියේ ය. එහි ඉතා ම අඩු එළියක් තිබුණත් ඔවුන්ට මහත දෙහෙත ඇති අභිගුණ්ඨික ඇඳුමින් සැරසුණු මන්තරකාරිය හඳුනා ගැනීමට හැකි විය. ඈ මේසයක් ළඟ වාඩි වී සිටියා ය.

"මම මේ ගෑනු ළමයව ඉස්සර වෙලා ම ගන්නම්" ඈ තම අත මඳක් ඔසවා නැන්සිගේ උරහිස මත තැබුවා ය. "අනිත් දෙන්නා කරුණාකරලා එළියෙන් ඉන්න"

බෙස් හා ජෝර්ජ් ඇතුළත කාමරයෙන් ඉවත්ව ඊට එහායින් වූ කාමරයට ගොස් කතාබහ ඇසෙන මානයෙන් වාඩිවූහ. රාත්‍රියේදී මළවුන්ගේ සභාව පැවැත්වීමට නියමිතව තිබුණේ ඔවුන් වාඩිවී සිටි ස්ථානයේ ය.

ටැරෙන්ටෙලා තමන්ට ඉදිරියෙන් මේසයේ අනිත් පැත්තේ වාඩිවන ලෙස නැන්සිට කිවා ය. ඇගේ දකුණු අතින් නැන්සිගේ දකුණත අල්ලා ගත් ඈ ඒ දෙස බැලුවේ නැත. නැන්සිගේ මුහුණ දෙස යන්තම් බලා ගෙන ඈ කතා කිරීමට පටන් ගත්තා ය.

නැන්සි ගැන ඇය කියූ බොහෝ දේවල් සත්‍ය වශයෙන් ම සිදු වූ ඒවා වීම නැන්සිට අදහාගත නොහැකි කරුණක් විය. නැන්සි

මෙහි එන බවවත් ඇය දැන නොසිටි නිසා මේ කරුණු දැන ගත්තේ කෙසේ දැයි සිතා ගැනීමටත් නොහැක.

මන්තරකාරිය ඈ දෙස බලා සිනාසුණා ය. "ඔබ බොහෝ සුන්දර තේරුම් බේරුම් ඇති ගැහැනු ළමයෙක්. ඒ නිසා ඔබට බොහෝ මිතුරන් ඉන්නවා. ඔබේ කණ්ඩායමේ ඉන්න උස, ලස්සන පෙනුමක් තියෙන කොල්ලා ගැන ඔබට අනාගතයේදී තීරණයක් ගන්න වෙයි."

"ඒ වගේ ම ඔබ සැම වෙලාවෙ ම අබිරහසක් විසඳීමට මාන බලන ප්‍රීතිමත් කෙනෙක්. හැම වෙලාවෙ ම ඔබ අනික් අයට උදව් කිරීමට සූදානම්. නමුත් ඔබට මගේ අවවාදය අනාගතයේදී හොඳින් පරිස්සම් වෙන්න කියලයි. මෙච්චර කාලෙකට වාසනාව තිබුණේ ඔබගේ පැත්තේ. නමුත් ඕනෑ ම වේලාවක ඒක අනිත් පැත්ත කැරකෙන්න පුළුවන්. තේරුණා ද? "

වැරෙන්ටෙලා කතාව නැවැත්වූවා ය. එක්වර ම ඈය තම අසුනින් නැගී සිටියා ය. මේසය වටා පැමිණි ඈ රහස් පරීක්ෂිකාවගේ මුහුණට මුහුණ ලා සිට ගත්තා ය. ඈ හිස වේගයෙන් කරකවන්නට පටන් ගත්තා ය. ඇගේ ඇස් අමුතුම ආකාරයකින් ඉහළට එසවී කළු ඉංගිරියාව නොපෙනී ගියේ ය. නැන්සිගේ සිතට මඳ බියක් ඇතුළු විය. මෙතැනින් පිටවීම වඩා සුදුසු බව සිතූ ඈ නැගී සිටියා ය.

ඇය සෙලවීමටත් පෙර භූතාවිෂ්ට කාන්තාව දඬු අඬුවක් වැනි ශක්තිමත් අත්වලින් ඇගේ උරහිස් තදින් අල්ලා ගත්තා ය. ගින්නේ දැවෙන ගල් අඟුරු වන් රත්පැහැ ඇස්වලින් ඈ නැන්සිගේ ඇස් තුළට කෙළින් ම කිඳා බැස්සා ය.

උගුරෙන් නැගුණු ජුගුප්සා ජනක අද්භූත හඬකින් ඈ නැන්සිව ඇමතුවා ය. "උඹට පුළුවන් දැන් මට උදව් කරන්න. කිසිම පැකිළීමක් නැතිව උඹ මට උදව් කළ යුතුමයි."

"ඔබ එයින් අදහස් කළේ මොකක්ද?" නැස්සි ඇසුවා ය. "උඹ දැන් මගේ බලයට යටත්වෙලා ඉවරයි. ඒ නිසා උඹ මට උදව් කළ යුතුමයි."

නැන්සිගේ එකම අදහස මෙතනින් පිටවීම වුවත් ඇයට සෙලවීමටවත් නොහැකි විය. වැරෙන්ටෙලා නැන්සිගේ උරහිස් වටා තම අත් යවා දඬු අඬුවක් මෙන් ඒවා එකට තද කළා ය !



# 07

මළවුන්ගේ සහාව රැස්වන කාමරයේ රැඳී සිටි බෙස් හා ජෝර්ජ් නැන්සි ආපසු පැමිණීමට ප්‍රමාද වීම ගැන කලබල වූහ.

"මම හිතන්නේ අපි ඇතුළට ගිහිල්ලා වෙන්නේ මොකද කියලා බැලුවොත් හොඳයි" බෙස් කීවා ය.

ජෝර්ජ් ඊට එකඟවූ අතර ගැහැනු ළමයි දෙදෙන පසුපස කාමරයට ඇතුළු වූහ. ඔවුන් දුටු දෙයින් භීතියට පත්වූහ. වැරෙන්ටෙලාගේ ඇස් ගිනි බෝල මෙන් බබළමින් තිබුණු අතර ඈ දඬු අඬුවකින් මෙන් නැන්සිව තද කර ගෙන සිටියාය.

"ඔය වැඩේ නවත්වනවා !" ජෝර්ජ් කෑගැසුවා ය.

"ඇයව අත ඇරපන්" බෙස් ඔවුන් දෙසට දුවමින් කීවා ය.

නැන්සි ඉතා ම සන්සුන් බවක් පෙන්වූවත් මිතුරියන් දෙදෙනාට ඇය ඉතා ම භීතියට පත්වී සිටින බවට සියුම් හැඟීමක් ඇතිවිය. ඇය උණ රෝගයෙන් පෙළෙන්නාක් මෙන් වූ අතර ඇගේ ඇස් මලානික ස්වරූපයකින් ද යුතු විය. දෙතොල් පවා සුදුමැලි වී ගොස් තිබුණි. භූතාවිෂ්ට කත ළමුන් දෙදෙනා දෙසට මඳ සිනහවක් පා ඇගේ ග්‍රහණය බුරුල් කළා ය.

"ස්තූතියි!" නැන්සි කෙඳිරුවා ය.

මෝහනයකින් ඉවත් වෙන්නාක් මෙන් වැරෙන්ටෙලා තම හිස සහ උරහිස් වැනුවා ය. "මට සමාවෙන්න. මම භයානක අසුභවාදී දර්ශනයක් දැක්කා"

"මා ගැනද?" නැන්සි ඇසුවා ය.

"නෑ, නෑ, ඒක කොහොමටවත් ඔබ ගැන නෙමෙයි. මම දැක්කා මිනිහෙක් මට පහර දෙන්න එනවා. මට දැනුණේ මිනිහා මාව මරන්න යනවා කියලයි"

"මොනතරම් භයානක ද?" බෙස් ඇස් එළියට පනින තරම් බිය වී සිටියා ය.

ජෝර්ජ් කතා කළා ය. "මොන හේතුවකට ද ඔහු ඔබව මරන්න ආවේ?" භූතාවේෂණිය යම් බිහිසුණු දර්ශනයක් පෙනිම වළක්වා ගැනීමට, මෙන් වේගයෙන් ඇස් පිල්ලම් ගසන්නට වූවා ය.

"ඔහුට අවශ්‍යයි ඉතා ම රහස් ලියවිලි වගයක් මගෙන් ලබා ගන්න."

"ඔබ ඒක කරන්න ඕනෑ නෑ" ජෝර්ජ් ප්‍රකාශ කළා ය.

"ඕ ! ඔබ දන්නේ නෑ මේ මිනිහව" ටැරෙන්ටෙලා කිවා ය. ඇය නැන්සි දෙසට හැරුණා ය. "ඔබ හැම වෙලාවෙ ම අනිත් අයට උදව් වෙන්න කැමැත්තෙන් ම ඉදිරිපත් වෙනවා. මම දැන් ඔබට ආයාචනා කරනවා. ඔබ මේ ලියවිලි ටික අරගෙන මා වෙනුවෙන් ඒවා ආරක්ෂා කරන්න ඕනෑ."

නැන්සි එම යෝජනාව අසා තිගැස්සුණා ය. ඇය තුළ මේ ඉල්ලීම බාර ගැනීමට කිසිම අදහසක් නොවූවත් මේ ලියවිලි තුළින් භූතාවේෂණියගේ රහසත් ඇගේ අද්භූත ජීවිතයත් පිළිබඳ දැනගත හැකි මේ යැයි විශ්වාසයක් ඇය තුළ ඇති විය.

"මගේ තාත්තා නීතිඥයෙක්" නැන්සි අවසානයේ දී කිවා ය. "මම එයාගෙන් මේ ගැන අහන්නම්, ඊට පස්සේ මම ඒවා බාර ගන්නම්" එහෙත් ඇගේ යටිසිත ඇයට කීවේ තම පියා ඒ සඳහා අවසර ලබා නොදෙනු ඇති බවයි.

"මට එච්චර කල් ඉන්න බෑ" ටැරෙන්ටෙලා කිවා ය. ඔබ ඒවා අද රෑම ගෙනියන්න ඕනෑ" මෙහිදී ජෝර්ජ් බාධා කළා ය. "ඇයි ඔයා ඒවා සේප්පුවක දාන්නේ නැත්තේ?"

භූතාවේෂණිය කත පිළිතුරු නුදුන්නා ය. ඒ වෙනුවට ඈ නැවතත් සිය ඇස් කරකවන්නට වූවා ය. බෙස් බියෙන් වෙව්ලන්නට වූවා ය. ඈ අනෙක් දෙදෙනාට "මෙතනින් පිටත් වෙමු" යනුවෙන් යෝජනා කරන්නට සූදානම් වෙත් ම ටැරෙන්ටෙලා නැවත ප්‍රකෘති තත්ත්වයට පත් වූවා ය. සුන්දර සිනාවක් පෑ ඈ බෙස් අමතා,

"ඔබ හරිම ලස්සනයි. ඔයාට මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවද?" යනුවෙන් ඇසුවා ය.

බෙස්ගෙන් ඊට පිළිතුරක් ලැබුණේ නැත. ඒ වෙනුවට ජෝර්ජ් හා නැන්සි ඇමතූ ඈ "අපි මෙතනින් පිටවෙලා යමු" යි කිවා ය. "ආදරණීය ළමයා කරුණාකරලා ඉක්මන් වෙන්න එපා" ටැරෙන්ටෙලා කිවා ය. "ආවේශ වෙලා අනාවැකි කියන්න පටන් ගැනීමට පෙර මම සමහර වෙලාවට අමුතු විදිහට හැසිරෙනවා කියලා මිනිස්සු කියනවා.



නමුත් මම ඔබලාට සහතික වෙනවා. ඔබලාට මගෙන් කිසිම උපද්‍රවයක් වෙන්නේ නෑ කියලා."

භූතාවේෂණිය කත බිත්තියෙහි වූ ඔරලෝසුව දෙස බැලුවා ය. වේලාව කියවූ ඇගේ මුහුණ මදක් වෙනස් අමුතු ස්වරූපයක් ගත්තා ය. "තව ටික වේලාවකින් මළවුන්ගේ සභාව පවත්වන වේලාව ළඟා වෙයි. මට එයට සූදානම් වීමට  මිනිත්තු කිහිපයක් අවශ්‍යයි. කරුණාකරලා එහා පැත්තේ විශාල කාමරයේ නැවතිලා ඉන්න. අද රෑට ඉතා ම සිත්ගන්නාසුලු පණිවිඩ කිහිපයක් මළවුන්ගේ ආත්මවලින් මට ලැබෙන්නට නියමිතයි."

"මම ඔයාට කොච්චර ණය ගැතිද?" නැන්සි මෙහි දී ඇගෙන් ඇසුවා ය.

ටැරෙන්ටෙලා සිනාසුණා ය. "මම මුදලක් ඉල්ලන්නේ නෑ. සාමාන්‍යයෙන් මගේ ගනුදෙනුකාරයෝ තමන්ට සිදුවුණු සේවයට අනුව සන්තෝෂයෙන් මට ගාස්තුවක් ගෙවනවා. නමුත් මේ ප්‍රශ්නෙදි මම ඔබගෙන් උදව් ඉල්ලන නිසා ඔබ කිසිම ගාස්තුවක් ගෙවන්න අවශ්‍ය නෑ"

ඔවුන් කාමරයෙන් පිට වූ විට ම බෙස් මේ කුඩාරමේ නොසිට නැවත අවන්හලට යමුයි ආයාචනා කළා ය. "හැමදෙයක් ම හොඳට සිද්ධවෙද්දිත් මම නම් කොහොමටවත් කැමති නෑ මේ අද්භූත මායාකාරී උගුලට අහුවෙන්න."

"අපේ අනිත් කට්ටිය ඉක්මනින් ම මෙහාට එයි. එතකොට ඔයා හොඳට ම ආරක්ෂා සහිතයි" බෙස්ව සනසන අටියෙන් නැන්සි කිවා ය.

"මෙතන ඉන්න කොට බයට ම මගේ ඇඟේ හිරිගඩු පිපෙනවා." බෙස් කන්කෙඳිරි ගාන්නට වූවා ය.

"ඔය ඉඳලා හිටලා ටිකක් හිරිගඩු පිපුණට ඒකෙන් ඔයාට ඒ තරම් හානියක් වෙන එකක් නෑ." ජෝර්ජ් බෙස්ට උසුළු විසුළු කළා ය.

අනෙක් ගැහැනු ළමයි පිරිස පැමිණි විට මේ තිදෙනාත් ඔවුන් සමග වාඩිවීමට ගියෝ ය. ටැරෙන්ටෙලාගේ භූතාවේෂය හා ඇගේ අසාමාන්‍ය ගති ගැනත් නැන්සිට සිදුවීමට ගිය අනතුර පිළිබඳවත් බෙස් අන් අයට සියලු විස්තර කොඳුරා කිවා ය.

හෙලන් සිනාසුණා ය. "ඒ කියන්නේ මේ වැඩෙන් අපිට සැහෙන විනෝදයක් ලබන්න පුළුවන් කියන එකයි. ආ !"

"මම හිතනවා භූතයෙක් වලාකුළු සුළියක් වගේ ඇවිදින් අපෙන් කෙනෙක් ඩැහැගෙන යන එකක් නෑ කියලා ?" බැබ් හෙලන්ගේ කනට කොඳුරා කීවා ය. සෑම කෙනෙකුගේ ම සිතේ දෙගිඩියාවක් ඇති වී තිබුණේ කුමකින් කුමක් සිදුවේද යන බිය නිසා ය.

තවත් ගැහැනු සමග ගැහැනු ළමුන් පැමිණි අතර ඉක්මනින් ම කාමරය පිරී ගියේ ය. ඒ වනවිට සතර අතින් අඳුර ගලාගෙන විත් විශාල කාමරය සැහෙන අඳුරකින් පිරී ගොස් තිබුණි. කාමරය දැඩි නිහඬතාවයක ගිලී ගිය අතර ඒ තුළ සිටි කිසිවෙක් කිසිවක් කතා කළේ නැත. එකිනෙකාගේ හදවත ගැහෙන හඬ අනෙකාට ඇසෙන තරම වේගවත් විය.

පසුපස කාමරයේ සිට දොර තුළින් විශාල කාමරයට පාවී ආ භූතාවේෂණිය කත කාමරය මැද වූ කුඩා පීඨිකාවට නැගුණා ය. ඇය බිම දිගේ ඇතිල්ලෙන තරම් දිග ලෝගුවක් ඇඳ සිටි අතර ඉතා දිගු බොරු කොණ්ඩයක් පැළඳ සිටියා ය. ඇගේ ඇඳුම කාමරය තුළ වූ මඳ එළියෙන් බැබළුණේ සතර අතට දීප්තිය විහිදුවමිනි. ඇගේ හිසමත දේදුණු පැහැයෙන් බබළන ඔටුන්නකි. අතෙහි වූ යෂ්ටියෙහි කෙළවරින් කුඩා ආලෝකයක් විහිදෙයි.

ජෝර්ජ් කිංකිණි සිනහවක් නගමින් නැන්සි දෙසට නැවී, "ඈ හරියට සින්ඩරෙල්ලගෙයි, මන්තරකාරියකගෙයි එකතුවක් වගෙයි" කීවා ය.

පීඨිකාවේ මැදට සෙමින් සෙමින් ළඟාවුණු භූතාවේෂණිය අර්ධ කවාකාර ලෙස යෂ්ටිය කිහිප වතාවක් වැනුවා ය. ඉන් පසුව සෙමින් ඈ ගැඹුරු ඒකාකාරී හඬකින් කතා කිරීමට පටන් ගත්තා ය.

"මිය පරලොව ගිය අයගේ කාරුණික ආත්මයනි," ඈ තියුණු උස් ස්වරයකින් කීවා ය. "මෙහි එකතු වී සිටින අය වෙනුවෙන් කතා කරනු මැනවි. අපහට ඔබගේ පණිවිඩ ලබා දෙනු මැනවි."

කුඩා නිවි නිවී දැල්වෙන එළි ඇගේ හිසට ඉහළින් දීප්තිමත්ව බැබළෙන්නට පටන් ගත්තේ ය. තත්පර කිහිපයක දී ඉහළ හඬකින් ගැහැනු කටහඬක් ඉතා දුරක සිට කතා කරන ආකාරයෙන් ඇසෙන්නට විය. "මාගේ දියණිය, ඔබ අතර වාඩිවී සිටිනවා මාර්තා, මම ඔබට කිව යුතුයි. ඔබ ඔයිට වඩා මුදල් පරිහරණයේ දී පරිස්සම් සහගත විය යුතු බව" එම කටහඬ කෙඳුරුවේ ය.



එම කටහඬ නතර වූ අතර වැරෙන්ටෙලා ඇයගේ යෂ්ටිය ඉතා ඉහළට ඔසවා රැස්ව සිටින පිරිස දෙස බලා "මාර්තා නම් කෙනෙක් මෙහි සිටිනවා ද?" යනුවෙන් ඇසුවා ය. පිරිස අතර කසු කුසුවක් පැතිර ගියේ ය. පිරිස මැදින් ඉකිගසමින් හඬන හඬක් නැගී ආවේ ය. සැමදෙන ම ඒ දෙස බැලූහ. "ඔව්, ඉන්නවා ! ඔව්, ඉන්නවා ! අනේ මගේ ආදරණීය අම්මා ! ඇය ජීවත් වෙලා ඉන්න කොට හැමදාම මට පරිස්සමින් මුදල් පරිහරණය කරන්න කියලා උපදෙස් දුන්නා" යැයි මහ හඬින් කීවා ය.

බෙස්, නැන්සිගේ අතින් අල්ලා ගත්තා ය. "අනේ මට නම් මෙක තව දුරටත් දරාගන්න බෑ, මට හරිම බයයි. අනේ කරුණාකරලා අපි යමු" යැයි කීවා ය.

ඔවුන්ට හැරීමටවත් ලැබුණේ නැත. භූතාවේෂණිය වැරෙන්ටෙලා නැවත කතා කරන්නට වූවා ය. ඇගේ යෂ්ටිය නරඹන්නන් දෙසට වනමින් ඈ මෙසේ කීවා ය. "මෙතන බියසුලු, සැකයෙන් යුතු කෙල්ලක් ඉන්නවා. ඇගේ නම බෙස්. අහෝ ! මළවුන්ගේ ආත්ම, ඇගේ විශ්වාසය තහවුරු කිරීම සඳහා ඇයට අනාවැකියක් ගෙන ඒමට ඔබලාට හැකිද?"

බෙස් බියෙන් පාෂාණිභූතව සිටි තැන ම වාඩි වූවා ය. වැරෙන්ටෙලා අදහස් කළේ තමා ගැනද? ඇගේ හදවත බියෙන් සැලෙන්නට විය. ඈ නැන්සිගේ උරහිස මත හිස තබා ගත්තා ය. නැන්සිගේ අතැඟිලි පටලවා තදින් මිරිකා ගත්තා ය.

නැන්සි හා ජෝර්ජ් පුදුමයට පත්ව කිසිම හැඟීමකින් තොරව දැඩි අවධානයකින් යුතුව භූත ලෝකයෙන් දැන් පැමිණීමට නියමිත අනාවැකි ඇසීමට දෙසවන් යොමු කළෝ ය.

ඒ සමග ම ගැඹුරු පිරිමි කටහඬක් කොඳුරන හඬකින් නැගී ආවේ ය. "මම නුඹගේ නගරයේ විවාහ ලියාපදිංචි කාර්යාලයේ ප්‍රධානියාව සිටියා, බෙස් මාවින්, මට නුඹට කීමට ඇති පණිවිඩය නම් තව නොබෝ දිනකින් නුඹ විවාහ ලියාපදිංචි කාර්යාලයට නුඹේ ම විවාහය ගැන කතා කිරීමට යනු ඇති බවයි."

බෙස් අසිහියෙන් මෙන් නැන්සිගේ උකුලේ වැතිරුණා ය. හිස දැතින් බදාගත් ඈ මහ හඬින් ඉකිගසන්නට වූවා ය.

"ඒක වෙන්න බෑ මම තාම ඉස්කෝලේ යන කෙල්ලෙක්" ඈ ළය පුපුරා යන තරම් සුසුමක් සමගින් කීවා ය.

නැන්සි අසරණ බෙස් වටා දැත් යවා ඈ තුරුල් කර ගත්තා ය. එවිට ම ජෝර්ජ් "අපි දැන් ගියොත් හොඳයි" යනුවෙන් කීවා ය.

එවර ආපසු යාමට නැන්සි එකඟ වූවා ය. ගැහැනු ළමයි පිරිස පිටත් වීමට සූදානම් වෙනවාත් සමග ම මහ හඬින් ගිගුම් දෙමින් අකුණු පුපුරන්නට පටන් ගත්තේ ය.

බෙස් පෙරටත් වඩා බියට පත් වූවා ය. ඇගේ සියොලඟින් දහදිය ගංගාවක් මෙන් ගලා හැලෙන්නට විය. "ඕ ! මට බෑ, මේ මහා අකුණු මැද්දේ එළියට යන්න. මම මේ ඔක්කෝම දේවල්වලට වඩා අකුණුවලට බයයි." ඈ වෙව්ලන්නට වූවා ය.

"ඔයාට මතක නැද්ද?" නැන්සි ඇයට කොඳුරා කීවා ය. "මේ මේඝ ගර්ජනා භූත සභාවේ කොටසක් විතරයි. එළියෙ එහෙම අකුණු ගහන කුණාටුවක් ඇත්තේ නෑ"

නැන්සිගේ අත අල්ලාගත් බෙස් සෙමින් නැගිට තම අඹ යහළුවන් සමග කුඩාරමෙන් පිට වූවා ය. කුඩාරමෙන් පිටත වර්ෂාවක් නොතිබුණත් කුණාටුවක් නැගී ගෙන ආවේ ය. අවට ගස් කොළන් වේගයෙන් ඇඹරී යන්නට විය. ළමයි පිරිස දුවමින් මෙන් මෝටර් රථය දෙසට ඉක්මන් ගමනින් ගියෝ ය.

ඔවුන් සිටි තැනට මඳ දුරකින් කුඩා උද්‍යානයක් තිබුණු අතර එහි මැද වානේ කොඩි කණුවක් සිටුවා තිබුණි. කිසිදු විදුලි කෙටීමකින් තොරව අකුණු පහරවල් අහසින් කඩා වැදුණේ ය. ඒවා කොඩි කණුවේ වැදුණු අතර පිටිය සිසාරා ආලෝකය විහිදුවමින් පැතිර ගියේ ය.

"ඌයි !" ජෝර්ජ් හදිසියේ ම කෑගැසුවා ය.

විසර්ජනය වෙතින් නිකුත් වූ විදුලි ධාරාවක් වැදීමෙන් ඇය බිම විසි වී පෙරළී ගියා ය. නැන්සිටත් බෙස්ටත් තමන්ව වෙව්ලුම් කවමින් විදුලි ධාරා තම ශරීරය හරහා ගමන් කරනු ඇතිණි.

"ඔයාට තුවාලයි ද?" නැන්සි ජෝර්ජ්ව අල්ලා ගැනීමට ඉදිරියට පනිමින් ඇසුවා ය.

ඇගේ මිතුරිය නැගිට සිට ගනිමින් මෙසේ කීවා ය. "මාව එක ම ගුලියක් වගේ ඇඹරිලා ගියා. තව පාරක් වැදුණොත් ඉවරයි. මම මීට පස්සේ නම් අකුණු ගැන මීට වඩා පරිස්සම් වෙනවා." අමාරුවෙන් නැගිට ගත් ඈ සෙමෙන් ඉදිරියට ඇදෙන්නට පටන් ගත්තා ය. ගැහැනු ළමෝ තිදෙන මෝටර් රථය අසලට ඇවිදගෙන



ගියහ. රියදුරු අසුන ළඟ දොර විවර කිරීමට ගිය නැන්සි අමුතු යමක් සිදුවී ඇතිවාක් මෙන් එක් වර ම නතර වී කල්පනා කරන්නට වූවා ය.

"මම මේ දොර අගුල් ලෑවේ නෑ. ඔයාලා කවුරු හරි මේ දොරට අගුල් දැම්මද ?"

"නැහැ," දෙදෙනාගේ ම පිළිතුර විය.

අනිත් පැත්තේ දොර පරීක්ෂා කළ විට එය ද අගුල් දමා ඇති බව දක්නට ලැබුණි. මෙය කළේ කවුදැයි නැන්සි කල්පනා කරන්නට වූවා ය. "මෙතනින් ගිය අපේ කෙනෙක් ම විහිළුවට අගුල තද කරලා යන්න ඇති" ජෝර්ජ් එකහෙලා කියා සිටියා ය.

"සමහරවිට," කියූ නැන්සි යතුර දමා දොර විවර කළා ය. මෝටර් රථය තුළ තද උණුසුමක් පැවතිණි. තම ස්වෙටරය ගැලවූ බෙස් ඉදිරිපස අසුනේ වාඩි වී එය හිසට ඉහළින් පසුපස ආසනයට විසි කළා ය.

"ඔයාලා මොකක්ද හිතන්නේ මම ඉක්මනින් ම විවාහ ලේකම් කාර්යාලයට යයි කියලා අර භූතාත්මය කියපු දේ ගැන" බෙස් අනෙක් දෙදෙනාගෙන් විමසුවා ය.

"ඒක කවදාහරි වෙන දෙයක්නේ. සමහරවිට අර තක්කඩි භූතයා ඔයාව රවට්ටන්න හැදුවා වෙන්න පුළුවන්"

බෙස් ලැජ්ජාවෙන් රතු වූවා ය. "නමුත් ඒකා මාව හොඳට ම බය කළා"

ඔවුන් අවන්හලට ළඟා වූ විට බෙස් ඇයගේ ස්වෙටරය ගැනීමට පසුපස ආසනය දෙසට හැරුණා ය. ඒ සමග ම "නැන්සි, මොකක්ද මේ කාඩ්බෝඩ් පෙට්ටිය" යනුවෙන් තරමක් බියපත් ස්වරයකින් ඇසුවා ය.

මේ වචනවලින් නැන්සි තිගැස්සුනා ය. "මම දන්නෙ නෑ. මම එතන කාඩ්බෝඩ් පෙට්ටියක් තිබ්බෙ නෑ" ඇය ඒ දෙස බලමින් කීවා ය. තිදෙනා ම ඉක්මනින් මෝටර් රථයෙන් බට අතර නැන්සි කාඩ්බෝඩ් පෙට්ටිය අතට ගත්තා ය. "ඒක සැහෙන්න බරයි" අමාරුවෙන් එය ඔසවමින් ඈ කීවා ය. "මට හිතාගන්නවත් බෑ මොනවද මේක අතුලේ තියෙන්නේ කියලා."

හදිසියේ ම බෙස්ගේ සිතේ අනතුරක සේයාවක් නැගී ආවා ය.

"නැන්සි ඒක බිම තියන්න. පෙට්ටිය අරින්න එපා. ඒක ඇතුළේ බෝම්බයක් තියෙන්න පුළුවන්"

# 08

නැන්සි පරිස්සමින් පෙට්ටිය අවන්හලට ඇතුළු වන පාර උඩින් තැබුවා ය. ඉන්පසු ඈ සමාධිගත වූවාක් මෙන් පෙට්ටිය දෙස බලා සිටින්නට වූවා ය.

අවසානයේදී සැනසුම් සුසුමක් හෙළූ ඈ, "මම විශ්වාස කරන්නේ නෑ ඒක ඇතුළේ බෝම්බයක් ඇති කියලා. අපිව ඉලක්ක කරගෙන බෝම්බයක් අටවලා තියෙනවා නම් මේ වෙන කොට ඒක පුපුරලා අපේ කෑලිත් ඉතුරු වෙන්නේ නෑ"

පෙට්ටිය නොඇරින ලෙස බෙස් නැන්සිට ආයාචනා කළාය. "සමහරවිට ඔයා පෙට්ටියේ පියන අරිද්දී ම ඒක පුපුරවන්න ලෑස්ති කරලා තියෙනව ද දන්නේ නෑ".

මේ වන විට ජෝර්ජ්ගේ බිය මුසු කුතුහලය ටිකක් අඩු වී තිබුණේ ය. "මට ඒක ඇතුළේ තියෙන දේ මොකක්ද කියලා බලන්න ආසයි" ඈ කීවා ය.

වටපිටාවෙන් පෙට්ටිය විවෘත කිරීමට සුදුසු උපකරණයක් සොයා ගැනීමට නැන්සි වටපිට බැලුවා ය. පසෙක දමා තිබුණු දිග මිටක් සහිත රේක්කයක් ජෝර්ජ්ගේ නෙත ගැටුණි. "මෙකෙන් අපිට දුර ඉඳලා පෙට්ටිය අරින්න පුළුවන් වෙයි."

රේක්කය අතට ගත් ඈ එය නැන්සිට දුන්නා ය. තමන් ආරක්ෂා සහිත යැයි හැඟුණු දුරක සිට නැන්සි රේක්කයේ උපකාරයෙන් පෙට්ටි පියන මඳින් මඳ එසෙව්වා ය. පියන පැත්තකට පෙරළී වැටුණි.

ගැහැනු ළමයි තිදෙන මහ හඬින් සිනාසෙන්නට වූයේ පෙට්ටිය කොළ ගොඩකින් පිරී තිබුණු හෙයිනි.

"මොනතරම් මෝඩ විහිළුවක් ද?" බෙස් සිනාසෙමින් කීවා ය.

නැන්සි අනෙක් දෙදෙනාත් කැඳවා ගෙන වඩාත් ළංවී පෙට්ටිය



දෙසට නෙත් යොමු කළා ය. එය පිරී ඇත්තේ ලිපි හා වෙනත් ලිය කියවිලිවලින් බව පෙනෙන්නට තිබුණි. පෙට්ටියේ උඩින් ම තිබුණේ අතින් ලියන ලද ඉල්ලීමකි.

"නැන්සි ඩ්‍රීව්, මා නැවත රැගෙන යාමට එනතුරු මේ ලියකියවිලි ප්‍රවේශමෙන් තබා ගන්නා ලෙස යටහත්ව ඉල්ලා සිටිමි."

එයට අත්සනක් යොදා නොතිබිණි. නමුත් මේ ලියකියවිලි ටැරෙන්ටෙලා ප්‍රවේශම් කිරීම සඳහා රැගෙන යාමට කියූ ලියකියවිලි ම බව තමාට සහතික යැයි නැන්සි කියා සිටියා ය.

"ටැරෙන්ටෙලා කොහොම හරි ඔයාට ඒ ලියකියවිලි ලැබෙන විදිහට කටයුතු කරලා තියෙනවා. ඔයා දැන් මේවට මොකද කරන්නේ" ජෝර්ජ් ඇඩි හුස්මක් පහත හෙලමින් කීවා ය.

"මම තාත්තාට කතා කරලා ඔහුගෙන් උපදෙස් ගන්න ඕනෑ"

ඇය නිවසට කතා කළ විට අවාසනාවකට මෙන් නිවසින් පිළිතුරක් නොලැබුණි.

මෙ අතර බෙස් සහ ජෝර්ජ් මේ පෙට්ටිය කවුරුන් විසින් කොයි මොහොතේ මෝටර් රථයට දමන්නට ඇද්දැයි යන්න පිළිබඳ ව සාකච්ඡා කළහ.

"ඒක සිද්ධ වෙන්න ඇත්තේ අපි මළවුන්ගේ සභාව පැවැත්වෙන කාමරේ ඉන්න කොට. හරියට ම ටැරෙන්ටෙලා එතැනට එන්න කලින්" ජෝර්ජ් තම විනිශ්චය ඉදිරිපත් කළා ය. "එයා තමයි මෝටර් රථය අගුළු ආන්න ඇත්තෙත් ලියකියවිලි කාටවත් හොරකම් කරන්න බැරි වෙන්න."

නැන්සි සහ අනෙක් දෙදෙන නිදා ගැනීමට සූදානම් වන අතරතුර දී ටැරෙන්ටෙලාගේ කූඩාරමේ දී දකින්නට ලැබුණු අමුතු ආකාරයේ සිදුවීම් මාලාව ගැනත්, ලියකියවිලි ප්‍රවේශම කිරීමේ කාර්ය නැන්සිට ම පැවරීමේ යටි අරමුණු කුමක් විය හැකි ද යන්න පිළිබඳවත් බොහෝ වෙලාවක් සාකච්ඡා කළෝ ය.

"මොකක් හරි දුෂ්ට අදහසක් මේ වැඩේට යටින් තියෙනවා." බෙස් ප්‍රකාශ කළා ය. "මම තදින් ම කියනවා නැන්සි, භූත දඩයක්කාරයින් මේ අබිරහස විසඳීම අතහැරලා දැම්මත් අර රැවටිලිකාර ගැහිත් එක්ක තව දුරටත් සම්බන්ධකම් පවත්වන්න යන්න එපා කියලා"

පසුදින උදේ ආහාරයට පෙර නැන්සි නිවසට කතා කළ අතර ඇගේ පියා නිවසේ සිටියේ ය.

ඇගේ කතාවට හොඳින් සවන් දුන් ඔහු, "මේ ලියකියවිලි ඔයා තියා ගන්න එපා. වහා ම ඒවා භූතාවේෂණිය ටැරෙන්ටෙලාට ගිහින් බාර දෙන්න" කියා ඇයට උපදෙස් දුන්නේ ය.

"ඔක්කෝම හරි තාත්තේ, මට උවමනා කළේ මා ළඟ ඒවා තියාගෙන ටැරෙන්ටෙලා නීති විරෝධී දෙයක් කළොත් ඒවා ඇයට විරුද්ධව පාවිච්චි කරන්න නෙමේ. ඒවාට මොනව ද මම කරන්න ඕනෑ කියලා හරියට ම දැන ගන්නයි."

ඒ ලියකියවිලි පෞද්ගලික දේපළක් බව ඇගේ නීතිඥ පියා ඇයට සිහිපත් කර දුන්නේ ය. "ටැරෙන්ටෙලා ඒවා ඔයා ළඟ පරිස්සමට තියාගන්න දුන්නත් ඒවා කියවන්න ඔයාට එයාගේ අවසරය දුන්නේ නැති බව මතක තියා ගන්න."

"එහෙනම් හොඳයි තාත්තේ, මම ඒවා නැවත ගිහිල්ලා දෙන්නම්"

උදේ කෑම මේසයේ දී නැන්සි පෙරදා සිදුවූ සියල්ල නෙඩ්, බ්‍රෙට් හා ඩේව්ට පැවසුවා ය. නමුත් ඇය බෙස් පිළිබඳ ව අනාවැකිය ඔවුන්ට කීවේ නැත. ඉන් බෙස් ලැජ්ජාවට පත් වෙතැයි ඈ සිතුවා ය.

"ඔයාලා භූතාවේෂණියගේ කූඩාරමට මාත් එක්ක එනව ද?"

"අපෝ ඔව්," ඩේව් පිළිතුරු දුන්නේ අතක් ඔසවමිනි. "මට මේ අමුතු සතාව බලා ගන්නකම් ඉවසිල්ලක් නෑ."

ටික වේලාවකින් කණ්ඩායමේ සෑහෙන පිරිසක් වර්නෝවයිල් හි සිට කෙළින් ම ටැරෙන්ටෙලාගේ කූඩාරම වෙත මෝටර් රියකින් ගමන් කරනු දැකිය හැකි විය.

දිගින් දිගට ම දොරට තට්ටු කළත් කූඩාරම තුළින් පිළිතුරක් නොනැගිණි.

"ඔයා හිතන්නේ එයා ගෙදර නෑ කියල ද, නැත්තම් එයා අපි ඇතුළට එන විට කැමති නෑ කියල ද?" ජෝර්ජ් ඇසුවා ය.

නැන්සි උරහිස් අකුළා තමන්ට පිළිතුරක් දිය නොහැකි බව ඇඟෙව්වා ය. ඉන්පසුව මඳ වේලාවක් සාප්පු සවාරියේ යෙදී නැවත පැමිණ බැලිය යුතු යැයි යෝජනා කළා ය. එවිට ම වාගේ තරුණ



කාන්තාවක් පාරෙන් අනිත් පස ඇති නිවසකින් පිටට පැමිණියා ය.

"ඔයාලා හොයන්නේ භූතාවේෂණිය ටැරෙන්ටෙලාව ද?" ඔවුන්ගෙන් හඬ ගා ඇසුවා ය.

"ඔව්, එයාව තමයි" නැන්සි ද උස් හඬින් ම පිළිතුරු දුන්නා ය.

කාන්තාව සිනාසී මෙසේ කීවා ය. "මම හිතන්නේ නෑ එයා නවදුරටත් මෙතන සාත්තර කියයි කියලා"

"මොකක් ?" ජෝර්ජ් ඇසුවා ය.

පාන්දර දෙකට පමණ මෝටර් රථයක් හා ට්‍රක් රථයක් කූඩාරමට පැමිණි බවත් පෙට්ටි, සූට්කේස් හා වෙනත් භාණ්ඩ සහ උපකරණ වාහන දෙකට පටවනු තමා දුටු බවත් අසල්වැසි කාන්තාව පැවසුවා ය.

"ඊට පස්සේ මෝටර් රථයට නැගිලා ටැරෙන්ටෙලාත්, ඒකේ හිටපු මිනිස්සු දෙන්නත් පිටවෙලා ගියා."

"සමහරවිට එයාව පැහැරගෙන ගියා වෙන්න පුළුවන්. ටැරෙන්ටෙලා අපේ මිතුරියට ඊයේ රෑ කිව්වා කවුද මිනිහෙක් එයාට කරදර කරලා ඇගෙන් ලියවිලි වගයක් හොරකම් කරන්න මාන බලනවා කියලා" බෙස් කීවා ය.

මේ ඇසූ අසල් වැසි කාන්තාව බියෙන් තැති ගත්තා ය. "ඇත්තට ම ඒක නම් සිද්ධවුණේ මම හිතනවා පොලීසිය මගෙන් ඒ මිනිස්සු දෙන්නා ගැන තොරතුරු අහන එකක් නෑ කියලා. මම කැමති නෑ ඕවට පැටලෙන්න. ඒ ඇරත් මම ඒ මිනිසුන්ව හරියට දැක්කෙත් නෑ"

"ඔයා ඒ මිනිසුන්ව හොඳට දැක්ක ද?" නැන්සි ප්‍රශ්න කළාය.

"එක මිනිහෙක් කෙට්ටුයි උසයි. කැරලි ගැහුණු කොණ්ඩයක් තිබුණේ. අනෙකා මිටි මිනිහෙක්." මේ ඇසූ භූත දඩයක්කරුවෝ විස්මයෙන් යුතු ව එකිනෙකාගේ මුහුණු බැලූහ. කෙට්ටු උස කැරලි සහිත කොණ්ඩයක් ඇති මිනිසා විල්බට් ප්‍රීට්සර් විය හැකි ද?

"භූතාවේෂණිය ටැරෙන්ටෙලා මෙතැනින් මකබෑව්ච්ච එක ගැන නම් මට සතුටුයි" අසල්වැසි කාන්තාව දිගට ම කියා ගෙන ගියා ය.

"ඇයි එහෙම කියන්නේ" නෙඩ් එක එල්ලේ ඈ දෙස බලමින් ඇසුවේ ය.

"මොකද හිටපු ගමන් හරි ම විකාර පෙනුමක් තියෙන මිනිස්සු මෙහෙ එන්න යන්න පටන් ගත්ත නිසා"

"ඔයා ඒකෙන් අදහස් කළේ කපටි එහෙම නැත්නම් තක්කඩි පෙනුමක් තියෙන මිනිස්සු ටැරෙන්ටෙලාව මුණ ගැහෙන්න ආවා ගියා කියන එක ද?" නැන්සි වඩාත් විමසිලිමත් වෙමින් ඇසුවා ය.

"මට ඒක හරියට ම කියන්න බෑ. මම දැන් යන්න ම ඕනෑ" එසේ කියූ ඇ ඉක්මන් ගමනින් ඔවුන්ගෙන් ඉවත්ව ගියා ය.

භූත දඩයක්කරුවන් නැවත අවන්හල වෙත පැමිණි පසුව නැන්සි පියා ඇමතුවා ය.

"ඇත්ත වශයෙන් ම ඔයා මේකට ගෑවෙනවාට මම කැමති නෑ" ඇගේ පියා ඇයට කීවේ ය. "මම දන්න නීතිඥ මහත්මයෙක් ඉන්නවා වර්නෝවයිල් වල. එයාගේ නම කාට්රිජ්. මම එයාට කතා කරලා බලන්නම් එයා කැමති ද කියලා ඔය පෙට්ටිය එයාගේ සේප්පුවේ තියා ගන්න. ඒ වගේ ම එයාට පුළුවන් නම් අතුරුදහන් වුණු භූතාවේෂණීය කාන්තාව ගැන සොයා බලන්න කියලා පොලීසියෙන් ඉල්ලීමක් කරන්නත් කියලා මම කියන්නම්. සමහරවිට ඇඳුව පැහැරගෙන ගිහිල්ලා වෙන්න පුළුවන්"

ඩ්‍රිව් මහතා තව දුරටත් නැන්සිට කොහේවත් නොගොස් කාමරයේ නැවතී සිට තමාගෙන් දුරකථන පණිවිඩයක් ලැබෙන තුරු සිටින ලෙස ද කීවේ ය. ඉන් පැය බාගයකට පමණ පසුව ඇයට කාට්රිජ් මහතාගෙන් දුරකථන ඇමතුමක් ලැබුණි. ඉන් කියවුණේ ඔහු ඉක්මනින් ම ඇය හමුවීමට එන බව ය.

"කරුණාකරලා මාව බලාපොරොත්තුවෙන් ඉන්න" ඔහු ඉල්ලා සිටියේ ය. මම ඔයාගේ කාමරයට ඇවිත් ලියකියවිලි පෙට්ටිය බාර ගන්නම්. ඔයාගේ තාත්තා කිව්ව විදිහට ඔයා ලියකියවිලි පෙට්ටිය අරගෙන පාරට එන එක හොඳ මදි"

තමා කාමරයේ ම නතර වී සිටින බවට නැන්සි පොරොන්දු වූවා ය. ජෝර්ජ්ට සහ බෙස්ට තව දුරටත් කාමරයේ රැඳී සිටීම අවශ්‍ය නොවන බව ඇය පැවසුවා ය. "මම ටික වේලාවකින් ඔයාලට එකතු වෙන්නම්"



"අපි අනිත් අයවත් එකතු කරගෙන පිහිනුම් තටාකයට යනවා" ජෝර්ජ් කිවා ය. "මම දැකපු විදිහට හරිම අපූරු වතුර ටික"

ඒ දෙදෙන පිටත් වී නොබෝ වේලාවකින් ම දොරට තට්ටු කරන ශබ්දයක් ඇසුණෙන් නැන්සි දොර විවර කළා ය.

"ආ ! හෙලන්" ඇ කිවා ය.

"මොකද ඔයා තනියෙන්?" කාමරයට ඇතුළු වෙමින් හෙලන් ඇසුවා ය.

"මම අපේ තාත්තාගේ යාළුවෙක් එනතුරු බලාගෙන ඉන්නවා"

නැන්සි ලියකියවිලි පෙට්ටිය තබා තිබුණු මේසය අසලින් කාමරය තුළට පැමිණි හෙලන්ගේ අත වැරදීමකින් පෙට්ටියේ හැපුණි. පෙට්ටිය "දඩාස්" යන හඬක් නගමින් බිම වැටුණු අතර කඩදාසි කොළ කාමරය තුළ හතර අත විසිර ගියේ ය.

"මට සමාවෙන්න"

"අපි ඉක්මනට ම ඒවා ඇහිඳිමු. එන්න මම උදව් කරන්නම්"

නැන්සි කඩදාසි සියල්ල පෙට්ටියේ තැන්පත් කරන්නට යුහුසුලු වූවාය. ඒ අතර කඩදාසි ගොන්නෙහි වූ ඉඩමක් සංවර්ධනය කිරීම පිළිබඳව අඳින ලද කටු සටහනක් වෙත ඇගේ ඇස් යොමු විය. ඒ ගැන වැඩි සැලකිල්ලක් නොදැක්වූ ඇ දිගට ම කඩදාසි ඇහිලීමෙහි නිරත වූවා ය.

"ඕ !" එක්වර ම ඇ විස්මයෙන් යුතු රාවයක් නැගුවා ය.

"මොකක්ද ප්‍රශ්නේ ?" හෙලන් ඇසුවා ය.

"මේ ලිපියක් තියෙනවා භූතාවේෂණීය ටැරෙන්ටෙලාට විල්බට් ප්‍රීට්සර්ගේ අත්සනින් එවපු" කඩදාසියක් රැගෙන නැගී සිටිමින් නැන්සි කිවා ය. හෙලන් ඉන් පුදුමයට පත් වූ අයුරක් දක්නට ලැබිණි. "ඔයා හිතනව ද ටැරෙන්ටෙලායි, ප්‍රීට්සරුයි අතර මොකක් හරි සම්බන්ධයක් තියෙනවා කියලා"

"ඔව්, ඒකෙන් මගේ සැකය තවදුරටත් තහවුරු වෙනවා"

නැන්සි කඩදාසි එකතු කරන අතර දී ඇගේ අතට නැවතත් වැදගත් ලියවිල්ලක් පත්විය. මෙවර එය විදුලි පණිවිඩයකි. එහි

යවන්නාගේ නම හා ලිපිනය කියවීමට නොහැකි සේ කපා දමා තිබුණි. එය භූතාවේෂණීය ටැරෙන්ටෙලාට යොමුකර තිබුණු අතර, එයින් කියවුණේ "අසාමාන්‍යයි. භූතාවිෂ්ටය, අනභිභවනීය යි" "ඒකේ තේරුම මොන කෙහෙල් මලක් ද?" හෙලන් කිසිවක් තේරුම් ගත නොහැකි අයුරින් උඩ බිම බැලුවා ය.

නැන්සි මඳ සිනහවක් පෑවා ය. "මට හිතාගන්න පුළුවන් එක ම දේ මේක තැන් තැන්වලින් වචන මාරු කරලා ලියලා තියෙන එකක්. ඒ වගේ ම රහස් සංඥාවක් ඒකේ සැඟවිලා ඇති. සමහරවිට භූතාවිෂ්ටය කියලා තියෙන්නේ ටැරෙන්ටෙලාට වෙන්න පුළුවන් වගේ ම ඇය තමන්ට නියම වෙලා තිබුණු යම් කිසි වැඩක් ඉතා ඉහළින් ඉටු කරලා තියෙන බව අපට හිතා ගන්න පුළුවන්"

"දක්ෂ විදිහට ඔබ පැහැදිලි කළා"

හෙලන් නැන්සිගේ උත්සාහය අගය කරමින් කිවා ය.

විවිධ අදහස් රාශියක් හා තර්ක විතර්ක රාශියක් නැන්සිගේ සිතේ මතුවෙමින් පැවතියේ ය. කඩදාසි සියල්ල පෙට්ටියේ තිබී පරිදි තැම්පත් කළ ඈ එය මේසය මත දොරට සමීප වන්නට තැබුවා ය.

නැන්සි හෙලන් සමග කතා කරමින් ම අවුල් වී ඇති තම කෙස් වැටිය පීරා සකස් කර ගැනීමට බිත්තියේ සවිකර ඇති කැඩපත වෙත ගියා ය. කැඩපත තුළින් දොර සහ මේසය මත වූ පෙට්ටිය හොඳින් දැකගත හැකි විය. ඊළඟ මොහොතේ කැඩපත තුළින් දුටු දෙයින් නැන්සි ගල් ගැසුණා ය.

කැඩපතෙහි වූ දර්ශනය පෙන්නුම් කළේ පිරිමියෙකුගේ හැඩි දැඩි අතක් බාගෙට විවර වී ඇති දොර තුළින් ඇතුළු වී මේසය දෙසට ඇදෙමින් තිබෙන බව ය. එම අත ලියකියවිලි පෙට්ටිය දෙසට යොමු වී එය ඩැහැ ගැනීමට ඔන්න මෙන්න කියා තිබුණි.



# 09

වේගවත් පිම්මක් සමගින් නැන්සි කාමරය හරහා දිව ගියා ය. ඈ නොපෙනෙන මිනිහාගේ ශක්තිමත් අත්වලින් අල්ලා ගත්තා ය. පිටතින් කෑගැසීමක් ඇසුණු අතර වේගවත් ඇදීමක් සමග අත් දෙක නැන්සි වෙතින් ගිලිහී ගියේ ය.

"හෙලන් ඔයා දොර අගුල දා ගන්න" යි කෑගැසූ නැන්සි පිටත ශාලාව දෙසට දිව්වා ය.

පිදුරු තොප්පියක් පැලඳ සිටි උස කෙට්ටු මිනිහෙක් තොප්පිය මුහුණ වැසෙන සේ පහළට ඇදගෙන ශාලාවෙන් පිටවෙන දොර දෙසට දිව යමින් සිටියේ ය. නැන්සි ඔහු පසු පස්සේ පැන්නුවා ය.

ශාලාවේ දොර කෙළින් ම අවන්හලේ උද්‍යානය වෙත යොමු වී තිබුණු අතර පිහිනුම් තටාකය වූයේ එහි ය. හොරෙක් යැයි සැක කරනු ලැබූ මිනිසා උද්‍යානය හරහා දිවයමින් සිටි අතර හිරු එළිය නාමින් සිටි අය ඒ දෙස හිස ඔසවා ප්‍රශ්නයක් සහිත මුහුණුවලින් ඔහු දෙස බැලූහ. ඔවුන්ට තවත් ප්‍රහේලිකාවක් වූයේ නැන්සි ඔහු පසු පසින් පන්නා යෑම ය.

"ඔහුව අල්ල ගන්න !" නැන්සි නෙඩ් ඇතුළු අනිත් පිරිමි ළමුන්ට කෑගසා කීවා ය.

ඉක්මනින් ම නැගී සිටි ඔවුහු පලායන්නා පසු පස්සේ වැටුණෝ ය. ඉතා ජව සම්පන්නයෙකු වූ මිනිසා උද්‍යානය ඈත කෙළෙවර වූ කෙටි සිමෙන්ති බැම්මෙන් ඉතා පහසුවෙන් පැන්නේ ය. ලුහුබඳින්නෝ ද නිමේෂයකින් එයට උඩින් ඉගිලුණෝය.

නැන්සි හුස්ම ගැනීමට මඳක් නතර වී බිත්තියට හේත්තු වන විට ම බෙස් හා ජෝර්ජ් .සමග අනෙක් දඩයම්කරුවෝ එන්නට පැමිණියහ.

"ඒ කවුද? මිනිහා මොකක්ද කළේ?" ජෝර්ජ් ඇසුවා ය.

නැන්සි සිදුවුණු දේ හති දමමින් ඔවුන්ට විස්තර කළා ය.

"මොනතරම් පහත් වැඩක් ද?" එකවර ම බෙස් කෑගැසුවා ය.

ගැහැනු ළමෝ බොහෝ වේලාවක් ලුහුබැඳ ගිය පිරිස පැමිණෙන තුරු නැවතී මඟ බලමින් සිටියහ. ඔවුහු නිරන්තරයෙන් ම තාප්පයට ඉහළින් හිස ඔසවමින් බැලූහ. අවසානයේ දී ඔවුන් පැමිණියත්, අවාසනාවක මහත; ඔවුන් සමග අත් අඩංගුවට ගනු ලැබූ මිනිසෙක් නොවී ය.

"මිනිහා පැනලා ගියා" නෙඩ් වාර්තා කළේ ය. "පුදුම විදිහෙ ධාවකයෙක් !"

"මම කියන්නේ" බ්‍රෙට් එකතු කළේ ය. "මගේ ජීවිතේට දැක්ක වේගවත් ම මිනිහා"

"මිනිහා කොයි පැත්තට ද පැන ගත්තේ ?" නැන්සි තවත් ප්‍රශ්නයක් නැගුවා ය.

"එහා පැත්තේ තියෙන ගෙවල්වලට පිටුපසින් ඇති වනාන්තරයට ඇතුළු වෙලා නොපෙනී ගියා. අපි කැලෑවේ අනිත් පැත්තට ම මිනිහා පස්සෙන් පැන්නුවා. එහා පැත්තේ පාරක් අපිට හම්බ වුණා. මිනිහා මෝටර් රථයකින් පැනලා යන්න ඇති"

මිනිහා අඳුනා ගත හැකි තරමින් ඔහුව දැක ගැනීමට ඔවුන්ට හැකි වූවාදැයි නැන්සි ඇසුවාය.

පිරිමි ළමෝ හිස දෙපසට වැනූ නමුත් නෙඩ් මෙසේ පැවසී ය. "මට හිතෙන්නේ මිනිහාගේ තොප්පියට යටින් කැරලි ගැහුණු කොණ්ඩයක් මම දැක්කා කියලයි."

"ප්‍රීට්සර්" ජෝර්ජ් ප්‍රකාශ කළා ය.

නැන්සි සොරකම පිළිබඳ උත්සාහයත්, තමා හෙලන්ට දොරගුළු ලා ගන්නට කී බවත් ඔවුන්ට කීවා ය.

"මම ඉක්මනට ම යන එක හොඳයි"

නැන්සි කාමරය වෙත ළඟා වන විට යම් කිසිවෙක් ශාලාවේ



සිටගෙන සිටින ආකාරය දුටුවා ය. හොඳින් වැඩුණු සිරුරක් ඇති ඔහුව මීට පෙර දැක ඇති බවක් ඇයට සිහියට නගා ගත නොහැකි විය.

කාමර තුළින් හෙලන් කෑගසන හඬ ඇයට ඇසුණි. කුමක් හෝ අමුතු දෙයක් සිදු වන බවක් හැඟී ගියෙන් ඈ පය ඉක්මන් කළා ය.

"නැන්සි එනකම් මම තමුසෙට ඇතුළට එන්න දෙන්නේ නෑ !"

"එයා ඉක්මනට ආවොත් හොඳයි" ශාලාවේ සිටි මිනිසා කිවේ ය. "මම සෑහෙන්න වැඩ තියෙන මිනිහෙක්"

ඔහු වෙත ළඟාවූ නැන්සි ඔහුට තමා හඳුන්වා දුන්නා ය. "ඉතිං එහෙනම් ඔබ?"

"මම කාට්රිජ්. ඔබේ පියා මට කිව්වා මට මෙහාට ඇවිත් කඩදාසි පෙට්ටියක් ගැන ඔබ එක්ක කතා කර ගන්න කියලා"

"ඔව්, කාට්රිජ් මහත්මයා අපිට පොඩි කරදරයක් වෙලා තියෙනවා. ඒ නිසයි මගේ යාළුවා ඔබට ඇතුළට එන්න දීලා නැත්තේ"

නැන්සි දොර විවර කරන ලෙස හෙලන්ට කෑගසා කීවා ය. දොර විවර වූ පසු ඈ නිතිඥයාට හෙලන් හඳුන්වා දුන්නා ය.

"ඔබට මොකක් හරි කරදරයක් ද?" නැන්සි පසුපසින් කාමරයට එමින් ඔහු විමසුවේ ය. "මට විශ්වාසයි ඔබ මගෙන් මොකක් හරි හඳුනා ගැනීමේ සලකුණක් බලාපොරොත්තු වෙන බවට"

නැන්සි හඬනගා සිනාසුණා ය. "ඔබ එසේ ඇසීමේ දී සිදුවන අපහසුතාවයෙන් මාව ගලවා ගත්තා"

කාට්රිජ් මහතා ඇයට තම රියදුරු බලපත්‍රය හා ක්‍රෙඩිට් කාඩ් කිහිපයක් පෙන්නුවේ ය. නැන්සි පෙට්ටිය සොරකම් කිරීමට තැත් කළ මිනිසා පිළිබඳ ව ඔහුට විස්තර කළා ය.

"මිනිහා පැනලා ගිය නමුත් අපේ අය හිතනවා ඒ විල්බට් ප්‍රීට්සර් කියන මිනිහා කියලා."

ඔහු පිටත ශාලාවේ නවත්වා ගෙන සිටීමට සිදුවීම ගැන හෙලන්, කාට්රිජ් මහතාට සිය කනගාටුව පළ කළා ය.

"ඔබ පරිස්සම් සහගත වීම ගැන මම ඔබට දොස් කියන්නේ නෑ" ඔහු සිනාසෙමින් කිවේ ය.

අනතුරුව නැන්සි දෙස හැරුණු හෙලන් "මට හම්බ වුණා කුඩා, සුදුපාට සිප්පි කටුවක්. මට හිතෙන්නේ ඒක ටැරෙන්ටෙලාගේ පෙට්ටිය බිම වැටුණු වෙලාවේ වැටුණු එකක් වෙන්න ඇති."

සිප්පි කටුව අඟල් පහක් පමණ උස පිරමිඩයක හැඩැති එකකි.

කාට්රිජ් මහතා එයට අතට ගෙන පරීක්ෂා කර බලා "මේක ඉතාම සිත් ඇදගන්නාසුලුයි. මේකට කියන අන්වර්ථ නම තමයි 'ප්‍රාවුඩ්', නියම නම තමයි එපිටෝනියම් ස්කැලාරේ"

නිතිඥයා පැවසූ පරිදි මේ වර්ගය චීනයේ වෙරළාසන්න ප්‍රදේශවල ගැඹුරු මුහුදේ දී ලැබෙන දුර්ලභ ගනයට අයත් සිප්පි කටුවක් බවයි.

"මීට අවුරුදු බොහෝ ගණනකට පෙර මේවාට ඉතා විශාල ඉල්ලුමක් තිබුණත් සොයා ගැනීමට ඉතාම අපහසු වුණා. ඒ කාලයේදී පවා මේ එක සිප්පි කටුවක් ඩොලර් තුන්සියයක් පමණ මිල වුණා.

"චීන්නු මේ සිප්පි කටු හොඳ ආදායම් මාර්ගයක් බව දැක්කා. ඔවුන් සොයා ගත්තා හාල්වලින් සාදාගත්ත මිශ්‍රණයකින් මේවා කෘත්‍රිමව හදන්න පුළුවන් කියලා."

"එයාලට ඒක කරගන්න පුළුවන් වුණාද?" හෙලන් කුතුහලයෙන් යුතුව ඇසුවා ය.

"ඔවුන් ඒ වැඩේ අවුරුදු ගණනාවක් කරගෙන ගියා" කාට්රිජ් මහතාගේ පිළිතුරු විය.

"නමුත් අවසානයේ දී සිප්පිකටු එකතු කරන්නෙක් ඒ එකක් වතුරෙන් සෝදලා පිරිසිදු කරන්න උත්සාහ කළා"

"ඒක දියවෙලා ගියා ද?" නැන්සි සිනාසෙමින් ඇසුවා ය.

"හරියට ම හරි, අද කාලයේ මේ වර්ගයේ සිප්පි කටු ඕනෑ තරම් තියෙනවා මුහුදේ ගැඹුරේ. කිමිදෙන කිමිදුම්කරුවෝ මේවා ඕනෑ තරම් ගෙනෙන නිසා. නමුත් මේ පැරණි කෘත්‍රිම ප්‍රාවුඩ් සිප්පි කටු ඇත්ත ම ඒවාට වඩා හුගාක් වටිනවා කියලා මම අහලා තියෙනවා"



නැන්සි සිප්පි කටුව හොඳින් පිරික්සා බැලුවත් එහි කිසි ම ආකාරයේ සලකුණක් දක්නට නොවී ය. ඇය නැවත "එපිටෝනියම් ස්කාලාරේ" එක පෙට්ටියට දැමුවා ය.

"මම මේ පෙට්ටිය, වටේ පිටේ ඉන්න කාටවත් ම අඳුනගන්න බැරි වෙන්න හොඳට ඔතන්නම්" නැන්සි කාට්රිජ් මහතාට කිවා ය.

කබඩ් එකෙන් විශාල කඩදාසියක් සොයා ගත් ඈ පෙට්ටිය එහි හොඳින් එතුවා ය. ඉන් පසු පෙට්ටිය තම බෑගයට දමා ගත් කාට්රිජ් මහතා කාමරයෙන් පිට විය.

අබිරහස දැන් ගමන් කරන දිශාව පිළිබඳ ව නැන්සි හා හෙලන් මඳ වේලාවක් සාකච්ඡා කළෝ ය. "දැන්වත් ඉතිං ටිකක් නා ගත්තොත් හොඳයි."

"මමත් එනවා" හෙලන් ද නෑමට යාමට එකතු වූවා ය.

ඒ මොහොතේ දොරට තට්ටු කරන ශබ්දයක් ඇසුණි. නැන්සි දොර විවර කළා ය. පිටත බැලූ හෙලන් විස්මයෙන් මහ හඬක් නැගුවා ය.

අවතාරයක් බඳු රුවක් ශාලාව මැද තර්ජනාත්මක ලෙස අතක් ඔසවා ගෙන සිටී.

ක්ෂණිකව ම නැන්සිගේ ඉදිරියට පිනූ හෙලන් දොර තදින් වසා අගුල් ලෑවා ය. "තවත් අවතාරයක්, අපිට ඊළඟට මොනව වෙයිද මන්දා?" ඇය මඳක් සැලෙමින් පැවසුවා ය.

නැන්සි කිසිවක් නොකීවා ය. ඈ කෙළින් ම දොර දෙස බලා සිටිමින් මේ අවතාරය කුමක් දැයි තේරුම් ගැනීමට උත්සාහ කළා ය.

"අර ශාලාවේ තිබුණු දේට බයවෙන්න මම කොයිතරම් මෝඩයෙක් ද? මම කොහොමද මෙහෙම බයවෙලා භූතයො දඩයම් කරන්නේ" හෙලන් ශබ්ද නගා තමාට දොස් පවරා ගත්තා ය.

නැන්සි නැවත දොර විවර කළා ය. අරුම පුදුම දර්ශනයකි. අවතාරය කොටස්වලට කැඩී බිඳී යමින් පැවතුණි. ඈ නැවත දොර වසා දැමුවා ය.

"ඕ ! මොකක්ද ඒ වෙන්නේ?" හෙලන් පුදුමයෙන් ඇත් නිකටෙහි තබා ගත්තා ය.

"මම හිතන්නේ ඒක යම් කිසි විදිහක ගඳක් සුවඳක් නැති වායුවකින් හැදුණු දෙයක් කියලයි" මඳක් කල්පනා කළ ඈ "ඒක විෂ සහිත වායුවක් වෙන්න පුළුවන්. ඒ නිසා මම කළමනාකරුට කතා කරලා යම් අනතුරක් වෙන්න පුළුවන් බව කියන එක හොඳයි. කවුරු හරි මෙහාට ආවොත් ඒ අයට විෂ සහිත වායුවෙන් හානි වෙන්න පුළුවන්"

මේ දෙය කවුරුන් විසින් හෝ විහිළුවට කරන දෙයක් නොවන බව කළමනාකරුට පැහැදිලි කර දීමට ඇයට මඳ වේලාවක් ගත විය. කවුරුන් හෝ කෙනෙක් ශාලාවට ඇතුළු වන කොරිඩෝවේ නවත්වා ඇතුළු වන්නන්ට අනතුරු හැඟවීම සුදුසු බවද අවන්හලේ සිටින සියලු ම අමුත්තන් ඉන් පිටතට යවා ඇතුළත වාතය පිරිසිදු වනතුරු සිටීම කළයුතු බව ඈ තව දුරටත් කළමනාකරුට කීවා ය.

"මට දැන් පැහැදිලියි. ඩ්‍රිව් මෙනවිය" අවසානයේ දී කළමනාකරු කීවේය. "ඒත් මට තාමත් පැහැදිලි නෑ මොන හේතුවකට ද මේ මිනිස්සු මෙච්චර උමතු නැත්තම් දුෂ්ට විහිළුවක් කරන්න ඇත්තේ කියලා. කොහොම වුණත් මම ඔබ කියූ විදිහට සියල්ල කරන්නම්"

ශාලාවේ වායුව පිරිසිදුවීම සඳහා කාලය ගත වන තුරු නැන්සි නෑමට යාමට සූදානම් වූවා ය.

"මට සැකයක් තියෙනවා" නැන්සි කීවා ය. "විල්බට් ප්‍රිට්සර් ම තමයි මේ වායු හොල්මන නිර්මාණය කරන්න ඇත්තේ. ඔයාට මතක ඇති අපි කතා වුණා ඔහුට සෑහෙන තාක්ෂණික දැනුමක් තියෙනවා කියලා"

"නමුත් නැන්සි," හෙලන් කීවා ය. "ඔයා හිතනවද ටික වේලාවකට ඉස්සර වෙලා අපි පස්සෙන් පන්නපු ප්‍රිට්සර් බය නැතිව ආපහු ඇවිල්ලා මෙහෙම දෙයක් කරයි කියලා"

"ඒත් මේ ලියකියවිලි පෙට්ටිය කොහොම හරි ගන්න මිනිහාට අවශ්‍ය වෙලා ඇති. ඇත්ත වශයෙන් ම මිනිහා දන්නේ නෑ කාට්රිජ් මහත්මයා ඇවිල්ලා පෙට්ටිය අරන් ගිය බව. සමහරවිට ප්‍රිට්සර්ගෙ කල්ලියේ සගයෙක් මෙහි නතර වෙලා මේ හොල්මන මැව්වා වෙන්න පුළුවන්"



හෙලන් ඔලොක්කුවට මෙන් සිනාසුණා ය. "හොල්මන ඇති කරපු මිනිහා හිතන්න ඇති අවතාරයේ මුහුණට බයේ දොර වහන්නේ නැතිව අපි බයේ පැනලා දුවයි කියලා"

නැන්සි එසේ බව කීමට හිස වැනුවා ය. "අපි පැනලා දුවපුවහම කාමරයට ඇවිල්ලා ලේසියෙන් ම පෙට්ටිය හොරකම් කරගෙන යන්න ඔහු බලාපොරොත්තු වෙන්න ඇති"

අනතුරුව දෙදෙනා ම මහ හඬින් සිනාසුණෝ ය. ඒ කාමරය තුළ රැඳී සිටීමෙන් ඔවුන්ගේ සතුරාගේ යටි අරමුණ පරාජය කිරීමට හැකි වීම පිළිබඳ ව ය. එහෙත් ප්‍රිට්සර් මේ කඩදාසි තමා ළඟ ඇති බව හෝ භූතාවේෂණීය ටැරෙන්ටෙලාගෙන් ඒවා පැහැර ගැනීමට උත්සාහ දැරීමට හේතුව හෝ කුමක් දැයි පැහැදිලි නැති බව නැන්සි කීවා ය.

"මට නම් මේක හරිම ප්‍රහේලිකාවක්" හෙලන් කීවා ය. ඇය දොර විවර කළා ය. "දැන් නම් අවතාරය ගැන කිසිම සලකුණක් නෑ. මම තදින් හුස්ම අල්ලගෙන මගෙ කාමරයට දුවනවා."

ඇය පිටත් වූ පසු නැන්සිගෙ දුරකතනය නද දුන්නේ ය. ඈ රිසීවරය අතට ගත්තා ය.

"මට නැන්සි ඩ්‍රිව්ට කතා කරන්න අවශ්‍යයි" ගැහැනියකගේ ගැඹුරු ස්වරයක් ඒ තුළින් ඇසිණි.

"ඔව්, නැන්සි කතා කරනවා"

"නැන්සි ඩ්‍රිව් මේ අහනවා, මට තමුන්ට කියන්න මළවුන්ගේ ලෝකයෙන් ලැබුණු වැදගත් පණිවුඩයක් තියෙනවා"

# 10

"ඔබ කවුද?" නැන්සි අමතන්නියගෙන් ඇසුවා ය. එය තමුන් හොඳින් දන්නා හඳුනන ටැරෙන්ටෙලාගේ හඬ නොවන බව ඇයට වැටහුණි.

කාන්තාව කිසිවක් කිවේ නැත. මඳ වේලාවක් ගත වූ හෙයින් ඇමතුම විසන්ධි කරන්නට ඇති බව නැන්සි සිතුවා ය. එහෙත් රිසීවරය තබන හඬක් ඇයට ඇසුණේ නැත.

"ඔබ කවුද?" ඇය නැවත ඇසුවා ය.

පිළිතුරක් නැගිණි. "මම භූතාවේෂණියක්. ඔබගේ සීයාගේ ආත්මයෙන් මට වැදගත් පණිවුඩයක් ලැබුණා ඔබට දන්වන්නට කියලා."

නැන්සිගේ මුහුණේ අප්‍රසාදය පළ කරන බැල්මක් මතුවී ආවත් ඈ කිසිවක් කිවේ නැත. මේ සංවාදය අතරතුර දී තමන් තනිව නොසිටීවා යන්න ඇගේ පැතුම විය. එසේ කවුරුන් හෝ පැමිණියා නම් ඔහු හෝ ඇය ලවා පණිවිඩය වෙනත් දුරකථනයක් ඔස්සේ පටිගත කරවීම ඇගේ අරමුණ විය.

නැන්සි කිසිවක් කීමට පසුබට වන බව දුටු කාන්තාව "ඔබට මා කියූ දේ තේරුණා ද? මට පණිවිඩයක් ලැබුණා භූත ලෝකයෙන් ඔබට දන්වන්නට කියා. එය කෙළින් ම ඔබේ සීයාගෙන් ලැබුණේ."

"මට ඔබ කිව් දේ ඇහුණා" නැන්සි පිළිතුරු දුන්නා ය.

"ඔබට අවශ්‍ය නැද්ද එය කුමක්දැයි දැන ගැනීමට?" දුරකථනයෙන් ඇමතූ කාන්තාව නොඉවසිල්ලෙන් ඇසුවා ය. "මට සහතික කරලා කියන්න පුළුවන් ඒක ඔබට ඉතා වැදගත් වෙයි කියලා"

"ඇයි මගේ සීයා ඔබ මාර්ගයෙන් මට කතා කරන්නේ?" නැන්සි විමසුවා ය. ඇයට අවශ්‍ය වූයේ තව දුරටත් අමතන්නිය දුරකථනයේ රඳවා ගැනීමට ය.



"ආදරණීය දරුවා" කාන්තාව ඉතා ඉවසිලිවන්ත ස්වරයකින් කිවා ය. "භූතාවේෂණියන්ට තමන් කවදාවත් අහලා දැකලා නැති පුද්ගලයින්ගේ ආත්මවලින් පණිවිඩ ලැබෙන්නේ කොහොමද කියලා ඔයාට වටහා ගන්න පුළුවන් නම් ඔයා තේරුම් ගනියි කොහොමද ඔබේ සීයා මට කතා කළේ කියලා."

වික්ෂිප්ත පෙනුමකින් යුතු නැන්සි නැවතත් නිහඬව රිසීවරය කනේ තබාගෙන සිටියා ය. හෙලන් කාමරයට ඇතුළු වත්ම, නැන්සිගේ මුහුණ දුටු ඈ ඇයට ළංවී,

"මොකද, කවුද කතා කරන්නේ?" යනුවෙන් කොඳුරා ඇසුවා ය.

නැන්සි හෙලන්ට පිළිතුරු දීමට පෙර කාන්තාව නැවත කතා කර, "පණිවිඩය නම් !"

"භූතාවේෂණිය ටැරෙන්ටෙලාට අයත් පෙට්ටිය ඔබ වර්නෝවයිවලට සැතපුමක් උතුරින් මාර්ග අංක 23 හි පිහිටා තියෙන කළුගල් පාලම යටින් තැබිය යුතුයි. අද සවස දෙකට ඔබ එය එතන තබා පිට විය යුතුයි. ඔබ එතන රැඳී නොසිට හැකි ඉක්මනින් එතනින් පිට ව යා යුතුයි."

නැන්සිගේ සිතේ කෝපයක් නැගී ආවේ ය. ඇය තරමක් වේගවත් ස්වරයකින් "මම එහෙම නොකළොත් මොකද වෙන්නේ?"

භූතාවේෂණිය පිළිතුරු දෙන විට ඇගේ ස්වරයේ තරමක තරහා ගතියක සේයාවක් තිබුණි. "ඔබේ සීයා කිව්වා ඔබ අකීකරු වෙන්න උත්සාහ කළොත් ඔහු ඔබට දඬුවම් කරන බව" එසේ කියූ ඇය රිසිවරය තැබුවා ය.

නැන්සි තම මිතුරියට තමන්ට ලැබුණු පණිවිඩය විස්තර කළා ය.

හෙලන් බියෙන් වෙව්ලා ගියා ය. "නැන්සි ඇය ඔයාට තර්ජනය කරනවා වගේ මම දැනගෙන හිටියේ නෑ භූතාවේෂණියක් මේ තරම් භයානකයි කියලා. ඇත්තට ම ඔයාට දැන් පෙට්ටිය එතන ගිහින් තියන්නත් බෑ. මොකද දැන් ඒක තියෙන්නේ කාට්රිජ් මහත්මයා ළඟ. දැන් ඔයා මොකද කරන්න සූදානම් වෙන්නේ?"

ඕනෑ ම වේලාවක තමන්ට එම පෙට්ටිය වෙනුවට වෙනත් පෙට්ටියක් සොයා ගන්න හැකි බව නැන්සි කිවා ය. එහෙත් මේ පෙට්ටිය ලබා ගන්නා තැනැත්තා රැවටිල්ල අවබෝධ වූ පසු නැන්සිගෙන් පළිගන්නට හෝ ඇයට හිරිහැර කරන්නට හෝ ඉඩ ඇති බවට හෙලන් තර්ක කළා ය.

"මට ඒ අවදානමට මුහුණ දෙන්න වෙනවා හෙලන්. කොහොම වුණත් මම කරන දේ හරිද කියලා දැනගන්න මම කාට්රිජ් මහත්මයට කතා කරනවා. මම ඔහුට කියනවා මගේ හිතේ තියෙන සැලැස්ම ගැන. එතකොට ඔහු මට අවශ්‍ය උපදෙස් දෙයි."

සිද්ධිය පසු ගිය පැය කිහිපයේ දී ගෙන ඇති වෙනස් මුහුණුවර පිළිබඳ ව කාට්රිජ් මහතා තරමක් කනස්සල්ලට පත්වූ අතර ඉතා ම ප්‍රවේශමෙන් කටයුතු කරන ලෙස නැන්සිට අවවාද කළේය.

"මම හිතන්නේ වෙනත් පෙට්ටියක් තියන්න කියලා ගත්ත ඔබේ තීරණය ඉතාම හොඳ දෙයක්. පැරණි ලියකියවිලි පෙට්ටිය තරම් ම ඒ බරට ම සරිලන පෙට්ටියක් තෝර ගන්නත්, ඔබ සමග පිරිමි කෙනෙක් එක්ක යන්නත් වග බලා ගන්න. ඔබලා පෙට්ටිය එතන තිබ්බ ගමන් ම කරුණාකරලා එතැනින් ඉවත් වෙන්න"

පෙට්ටිය ගැනීමට එන යම් කෙනෙක් වෙතොත් අල්ලා ගැනීම සඳහා සිවිල් ඇඳුමෙන් සැරසුණු පොලිස් නිලධාරීන් දෙදෙනෙක් යොදන ලෙස පොලිසියෙන් ඉල්ලා සිටින බව ද, කාට්රිජ් මහතා තව දුරටත් පැවසී ය.

"මම ඔබට දැනුම් දෙන්නම් සිද්ධවුණේ මොකක්ද කියලා" ඔහු පොරොන්දු වූයේ ය.

නැන්සි දිය නෑමට යායුතු බව හෙලන් තදින් ම කියා සිටි අතර දෙදෙනා ම නාන තටාකය වෙත පිය නැගුවෝ ය. එහිදී නැන්සි බෙස්ටත් ජෝර්ජ්ටත් එතැන සිටි තම මිතුරු පිරිසටත් ඇතිවී තිබෙන අලුත් ම තත්ත්වය පිළිබඳවත් මේ අබිරහස හා බැඳී සිටින එක් පුද්ගලයෙකු හෝ අල්ලා ගැනීමට සකස් කර ඇති ඇගේ සැලසුම පිළිබඳවත් කොඳුරා කීවා ය.

"දවල් කෑමෙන් පස්සේ මම කෙළින් ම ගිහිල්ලා ගබඩා භාරකරුගෙන් පෙට්ටියක් ඉල්ලා ගන්නවා. මම හිතන්නේ ඒක පුරවන්න හොඳ ම ක්‍රමය අඩියට ගල් ටිකක් දාලා ඊට පස්සේ උඩින් පත්තර දැමීම" එසේ කියූ ඈ සිනාසුණා ය. "පිරිමි ළමුන්ට පුළුවන් ද ඒ දේවල් මට ගෙනල්ලා දෙන්න?" මේ ඇසූ ඔවුහු සිනාසෙමින් අවශ්‍ය දේවල් සපයන බවට පොරොන්දු වූහ.

"නෙඩ් ඔයා මාත් එක්ක යන්න එනවා ද?"

"ඇත්ත වශයෙන් ම. ඉතා ම කැමැත්තෙන් මම මේ ගමනට එකතු වෙනවා"



"මමත් එහෙම කරන එක ගැන සතුටුයි" බෙස් කීවා ය. "මොකද නැන්සි ඕනෑවට වඩා භයානක දේවල්වලට අත පොවන්න ඉඩ තියෙන නිසා නෙඩ් යන එක හොඳයි."

දිවා ආහාරය ගන්න අතරේ දී නැන්සි පමණක් නොව අනෙක් හූත දඩයක්කරුවෝ ද සිදු වෙමින් පවතින දේවල් පිළිබඳ ව කම්පනයකින් යුතුව රහසින් එකිනෙකාට කොඳුරා ගත්හ. නැන්සි මේසයෙන් නැගිට යන විට මේ අවදානම් ගමනේ දී ඇයට ශක්තිය ලැබේවායි සියලු දෙනා ම සුබ පැතුවෝ ය. "පණිවිඩය දීපු ගැහැනිය කවුරු වුණත් ඔයාගේ සීයව මේ ප්‍රශ්නෙට ඇදලා ගන්න තරම් නිව වෙලා තියෙනවා" බෙස් කලකිරුණු හඬින් කීවා ය.

නැන්සි මඳ සිනාවක් පෑවා ය. එක්වර ම ඇගේ දෑසට කඳුළු පිරුණු ආකාරයක් අන් අයට දිස් විය. "මමත් හිතන්නේ එහෙමයි. මගේ සීයා හරිම කරුණාවන්ත කෙනෙක්. ඉතිං මම මේ වගේ යටිකුට්ටු වැඩකට ඔහුගේ නම ගෑවෙන එකට කොහොමටවත් කැමති නෑ."

මිනිත්තු විස්සක් පමණ ගත වන විට දෙදෙනා පිටත් වීමට සූදානම් වූහ. නැන්සි ඇය සූදානම් කර ගත් පෙට්ටිය මෝටර් රථය වෙත ගෙන ගියා ය.

මුල සිට ම මේ ත්‍රාසජනක වැඩ පිළිවෙළ පිළිබඳව සිය විරෝධතාව පළ කළත් පෙට්ටියේ අඩංගු දේවල් සිහිවීමෙන් මතු වූ සිනහව නවත්වා ගැනීමට බෙස් අපොහොසත් වූවා ය. කට අතින් වසා ගත් ඈ "හිකි හිකි" යන අනුකරණයෙන් සිනාසෙන්නට වූවා ය. "අද නම් කවුරු හරි ලොකු ම රැවටීමකට අහුවෙයි" ඇය ජෝර්ජ්ට කොඳුරා කීවා ය.

"ඒ තමයි එයාගේ උරුමය ලබා ගන්න එන කෙනා" ජෝර්ජ් මුබරි ලෙස කීවා ය.

නැන්සි සහ නෙඩ් රැගත් මෝටර් රථය වර්නෝවයිල් බලා ධාවනය වූ අතර අංක 23 මාර්ගයට ඇතුළු විය. ඔවුහු මෝටර් රථයේ සැතපුම් දර්ශකය දෙස පරීක්ෂාවෙන් බලාගෙන සිටියෝ ය. ඔවුන් කළුගල් පාලම අසලට එනවිට ප්‍රධාන මාර්ගයේ සිට හරියට ම සැතපුමක් ගෙවා තිබුණි. නැන්සි මෝටර් රථය පාරෙන් ඉවතට ගෙන නැවැත් වූවා ය.

"මම හිතන්නේ මෙතන තමයි තැන" නෙඩ් කීවේ මෝටර් රථයෙන් බසින අතරතුරදී ය.

පාලම පැරණි එකක් වූ අතර කොටසක් පාසිවලින් වැසී තිබුණි. පහලින් ගලා ගිය ඇළ පටු එකක් වූවත් එය තරමක් ගැඹුරු බව පෙනෙන්නට තිබුණි. ඇළ පුරා ම ඉතා තියුණු උල් සහිත ගල් විසිරී තිබුණු අතර ඒවා අතරින් පෙණ පිඩු නංවමින් හැපෙමින් වැටෙමින් ජලය ගලා ගියේ ය.

නැන්සි සහ නෙඩ් ඇළේ දෙපස දෙස පරීක්ෂාවෙන් බැලුවේ කවුරුන් හෝ ගැවසේ දැයි දැන ගැනීමට ය. ඔවුන් කිසිවෙකු නුදුටු අතර කිසිවෙකුගේ හඬක් හෝ අසන්නට නොවී ය. අන්තිමේ දී එක ඉවුරක් මතින් ඇළට බට ඔවුහු පාලම යට කිසිවෙක් සිටී දැයි සොයා බැලීමට එබී බැලුවෝ ය. කිසිවෙකු එහි සිටියේ නැත. පාලම ඉතා රළු ලෙස නිමවා තිබුණු අතර පෙට්ටිය රැඳවීමට හැකි ගැටි අවශ්‍ය තරම් එහි විය.

"මට හොඳ තැනක් පෙනෙනවා" නැන්සි කීවා ය.

"මම එතන හොඳට සමතලා ද කියලා බලන්නම්. ඔයා ඊට පස්සේ පෙට්ටිය එතන තියන්න."

නැන්සි අමාරුවෙන් ගලින් ගල අඩිය තබමින් ඉහළ නැඟුණා ය. ලිස්සනසුලු මඩ වැකුණු එමෙන් ම පෙඳ පාසි සහිත ගල් මත අඩිය තබමින් ඉහළට නැගෙන ඈ පය ලිස්සා කීපවරක් ම ඇද වැටීමට ගියා ය. ඉහළට නැගීමට හිසට ඉහළින් වූ ගලක් අල්ලා ගැනීමට අත දිගු කළ ඇගේ අතේ වියරුවෙන් දඟලන යමක වැදුණි. ඇය අත ඇද ගැනීමට පෙරම ස් ......... ස් ..... වැනි හඬක් නැගුණි. ඒ සමග ම තියු පඳුරු යුවලක් ඇගේ අත පුරා ඇම්මේ ය.

"ඔ !" නැන්සි වේදනාවෙන් කෑ ගසා අතදෙස බැලුවා ය. ඒ වන විටත් තුවාලවලින් ලේ ගලා එමින් තිබුණි.

ඊළඟ මොහොතේ දී බැළලියකගේ විශාල ඇස් දෙකක් ඇගේ හිසට ඉහළින් වූ ගල් පොත්තෙන් එබී ඈ දෙස යොමු විය. "පූස් පැටව් !" ඇය නොදැනුවත්ව ම ඇයට කියැවිණි.

නෙඩ් මහ හඬින් සිනාසුණේ ය. "වයසක අම්මණ්ඩි කරදර කරනවට කැමති නෑ වගේ, මට ඔයාගේ අතට වෙච්ච දේ ගැන කනගාටුයි."

නැන්සි සිසිල් ජලයෙන් අත සෝදා ගැනීමට සූදානම් වනවාත් සමග ම ඔහු කීවේ ය.

ඒ මොහොතේ ම ඔවුන්ට පිරිමි ළමයෙකුගේ හඬක් ඇසුණු



බැවින් ඔවුහු ආපසු හැරී බැලුවෝ ය. ඔහුට වයස අවුරුදු දහයක් පමණ යැයි පෙනුණු අතර මේ දැන් ගොවිපලක සිට පැමිණියාක් මෙන් විය.

"හලෝ !" නැන්සි සහ නෙඩ් එක වර කියූ අතර "අතන ඉන්නේ ඔබේ පූසාද?" යනුවෙන් නැන්සි විමසුවා ය.

"තෝපි !" පිරිමි ළමයා පිළිතුරු දුන්නේ ය.

"පුංචි මහත්තයා ඔබ නෙඩ් නිකර්සන්ද?"

"ඔව්"

"ඔබගේ යාළුවෝ උඩහ පාරේ ඉන්නවා. ඒ ගොල්ලෝ වටපිට බලද්දී මම කිව්වා ඔබ සමහර විට පහළ ඇති මම හොයලා බලන්නම් කියලා."

"මගේ යාළුවෝ ?" මේ පුද්ගලයින් කවුරුන් විය හැකිදැයි සිතමින් ම නෙඩ් විමතියෙන් යුතුව විමසුවේ ය.

"එහෙම තමයි එයාලා කිවුවේ. ඒ අයගේ නම් බ්‍රෙට් හා ඩේව් කියලත් කිව්වා" එසේ කියූ ඔහු ඈතට දිව ගියේ ය.

"නෙඩ් ඔයා ගිහිල්ලා ඒ ගොල්ලන්ට අවශ්‍ය මොනවද කියලා බැලුවොත් හොඳයි" නැන්සි යෝජනා කළා ය. "සමහරවිට එයාලා අපිට මොනව හරි වැදගත් පණිවිඩයක් හරි තොරතුරක් හරි ගෙනත් ඇති"

"හොඳයි, මම ඉක්මනින් ම එන්නම්"

තවත් ගැටියක් ඇති තැනක් සොයමින් සිටි නැන්සිට පෙට්ටිය බාරදුන් ඔහු පිටත් විය. වඩාත් පුළුල් තැනක් තෝරා ගත් ඈ පයේ ඇඟිලි තුඩුවලින් සිට ගෙන එතැන කිසියම් සතෙකු නැති බව සැකහැර දැන ගත්තා ය. ඉන්පසුව ඈ පෙට්ටිය ඔසවා එහි තැබුවා ය.

"මම දැන් පාරට නැගලා බලන්න ඕනෑ අනිත් අය ඇවිල්ලා තියෙන්නේ මොකද කියලා" ඈ තමාට ම කියා ගනිමින් ආපසු ඉවුර දෙසට ඇදුණා ය.

ඈ ප්‍රවේගමෙන් මඩ සහිත මාර්ගය ඔස්සේ පියවර තබමින් ඉවුර කරා සෙමින් පියවර තබන්නට පටන් ගත්තා ය. ඇයට පිටුපසින් පියවර හඬක් ඇසුණි. ඇය හැකි ඉක්මනින් ම ආපසු හැරුණු නමුත් හදිසි ප්‍රහාරයෙන් ආරක්ෂා වීමට ඇයට නොහැකි විය.

විශාල අතක් ඇගේ මුව වසා තදින් ග්‍රහණය කර ගත්තේ ය. අනතුරුව හැඩි දැඩි මිනිහෙක් ඇයව ජලය දෙසට අදින්නට පටන් ගත්තේ ය.

# 11

රැවටිල්ලට අසුවීම පිළිබඳව තමාට ම දොස් පවරා ගනිමින් තමා ග්‍රහණය කර ගෙන සිටින්නා වෙතින් මිදීම සඳහා මහත් අරගලයක් කළාය. ඇය නැවත නැවතත් කෑ ගැසීමට උත්සාහ කළත් ඇගේ උගුරෙන් "ගොර ..... ගොර" යන හඬකට වඩා ශබ්දයක් නැගුණේ නැත.

"උඹ කුඩා නරිදෙන" යෝධයෙක් වැනි මිනිසා ගෙරවී ය. "ඇඟලීමෙන් උඹට වෙන හොඳක් නෑ උඹට ම තුවාල කර ගන්නවා විතරයි. උඹ දන්නව ද මම ජූඩෝ කරාටේ වැනි සෙල්ලම්වල ගුරයෙක්. උඹ වැඩිය ඇඟලුවොත් මට ඒවා පාවිච්චි කරන්න වෙයි."

නැන්සිගේ ශක්තිය සිඳී ගියත් නෙඩ් කොයි මොහොතේ හෝ ආපසු ඒවි යැයි දිගින් දිගට ම කල්පනා කළා ය. ඔහුට කුමක් වීද? ඔහු කොහේ ද?

දැන් ගැහැනු ළමයාගේ ග්‍රාහකයා ඇයගේ බෙල්ලෙන් අල්ලා වතුරේ ඔබන්නට පටන් ගත්තේ ය. මෙයින් මහත් සේ බියට පත් නැන්සි ඔහුගේ බලාපොරොත්තුව තමා ගිල්වා දැමීමට දැයි කල්පනා කළා ය. ඈ නැවත දඟලමින් අරගල කරන්නට පටන් ගත්තා ය.

එවිට ම ඈතින් අණ කිරීමක් නැගුණේ ය. "ඔය වැඩේ නවත්වනු!"

එම හඬ කන වැකුණු වහා ම පහර දෙන්නා ඇය අතහැර දැමූ අතර නැන්සිගේ සිරුර ගල්වල තදින් හැපුණේ ය. ඒ වන විටත් යෝධයා දුවන්නට පටන් ගෙන තිබුණි.

නැන්සි ඉක්මනින් ම නැගිට ගත්තා ය. මිනිස්සු දෙදෙනෙක් ඈ පසු කරගෙන වේගයෙන් පලායන්නා පසුපස පැන්නුවෝ ය. ඔහු ඉක්මනින් ම යටත් කරගැනීමට ඔවුන්ට හැකි විය. ඔහු කරාටේ ජූඩෝ හපන්කම් දැක්වූවත් අනිත් මිනිස්සු දෙදෙනා ඔහුට වඩා බොහෝ දක්ෂයෝ වූහ.



"උඹලට මාව නවත්වන්න කිසි ම අයිතියක් නෑ" සිරකරුවා විරෝධතාවය පෑවේ ය. "මේක පෞද්ගලික ප්‍රශ්නයක්. මෙතන ඉන්න කෙල්ල ප්‍රශ්න ඇති කරන්නියක්. ඒ නිසා දඬුවම් ලැබිය යුතුයි."

"හොඳයි අපි මේ කතාවේ එයාගේ පැත්තත් අහලා බලමු" එක් මිනිසෙක් කීවේ ය.

මිනිසුන් දෙදෙනා ඔවුන් ප්‍රාදේශීය පොලිසියේ සිවිල් නිලධාරීන් දෙදෙනෙකු වශයෙන් තමන්ව හඳුන්වා දුන්හ.

"මම තමා සාජන්ට් බ්‍රදර්ස්. මේ රහස් පරීක්ෂක පේරොන්." එක් අයෙක් තමන්ව හඳුන්වා දෙමින් කීවේ ය.

"ඔබලාට මේ ගැන දැනුම් දුන්නේ කවුද?" නැන්සි තවදුරටත් පරීක්ෂාකාරී වෙමින් විමසුවා ය.

"කාට්රිජ් මහත්මයා"

නැන්සි එම පිළිතුරෙන් සෑහීමකට පත් වූවා ය. "මාව ගලවා ගැනීමට පැමිණීම ගැන ඔබලාට බොහෝමත් ස්තුතියි." ඈ සතුටු සිතින් යුතුව කීවා ය.

එතැනින් පිටත් වීමට කලින් නැන්සි තමන් තැන්පත් කළ පෙට්ටිය පොලිස් නිලධාරීන්ට පෙන්වූවා ය. ඔවුන්ගේ අදහස වූයේ එය එතැන ම තබා යාම සුදුසු බවයි. කවුරුන් හෝ එය ගැනීමට පැමිණෙනවා දැයි සොයා බැලීම සඳහා පොලීසියෙන් එම ස්ථානය මුර කරනු ඇති බව ඔවුහු පැවසූහ.

සිදු වූ අකරතැබ්බය නිසා නැන්සිට නෙඩ් ආපසු නොපැමිණි බව අමතක වී තිබුණි. ඔහු තවමත් බ්‍රෙට් හා ඩේව් සමග කතා කරනවාද?

සිරකරුවා සහ පොලිස් නිලධාරීන් සමග නැවත මාර්ගයට පිළිපන් නැන්සි එහි නෙඩ් දකින්නට නොලැබීමෙන් විස්මයටත් බියටත් පත් වූවා ය. ඇයගේ මෝටර් රිය නැවැත්වූ ස්ථානයේ ම තිබුණු අතර වෙනත් මෝටර් රියක් හෝ මිතුරන් හෝ දක්නට නැත.

නැන්සි මිතුරන් පිළිබඳ ව පණිවිඩය රැගෙන ආ කොලුවාගේ හැඩරුව පොලිස් නිලධාරීන්ට විස්තර කළා ය.

"මට කනගාටුයි ඒ කොල්ලා ගැන. සමහර විට ඔහුව එච්චර ඔබලාව රවටීමට වෙන්න පුළුවන්. නැත්තම් ඒ කොලුවටත් කරදරයක් ඇති" රහස් පරීක්ෂක පේරොන් කිවේ ය.

"ඒක වෙන්න හොඳට ම ඉඩ තියෙනවා" සාජන්ට් බ්‍රදර්ස් එම අදහස අනුමත කරමින් කිවේ ය.

ඔහු සිරකරුවා දෙසට හැරී "තමුසේ මේ ගැන මොනවා හරි දන්නව ද?" යනුවෙන් ඇසුවේ ය.

"නෑ"

"තමුන්ගේ නම මොකක් ද?" රහස් පරීක්ෂක පේරොන් ඇසුවේ ය.

සිරකරුවා දැඩි ලෙස නිහඬව සිටියේ ය. රහස් පරීක්ෂකවරයා ඔහු පරීක්ෂා කළත් ඔහු ළඟ හැඳුනුම්පතක් නොතිබිණි.

"තමුන්ගේ ගැලවීමට මොනවද කියන්න තියෙන්නේ?" සාජන්ට් බ්‍රදර්ස් සිරකරුවාගෙන් ප්‍රශ්න කළේ ය.

"එක ම එක දෙයයි. මම කා ළඟවත් වැඩ කරන්නෙ වත් මේ ජාතියේ වැඩ කරන්නේ වත් නෑ. මම භූතාවේෂණියක් මුණ ගැහෙන්න ගිය විට ඈ මට අණ කළා නැන්සි ඩ්‍රිව් පාලම යට තනිව ඉන්න විට අල්ල ගත යුතු බවට"

"ඊට පස්සේ ?" පේරොන් ඔහු දිරි ගන්වමින් විමසී ය. "ඈ කිව්වා මට කියපු විදිහට වැඩ නොකළොත් මට ඉතා ම දරුණු විදිහට දඬුවම් කරන බව. සමහර විට මාව මරන්න පවා ඉඩ තියෙන බව"

"මේ භූතාවේෂණිය කවුද?" නැන්සි මෙහිදී පුදුමයෙන් යුතුව ඇසුවා ය.

"නෑ මම කියන්නේ නෑ"

සාජන්ට් බ්‍රදර්ස් මෙහි දී තද ස්වරයකින් "මොකද බැරි ?" යනුවෙන් විමසුවේ ය.

සිරකරුවා කිවේ තමුන් භූතාවේෂණියට බිය නිසා තවදුරටත් විස්තර නොකියන බවයි. "මම හිතනවා ඔබලා හිතයි කියලා ඒක බොරුවක් බව. මොකද මම වගේ ශක්තිමත් විශාල ශරීරයක් තියෙන කෙනෙක් භූතාවේෂණියකට බයයි කිව්වහම. නමුත් යමක් කරන්න



කියලා භූත ලෝකයෙන් අණක් ආපුවහම මනුෂ්‍ය අපගේ මුළු ශාරීරික ශක්තිය යෙදුවත් අපිට ඒකෙන් බේරෙන්න බැහැ."

නැන්සි අත් අඩංගුවේ පසුවන්නා දෙස පුදුමයෙන් බැලුවා ය. මේ මිනිසා හතර රියන් දේහධාරියෙකි. නමුත් ඔහු භූත බලවේගයකට ඇති බියෙන් හැකිළී ගොසිනි. ඔහු පවසන භූතාවේෂණිය තමාට දුරකථනයෙන් කතා කළ අය ම බවට හැඟීමක් ඇගේ සිතේ මතු විය. මේ මිනිසාත් ප්‍රිට්සර් විසින් මෙහෙයවනු ලබන කල්ලියේ සාමාජිකයෙකු නොවන බවට හරිහැටි විශ්වාස නැති නිසා නැන්සි සිය අදහස සඟවා ගත්තා ය.

"මම දැන් මගේ යාළුවා පිළිබඳව සොයා බැලිය යුතුමයි" ඈ කතාව වෙනතකට යොමු කරමින් කිවා ය.

සිවිල් පොලිස් නිලධාරීහු එකිනෙකාගේ මුහුණු බලා ගත්තෝ ය. "ඔබ ඒක තනිව කළයුතු නෑ ඔබගේ මෝටර් රථය පදවා ගෙන පොලිස් කාර්යාලයට එන්න. අපි පිටිපස්සෙන් එන්නම්. මේ මිනිහගේ වැඩේ අවසන් කරපු ගමන් ම ඔබත් එක්ක ආපහු ඇවිල්ලා පරීක්ෂා කර බලන්න අපිට පුළුවන්."

නගරය කරා යන ගමනට ගත වූයේ මිනිත්තු කිහිපයකි. ඈය පොලිස් නිලධාරීන් ආපසු එනතුරු බලා ඉන්න අතර තුර අවන්හලට ඇමතුමක් ලබා ගත්තා ය. යම් කිසි විදිහකින් නෙඩ් ආපසු ඇවිත් ඇත්දැයි දැන ගැනීම ඇගේ අරමුණ විය. පිළිතුර වූයේ නැත යන්නයි. එසේ නම් නෙඩ් තමන් ඉන්නා තැනක් දන්වා ඇමතුමක් දුන්නා දැයි ඊළඟට ඈ විමසුවා ය.

"නෑ, නැන්සි"

නැන්සි මිනිත්තුවෙන් මිනිත්තුව වඩ වඩාත් බියට පත් වන්නට පටන් ගත්තා ය. නමුත් නෙඩ්ව සොයා ගන්නට ගත වන කාලය වැඩි වන්නට වැඩි වන්නට සතුරන් අතින් ඔහුට සිදුවන හිරිහැර ප්‍රමාණය වැඩි වනු ඇත.

හිරිහැර කිරීම හා අඩන්තේට්ටම් කිරීම පිළිබඳ චෝදනා පත්‍රයකට අත්සන් තබන ලෙස ඈය ගෙන් ඉල්ලනු ලැබී ය. ඉන් පසුව සිවිල් ඇඳුමෙන් සැරසී සිටි පොලිස් නිලධාරීන් දෙදෙන පිටත් වීමට සූදානම් බව ඈයට දැක්වූහ.

නැන්සි නැවත ගල් පාලම වෙත රිය ධාවනය කළ අතර පොලිස් නිලධාරීහු දෙදෙන ඇය පසුපස පැමිණියෝ ය. එතැන දී රියෙන් බට තිදෙන වේගයෙන් ඇළ ඉවුර දෙසට දිව ගියෝ ය. ඉවුර දෙපස ම හොඳින් පරීක්ෂා කරන ලද නමුත් එහි නෙඩ් පිළිබඳ සලකුණක් හෝ නොවී ය. ඉන් පසුව නෙඩ්ගේ අඩි සලකුණු පරීක්ෂා කිරීමට තීරණය විය. පළමු වෙන් ම ඉවුරේ තිබුණු බොහෝමයක් වූ පියවර සටහන් අතරින් ඔහුගේ පියවර සටහන් වෙන් කර හඳුනා ගැනීම අසීරු කරුණක් විය. සෑහෙන වේලාවක් පරීක්ෂා කර බැලීමෙන් පසු මඩක් රැළි වැටුණු සපත්තු අඩි සලකුණු නෙඩ්ගේ සපත්තුවලින් ඇති වූ ඒවා බව නැන්සි ප්‍රකාශ කළා ය. ඉවුරේ පහළ සිට ඒවා වක ගැසුණු කුඩා අඩි පාරක් දිගේ විහිදී තිබුණේ ය.

"අපි ඉස්සරහට යමු" නැන්සි ආයාචනා කළා ය. ගල්කුළු, පත් පඳුරු හා ගස් ගොන්නක් තුළින් තිදෙනා ම නිශ්ශබ්ද ව ඉදිරියට ඇදුණෝ ය. අවසානයේ දී ඔවුහු කෙටි පඳුරු සහිත වංගු ගැසුණු අඩි පාරකට පැමිණියෝ ය. එහි ඇවිද යාම තරමක් පහසු කාරණයක් වූයේ ය.

ඉදිරියට යාමට ඇඩි උනන්දුවක් දැක් වූ නැන්සි පොලිස් නිලධාරීන්ට ඉදිරියෙන් දුවමින් මෙන් ඇවිද ගියා ය. ඇය පඳුරු අතරින් කුඩා පැල්පතක් දැක තිබුණි.

"සමහරවිට නෙඩ්ව මේක ඇතුළේ හිරකරලා ඇති" ඈ තමාට ම කියා ගත්තා ය.

"නවතින්න ගැහැනු ළමයා" සාජන්ට් ඇයට හඬ ගා කීවේ ය. "වෙලා තියෙන කරදර මදිවට ඔයාටත් අනතුරක් වෙනවට අපි කැමති නෑ"

නැන්සි නැවතුණා ය. එහෙත් පය ඉක්මන් කරන ලෙස පොලිස් නිලධාරීන්ගෙන් ඉල්ලුවා ය. ඔවුන් පැලට ළඟා වී බලන කල සියලු ම ජනේල වැල්වලින් වැසී ඇති බව දැකීමට හැකි විය. මිදුලේ හා අවට උස් ගස් කියා පෑවේ කිසිවෙක් මේ පැලේ බොහෝ කාලයක් සිට ජීවත් ව නොසිට ඇති බවයි. එසේ කවුරුන් හෝ සිටියා නම් ඔහුත් මේ නිවස ස්ථිර පදිංචිය සඳහා යොදා ගෙන නොතිබුණු බවට ඕනෑ තරම් සාක්ෂි අවටින් සොයා ගත හැකි විය. ගෙපැල හාත්පස වූයේ අඳුරු මූසල නිහැඬියාවකි.



පරීක්ෂකයෝ දෙදෙන පැල වටා ගොස් සෑම තැනක් ම සෝදිසි කර බැලුවත් ඒ අවට පියවර සලකුණු තව දුරටත් සොයා ගත නොහැකි විය.

"මට හරි ම බයක් තියෙනවා නෙඩ්ව මේක ඇතුළේ හිර කර ගෙන ඇති කියලා" නැන්සි කඳුළු කැට කඩා වැටෙන්නට ආසන්න වූ දෙනෙතින් යුතුව කීවා ය. "අපි ඇතුළට එබී බැලීම නීති විරෝධී ද?"

වැල් ඉවත් කර, ජනේලයක් පැල තුළ බැලිය හැකි ආකාරයට පාදා ගැනීමට පරීක්ෂකයෝ එකඟ වූහ. ඔවුන් ළඟ තියුණු ආයුධ නොතිබුණු හෙයින් අවටින් සොයා ගත් තියුණු ගල් පතුරු දෙකකින් ජනේලයට තදින් බැඳී තිබුණු වැල්වල මුල් ඉවත් කිරීමට සිදු විය. සෑහෙන උත්සාහයකින් පසුව ජනේලය පාදා ගැනීමට ඔවුන්ට හැකි විය. දීප්තිමත් දිවා හිරුගේ රැස් ධාරා ජනේලය තුළින් ගලාවිත් කාමරය ආලෝකමත් කළේ ය.

නැන්සි පා ඇඟිලි තුඩුවලින් සිටගෙන ජනේලය තුළින් ඇතුළට බැල්මක් හෙළුවා ය. ඔවුන් දෙසට පිටුපා සිහිසුන් රුවක් බිම වැතිරී සිටියේ ය. නෙඩ් ඇඳ සිටි ආකාරයෙන් ඔහු ද සුදු පාට කමිසයක් හා දුඹුරු පැහැති කලිසමක් හැඳ සිටියේ ය. හිස රෙදි කඩකින් බාගෙට වෙලා තිබුණි.

නැන්සිගේ හදවත වේගයෙන් ගැහෙන්නට වූ අතර ඇගේ දෑසින් කඳුළු කැට වැටීමට ආසන්න ය. "ඕ ! කරුණාකරලා ඇතුළට පනින්න. ඒ කවුද කියලා අපි බලමු."

නැවත ගල් දෙක අතට ගත් පරීක්ෂකයෝ මහත් වෙහෙසක් දරා ජනේලය විවර කිරීමට උත්සාහ දැරූහ. මේ අතර නැන්සි වරක් ජනේලය තුළින් බලමින් ද වරක් හිස බිමට නැඹුරු කරගෙන අත් පස්සට බැඳ ගෙන කල්පනාවෙන් බරව ද ඒ මේ අත නොසන්සුන් ලීලාවෙන් සක්මන් කරන්නට වූවා ය. අවසානයේ දී ජනේලය විවර කර ගත් සාජන්ට් බ්‍රදර්ස් ඒ තුළින් කාමරයට ඇතුළු විය. නැන්සි විශාල කර ගත් දෑසින් යුතුව තදින් හුස්ම අල්ලාගෙන සිටියා ය. බිම දණ ගසා ගත් සාජන්ට්වරයා කාමරය තුළ වූ රූපය උඩබැලි අතට හැරවූයේ ය.

ඒ සමග ම ඔහු කොක් හඬලා සිනාසෙන්නට වූයේ ය.

"ඒක අනුරුවක්" ඔහු තරමක බලාපොරොත්තු කඩ වූ ස්වරයකින් කීවේ ය.

"අනුරුවක් ?" රහස් පරීක්ෂක පේරොන් ද එය ම ප්‍රතිරාවය කළේ ය.

නැන්සිට කොතරම් සැනසිල්ලක් දැනුණේ ද යත් ඇට නොහඬා සිටිය නොහැකි විය. ඇගේ ඇසිපිය වේගයෙන් සැලෙන්නට වූ අතර ඒවා තුළින් සතුටු කඳුළු ගලා ගියේ ය. දෑතින් ඇස් පිස දමාගත් ඈ ජනේලය තුළින් කාමරයට ඇතුළු වූවා ය. එය ඇත්තෙන් ම විශාල අනුරුවකි. විජ්ජාකරුවන් හෝ රූකඩ නටවන්නන් භාවිත කරන වර්ගයේ අනුරුවක් බව සාජන්ට්වරයාගේ අදහස විය.

අඩි සටහන් නෙඩ්ට අයත් ඒවා නොවේ නම් ඔහු දැන් කොහිද? ඇය වතුරේ ගිල්වා දැමීමට උත්සාහ කළ මිනිසාගෙන් ඇය බේරා ගැනීමට නෙඩ්ට නොහැකි වූයේ ඔහු පැහැරගෙන ගොස් තිබුණු නිසා බව නැන්සිට දැන් හොඳට ම සහතික ය. ඇය තව දුරටත් තම මිතුරාට සිදුවී ඇත්තේ කුමක් දැයි සිතීමට උත්සාහ කළේ නැත.

"මට හිතෙනවා මේ අනුරුව භූතාවේෂණියකට අයිති එකක් ද කියලත් ?" නැන්සි වටපිටාව පරීක්ෂා කර බලමින් ම අවධාරණයෙන් යුතුව පැවසුවාය.

බිත්තියෙහි වූ කොක්කක ටැරෙන්ටෙලා මළවුන්ගේ සභාව මොහොතේ පැලඳ සිටි ලෝගුවට සමාන ලෝගුවක් එල්ලෙමින් තිබුණි. මේසයක් මත කුඩා විදුලි බල්බ රාශියක් සහ වයර් කැබලි ගොඩක් විසිරී තිබෙනු දක්නට ලැබුණි.

"මෙතන තියෙන උපකරණ සේර ම සාමාන්‍යයෙන් පාවිච්චි කරන්නේ නිත්‍යානුකූල කටයුතුවලට. ඇයි එහෙනම් මේ මිනිස්සු ජනේල් වැහෙන්ඩ ඉඩ ඇරලා තියෙන්නේ?" රහස් පරීක්ෂකයා ඇසුවේ ය.

මෙම ස්ථානය සැඟවී සිටීම සඳහා පාවිච්චි කර ඇති නමුත් නිවසක් ලෙස පාවිච්චි කර නැති බව නැන්සිගේ අදහස විය.

"මම හිතන්නේ මෙතන පරීක්ෂාවකට ලක් කළයුතු බවයි." සාජන්ට් බ්‍රදර්ස් සැකයෙන් යුතුව කීවේ ය. "අපි ඉස්සර වෙලා ම හොයා බලමු මේ ස්ථානය කාටද අයිති කියලා"

නැන්සි දිගට ම සිය පරීක්ෂණය කර ගෙන ගිය අතර ටික වේලාවකින් ඇයට සිප්පිකටුවක් හමුවිය.



"කුරුස යුද සෙනෙවියෙකුට අයත් ය."

ඒ කෙසේ ද යත්,

එය කුරුස යුද්ධයේ සංකේතය වූ අතර

මෙය පැළඳ සිටියේ ස්පාඤ්ඤයේ

අනුශාසක සාන්තුවර ජේම්ස් විසිනි.

ජාති නාමය පැක්ටෙන්" යනුවෙන් කියැවෙන කාඩ්පතක් එහි එල්ලා තිබුණි.

රහස් පරීක්ෂක පේරොන් පැමිණ එය නැන්සිගෙන් ඉල්ලා ගෙන බලා, "ඒක නම් විශිෂ්ට කෞතුක භාණ්ඩයක්" යැයි කීවේ ය. "මගේ බිරිඳ ළඟ තියෙනවා රළි ගැසුණු බෙලි කටු එකතුවක්. ඇය ඒවා පාවිච්චි කරනවා සලාද වර්ග මේසයට එවීමට"

නැන්සි ඉතා පරීක්ෂාවෙන් සිප්පි කටුව ඒ මේ අත හරවා බැලුවත් මුලදී වැදගත් යමක් සොයා ගැනීමට ඇයට නොහැකි විය. මඳ වේලාවකින් සිප්පි කටුවේ රළි දෙකක් අතර M.T. ඉංග්‍රීසි අක්ෂර දෙකක් කොටා තිබෙන අයුරු ඇගේ විමසිලිමත් දෑසට හසු විය.

"භූතාවේෂණිය ටැරෙන්ටෙලා" ඇයට එකවර ම කියවිණි.

"එසේ නම් මෙය අයිති ඇයට ද? ඇත්තෙන් ම මේ බඩු මුට්ටු සියල්ල ඇයගේ ද?"

සාජන්ට් බ්‍රදර්ස් ඇගේ සිතිවිලි ධාරාවට බාධා කළේ ය. "අපි දැන් මේ ස්ථානය තිබුණු විදිහට ම වහලා දාලා අපේ වැඩේ දිගට ම කර ගෙන ගියොත් හොඳයි. දැන් ඔබගේ මිතුරා නෙඩ් ගැන මොකද අපි කරන්නේ ?"

නැන්සිගේ හදවත නැවතත් ශෝකයෙහි ගිලුණේ ය. ඔහු සෙවීමට කළ සියලු ම උත්සාහයන් නිෂ්ඵල වී ඇත. ඔහු දැන් කොහිද?

# 12

නැන්සි සහ පොලිස් නිලධාරීන් දෙදෙනා ආපසු පිය නඟද්දී ඔවුන් අතර කිසි ම වචන හුවමාරුවක් සිදු නොවී ය. බිම බලාගත් නෙතින් යුතුව ඔවුහු ඉදිරියට පිය මැන්නෝ ය. නැන්සිගේ හදවත ශෝකයෙන් අඳුරු සිතුවිලිවලින් බරව තිබුණා ය. නෙඩ් පැහැර ගත් පුද්ගලයින් ඔහු මේ ප්‍රදේශයෙන් පිටතට ගෙන ගොස් ඇති බව ඇගේ සිත නැවත නැවතත් කියන්නට විය.

නැන්සිගේ දුක්බර කල්පනාකාරී මුහුණත්, තිගැස්මක් දුටු සාජන්ට් මුද්ර්ස් ඇ සනසන අයුරින් මෙසේ කීවේ ය. "අපි ඔබගේ යාළුවාව හොයන්න හැකි සෑම උත්සාහයක් ම දරනවා. ඒකෙන් ඔබට යන්තම් සැනසුමක් දැනේවි. ඒ වගේ ම ඔබ අපිව සාධාරණ පරීක්ෂණයක් කළ යුතු සිද්ධියක් කරා යොමු කරවලා තියෙනවා"

නැන්සි මිලානිත අයුරින් සිනාවක් පෑවා ය. "ඔබට පැළේ අයිතිකරුවා ගෙන් යම් දෙයක් දැන ගන්න ලැබුණොත් දන්වන්න."

"මම එහෙම කරන බවට පොරොන්දු වෙන්නම්" රථයක් එහි නවතා තිබෙනු දක්නා ලදී. පොලිස් නිලධාරීන් දෙදෙනා සිදුවිය හැකි ඕනෑ ම දෙයකට මුහුණ දීමට සූදානම් වූහ.

ඔවුන් දෙදෙනා නැන්සිට තමන්ගේ පසු පසට වී ගමන් කරන ලෙස අනතුරු හඟවා පැමිණ ඇත්තේ කවුරුන් දැයි පරීක්ෂා කර බැලීමට ඉදිරියට ඇදෙත් ම මෝටර් රථයෙන් බැස ගත් සිව් දෙනාගෙන් එක් ගැහැනු ළමයෙක්.

"හායි ! නැන්සි" යනුවෙන් අතක් ඔසවමින් කීවා ය.

රහස් පරීක්ෂක පේරොත් නැන්සි දෙසට හැරී "ඔබ ඔවුන් හඳුනනවා" දැයි ඇසුවේ ය.

"මගේ හොඳ ම යාළුවො" ඇ සහනදායි හැඟීමක් දක්වන ස්වරයකින් කීවා ය."



"නෙඩ් කොහෙද?" බ්‍රෙට් ඇසුවේ නැන්සි සහ පොලිස් නිලධාරීන් ඉවුරට ගොඩ වෙන අතරතුර දී ය.

"අපි දන්නේ නෑ" නැන්සිගේ ස්වරය නැවතත් හැඟුම් බර විය.

ඇ බෙස්, ජෝර්ජ්, බ්‍රෙට් හා ඩේව් පොලිස් නිලධාරීන්ට හඳුන්වා දුන්නා ය. ඉන් පසුව සාකච්ඡාව මෙම අභිරහස වෙත යොමු විය. පැමිණි සිව්දෙනාට අලුත් ම තත්ත්වය කෙටියෙන් දන්වන ලදී.

"එතකොට නෙඩ්ව පැහැර ගෙන ගිහිල්ල ද?" කතාව විශ්වාස කරගත නොහැකි සේ ජෝර්ජ් විස්මයෙන් කෑ ගැසුවා ය.

"අපිට එහෙම හිතෙනවා" නැන්සි පිළිතුරු දුන්නා ය.

"අපි දන්නේ නෑ කොහෙ කියලා හොයන්න ද කියලා"

"ඔයාට සෑහෙන්න බය හිතෙන්න ඇති අර අතුරුව දක්කහම ඒ ඉන්නේ නෙඩ් වෙන්න ඇති කියලා" බෙස් කල්පනාකාරීව පැවසුවාය.

"ඔව් ඇත්තට ම බය හිතුණා" නැන්සි මිතුරන් සිව්දෙනා නගරයේ සිට පැමිණි මෝටර් රථය දෙස බලමින් ඇසුවා ය. "ඔයාලා මේක ජිම්ගෙන් ඉල්ලගෙන ද ආවේ ?"

"ඔව්" ඩේව් පිළිතුරු දුන්නේ ය. "ඔයාට අවශ්‍ය ද අපිත් එක්ක ඇවිදලා නෙඩ් ගැන ටිකක් හොයලා බලන්න"

මේ මොහොතේ එය අවශ්‍ය කාරණයක් නොවන බව සාජන්ට් මුද්ර්ස් පැවසුවේ ය. පොලීසිය තව සුළු මොහොතකින් නැති වූ පුද්ගලයින් පිළිබඳ සංඥාව නිකුත් කරනු ඇති බව ඔහු තවදුරටත් කීවේ ය.

"මම හිතන්නේ මේ ළමයි ආපහු අවන්හලට ගිහිල්ලා අපෙන් පණිවිඩයක් ලැබෙනකම් ඉන්න එක හොඳයි."

බ්‍රෙට් සහ ජෝර්ජ් නැන්සිගේ මෝටර් රථයේ ගමන් කිරීමට තීරණය කළේ ඇගේ ධෛර්යය වැඩි කිරීමේ බලාපොරොත්තුවෙනි. කෙසේ නමුත් ඔවුහු තමන් ඕනෑවට වඩා උනන්දුවක් දක්වන බව නොපෙන්වමින් නැන්පත් ලෙස තම නිගමන පිළිබඳ නැන්සි හා කතා කළෝ ය. සහතික වශයෙන් ම ප්‍රිට්සර් හා ගුහාවේෂණිය වැරෙන්වෙලා මේ අභිරහස පිටුපස සිටින බව ජෝර්ජ් කීවා ය.

"නමුත් ඔවුන්ගේ අරමුණ තමයි මට තේරුම් ගන්න බැරි" ඇ කීවා ය.

බ්‍රෙට් බලාපොරොත්තු සහගත ලෙස පැවසුවේ නෙඩ් පැහැරගෙන ගොස් නැති බවයි. "එයා ඔයාව අල්ල ගන්න හදපු ගෝරිල්ලා ආපු වාහනේ හැංගිලා ඇති මිනිහා කොහාට ද යන්නේ කියලා හොයා බලන්න"

"ඒක නම් ඇත්ත. මිනිහා නම් හරියට ගෝරිල්ලෙක් වගේමයි." නැන්සි මඳ සිනහවක් පාමින් කිවා ය.

"බ්‍රෙට් හරි" ජෝර්ජ් බ්‍රෙට්ගේ අදහසට යමක් එකතු කරමින් කිවා ය. "මම ඕනෑ ම ඔට්ටුවක් අල්ලනවා. නෙඩ් විශ්වාස කරන්න අමාරු විස්තරේකුත් හොයා ගෙන අපි නොහිතන වෙලාවක අවන්හලට එන බවට"

නැන්සි එසේ වේවායි පැතුවා ය. නමුත් මේ බොහෝ කතා මිතුරන් පවසන්නේ තමන් සතුටු කරවීමට බව ඈ දැන සිටියා ය. නෙඩ්ට අනතුරක් සිදුවී ඇතැයි යන සිතිවිල්ල ඇගේ සිතින් ඉවත්කර ගැනීමට ඇයට නොහැකි ය. ඔවුන් අවන්හලට ළඟා වූ පසු නැන්සි කෙළින් ම කාමරයට ගොස් එහි ම රැඳී සිටීමට කැමැත්ත පළ කළා ය.

"මම දුරකථනය ළඟ ම ඉන්න ඕනෑ. සමහරවිට පොලීසියෙන් හරි වෙනත් කෙනෙකුගෙන් හරි මට පණිවිඩයක් ලැබෙන්න පුළුවන්" ඈ කිවා ය. ඇය නෙඩ්ගේ නම අවධාරණය නොකළ අතර ඉක්මනින් ම නෙඩ් ගැන ආරංචියක් ලැබේවි යැයි ඇය මඟ බලා සිටින බවට බෙස්ට හා ජෝර්ජ්ට වැටහුණි.

"ඔයා කෑමට එන්නේ නැද්ද?" බෙස් නැන්සිගේ අතින් අල්ලා ගෙන ඇසුවා ය.

නැන්සි හිස වැනුවා ය. "මගේ කෑම මෙහාට එවන්න" නැන්සි තව දුරටත් කතා නොකළ නිසා තමා ආහාර ඇනවුම් කර කාමරයට එවන බව බෙස් කීවා ය. "මට වැඩිය කෑම ජාති එවන්න එපා. වැඩිය කාපුවාම මට ලෙඩ ගතියක් දැනෙයි. කරුණාකරලා මට කුකුල් මස් අපු සැන්විච් එක්ක තේයි පලතුරු ටිකකුයි එවන්න."

දොර ඇරීමේ සංඥාව තෙවරක් දොරට තට්ටු කිරීම බවට එකඟතාවකට පැමිණි ජෝර්ජ් සහ බෙස් ඇඟපත සෝදා ගෙන ඇඳුම් මාරු කර ගෙන කාමරයෙන් පිට වූහ. ඔවුන් පිට වූ පසු නැන්සි පොතක් ගෙන කියවීමට උත්සාහ කළා ය. එහෙත් මනස එක් තැන් කර ගෙන පොත කියවීමට ඇයට නොහැකි ය. ඈ පොතේ පිටු එහා



මෙහා පෙරළුවා පමණි. විටින් විට බියජනක සිතුවිලි මායාවන් මෙන් ඇගේ දෑස් ඉදිරියේ ඇඳී මැකී යයි. දොරට තට්ටු කරන හඬක් ඇසී ඈ හිස ඔසවා බලන තුරු ම ඈ සිටියේ බිමට නැඹුරු කර ගත් හිසින් යුතුව ය. භෝජන ශාලාවේ සේවය කරන වේටර්වරයෙක් ඇයට කෑම රැගෙන විත් තිබුණි.

මිටි බංකුවක් මත ආහාර බඳුන් තැබූ වේටර්වරයා කාමරයෙන් පිට වී ගියේ ය. නැන්සි වාඩි වී කුකුල්මස් සැන්විචස් පෙත්තක් සපන්නට පටන් ගත්තා ය. එහෙත් ඇයට කටවල් දෙකකට වඩා කෑමට නොහැකි විය. තව දුරටත් ඇයට ආහාර රුචියක් නැතිබව හැඟී ගියෙන් ඈ පාන් පෙත්ත දීසියේ තැබුවා ය. උණුසුම් තේවලින් ඇයට ප්‍රබෝධයක් දැනුණු හෙයින් ඈ ඉන් කෝප්ප දෙකක් ම පානය කළා ය.

රාත්‍රී අටට පමණ දුරකථනය නාද දෙන්නට විය. ඈ චකිතයෙන් යුතුව රිසීවරය අතට ගත්තා ය.

"නැන්සි" ඒ නෙඩ්ගේ කටහඬයි !

"ඕ ! නෙඩ්, ඔයාට කරදරයක් නෑ නේද?" ඈ සතුටින් කෑගසා ඇසුවා ය.

"මීට වඩා සනීපයක් මීට පෙර කවදාවත් දැනිලා නෑ"

"ඔයා කොහෙද ඉන්නේ ?"

"අපේ හූත දඩයමේ තුන් වන අදියරේ"

"ඔයා කියන්නේ භූතාවේෂ අශ්වයා ඉන්න රෙඩ්බාන්වල කියලද?"

"හරියට ම හරි, මිඩ්ල්බර්ග්වලට ටිකක් එහායින්"

"ඔයා කොහොම ද ඔහාට ආවේ ?"

"මාව වෙස්මුණු දාගත්ත මිනිස්සු දෙන්නෙක් පැහැර ගත්තා. නමුත් මම කොහොම හරි පැන ගත්තා. මට දැනට මීට වැඩිය විස්තර කියන්න බැහැ. මට අවශ්‍ය ඔයයි, අපේ අනෙක් මිත්‍රයොයි, ඔක්කොම හැකි ඉක්මනින් මෙහාට පැමිණීමයි. මම අපි සියලු දෙනාට ම රෙඩ්බාන් තානායමේ නවාතැන් සූදානම් කරලයි තියෙන්නේ"

නැන්සි දැන් ම සියලු දෙනාට මේ ගැන දන්වා ඉක්මනින් ම ඔහුට කතා කරන බව කිවා ය. ඔහු ඇට තමා ඉන්න ස්ථානයේ දුරකථන අංකය දුන්නේ ය.

ඇ භෝජන ශාලාව වෙත දිව ගියා ය. ඒ වන විටත් භූත දඩයක්කරුවෝ රාත්‍රී ආහාරයෙන් පසුව භෝජන ශාලාවෙන් පිටත් වෙමින් සිටියහ. නැන්සි ඉතා කෙටියෙන් තමාට ලැබුණු දුරකථන පණිවිඩය පිළිබඳ ව ඔවුන් දැනුවත් කළා ය. එහෙත් ඇ මෙසේ ද කීවා ය.

"සමහරවිට නෙඩ්ව පැහැරගෙන ගිය මිනිස්සු ඔහු ලවා කතා කෙරෙව්වා වෙන්නත් පුළුවන්. ඒක අපිව මෙහෙන් රෙඩ්බාන් තානායමට ගෙන්න ගන්න යොදපු උපක්‍රමයක් වෙන්නත් පුළුවන්."

"ඔයා කොහොමද ඒක දැන ගත්තේ ?"

"නෙඩ් හා මා අතරේ රහස් සංඥා ක්‍රමයක් තියෙනවා. මම එයාට ආපහු කතා කරලා අපේ රහස් සංඥා ක්‍රමයෙන් දැන ගන්නම් මොකද සිද්ධවෙලා තියෙන්නේ කියලා"

ඩේව්ට රහස් සංඥා පිළිබඳ ව දැඩි උනන්දුවක් ඇති විය. "අපි අහගෙන හිටියට කමක් නැද්ද?"

"ආ ! ඒකට කමක් නෑ. එන්න" නැන්සි ඔවුන් කැඳවූවා ය.

පණිවිඩයේ රහසිගත බව ආරක්ෂා කර ගැනීමට කාමරයේ දුරකථනයෙන් කතා කළ යුතු බව ඇගේ අදහස වූයෙන් සියලු දෙනා ම කාමරයට ඇතුළු වූහ. ඇ දුරකථන අංකය කරකැවූ විට අනෙක් පසින් පිළිතුරු දුන් මිනිසා නෙඩ්ව ඉක්මනින් ම කැඳවන බව කීවේ ය.

නෙඩ් දුරකථනයට පිළිතුරු දුන්විට නැන්සි "ඔබගේ හරි නම කුමක් දැයි "ඇසුවා ය.

ඔහු කොක් හඬ ලා සිනාසුණේ ය. "මට තේරුණා, එඩ්වඩ් එමර්සන්"

"නෙඩ් මිනිත්තුවක් ඔහොම ම ඉන්න." නැන්සි ඉල්ලා සිටියා ය. ඇය මිතුරු පිරිස දෙසට හැරී, "ඒ පිළිතුරෙන් කියවෙන්නේ නෙඩ්ව හිර කරගෙන නොසිටින බවයි. කවුරුහරි එයාව හිරකර ගෙන ඉන්නවා නම් එයා කියන්නේ මම මගේ මැද නම රහසක් වශයෙන් රකිනවා කියලයි."

නැවත නෙඩ් ඇමතූ නැන්සි "අපි හෙට උදේ පාන්දර ම රෙඩ්බාන් තානායමට එනවා" යැයි පැවසුවා ය.



නෙඩ්ගේ දුරකථනය විසන්ධි වූ වහා ම නැන්සි සාජන්ට් බ්‍රදර්ස්ට ඇමතුමක් ලබා ගෙන නෙඩ් පැහැර ගෙන යනු ලැබුවත් ඔහු දැන් බේරී සිටින බව දැන්වූවා ය. අනතුරුව තව දුරටත් කතා කළ ඇ අනුරුව තිබුණු පැල්පත පිළිබඳ යම් තොරතුරක් ඇත්දැයි විමසුවා ය. ඔහු පිළිතුර වශයෙන් කීවේ මේ වන විටත් ඒ ස්ථානයට කිසිවෙකු පැමිණ නැති බවත්, ඒ පැල්පත පාවිච්චි කිරීමට ඔහු කිසිවෙකුට අවසර දී නැති බව එහි අයිතිකරුවා තමාට පැවසූ බවත් ය.

"එතන තිබුණු අඩුම කුඩුම සියල්ල ම අපි පොලිස් ස්ථානයට ගෙනාවා" සාජන්ට් බ්‍රදර්ස් කීවේ ය. "ඒ කොහොම වුණත් එහි තිබුණු පිරිමි අනුරුව නම් හරිම සිත්ගන්නාසුලුයි. ඒක එක්තරා විදිහක රොබෝ කෙනෙක්. ඕනෑ ම විදිහකට ක්‍රියා කරවන්න හැකි විදිහේ උපාංග සවි කරලා තිබුණා. ඔහුට දුවන්න, ඇවිදින්න වගේ ම කරාටේ ඉරියව්වලින් මිනිහෙකුට පහර දෙන්නත් පුළුවන්"

නැන්සි භූතාවේෂණිය ටැරෙන්ටෙලා පිළිබඳ ව ඇගේ පවතින සැකයත් ටැරෙන්ටෙලාගේ නමේ මුලකුරු සිප්පි කටුවේ කොටා තිබුණු බවත් කීවා ය. "ඇ මේ යටිකුට්ටු ව්‍යාපාරයේ කොටස්කාරියක් වෙන්න හොඳට ම ඉඩ තියෙනවා. අපි හෙට උදේම රෙඩ්බාන් තානායමට යනවා මිඩ්ල්බර්ග්වලට එහායින් තියෙන" පොලිස් නිලධාරියා ඇයට ස්තූති කළ අතර මේ සිද්ධිය පිළිබඳ යම් තත්ත්වයක් මතු වුවහොත් ඇය ඒ පිළිබඳව දැනුවත් කරන බවත් කීවේ ය.

නැන්සි භූත දඩයක්කරුවන්ට රොබෝ පිළිබඳ විස්තරය පැවසූ විට, "ම් ! ඌට පුළුවන් කාට හරි පහර දෙන්නත් ඒ වගේ ම කිසිම ඇඟිලි සලකුණක් නොතියා ඕනෑ ම දෙයක් හොරකම් කරන්නත්" යනුවෙන් පැවසුවා ය.

"එක දෙයක් හොඳටම විශ්වාසයි" නැන්සි කීවාය. "ඒක හදපු කෙනා නම් හරිම දක්ෂ ඉංජිනේරුවෙක්. ඇත්තෙන්ම ඒ සම්මානය විල්බට් ප්‍රීට්සර්ට හිමිවෙන්න ඕනෑ"

පසුදා උදෑසන භූත දඩයක්කරුවන් රෙඩ්බාන් තානායමට ළඟා වූ විට නෙඩ් ඔවුන් පිළිගෙන විසිත්ත කාමරයට කැඳවා ගෙන ගියේ ය. එහි සිටි එක ම පුද්ගලයා ඔහු බව ඔවුන්ට දැක ගත හැකි විය. ජෝර්ජ් මේ පිළිබඳ ව ඔහුගෙන් විමසුවා ය.

"මිනිස්සු බයයි මෙහාට එන්න" නෙඩ් ඇයට කීවේ ය. "මෙතන

අයිතිකාරයා හෝග් මහත්මිය. ඇය ඉන්නේ බිම් කාමරයේ. ඈ ඉතා ම අධෛර්යයට පත්වෙලා ඉන්නේ. ඇය කියනවා මේ ස්ථානය වටිනාකමට වඩා ඉතා ම අඩු මුදලකට විකුණලා දාන්න ඇයට සිද්ධවේවි කියලා. ඒකේ මොකක් හරි වෙනත් සිද්ධියකට සමානකමක් එහෙම තියෙනවා ද?"

"සෙව්නි විලයි, පයින් ග්‍රෝව් කඳවුරයි ගැන කතාව" භූත දඩයක්කරුවෝ එක හඬින් කියා සිටියහ.

"මට සැකයි එතන වගේ ම සිද්ධියක් මෙතනත් සිද්ධවෙනවා කියලා" නෙඩ් පැවසී ය. "අපි හොයලා බලමුකෝ"

"මෙතන අවතාර අශ්වයා පස්සෙන් පන්නන අශ්වාරෝහකයා හැරුණු විට වෙනත් අද්භූත දේවල් සිද්ධවෙනව ද?"

"ඔව්" යනුවෙන් හඟවමින් නෙඩ් හිස වැනුවේ ය. "හෝග් මහත්මිය කියන විදිහට එක එක විදිහේ අමුතු දේවල් රාත්‍රියේ දී ඇති වෙනවා. සමහර දේවල් මේ තානායම තුළමත් සිද්ධවෙන බවයි ඈ කියන්නේ. පැරණි අවතාර පිළිබඳ කතාව බොහෝ කාලයකට පෙර අමතක වෙලා තිබුණත් දැන් ආයෙමත් ටික දවසකට පෙර අමුත්තෙක් ඇත්තට ම අවතාරයක් දැකලා තියෙනවා"

"අවතාරය දැකපු කෙනා අනිත් අයට විස්තරේ කිව්වාහම ටිකින් ටික ඒ අයත් බය වෙලා තානායමෙන් පිට වෙලා ගිහිල්ලා. දැන් අමුත්තෙක් ආවත් ඉන්නේ ටික දවසයි. කොහොම හරි කෙනෙක් අශ්ව අවතාරේ දකිනවා. ඉතිං ඒ නිසා කවුරුවත් මෙතන කාමර වෙන්කර ගන්න ලියුම් එවන්නේ නෑ"

"මොන තරම් ලැජ්ජාවක් ද?" බෙස් පැවසුවා ය. "ඔයාට හිතෙන්නේ නැද්ද හෝග් මහත්මිය හිතෙන් මවා ගත්ත විකාර කියලා" බ්‍රෙට් පහත් හඬකින් ඇසුවේ ය.

"මම හිතන් නෑ" නෙඩ් පිළිතුරු දුන්නේ ය. "මමත් ඊයේ රාත්‍රියේ ඔය කියන විදිහේ සිද්ධියකට මුහුණපෑවා"

"ඕ ! ඒ මොකක්ද?" බෙස් විමතියෙන් ඇසුවා ය. තමන් රාත්‍රියේ දී අද්භූත ආකාරයෙන් යටිගිරියෙන් කෑ ගසන හඬක් ඇසී අවදි වූ බව නෙඩ් කීවේ ය. "ඒක හරියට කෙනෙක් තවත් කෙනෙකුට දම්වැලකින් පහර දෙනවා වගේ."



"හරි ම භයානකයි !" බෙස් උරහිස් අකුළවමින් කීවා ය.

"ඒ ශබ්දේ ස්වභාවයට මාත් බය වුණා." නෙඩ් දිගට ම කියා ගෙන ගියේ ය. පිරිසගේ කටවල් ඇරී දැස් විස්මයෙන් විශාල වී නෙඩ් දෙසට යොමු වී තිබුණි. "මම දුවලා ගිහිල්ලා ජනේලය ඇරලා බැලුවා. කිසිම පුද්ගලයෙක් පේන්න හිටියේ නෑ. මම යන්තමට හිතුවා අවතාර අශ්වයාවයි අශ්වාරෝහකයාවයි දකින්න ලැබෙයි කියලා. නමුත් එළියේ කවුරුවත් පේන්න හිටියේ නෑ"

"ඊට පස්සේ මර හඬ දීම නතර වුණාද?" නැන්සි විමසුවා ය.

"ඔව්, අද උදේ මම හෝග් මහත්මියගෙන් ඒ ගැන ඇහැව්වා. ඇටත් ශබ්දය ඇසුණු නිසා එයත් එළියට ඔළුව දාලා තියෙනවා. නමුත් ඇයත් සැක කටයුතු කිසිම දෙයක් දැකලා නෑ. ඈ කල්පනා කරන්නේ හිතලා මතලා උවමනාවෙන් ම කවුරු හරි ඇගේ ව්‍යාපාරය කඩා කප්පල් කරන්න හදනවා කියලයි."

මිනිත්තු කිහිපයක් ඔවුහු මේ අමුතු සිද්ධි මාලාව පිළිබඳ ව සාකච්ඡා කළෝ ය. "නෙඩ් අපිට කියන්න ඔයා පාලම යට ඉඳලා උඩට ගිය වෙලාවෙ ඉඳලා මොකද සිද්ධවුණේ කියලා" අනතුරුව නැන්සි ඉල්ලා සිටියා ය.

"මැරයෝ දෙන්නෙක් පඳුරු අස්සේ හැංගිලා ඉඳලා මාව බඳලා අල්ල ගත්තා. එවුන් සමග සටන් කරන්න අමාරු නිසා මම බොරුවට සිහිනැති බවක් මවා ගත්තා, ඊට පස්සේ ඔවුන් මාව මෝටර් රථයක පස්සේ ආසනය උඩට දැම්මා. පැයක් විතර ගමන් කරද්දී රෝදයක හුළං ගිය නිසා ඔවුන්ට මෝටර් රථයෙන් බහින්න සිද්ධ වුණා. ඒ වෙලාවේ නැගිට ගත් මම හිමීට ම දොර ඇර ගෙන කැලෑවට දුවලා බේරුණා. ඔවුන් මාව හෙව්වත් මම ගස් බෙනයක් අස්සේ හැංගිලා සිටියා. නමුත් මට හිතා ගන්න බැරි මොකට ද උන් මාව පැහැර ගත්තේ කියලයි."

නැන්සි පාලම අසල දී ඈ මුහුණ දුන් සිද්ධිය ප්‍රකාශ කළ අතර "උන්ට ඕන වෙලා තියෙන්නේ මේ වැඩෙන් ඔයාව අයින් කරන්නයි" යනුවෙන් ද පැවසුවා ය.

ඉහළ මාලයෙන් එක්වර ම ඇසුණු කන් බිහිරි කරවන විශාල ශබ්දයක් සමගින් ඔවුන්ගේ සාකච්ඡාව අවසන් විය.

# 13

භූත දඩයක්කරුවෝ ඉහළ මාලයට තරප්පු පෙළ දිගේ දුවන්නට වූ අතර පෙරමුණේ වූයේ නෙඩ් ය. ඔවුන් දෙවන මහල දිගේ දිව ගොස් ශාලාව කෙළවර වූ බිම් කුටියකට පැමිණියෝ ය. පඩිපෙළ පාමුල කාන්තාවක් සිට ගෙන සිටියා ය.

"හෝග් මහත්මිය !" නෙඩ් විස්මයෙන් ඇස් දල්වා බලා කීවේ ය. "මොකක්ද වැටුණේ ?"

ඇය අළු පැහැයට හුරු සුදු පැහැයෙන් යුතු කාන්තාවකි. ඇගේ ලා අළු පැහැති තනිපාට ඇඳුමත්, සුදුපැහැ ගැන්වුණු කොණ්ඩයත් නිසා ඇ ද අවතාරයක් සේ පෙනිණි.

ඇ වෙව්ලන හඬකින් පිළිතුරු දුන්නා ය. "ට්‍රන්ක පෙට්ටියක්. ඒක අවුරුදු ගණනාවක් ම තවත් ට්‍රන්ක පෙට්ටියක් උඩ තියලා තිබුණේ. මම එතනට ගිය වෙලාවේ ඒක වැනෙන්න පටන් ගෙන එක පාරට ම පොළොවට ඇදගෙන වැටුණා."

හෝග් මහත්මිය සසල වී සිටින බව නැන්සිට පැහැදිලි විය. අඳුනා ගැනීමක් සිදුවීමටත් පෙර ම ඇ වෙත ගිය නැන්සි ඇගේ උකුල වටා අත දමා ගත්තා ය.

"කරුණාකරලා ටිකක් ඇල වෙන්න" ඇ කාරුණික ස්වරයකින් හෝග් මහත්මියට කීවා ය.

"අපි පරීක්ෂා කරලා බලන්නම් මොකද ට්‍රන්ක පෙට්ටිය එකපාරට ම පෙරළුණේ කියලා"

ඇ තම කාමරය වෙත ඇදෙන හෝග් මහත්මියගේ උකුල වටා අත දමාගෙන ඇට ගමන් කිරීමට පහසුව සලසා දුන්නා ය. අනිත් පිරිස ඔවුන් පසුපස ගමන් කළ අතර හෝග් මහත්මිය භීතියට පත් වීම පිළිබඳ ව ඇති වූ කනගාටුවක් ඔවුන්ගේ මුහුණුවල සටහන් වී තිබුණි.



කාමරයට පැමිණි පසු නෙඩ් භූත දඩයක්කරුවන් කණ්ඩායම හෝග් මහත්මියට හඳුන්වා දුන්නේ ය. ඇ ඔවුන්ගේ මිත්‍රශීලී වදන් අගය කරමින් සිනාසුණ අතර නානායමකට අමුත්තන් පිළිගැනීමේ ක්‍රමය මෙය නොවන බව කනගාටුවෙන් කීවා ය.

"කරුණාකරලා ඒ ගැන කරදර වෙන්න එපා" නැන්සි ඇය සනසන අටියෙන් කීවා ය. "අපි දන්නවා ඔබට බොහෝ කරදරවලට මුහුණ පාන්න වෙලා තිබෙන බව. ඉතිං අපි ලෑස්තියි ඔබට උදව් කරන්න. අපි බිම් කාමරය පරීක්ෂා කරලා බැලුවට කමක් නැද්ද?"

"කරුණාකරලා එහෙම කරන්න" හෝග් මහත්මිය ඉතා කැමැත්තෙන් එකඟතාව පළ කළා ය.

බිම් කාමරය ඉතා කුඩා එකක් වූ නිසා නැන්සි සමග කිහිප දෙනෙකු පමණක් යාම සුදුසු බව යෝජනා විය. රීටා අස්වාභාවික සුරංගනාවියන් මේ සිද්ධියට සම්බන්ධ දැයි දැන ගැනීමට කැමති වූ හෙයින් ඇ ද පරීක්ෂාව සඳහා එක් වූවා ය.

ඔවුහු කාමරයට ඇතුළු වී වටපිට බැලූහ. තවමත් වැඩ අවසන් නොකළ කුටියේ බිත්තිවල තිබූ පිපිරුම් හා කඩතොලු මේ ගොඩනැඟිල්ලේ පැරණි බව කියා පෑවේ ය. කෞතුකභාණ්ඩ තරම් පැරණි ගෘහභාණ්ඩ කිහිපයක් සහ පෙට්ටි කිහිපයක් එහෙ මෙහෙ දමා තිබුණි. පරණ බ්ලැන්කට්ටුවක් වහලයේ පරාලයක එල්ලෙමින් තිබුණේ ය.

එක් පැත්තක බිම වැටුණු ට්‍රන්ක පෙට්ටිය විය. එහි පියන පසෙකට විසි වී ගොස් කඩමාලු වුණු පැරණි පන්නයේ ඇඳුම් පැළඳුම් පොදියක් වැටී තිබුණි. ඊට පිටුපසින් තවත් ට්‍රන්ක පෙට්ටියක් තිබුණි.

නැන්සිට අවශ්‍ය වූයේ මේ සිද්ධිය හදිසියේ සිදුවූයේ කෙසේ දැයි දැන ගැනීමට ය. අනිත් පිරිස කාමරයේ අනෙක් අහුමුලු පිරික්සා බලන අතරතුර නෙඩ් හා නැන්සි බිත්තිය අයිනේ වූ අනෙක් ට්‍රන්ක පෙට්ටිය ඔසවා බැලුවෝ ය. එය පිරී තිබුණේ පැරණි බෝනික්කන්ගෙන් හා සෙල්ලම් බඩුවලිනි.

"නෙඩ්, මේ බලන්න" නැන්සි ඇඟිල්ල පොළොව දෙසට යොමු කර දැක්වූවා ය.

ට්‍රන්ක පෙට්ටිය තිබුණු තැන පොළොවට සවි කළ යකඩ අගුලක් සහිත රහස් දොරක් විය. නෙඩ් පහසුවෙන් දොර ඉහළට ඇද විවර

කළේ ය. රහස් දොරෙන් යට පැත්ත බිත්තිවලට අලවන කඩදාසියකින් වැසී තිබුණු අතර එම කඩදාසිය පහතින් වූ කාමරයේ කබඩ් එකේ අලවා තිබූ බිත්ති කඩදාසිවලට සෑම අතින්ම සමානකමක් දැරුවේය. රහස් දොරට යටින් වූ කාමරයේ දොරට විවර වී තිබෙනු දක්නට ලැබිණි.

"කවුරු හරි මේ රහස් දොර යටින් උඩට තල්ලු කරලා තියෙනවා" නැන්සි අවධාරණය කළා ය. මිනිහා ටීපෝවක් මත නැගලා තමයි රහස් දොර උඩට තල්ලු කරලා තියෙන්නේ"

"අපි පහළට ගිහිල්ලා බලමු කවුරු හරි හැංගිලා ඉන්නව ද කියලා" නෙඩ් යෝජනා කළේ ය.

කෙටි පැහැදිලි කිරීමකින් අනතුරුව අනිත් පිරිස සමග නෙඩ් හා නැන්සි තරප්පු පෙළ දිගේ පහළට පැමිණ රහස් දොරට යටින් වූ කාමරයට ඇතුළු වූවෝ ය. එහි කිසිවෙක් නැත. දෙවෙනි තට්ටුවේ තිබුණු අනිත් කාමර ද ඉක්මනින් පරීක්ෂාවකට ලක් විය. අනතුරුව පළමු මහල ද පරීක්ෂා කළත් කිසිම හෝඩුවාවක් එහි ද නොතිබිණි.

"අපි හෝග් මහත්මියගේ කාමරේ කතා කර කර ඉන්න අතරේ රහසේ ඇතුළු වන්නා මෙතැනින් පැනලා යන්න ඇති" නෙඩ් සිද්ධිය හකුළුවා දැක්වී ය.

ඔවුහු නැවත උඩු මහලට ගොස් තමන්ට දැන ගැනීමට හැකි වූ දේ හෝග් මහත්මියට පැවසූහ.

"අර කබඩ් එක ඇතුළෙන් ඉහළට එන්න පුළුවන් රහස් දොරක් තියෙන බව දැන ගෙන හිටිය ද?" ඈ හෝග් මහත්මියගෙන් විමසුවාය.

"නෑ මම දැන ගෙන හිටියේ නෑ. අනේ වස්තුවේ ! මේක තවත් සලකුණක් මාව සත්‍යයෙනුත් බොරුවෙනුත් විනාශ කරන්න හදන බවට"

"ඔයාට කවුරු හරි අද්භූත දේවල් කරන කෙනෙක් මෙහේ හැංගිලා ඉන්න බවට සාක්ෂියක් තියෙනව ද?" නැන්සි ඇසුවා ය. "මේ ගොඩනැඟිල්ලේ බිම් මහලක් තියෙනවා ද?"

"ඔව්, නමුත් මම ඒක වහලා අලයි තියෙන්නේ. යතුර මං යන තැන ගෙනියන නිසා ඔහුට එතන හැංගිලා ඉන්න පුළුවන් කමක් නෑ. නමුත් ඔහු පහළ ධාන්‍යාගාරෙ හැංගිලා ඉන්න ඉඩ තියෙනවා."

"හොඳයි, එහෙනම් අපි ධාන්‍යාගාරෙ බලමු"



"කරුණාකරලා ඇවිල්ලා අපිට උදව්වෙන්න" සිනාසී රීටා දෙස බැලූ නැන්සි කීවා ය. "මම හිතන්නේ ට්‍රන්ක පෙට්ටිය වැටුණු තැන නම් අද්භූත දෙයක් නෑ කියලයි. රහසේ ඇතුළු වන්නා හෝග් මහත්මිය බය කරන්න තව අස්ථාවක් ලැබෙනකම් බලා ඉන්නවා වෙන්න පුළුවන්. සමහර විට ඒ කාමරයේ අමුත්තෙක් විදිහට නවාතැන් ගෙන ඉන්න ගමන් ඒ රහස් දොර හොයා ගත්තා වෙන්නත් පුළුවන්" ඉතිරි භූත දඩයක්කරුවන් පිරිස ධාන්‍යාගාරය වෙත ඇදෙද්දී නැන්සි, හෝග් මහත්මිය සමග කතා කිරීමට නැවතුණා ය. "ඔබට මතක් කරන්න පුළුවන් ද රහස් දොර තියෙන කාමරේ පසු ගිය අවුරුද්දකට විතර ඉඳලා නතර වෙලා හිටිය අයගේ නම් එහෙම ?"

"ඒකට ටිකක් වෙලා යයි. නමුත් මම ඔබට පෙන්වන්නම් මගේ අමුත්තන්ගේ නාම ලේඛනය"

ඇය නැන්සි සමග පහත මාලයට ගිය අතර පැරණි තාලයේ ලේඛනයක් ගෙන පෑවා ය. නැන්සි හා ඇය එක් ව ඉක්මනින් ම අමුත්තන්ගේ ලේඛනය කියවා බැලුවෝ ය.

එක්වර ම නැන්සිගේ ඇඟිල්ල මීට වසරකට පමණ පෙර දිනයක් ළඟ නතර විය. ඇය සන්ත්‍රාසයෙන් යුතුව ඒ දෙස බලා සිටියා ය. "මෙන්න තියෙනවා මට හුඟක් සමීප නම් දෙකක් ?" ඈ කීවා ය. "විල්බට් ප්‍රීට්සර් මහතා හා මහත්මිය."

මේ යුවළගේ පෙනුම ගැන විමසන ලදුව හෝග් මහත්මිය දැක්වූ විස්තරය ඇය සොයමින් සිටි මිනිසුන්ගේ විස්තරවලට සෑම අතින් ම ගැළපෙන බව නැන්සිට පෙනී ගියා ය.

"ඒ ගොල්ලො තමයි මිනිස්සු" නැන්සි හිස සලමින් පැවසුවා ය. "එයාලා ගැන වැඩි විස්තර මොනවත් හරි මතක ද?"

"ම් ! හුඟක් දේවල් නෙමේ. ප්‍රියමනාප පෙනුමක් තිබුණත් වැඩිය කාත් එක්කවත් කතා බහට කැමති පාටක් පෙන්නුවේ නෑ. ඇවිදින්න හරි සූරයෝ. වැඩි කාලයක් ගත කළේ අවට කැලෑවලයි, වතුපිටිවලයි ඇවිදිමින්"

"මට මතකයි එක් වතාවක් ප්‍රීට්සර් මට කිව්වා. ඔහුටත් මේ තානායම වගේ තැනක් තිබුණා නම් කියලා. මේ ස්ථානය විකිණීමේ අදහසක් නැද්ද කියලත් ඔහු ඇහැව්වා. ඇත්ත වශයෙන් ම මම නෑ කිව්වා. ඒ කාලේ මගේ ව්‍යාපාරය හරිම දියුණුයි. ඉතිං මට මෙතන විකිණීමේ කිසිම උවමනාවක් තිබුණේ නෑ"

ඇගෙන් ලද තොරතුරුවලින් ප්‍රබෝධමත් වූ නැන්සි තම මිතුරන්ට එක් වීම සඳහාත්, තමුන් දැනගත් දේ පැවසීම සඳහාත් ඔවුන් සොයා දිව ගියා ය.

ඇයගේ විස්තරය ඇසූ නෙඩ්, "මාව පැහැර ගත් වේලාවේ මෝටර් රියේ ඇතුළේ වැටිලා තිබිලා මට පොඩි සටහනක් හම්බවුණා. ඒකේ ලියලා තිබුණේ "රෙඩ්බාන් තානායම බලහත්කාරයෙන් විකිණීම" කියලයි. එහෙනම් ඒ සටහන මේ ස්ථානය ගැන වෙන්න ඕනෑ."

"සත්‍ය වශයෙන් ම ඔයා හරි !" නැන්සි ප්‍රකාශ කළා ය. "ප්‍රිට්සර් හදන්නේ හෝග් මහත්මියගේ විරෝධතාව බිඳ දමන්නයි. එතකොට තානායම අඩු මිලකට විකිණීමට ඇය එකඟ වෙන නිසා." අනෙක් පිරිස මේ අදහසට එකඟ වූහ.

ධාන්‍යාගාරය තුළත්, අවට වූ ගොඩනැඟිලි තුළත් කිසිවෙක් සැඟවී නොසිටි නිසා පරීක්ෂා කිරීම අත්හැර දැමීමට ඔවුහු තීරණය කළහ. සැන්දෑ කාලය ගත වූයේ අවතාර අශ්වයා හා අශ්වාරෝහකයා අල්ලා ගැනීමේ උපක්‍රම පිළිබඳ ව සාකච්ඡාවකිනි.

"අද රෑ හොඳින් හඳපායාවි" නැන්සි කීවා ය. "අපි රෑට මාරුවෙන් මාරුවට ධාන්‍යාගාරයේ ඉඳලා අවතාරේ පෙනෙයි ද කියලා බැලුවොත් හොඳ නැද්ද?"

භූත දඩයක්කරුවන් එකඟ වූ අතර මුර කිරීමේ කාලය වෙන්කර ගැනීම සඳහා තුණ්ඩු උඩ දමන ලදී. නැන්සිගේ කණ්ඩායමට ලැබුණේ රාත්‍රී දහයත් පාන්දර දෙකත් අතර කාලය තුළ ධාන්‍යාගාරයේ රැඳී සිටීමට ය. රාත්‍රී ආහාරයෙන් පසුව කෙටි නින්දකට ගිය ඔවුහු හරියටම රාත්‍රී දහයට ධාන්‍යාගාරයට පැමිණියහ.

"අපිට නම් මොකෙක්වත් දකින්න ලැබුණේ නෑ" ඔවුන් ධාන්‍යාගාරයට ඇතුළු වන විට ම හෙලන් වාර්තා කළා ය. "හැම දෙයක් ම නිහඬයි !" යනුවෙන් පැවසූ හෙලන් තම මුරය අවසන් කර කණ්ඩායමේ සිව් දෙනා ද සමඟ ධාන්‍යාගාරයෙන් පිට වූවා ය. "මම ඕනෑ ම ඔට්ටුවක් අල්ලන්නම් යම් කිසි සිද්ධියක් සිද්ධ වුණොත් සිද්ධ වෙන්නේ නැන්සි මුරකරන වේලාව ඇතුළත කියලා"

නැන්සි තම මිතුරන් සමග සේවා මුරය සඳහා හරි බරි ගැහී වාඩි වූවා ය. රාත්‍රිය ඉතා ම සුන්දර ය. නිශාචර පක්ෂීන්ගේත් රැහැයියන්ගේත් නාදය හැරුණු කොට සම්පූර්ණ නිහඬතාවක් පරිසරය පුරා ම විහිදී තිබුණි. ළමුන්ට රාත්‍රියේ අවදියෙන් සිටීම අපහසු බව



දැනී ගියේ නිදි කිරා වැටෙන එකිනෙකාගේ හිස් එකට ගැටෙන්නට පටන් ගත් විට ය.

තරු දීප්තිමත් ව බැබළුණු අතර සඳ රන් තැටියක් සේ ඉහළ අහසේ පායා විත් මුළු පොළෝ තලය ම කිරි සයුරක ගිල්වා දැම්මේ ය.

ඈතින් ඔරලෝසුවක මධ්‍යම රාත්‍රිය හඟවන කණිසම නාද වන්නට විය. තවත් මිනිත්තුවක් පමණ ගෙවී ගියේ ය. එක් වර ම බෙස් නැන්සිගේ උරහිසින් අල්ලා ගත්තා ය.

"අර අතන" ඈ කෙඳිරුවා ය.

වනයේ ගස් අතරින් තණ පිටිය වෙත ඇදෙමින් සිටියේ අවතාරයක පෙනුම ඇති සුදු පැහැති අශ්වයෙකි. ටික වේලාවකින් ඌ තණ පිටිය වටා දුවන්නට පටන් ගත්තේ ය.

සියලු දෙනා ම චකිතයෙන් යුතුව ඒ දෙස බලා සිටිද්දී ම වනය තුළින් අශ්වයා පදවන්නා ද මතු වී ආවේ ය. ඔහු සුදුපාට අශ්වාරෝහක ඇඳුම් ඇඳ සිටි අතර අශ්වයා පසුපස කඩා බිඳගෙන දුවන්නට පටන් ගත්තේ ය.

පළමුවෙන් ම අශ්වයා ධාන්‍යාගාරය වෙත කෙළින් ම දුවගෙන එන බව පෙනී ගිය හෙයින් ඌ ඇතුළට කඩා වැදීමට ඉඩ ඇති බව තරඹන්නෝ සිතූහ. ඔවුහු දොර ළඟින් ඈත් මෑත් වූහ. නමුත් ඊළඟ තත්පරයේදී ආපහු හැරුණු අශ්වයා වනය දෙසට දුවන්නට විය. ලුහු බඳින්නා ද ආපහු හැරී ඒ දෙසට ම දිවෙන්නට විය.

"අපි එයාව අල්ල ගන්න ඕනෑ" නැන්සි කීවා ය.

මුළු කණ්ඩායම ම ධාන්‍යාගාරයෙන් පිටට පැන තණ පිටිය හරහා වනය දෙසට දුවන්නට පටන් ගත්හ. භූත දඩයක්කරුවන් අශ්වයා හා අශ්වාරෝහකයා වනයට ඇතුළු වූ ස්ථානයට පැමිණෙන විට දෙදෙනා පිළිබඳව ම සලකුණක් හෝ එහි නොවී ය.

"උන් ඇත්ත සත්තු නොවෙයි ! අවතාර !" බෙස් වෙව්ලමින් කීවා ය.

බිම දණ ගසා නෙඩ් බිමට කණ තබා ටික වේලාවක් හොඳින් ඇහුම් කන් දුන්නේ ය.

"හරිම පුදුමයක්" ඔහු නැගී සිටිමින් කීවේ ය. "මට කිසිම කුර සද්දයක් ඇහෙන්නෙ නෑ"

"ඇත්තට ම නෑ" බෙස් තවමත් සිටියේ වෙව්ලමිනි. "මොකද

උන් දෙන්න ම අවතාර නිසා" නැවත ධාන්‍යාගාරයට ගොස් පාන්දර දෙක වන තුරු එහි සිට නිදා ගැනීමට යාම සුදුසු බවට ඈ අනිත් පිරිසට ආයාචනාත්මක ස්වරයෙන් කීවා ය.

ඇඩි අඳුර තුළින් වනය පීරා අශ්වයෙක් හා අශ්වාරෝහකයෙක් ලුහුබැඳීම ප්‍රායෝගික නොවූ නිසා බෙස් කියූ පරිදි ඔවුහු නැවත ධාන්‍යාගාරය වෙත ඇදුණෝ ය. ඉතිරි කාලයේ දී ඔවුන්ට කිසිවක් දක්නට නොලැබිණි.

ඊළඟට පැමිණි කණ්ඩායමට මේ පරිච්ඡේදය විස්තර කළ ඔවුහු නිදා ගැනීමට පිටත් වූහ. පසුදින උදෑසන අනාවරණය වූ පරිදි රාත්‍රියේ ඉතිරි යාමයේදී ද කිසිවක් සිදු වී නැත.

උදේ ආහාරයෙන් පසුව භූත දඩයක්කරුවන් සියලු ම දෙනා භූතාශ්වයා හා අශ්වාරෝහකයා පිළිබඳ කිසියම් සලකුණක් සොයා ගත හැකි දැයි බැලීම සඳහා වනය පරීක්ෂා කිරීම සුදුසු බව නැන්සි යෝජනා කළා ය. එය හොඳ අදහසක් බවට සියලු දෙනා ම එකඟ වූයෙන් පිරිස ඒ සඳහා පිටත් වූහ.

ඔවුන් තණ පිටිය හරහා ඇවිද යන අතරතුර දී "මෙතන කිසිම අශ්ව කුර සලකුණක් නෑ. ඒ කියන්නේ අශ්වයා අවතාරයක් බවයි" යනුවෙන් රීටා රහසින් පැවසුවා ය.

"මමත් ඒ කතාවට එකඟයි" බෙස් පැවසුවා ය. "අනේ වස්තුවේ, මම නම් මේ වැඩේට කැමති නෑ"

හොල්මන් අශ්වාරෝහකයා වනයට ඇතුළු වූ තැනින් හා වනයෙන් පිට වූ ස්ථානයෙන් පා සටහන් රාශියක් ම සොයා ගන්නට නැන්සි සමත් වූවා ය.

"මම නම් කියන්නේ" රීටා නැවතත් කතා කළා ය. "මේ පියවර සටහන් වෙන කෙනෙකුගේ කියලයි. අවතාර අශ්වයාට හිටියේ අවතාර අශ්වාරෝහකයෙක්."

පා සටහන් අනුව ගමන් කළ පිරිස පඳුරුවල කොළ අතු බිඳ දමා ඇති ස්ථානයකට පැමිණියෝ ය.

ටික වේලාවකින් අවට පරීක්ෂා කරමින් සිටි ජෝර්ජ් කෑ ගැසුවා ය. "මෙතන අශ්වයෙකුගේ කුර සටහන් තියෙනවා" ඈ ඉදිරියට දුවන්නට පටන් ගත් අතර ටික වේලාවකින් ම අනිත් අය වෙතින් නොපෙනී ගියා ය.

එක්වර ම බෙස් බියෙන් මර ලතෝනි දුන්නා ය. "ජෝර්ජ් අතුරුදහන් වුණා." යයි කෑගැසුවේ මහ පොළොව ඇගේ සොහොයුරිය ගිල ගත්තාක් මෙනි !



# 14

තිගැස්සුණු නැන්සි සහ මිතුරෝ ජෝර්ජ්ට කුමක් සිදුවී දැයි බැලීමට ඉදිරියට දිව යන්නට වූහ. අවතාර මිනිසා ඈ අල්ලා ගැනීමට මග රැක සිටියාවත් ද?

"ජෝර්ජ් ............ ජෝර්ජ්, ඔයා කොහෙද?" බෙස් වියරුවෙන් මෙන් ඒ මේ අත බලමින් කෑ ගැසුවා ය.

ඔවුන්ට ජෝර්ජ් සොයා ගැනීමට වැඩි කාලයක් ගත වූයේ නැත. ඈ පඳුරුවලින් වැසී ගත් ගැඹුරු වළකට වැටී සිටියා ය. වැල් හා මුල්වල එල්ලෙමින් උඩට ආ ඈ ලැජ්ජාවෙන් මෙසේ කීවා ය.

"මට විශ්වාසයි මාව උගුලකට අහුවුණා. මම දන්නේ නෑ මට වලහෙක් කියල ද නැත්තම් හාවෙක් කියල ද කියන්න ඕනෑ කියලා."

අන් පිරිස සිනාසුණු අතර බෙස් සිතට දැනුණු සහනය නිසා ම විශාල සුසුමක් හෙලුවා ය.

"මම කල්පනා කරන්නේ මෙතන වළක් කපලා තියෙන්නේ මොකටද කියලයි ?" ඩේව් අනිත් පිරිස දෙස බලමින් කීවේ ය.

"සමහරවිට පස්සෙන් පන්නගෙන එන කෙනෙක්ව වළක්වන්න වෙන්න පුළුවන්" ජෝර්ජ් ප්‍රකාශ කළා ය. "අපි ගිහිල්ලා අශ්ව කුර සලකුණු සොයා ගෙන ඔවුන් පස්සෙන් පන්නමු."

ඔවුහු වනය තුළ ඉව අල්ලමින් ඉදිරියට ගියහ. කුර සටහන් අනුව යාම පහසු වුවත් ඒවා මහා මාර්ගය අසලින් අවසන් වී තිබුණි. පාරට ගල් දමා තලා තිබුණු නිසා ඉන් එහාට කුර සටහන් සෙවීම නිෂ්ඵල කාර්යයක් විය.

"අපිට වැඩේ මෙතනින් අත් හරින්න වෙනවා" නෙඩ් අසන්තෝෂයෙන් කීවේ ය. "හරිම සවුත්තුයි."

බලාපොරොත්තු සුන් වූ භූත දඩයක්කරුවෝ වනය තුළින් තානායම බලා ආපසු පියවර මනින්නට වූහ.

අශ්වයා තමන්ට තවමත් ප්‍රහේලිකාවක් බව ඩේවි කීවේ ය. "අපි දැන් දන්නවා අශ්වයත්, අශ්වාරෝහකයාත් දෙන්න ම ඇත්ත ම සතෙකුයි, මිනිහෙකුයි කියලා. ඒත් මොකද අශ්වයගේ කුර සටහන් තණ බිමේ තිබුණේ නැත්තේ?"

මේ ගැටලුවට තමා ළඟ විසඳුමක් ඇති බව නැන්සි කීවා ය. "මම හිතන්නේ නෑ අර සුදුපාට අශ්වයා ඇත්ත එකෙක් කියලා. ඒක සමහර විට විශාල බැලුමක් වෙන්න ඇති. ඒකට යන්ත්‍රයක් සවි කරලා පස්සෙන් දුවන අශ්වාරෝහකයා දුරස්ථ පාලකයක් මඟින් ඒ අශ්වයාව ක්‍රියා කරවනවා."

"ඔයා කියන්නේ භූතාවේශ ඔරුව වගේ ?" ජෝර්ජ් ඇසුවා ය.

"ඔව්, ඒ වගේ ම මට හිතුණා අශ්වාරෝහකයා විල්බට් ප්‍රීට්සර්. ද කියලත්"

මෙවැනි සූක්ෂම, එමෙන් ම ඉතා වියදම් සහිත ක්‍රමයක් හොල්මන් වැඩ සඳහා යොදා ගන්නේ ඇයි දැයි තේරුම් ගැනීමට නොහැකි බව බ්‍රෙට් කීවේ ය. "මිනිහා එක්තරා විදිහක පිස්සෙක් ද කොහෙද? නැත්නම් හදවතක් නැති දුෂ්ටයෙක්" නැන්සි කීවා ය.

ඔවුන් ජෝර්ජ් ඇද වැටුණු බොරුවළ වෙත පැමිණි විට, "මට පොඩි සැකයක් තියෙනවා. අපි මේ බොරුවල පරීක්ෂා කරලා බලමු" යනුවෙන් පැවසුවා ය.

පිරිමි ළමෝ ඉක්මනින් ම වළට පැන කොළ අතු ඉවත් කරන්නට පටන් ගත්තෝ ය. ඉන් පසු නැන්සි වළ තුළට ලිස්සා ගියා ය. එහි වූ බොහෝ කොළ ඉවත් කරමින් සෑහෙන වේලාවක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඇගේ මහන්සියේ ප්‍රතිඵල ලැබුණි. ඈ කුඩා සිප්පි කටුවක් සොයා ගත්තා ය. "මම කල්පනා කරන්නේ කවුරු හරි මේක වලට විසි කරලා ද?" ඇය සැකයෙන් යුතුව කීවා ය.

"නැත්නම් වළ කොටන කොට කොටපු කෙනාගේ සාක්කුවෙන් මේක වැටුණ ද කියලයි."

"තවත් සිප්පි කටුවක් ! මොනවා හරි ඒකේ කොටලා තියෙනවද?" ජෝර්ජ් විස්මය පළ කරමින් ඇසුවා ය. ඇය වළෙන්



ගොඩ ආ විගස ම ඉර එළියට අල්ලා සිප්පි කටුව පරීක්ෂා කර බැලීම ඇරඹුවා ය.

"මේ තියෙන්නේ සලකුණ" ඇය සතුටින් යුතුව උඩ පැන්නා ය. "ඉස්සර වෙලා වගේමයි. M.T ඉංග්‍රීසි අකුරු දෙක"

"ඒ ගැනි නම් සිප්පිකටුවලට වහ වැටුණු කෙනෙක්" ඩේවි කීවේ ය. "මේක ඉතා ම සුන්දරයි"

එය ඉතා සිත්ගන්නාසුලු රැළි ගැසීමක් සහිත තද තැඹිලි පාට කටුවකි.

ඔවුන් තානායමට ළඟා වූ විට ඈ සමග පල්ලියට යාමට ඔවුන් කැමති දැයි හෝග් මහත්මිය ඇසුවා ය. නෙඩ් සහ නැන්සි එක වර ම ඊට කැමැත්ත පළ කළහ.

"මමත් යන්න හරි ම කැමතියි. ඒත් අපිට ලෑස්ති වෙන්න කොච්චර වෙලාවක් තියෙනවා ද? මාව වළට වැටුණු නිසා ඇඟ පුරා ම මඩ. මම නාගන්න ඕනෑ" ජෝර්ජ් මඳක් පැකිළෙමින් කීවා ය.

"ඕ ! ඔබට තියෙනවා පැය බාගයක්" හෝග් මහත්මිය කීවා ය.

"හරි මම එන්නම්" කී ජෝර්ජ් එක වරකට පියගැට දෙක බැගින් නගිමින් කාමරය වෙත දිව ගියා ය.

සෑම අයෙකු ම පල්ලියට යාමට කැමැත්තක් දැක්වූ අතර ඊට සුදුසු ඇඳුම් ඇඟලා ගැනීමේ යුහුසුලු වූහ. නැන්සි සූදානම් වී පළමුවෙන් ම කාමරයෙන් එළියට පැමිණි අතර හෝග් මහත්මියට බොරු වළේ දී සොයා ගත් සිප්පිකටුව පෙන්වීමට පහළ මාලයට ආවා ය.

"ඔබ දන්නව ද මේ මොකක් ද කියලා ? මම නම් ඒකේ පාටට හරිම කැමතියි."

"නෑ, මම දන්නේ නෑ" මහලු කාන්තාව පිළිතුරු දුන්නා ය. "නමුත් අර රාක්කේ තියෙනවා බෙල්ලො ගැන පොතක් අවශ්‍ය නම් අරගෙන බලන්න."

නැන්සිට ඉක්මනින් ම පොත සොයා ගැනීමට හැකිවූ අතර තමන්ගේ අතේ ඇති සිප්පි කටුවට සමාන රූපයක් තිබෙන පිටුව දක්වා පිටු පෙරළා ගෙන ගියා ය.

"සයිප්‍රියා නමින් විශාල බෙල්ලන් පවුලක් තිබේ. ඔවුන්ට කියන පොදු නම නම් කව්රීස්. මේවා පැසිපික් සාගරයේ ඇති ෆීජි දූපත් වාසීන් අතර ඉහළ වටිනාකමක් ඇති දෙයක් ලෙස සැලකුම් ලබයි. එක්තරා කාලයක දී නායකයෙක් තම නිල ලාංඡනය ලෙස "කව්රී" කටුවක් පැළඳි අතර වෙනත් අයට එම වර්ගය පැළඳීම තහනම් කර තිබුණි." යනුවෙන් පොතේ සඳහන් ව තිබුණි.

ඈ දිගට ම කියවා ගෙන ගියා ය. ඇය දැනගත් කරුණුවලට අනුව, "මේකට තමයි 'සයිප්‍රියා' එහෙම නැත්තම් රත්තරන් කව්රී කියන්නේ" ඈ තමාට ම කියා ගත්තා ය. ලිපියේ තව දුරටත් සඳහන් ව තිබුණු ආකාරයට මේ වර්ගයේ සිප්පි කටු කොතරම් දුර්ලභ ද යත් ආණ්ඩුව විසින් ඒවා ෆීජි දූපත්වලින් පිටතට ගෙන යාම පවා තහනම් කර තිබුණි.

ඒ මොහොතේ එතැනට පැමිණි නෙඩ්ට ඇය මේ දුර්ලභ සිප්පි කටුව ගැන පොතේ සඳහන් ව තිබූ දේ පැවසුවා ය.

"මට හොඳට ම විශ්වාසයි මේක නැතිවුණු කෙනා නැවත බොරු වළ ළඟට ඇවිත් සිප්පි කටුව හොයන බවට. අපි රෑ කෑමෙන් පස්සේ එතැනට ගිහිල්ලා ටික වේලාවක් ඔත්තු බලමු" ඈ යෝජනා කළා ය.

"හරි මම ලෑස්තියි" ඔහු කිවේ ය. "මම බලාපොරොත්තු වෙනවා අපි දකින්න බලාපොරොත්තු වෙන මිනිහා අපි යන්න කලින් ඇවිත් ගිහිල්ලා නොතියෙයි කියලා"

නැන්සි සුසුමක් හෙළුවා ය. "මම හිතනවා එහෙම වුණොත් අපිට කරන්න දෙයක් නෑ කියලා"

ප්‍රීට්සර් පූජාවට සහභාගී වීම ගැන ඈ තුළ සැකයක් වුවත් පල්ලියට ඇතුළු වූ හැටියේ ම නැන්සි පැමිණ සිටි සියලු දෙනාගේ ම මුහුණු පරීක්ෂාවෙන් බැලුවා ය. එහෙත් ඒ කිසි ම මුහුණක් ප්‍රීට්සර්ගේ ගති ලක්ෂණ කියා පෑවේ නැත.

ඉන්පසු ඈ සිය පූර්ණ අවධානය දේශනය වෙත යොමු කළා ය. *අන් වස්තු සොරකම් නොකරනු* යන්න ඔස්සේ පැහැදිලි කිරීමක් කළ පියතුමා කෙනෙකුගේ දේපළ සොරකම් කිරීම හැරුණු කොට වෙනත් බොහෝ ආකාරවල සොරකම් ඇති බව පැහැදිලි කළේ ය. කෙනෙකුගේ



කාලය, හොඳ නම, ප්‍රීතිය යන දේවල් සොරකම් කිරීමත් මහත් පාපයක් බව දක්වා සිටියේ ය. ඒ ඇසූ නැන්සිට ප්‍රීට්සර් ගැන සිහිපත් නොකර සිටීමට නොහැකි විය.

පූජාව අවසන් වූ පසු කුඩා නගරයේ සවාරියක් යෑමට නැන්සි යෝජනා කළා ය. "අපිට සමහර විට අබිරහස විසඳන්න හෝඩුවාවක් හොයා ගන්නත් පුළුවන් වෙයි." එහෙත් කිසිවෙක් ඊට එකඟ වූයේ නැත.

"මේක ඇත්ත වශයෙන් ම ලස්සන සාමකාමී පිටිසර නගරයක්." බෙස් පැවසුවා ය. "මම හිතන්නේ නෑ අර නිච ප්‍රීට්සර් මෙහාට ඇවිත් මෙතන පිළිවෙළ නැති කරලා දායි කියලා"

පැය දෙකකින් පමණ පසු රාත්‍රී ආහාර ගත් හුත දඩයක්කරුවෝ බොරු වළ වෙත ගියහ. එතැනට කවුරුන් හෝ පැමිණි බවක සලකුණක් ඔවුන්ට සොයා ගත නොහැකි විය.

"සිප්පි කටුව හොයාගෙන එන පුද්ගලයෙකු අල්ල ගන්න අපි තාමත් ප්‍රමාද නැතිව ඇති" බ්‍රෙට් බලාපොරොත්තු සහගතව කිවේ ය.

පිරිස හැකි ඉක්මනින් ම ජෝර්ජ් ඇද වැටීමට පෙර තිබූ ආකාරයෙන් ම බොරු වළ කොළ අතු දමා වසා දැමූහ. ඉන් අනතුරුව සෑම කෙනෙක් ම ගසක් පිටි පසට වී සැඟවුණෝ ය.

රැක සිටින්නන්ට බොහෝ කාලයක් ගත වන්නාක් මෙන් දැනුණි. පිරිමි ළමයි අසහනයට පත් වූ අතර ඇඟමැලි කැඩීමටත් ව්‍යායාම් වශයෙන් උඩ පැනීමටත් පටන් ගත්තෝ ය.

බෙස් වෙතින් "ඌයි" යන හඬක් නික්මිණි. "මට මොකෙක් හරි දෂ්ට කළා" ඈ කීවා ය.

ජෝර්ජ් ඇයට අතින් ඇන්නා ය. "මඩ ටිකක් එතනට තියා ගෙන දෙවියන්ගේ නාමෙට කට වහගෙන ඉන්න. ඔයා මෙතැන්ට එන කාව හරි අල්ල ගන්න තියෙන අවස්ථාව නැති කරන්නයි හදන්නේ"

බෙස් ඊට අවනත වූවා ය. ඇය සිටි තැනින් ගලා ගිය කුඩා දිය පහරෙන් මඩ ටිකක් සූරාගත් ඈ දෂ්ට කළ ස්ථානයට තබා ගත්තා ය.

ඔවුන්ට හැඟුණේ කාලය ඉතා සෙමින් ගත වන බවකි. පිරිමි

ළමයි වරින් වර තම අත් ඔරලෝසු දෙස නොරිස්සුම් බැලුම් හෙළූහ. ඩේවි යමක් කීමට කට අරිනවාත් සමග ම ළඟින් ම ශබ්දයක් ඇසුණෙන් ඔහු තම වචන ගිල ගත්තේ ය.

"අඩි ශබ්දයක් !"

සැඟවී සිටි ඔත්තු බලන්නෝ තම දෑස් අඩිපාරෙන් ඉවතට නොගෙන ම බලා සිටින්නට වන්හ. ඔවුන්ගේ හදවත් වේගයෙන් ස්පන්දනය වන්නට පටන් ගත්තේ ය. තමන් වෙතින් යම් හඬක් නැගේවි යැයි සැකයෙන් තව තවත් සැහැල්ලුවෙන් හා ප්‍රවේශමෙන් රැඳී සිටීමට උත්සාහ දැරූහ.

අවුරුදු දහසයක් පමණ වයසැති පිරිමි ළමයෙක් ඔවුන් සිටි දිශාවට ඇවිද එමින් සිටියේ ය. මනා පෙනුමකින් යුතු ඔහු හොඳින් ඇඳ පැළඳ සිටි බව කාහටත් පැහැදිලි ව පෙනී ගියේ ය.

"සහතික වශයෙන් අපි මුණ ගැහෙන්න බලාපොරොත්තු වුණු පුද්ගලයා මෙයා නෙමෙයි." නැන්සි තමාටම කොඳුරා ගත්තා ය.

පිරිමි ළමයා කොළ අතුවලින් වසා ඇති බොරු වළ ළඟට විත් නතර විය. ඒ දෙස නැවතී මඳ වේලාවක් බලා සිටි ඔහු පහතට නැවී කොළ අතු ඉවත් කරන්නට පටන් ගත්තේ ය.

"කවුරු හරි සිප්පි කටුව සෙවීමට මෙයාව මෙහාට එවලා තියෙනවා" නැන්සි සිතුවා ය.

සැඟවී රැකවලෙහි යෙදී සිටි පිරිස පෙර එකඟ වී සිටි ආකාරයෙන් ම නැන්සි අත ඔසවා සංඥා කරත් ම පෙරට යාම ඇරඹූවෝ ය.

සොරුන් මෙන් සෙමෙන් පා තගමින් ළමයි සිව්දෙනා තමන් සැඟවී සිටි ස්ථානවල සිට ආගන්තුක පිරිමි ළමයා වටා වටයක ආකාරයෙන් සිට ගත්හ. ඔවුන් කොතරම් නිහඬ ව වටලෑම සිදුකළා ද යත් පිරිමි ළමයාට ඔවුන්ගේ පැමිණීම පිළිබඳ ව කිසි ම අදහසක් ඇති කර ගැනීමට නොහැකි විය.

"ඔබ සොයන්නේ මොනවා ද?" යනුවෙන් නෙඩ් පැවසූ විට ඔහු තිගැස්සී උඩ පැන්නේ ය.



## 15

අධික ලෙස බියට පත්වූ ඔහු කෑ කැගැසුවේ ය.

"මම ........ කවුද?" ඔහු ගොත ගැසුවේ ය.

තමා සම්පූර්ණයෙන් ම වටලා ඇති බව දුටු විට බියපත් බැල්මක් ඔහුගේ දෑසට ආරූඪ විය. නමුත් වැඩි වේලා ගත වීමට පෙර ම ඔහු ස්වාභාවික තත්ත්වයට පත් විය.

"මම ........ මම හාවන් අල්ලන්න ආවා" පිරිමි ළමයා නෙඩ්ට පිළිතුරු දුන්නේ ය. "ඒකේ කිසි ම වැරැද්දක් නෑනේ."

"ඔයා බැලුවේ මේ වළ ඇතුළේ හාවෝ ඉන්නව ද කියල ද?" ජෝර්ජ් ප්‍රශ්න කළා ය.

"ඇත්තෙන් ම, ඇයි නැත්තේ"

නැන්සි පෙරට විත් ඔහුගේ දෑස් දෙස කෙළින් බලමින් ඉදිරියෙන් සිට ගත්තා ය. "ඔබ කියන්නේ ඇත්තම ද?" ඈ ඇසුවා ය. "මට නම් හිතෙන්නේ ඔබ වෙන කිසියම් දෙයක් හොයනවයි කියලයි."

"ඔබ හිතනව ද එහෙමයි කියලා" ළමයා තරමක් පුදුමයට පත්වූ ආකාරයෙන් විමසුවේ ය.

නැන්සි තරමක අනතුරු දායක පියවරක් ගැනීමට සිතුවා ය. "යම් කිසි විදිහකින් ඔබ සොයන දේ සිප්පි කටුවක් වෙන්න බැරිද?" ඈ කිසිත් ගණන් නොගන්නා ආකාරයෙන් ඇසුවා ය.

කොලුවා පුදුමයෙන් උඩ පැන්නේ ය. ඔහුගේ නිර්භීතකම සම්පූර්ණයෙන් ම නැතිවී ගියේ ය. "ඔබ දන්නේ කොහොම ද?" ඔහු වෙව්ලන හඬකින් ඇසුවේය. ඔහුගේ දෑස්වල හා පැටියෙකුගේ මෙන් බියසුලු අහිංසක ස්වරූපයක් මතු වී ආවේ ය.

"මම ඒක ඇහිඳ ගත්තා. ඒකේ අයිතිකාරයා කවුද?"

"මම දන්නේ නෑ" පිරිමි ළමයා පිළිතුරු දුන්නේ ය. "ඒක තමයි ඇත්ත. මගෙ නම ස්ටීව් රෝවර්, පදිංචි වෙලා ඉන්නේ මිඩ්ල්බර්ග් නගරයේ. උස කෙට්ටු මිනිහෙක් ඇවිත් මගෙන් ඇහැව්වා ගතමනාවක් හොයා ගන්න කැමති ද කියලා"

ස්ටීව් මඳකට කතාව නැවැත්වූ විට නැන්සි ඔහුව පොලඹවමින්, "ඔහු සිප්පි කටුව සොයා දුන්නොත් මුදලක් දෙන බව කිව්වා. එහෙමද?" යනුවෙන් විමසුවා ය.

පිරිමි ළමයා හිස වැනුවේ ය. "මිනිහ මට කිව්වේ නෑ එයා කවුද කියලා. ඔහු වළට වැටෙන කොට වළලුකර පෙරළුනා කිව්වා එච්චරයි. ඔහුට වැඩි දුරක් ඇවිදින්න අමාරුයි. ඒ නිසයි මාව එව්වේ."

"එතකොට ඔබ මෙහාට ආවේ කොහොමද?" නැන්සි විමසුවා ය.

ඔහු තමා මෝටර් රියෙන් කැලෑවේ මායිම දක්වා ගෙන ආ බව කොලුවා පැවසුවේ ය. ඔහු එතන සිට වනය තුළින් පයින් ගමන් කර ඇත. "එයා මං එනකම් බලා ගෙන ඉන්නවා. සිප්පි කටුව නැතිව මං ආපසු ගියොත් ඔහු මොනවා කියයි ද මං දන්නේ නෑ."

මෙහි දී නෙඩ් අලුත් යෝජනාවක් ගෙනාවේ ය. "අපි ඔබත් එක්ක එනවා. නමුත් ජේන්න එන්නේ නෑ. අපි හොයන මිනිහා මේ මිනිහා නම් ඔබ තනිව ම ඉන්න බව පෙන්වන එක හොඳයි. නමුත් මීට පස්සේ ඔහුත් එක්ක කිසි ම ගනුදෙනුවකට යන්න එපා."

නෙඩ්, බ්‍රෙට් හා ඩේව් ඉදිරියෙන් ගොස් සැඟවී සිට ස්ටීව් මෝටර් රියට නැඟුණු වහා ම මිනිසා මතට පැන ඔහු මෙල්ල කර ගැනීම කළ යුතු විය. ආරක්ෂාව සඳහා ගැහැනු ළමයින් තිදෙනා පසුපසින් පැමිණිය යුතු විය.

"ඒ වගේ ම" නැන්සි සිතුවා ය. "අපි තුන් දෙනා ම ඇහැ ගහගෙන හිටියොත් ස්ටීව්ට අපේ ඇස්වලට වැලි ගහලා පැනලා යන්නත් බැරි වේවි."

නෙඩ් සහ ඔහුගේ සගයෝ මහා මාර්ගය ආසන්නයට ම පැමිණ මහා මාර්ගය හොඳින් දර්ශනය වන සේ ගස්වලට මුවා වී සිටියහ. මෝටර් රථයක් නවතා තිබුණු නමුත් එහි කිසිවෙකු සිටින බවක් නොපෙනුණි. ඔවුන්ගේ ඇස් පාරේ එක් පැත්තක සිට අනෙක් පැත්තට සැහෙන වේලාවක් ගමන් කළත් ඔවුන්ට කිසි ම මිනිසෙකුගේ සේයාවක් දැකිය නොහැකි විය.



"මට හිතා ගන්නවත් බෑ මේ මිනිහා කොහේද කියලා" නෙඩ් තමාට ම මුමුණා ගත්තේ ය.

මිනිත්තු කිහිපයකින් සෙමෙන් පිය නගමින් ස්ටීව් ආපසු එන ආකාරය පෙනුණි. ඔහු බියට පත් වී සිටින බව නෙඩ් අනුමාන කළත් ඔහු දිගට ම ඉදිරියට ම ගියේ ය. මෝටර් රථය වෙත පිය නැගූ ඔහු එහි ඉදිරිපස දොර විවර කර ගෙන වාඩි වූයේ ය. ඔහු රියදුරු අසුනට මාරු වනවිට යන්තම් දොර වැසුවේ ය.

"ඒක හරිම විහිළුවක්" නැන්සි නෙඩ් සැඟවී සිටි තැනට පැමිණෙමින් කොඳුරා කීවා ය.

"සමහර විට ඒක එක්තරා විදිහක උපක්‍රමයක් වෙන්න පුළුවන්"

ඊළඟ මොහොතේ ස්ටීව් එන්ජිම පණ ගැන්වී ය. ඊළඟ මොහොතේ ගියරය මාරු කළ ඔහු පාර දිගේ මෝටර් රථය පදවා ගෙන ඉගිලුණේ ය.

"ඕ ! විශ්වාස කරන්නත් අමාරුයි" බෙස් ජෝර්ජ් සමග අනිත් පිරිසට එකතු වන අතර කීවා ය. "එහෙනම් එයා අපේ කනෙන් රිංගුවා"

එම තත්පරයේ දී ම රැකවල්ලු පිරිස පිටුපස ආසනයේ නිඳා සිටි මිනිසෙක් හරිබරි ගැහී වාඩි වනු දුටුහ. එම මිනිසා උස, කෙට්ටු එමෙන් ම කැරලි ගැසුණු කෙස් සහිත බව පුදුමයෙන් කටවල් අයා ගෙන සිටි පිරිසට පෙනී ගියේ ය.

"ප්‍රීට්සර් !" බ්‍රෙට් කෝපයෙන් කෑ ගැසුවේ ය. "මිනිහා නියමෙට රඟපෑම කළා. අපි නිකම්ම මෝඩයෝ වුණා."

"ඔව්" නැන්සි කීවා ය. "නමුත් අඩු තරමින් එයාට සිප්පි කටුව ලබා ගන්න බැරි වුණා. අපි දන්න තොරතුරු ටික පොලීසියට දන්වමු."

මෝටර් රථය ඉදිරියට ඇදෙන අතර ළමයි පිරිස එහි වර්ගය, අංකය ආදිය සටහන් කර ගත්හ.

"දැන් පොලීසියට ලේසි වෙයි මිනිහාව අල්ල ගන්න එක" බ්‍රෙට් කීවේ ය.

"ඔව්" ඩේව් එකඟ වූයේ ය. "නමුත් අපි ස්ථානායමට ගිහිල්ලා කතා කරද්දී ප්‍රීට්සර් හුඟක් දුර ගිහිල්ලා තියෙයි. ඒ වගේ ම වෙනත් අංකයක් සවිකර ගන්නත් වෙලා තියෙනවා"

“එහෙනම් අපි මොකක්ද කරන්නෙ?” ජෝර්ජ් ඇසුවා ය.

පාර දිගේම පයින් යායුතු බවට නැන්සි යෝජනා කළා ය. “අපිට හම්බවෙන පළමු ගෙදරින් ම අහමු අපට දුරකථනය පාවිච්චි කරන්න දෙන්න පුළුවන් ද කියලා”

ළමයි හය දෙනා ඉතා වේගයෙන් මාර්ගය දිගේ පියවර මැන්න අතර ප්‍රීට්සර් ඔවුන් මගහැර ගිය දක්ෂ උපායශීලී ආකාරය පිළිබඳ ව දිගින් දිගට ම පුදුමයෙන් යුතුව කතා කළෝ ය.

“ස්ටීව් මෝටර් රථයට නැග්ග වෙලාවෙ ම ප්‍රීට්සර් අණ කරන්න ඇති මෝටර් රථය එළවගෙන යන්න කියලා. සමහර විට ස්ටීව්ට තර්ජනය කරන්නත් ඇති අනතුරක් කරන බවට” නැන්සි සිද්ධිය තමා උපකල්පනය කළ ආකාරය පැහැදිලි කළා ය.

“මම නම් හිතන්නේ ස්ටීව්, මිනිහට අපි ගැන කියයි කියලා” බෙස් පැවසුවා ය.

“මම හිතන්නේ ඔහු කියන එකක් නෑ” ජෝර්ජ් සිය විරෝධය පළ කළා ය. “ප්‍රීට්සර් දැන ගත්තොත් සිප්පි කටුව අපි ළඟ කියලා ඒක නැවත ලබා ගන්න මොකක් හරි භයානක දෙයක් කරයි.”

ඊළඟ නිවස කරා දිගු වෙහෙස කර ගමනක් විය. එම නිවසේ අය ආලින්දයේ වාඩි වී සිටියහ. ඔවුහු ඉතා මිත්‍රශීලී ආකාරයට ළමා පිරිස පිළිගෙන තමන්ගේ පවුලේ නම “සැටර්න්” බව ද කීවෝ ය.

“ඔයාලට හරිම මහන්සි පාටයි” සැටර්න් මහත්මිය කීවා ය. “ඔයාලට බොන්න සීතල බීමක් දෙන්න ද?”

“ඒවා නම් අපි සතුටින් බාර ගන්නවා” නැන්සි පිළිතුරු දුන්නා ය. “නමුත් මම ඊට කලින් දුරකථනය පාවිච්චි කරන්න කැමතියි. පොලීසියට හදිස්සි පණිවිඩයක් දීමට තියෙනවා. අපි මෙහාට සැතපුමකට විතර එහායින් අරුම පුදුම සැක කටයුතු සිද්ධියක් දැක්කා. අපිට අවශ්‍යයි පොලීසිය මේ ගැන දැනුවත් කරන්න.”

සැටර්න් මහත්මිය නැන්සි ගේ තුළට කැඳවා ගෙන ගොස් දුරකථනය ඇති තැන පෙන්වූවා ය. ඇය දුරකථන ඇමතුම ගන්නා අනතුරේ දී ගෙහිමි කාන්තාව මුළුතැන්ගෙට ගොස් උස වීදුරු සයකට පලතුරු බීම පුරවා නිවසේ දී සාදන ලද කේක් තසිමක් ද සූදානම් කළා ය. නැන්සි ඈ සමග ආලින්දයට පැමිණි විට ළමයි පිරිස බිම වාඩි වී තමන්ගේ බීම වීදුරු ආශාවෙන් තොල ගාන්නට පටන් ගත්හ.



කේක් සමග පලතුරු බීම ඔවුන්ට දිව්‍ය භෝජනයක් මෙන් හැඟුණේය. මිඩ්ල්බර්ග් හි පදිංචි ස්ටීව් රෝවර් නම් ළමයෙකු ඔවුන් හඳුනන්නේ දැයි නැන්සි ඇසුවා ය.

දූවරුන්ගෙන් එක් අයෙක් පිළිතුරු දෙමින්, “මම දන්නවා ස්ටීව්ව එයා මාත් එක්ක උසස් විද්‍යාලේ ඉගෙන ගත්තා. නමුත් එතනින් කට්ටි පැන්නා. එයා හරි ම හොඳ කෙනෙක්. නමුත් එයාට ඉස්කෝලේ පෙන්නනන්න බෑ” යැයි පැවසුවා ය.

“ඔව්, බාර්බි, මට නගරෙ දී දැනගන්න ලැබුණු විදිහට කිසි ම සැකයක් නැතිව ම කියන්න පුළුවන් එයා මහන්සිවෙලා වැඩ කරන්න අකමැති බව” සැටර්න් මහතා කතාවට එක්වෙමින් කීවේ ය.

“අපි හිතනවා ඔහු මොකවත් කරදරේක පැටලිලා නැතෙයි කියලා”නැන්සි දිගට ම කියා ගෙන ගියා ය. ඈ කෙටියෙන් ස්ටීව් හා මෝටර් රථයේ සිටි මිනිසා පිළිබඳ ව විස්තර කළා ය.

බාර්බිගේ ඇස් එළියට පැනීමට තරම් විශාල වී ගියා ය. “ඔයා කියන්නේ අර මිනිහා ස්ටීව්ට අනතුරක් කරයි කියල ද? අයියෝ දෙවියනේ ! මම හිතනවා එහෙම දෙයක් නොවෙයි කියලා”

“මමත් එහෙම ම හිතනවා” නැන්සි කීවා ය. “නමුත් මට හරි ම කනගාටුයි”

රසවත් බීම හා කේක් මෙන් ම විනාඩි කිහිපයක විවේකය පයින් ගමන් කළ පිරිසගේ ප්‍රාණවත් බව නැවත ඇතිකර තිබුණි. යම් කිසි විදියකින් රෙඩ්බාන් තානායම වෙතට යාමට කෙටි පාරක් ඔවුන් දන්නේ දැයි නෙඩ් ඇසී ය.

“ඔයාලා එහේ ඉඳල ද එන්නේ?” සැටර්න් මහත්මිය පුදුමයෙන් ඇස් ලොකු කර ගනිමින් ඇසුවා ය. “මට ආරංචි වුණා ආයෙත් අවතාර අශ්වයා නිතර පෙනෙන්නට පටන් ගෙන ඇති නිසා තවදුරටත් කවුරුත් ම එහෙ නවාතැන් ගන්නේ නෑ කියලා”

“අවාසනාවකට වගේ ඒ කතාව ඇත්ත” නැන්සි ඇයට කීවා ය. ඈ සිනාසුණා ය. “අපි බලාපොරොත්තු වෙනවා මේ අබිරහස විසඳන්න. මොකද අපි හිතන්නේ නෑ මේ අශ්වයයි, අශ්වාරෝහකයයි ඇත්තට ම අවතාර කියලා. සමහරවිට කෙනෙක් හෝග් මහත්මියව බය කරන්න හදනවා වෙන්න පුළුවන්”

“නමුත් ඒ මොන එහෙකට ද?”

“අපිටත් දැන ගන්න ඕනෑ ඒක ම තමයි” නැන්සි කල්පනාකාරීව

කිවා ය. ප්‍රීට්සර් හෝග් මහත්මිය බිය ගන්වා අඩු මුදලකට තානායම මිල දී ගැනීමට බලාපොරොත්තු වෙනවා යන තම සැකය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඔවුන්ට පැවසීමට අවශ්‍ය කාරණයක් ලෙස නැන්සි නොසිතුවා ය.

"මම ඔබලාට සුබ පතනවා" සැටර්න් මහතා කීවේ ය. "හොඳයි, කෙටි පාරක් ගැන නේද? මෙතැනින් සැතපුම් බාගයකට විතර එහායින් ඔයාලගේ දකුණු අත පැත්තට ගුරු පාරක් හම්බ වෙයි. එතැනින් හැරිලා ඒ පාර දිගේ ම ගියහම ඔයාලට තානායමට ඉතා ම ළඟයි."

සැටර්න් මහතාටත්, මහත්මියටත් ආගන්තුක සත්කාරය පිළිබඳ ව මුව නොසෑහෙන තරම් ස්තුති කළ ඔවුහු තානායම බලා පිටත් වූහ. ඔවුන් ගුරු පාර දිගේ සෑහෙන දුරක් ඇවිද ගිය පසු ඩේව් මහ හඬින් සිනා සෙන්නට පටන් ගත්තේ ය.

"මොකක් ද අර පැරණි කියමන? වටෙන් යන පාර තමයි ගෙදරට ළඟ ම පාර ද? නැත්නම් ළඟින් ම කැරකිලා යන එක ගෙදරට දුර ම පාර ද? මොකක් වුණත් මේක තමයි මගේ ජීවිතේට දැකපු දිග ම "කෙටි පාර"

මිතුරෝ සයදෙන ඉතා වෙහෙස නිසා දෙපැත්තට වැනෙමින් අවසානයේ දී ගුරු පාරේ කෙළවරට ආවෝ ය. සැටර්න් මහතා පැවසූ ආකාරයට තානායම ඔවුන්ට ඈතින් දිස් වූ අතර ඔවුහු ඒ දෙසට හැරී ගාටන්නට වූහ.

තානායමට ඇතුළු වනවාත් සමග ම හෝග් මහත්මිය මහත් කනස්සල්ලකින් සිටින බව ඔවුන්ට පෙනී ගියේ ය. ඇය මෙතෙක් වේලා හඬමින් සිටි බව ඔවුන්ට ඒත්තු ගියේ ඇගේ දෙකොපුල් මත වියළී ගිය කඳුළු ධාරාවන් දුටු විට ය. බෙස් ඈ වෙතට ගොස් ඇගේ කර වටා අත දමා ගත්තා ය.

"මොකක් හරි වෙලා තියෙනවා. ඒ මොකක් ද වුණේ?" බෙස් කාරුණික හඬකින් ඇසුවා ය.

"මට ලැබුණු දුරකථන ඇමතුමකට අනුව මම මගේ යාළුවෙක් මුණ ගැහෙන්න නගරයට ගියා. මං ආපහු එනකොට මුළු තානායමම කොල්ල කාලා !"



# 16

"මොනා තරම් භයානක ද?" නැවතත් ඉක්මනින් බියට පත් වන හැඟීම් වසා ගෙන සිටීමට බෙස්ට නොහැකි විය. "හොරා හුඟක් දේවල් අරං ගිහින් ද?"

"මට ඒ ගැන සොයා බලන්න බැරි වුණා" හෝග් මහත්මිය සිටියේ තවමත් හති අරිමිනි. "මමත් මෙහාට ඇවිත් තව ම මිනිත්තු කීපයක් විතරයි."

"මට නම් හරිම කනගාටුයි" මෙතෙක් වේලා නිහඬ ව සිටි නැන්සි මුහුණ බෙරි කර ගෙන පැවසුවා ය. "අපේ යාළුවො කවුරුවත් තානායමේ හිටියේ නැද්ද?"

"නෑ හැමෝ ම එළියට ගිහින් හිටියේ. මට තේරෙන්නේ නෑ දැන් මම මොනවා කරන්න ද කියලා"

ඉක්මනින් ම පොලීසියට හොරකම ගැන දැන්විය යුතු බවට නැන්සි ඇයට අවවාද කළා ය. "මම ඔබ වෙනුවෙන් පොලීසියට කතා කරන්න ද?"

සොරකම පිළිබඳ ව පොලීසියට දැනුම් දීමෙන් අනතුරුව සෑම දෙනා ම යුහුසුලු වූයේ තම තමන්ගේ බඩු බාහිරාදිය සොරකම් කර ඇත්දැයි දැන ගැනීමට ය. ඉක්මනින් තරප්පු පෙළ නැග කාමරවලට එබී බැලූ ඔවුන්ට දැකගත හැකි වූයේ ඇඳුම් පැළඳුම් හා ඔවුන්ට අයත් වෙනත් උපකරණ කාමරය පුරා සී සී කඩ විසුරුවා දමා තිබුණු ආකාරයයි. ඉක්මන් සොයා බැලීමකින් පසු හෙළි වූයේ ඔවුන්ට අයත් කිසි ම දෙයක් සොරාගෙන නැති බවයි. මේ දුටු භූත දඩයක්කරුවෝ අප්‍රමාණ සැහැල්ලුවකින් යුතු ව සැනසුම් සුසුම් හෙළූහ.

"මිනිහා මේවාට වඩා වැදගත් දෙයකුයි හොයලා තියෙන්නේ" සොයා බැලීම අවසන් කළ ජෝර්ජ් තම ඇඳුම් පැළඳුම් බෑගයට

ඔබන අතර කිවා ය. "නැන්සි ඔයා මොනව ද මේ ගැන හිතන්නේ?"

නැන්සි ස්ථිර අදහසක් නොමැති බව දක්වමින් උරහිස් ඇකුළුවා ය. "සමහර විට සිප්පි කටුව වෙන්නත් පුළුවන්. ප්‍රීට්සර් තර්ජනය කරලා ස්ට්වීගෙන් සිද්ධ වුණේ මොකක්ද කියලා දැන ගන්න ඇති. ඒ නිසා කවුරුත් නැති වෙලාවක් බලලා ඇතුල් වෙන්න ඇති. මම ඒක සූට්කේස් එකේ ඉරුණු තැනක් අස්සේ හංගලා තිබුණේ"

බෙස් මෙහිදී තිගැස්සී නැගී සිටියා ය. බාගෙට නවමින් සිටි සායක් ඇගේ අතේ රැඳී තිබුණි. "ඒක අපි ගාව තියෙන බව ප්‍රීට්සර් දන්නවා නම් මොන කාරණේකට ද හෝග් මහත්මියගේ දේවල් ඇදලා බැලුවේ."

"හරි මම උත්තරේ දන්නවා. අපි පහළ තට්ටුවට ගිහින් බලමු අපේ උදව්වක් එහෙම හෝග් මහත්මියට අවශ්‍ය ද කියලා. දැනටමත් සිද්ධවෙලා තියෙන කරදරවල හැටියට තව දුරටත් දරා ගන්න ඇයට හැකියාවක් නෑ."

විසිත්ත කාමරයේ දී ඔවුන්ට ඇය මුණ ගැසුණි. ඇගේ මුහුණේ වූයේ ප්‍රහේලිකාවක සලකුණකි.

"වැඩිමනක් දෙයක් අරගෙන නෑ" ඈ කීවා ය. සල්ලි ටිකකුයි, රත්තරන් බඩු ටිකකුයි විතරයි. මෙච්චර දේවල් තියෙද්දී කොහොම ද එහෙම වුණේ කියන එකයි මට හිතාගන්න බැරි"

පිරිමි ළමුන් ද කාමරයට පැමිණි අතර නෙඩ් කීවේ ඔහු සිතන ආකාරයට හොරා සොරකම් කිරීමට බලාපොරොත්තු වී ඇත්තේ ඔවුන් නොසිතන ආකාරයේ දෙයක් බවයි.

"එහෙනම් ඒ මොකක් ද?" හෝග් මහත්මිය මඳක් විමසිලිමත් බව පළ කරමින් ඇසුවා ය.

"ඔබ ළඟ තියෙනව ද දුර්ලභ ඒ වගේ ම බොහෝ වටිනා දෙයක් එහෙම ?" බ්‍රෙට්, හෝග් මහත්මියගෙන් විමසුවේ ය.

"මගේ මහත්මයාගේ මරණින් පස්සේ මම වටිනා කියන සෑම දෙයක් ම විකුණුවා" ඈ හිස සලමින් කීවා ය.

නැන්සි විමසිල්ලෙන් කාමරය සිසාරා සිය නෙත් විහිදුවා ය. කාමරයේ කෙළවරක වැටී ඇති ලිපිගොනුවක් වෙත ඇගේ ඇස් යොමු විය. ලිපි ගොනුවේ කඩදාසි බිම පුරා ම විසිරී ගොස් තිබුණි.



"අර ලිපිගොනුවේ වටිනා දෙයක් ද තිබුණේ ?" නැන්සි ඒ දෙස බලාගත්වන ම ඇසුවා ය.

එක්වර ම හෝග් මහත්මිය සිය උගුර අතින් අල්ලා ගත්තාය. ටික වේලාවක් ඇට කතා කර ගත නොහැකි විය. ඇස් විශාල වී ඇගේ නළලේ දාඩිය බිංදු නැගී ආවේ ය. "ඒකේ ....... ඒකේ තමයි මේ ඉඩමේ ඔප්පුව තිබුණේ" ටික වේලාවකට පසු ඈ ගොත ගසමින් අමාරුවෙන් කීවා ය.

කඩදාසි ගොනුව වෙත දිව ගිය ඈ දණගසා ගෙන පිටු පෙරළමින් පිස්සියක මෙන් ඔප්පුව සොයන්නට වූවා ය. "ඒක ඉවරයි ! මේ තානායමේ ඔප්පුව හොරකම් කරලා !" ඈ ඇඬූ කඳුළෙන් යුතුව කීවා ය.

"එහෙනම් ඒක තමයි හොරාට උවමනා කරලා තිබුණු දේ" බෙස් ඈ අසලින් වාඩි වෙමින් කීවා ය. "ඔී හෝග් මහත්මිය මට හරිම කනගාටුයි. ඔයා දැන් මොනව ද මේකට කරන්නේ?"

මේ සාකච්ඡාව කෙරීගෙන යන අතරතුර දී නැන්සිගේ සිතුවිලි ප්‍රීට්සර් කරා යොමු විය. ප්‍රීට්සර් මේ සොරකම සැලසුම් කළ බව ඇයට හොඳට ම පැහැදිලි ය. ඉඩ කඩම් වෙළෙන්දෙකුගේ ස්වරූපයෙන් පෙනී සිටින මේ දරුණු මිනිසා කොයි යම් ආකාරයකින් හෝ රෙඩ් බාන් තානායම ලබා ගැනීමට මේ ඔප්පුව යොදා ගනු නිසැක ය.

මිනිත්තු කිහිපයකට පමණ පසුව පොලිස් නිලධාරීහු දෙදෙනෙක් පැමිණියහ. ඔවුන් කතාවට සවන් දුන් පසුව එක් අයෙක් කිවේ "ඔප්පුවක් හොරකම් කිරීම බරපතළ වරදක්. හෝග් මහත්මිය ඔයා සැක කරන කෙනෙක් එහෙම ඉන්නවා ද?" යනුවෙනි.

"මම නම් එහෙම සැක කරන කෙනෙක් නෑ. නමුත් නැන්සි ඩ්‍රිව් එහෙම කෙනෙක් ගැන කියනවා" තවමත් වික්ෂිප්ත භාවයෙන් සිටි හෝග් මහත්මිය නැන්සි දෙසට පොලිස් නිලධාරීන්ගේ අවධානය යොමු කළා ය.

නැන්සි තමා සැක කරන මිනිසාගේ නම විල්බට් ප්‍රීට්සර් බව පැවසූ විට තමන් ලෙෆ්ටිනන්ට් සැන්පෝර්ඩ් ලෙස හඳුන්වා දුන් පොලිස් නිලධාරියා, "ඔබ පැය කිහිපයකට කලින් දුරකථනයෙන් කතා කරලා අපට දැන්වූවෙත් ඔය නම ම තියෙන පුද්ගලයෙක් ගැන නේද?" යනුවෙන් ඇසුවේ ය. "හරියට ම හරි," නැන්සි තත්ත්වය පැහැදිලි කළා ය.

"අපි සැක කරනවා. මේ ප්‍රදේශය අවට බොහෝ වැදගත් ස්ථානවල අයිතිකරුවන්ට එම ස්ථාන විකිණීමට බල කරන ආකාරයේ අවතාර, හොල්මන් එහෙම නැත්තම් භූතයින් වැනි සිද්ධි ඇති කිරීම පිළිබඳ ව පෞද්ගලිකව ම වගකිව යුතු පුද්ගලයා ප්‍රීට්සර් කියලා."

"ඔහු සමහර අවස්ථාවල භූතාවේෂණීය ටැරෙන්ටෙලාව හවුල් කර ගෙන වටිනා සිප්පි කටු එකතු හොරකම් කරනවා. මම ඇගේ නාමේ මුලකුරු සඳහන් වෙලා තියන කව්රී වර්ගයේ සිප්පි කටුවක් සොයා ගත්තා" පොලිස් නිලධාරියාට බාර දීම සඳහා සිප්පි කටුව ගෙන ඒමට නැන්සි උඩුමහලට ගියා ය.

ඇය ආපසු එන විට සැන්පෝර්ඩ් පුදුමයෙන් යුතුව ඈ දෙස බලා සිටියේ ය. "ඔබ දක්ෂ නවක රහස් පරීක්ෂිකාවක් එහෙම නේද? මම ඔබ ගැන පුවත් පත්වලින් කියවලා තියෙනවා වගේ මතකයක් තියෙනවා."

නැන්සි ලැජ්ජාවෙන් සිනා සී තමා සිදු කළ ඇතැම් පරීක්ෂණ කිහිපයක් පිළිබඳ ව පුවත් පත් මගින් ප්‍රචාරයක් ලබා දී තිබුණු බව පිළිගත්තා ය. ඉක්මනින් ම එම කතාවේ මාතෘකාව වෙනස් කළ ඈ නැවතත් සොරකම පිළිබඳ සිද්ධිය ගැන කතා කරන්නට පටන් ගත්තා ය.

"ස්ටීව් රෝවර් ගැන හරි, ඔහු පිටත්වෙලා ගිය මෝටර් රථය ගැන හරි මොනවත් අලුත් ආරංචි ලැබුණ ද?"

"ඔව්," සැන්පෝර්ඩ් පිළිතුරු දුන්නේ ය. "මෝටර් රථය අතර මග දාලා ගිහිල්ලා තිබිලා සොයා ගන්න අපේ කණ්ඩායමට පුළුවන් වුණා. ඒකත් සොරකම් කළ එකක්. ඔබ පැමිණිලි කළ මිනිහත් ස්ටීව් රෝවර් වත් එහි ඉඳලා නෑ"

බෙස් හුස්මක් ඉහළට අල්ලා ගත්තා ය. "ඒ කියන්නේ එයා ගෙදර ගිහිල්ලා නැද්ද?"

පොලිස් නිලධාරියා "නැත" යනුවෙන් පිළිතුරු දුන්නේ ය. එමෙන් ම දරුවා දැකීමට නොලැබීම නිසා ස්ටීව්ගේ මව මහත් කලබලයට පත් වී සිටින බව ද ඔහු තව දුරටත් ඔවුන්ට විස්තර කළේ ය.

"කිසි ම සැකයක් නෑ. ඔහු කුලියට ගත් මිනිහා ඔය පිරිස කැලෑවෙ දී මුණ ගැසුණු බව දැන ගන්න ඇති, මෙන්න මේ හේතුව නිසා ප්‍රීට්සර්, ස්ටීව් නිදහස් කිරීම භයානකයි කියලා හිතන්න ඇති"



"මට හරි ම කනගාටුයි ස්ටීව්ගේ අම්මා ගැන" බෙස් කම්මුලට අත තබා ගෙන කනගාටුවෙන් කිව්වා ය. "ඕ ! මම හිතනවා අර නින්දිත මිනිහා ප්‍රීට්සර් ඔහුට අනතුරක් නොකරාවි කියලා"

ස්ටීව් සෙවීමට සියලු ම ශක්තිය යොදවන බවට පොලිස් නිලධාරීන් දෙදෙනා භූත දඩයක්කරුවන්ට පොරොන්දු වූහ. එමෙන් ම ඔවුන් දෙදෙනා ප්‍රීට්සර් හෝ ඔහුගේ සගයෙක් තානායම වෙත එන්නට ඇත්තේ කරුණු දෙකක් පදනම් කර ගෙන බව පැහැදිලි කළහ. ඉන් පළමුවැන්න නම් ඔවුන්ට ඉතා වැදගත්කමක් ඇති සිප්පි කටුව සොරකම් කිරීමත්, දෙවනුව මෙම දේපළ හා බැඳී ඇති ඔප්පුව සොරකම් කිරීම ය.

පොලිස් නිලධාරීහු තානායමත්, ඒ අවටත් පරීක්ෂා කිරීම සඳහා මඳ වේලාවක් එහි ගත කළෝ ය. ඔවුන් ක්‍රියා කළ ආකාරය දෙස බැලූ නැන්සිට තමාගේ අනාගත පරීක්ෂණ කටයුතු සඳහා ප්‍රයෝජනවත් වෙතැයි සිතිය හැකි කරුණු කිහිපයක් ඉගෙනීමට අවස්ථාව සැලසුණේ ය.

නිලධාරීන් දෙදෙනා තම සටහන් පොත්වල යම් යම් සටහන් තබා ගත්තත් ඔවුන්ට කිසිදු ඇඟිලි හෝ පා සලකුණක් සොයා ගැනීමට නොහැකි විය. "මේ කරුණුවලින් ඔප්පු වෙන්නේ හොරා මේස් දාගෙන අත් මේස් පැළඳ ගෙන හිටිය බවයි." සැන්පෝර්ඩ් පැහැදිලි කළේ ය.

ඔහුගේ මල්ලෙන් ප්‍රබල අත් කාචයක් එළියට ගත් ඔහු හෝග් මහත්මියගේ නිදන කාමරය අඟලෙන් අඟල පරීක්ෂා කළේ ය. අවසානයේ දී මඩ පැල්ලමක් හා කෙස් ගසක් සොයා ගැනීමට ඔහුට හැකි විය.

"හොරාට තියෙන්නේ තද දුඹුරු පාට කැරලි ගැසුණු කෙස් වැටියක්" ඔහු තමා සොයා ගත් කරුණු නිවේදනය කළේ ය. "ඒ වගේ ම ඔහු නතර වෙලා ඉන්නවා ඇත්තේ පර්න් ගස් වැවෙන ඇළ ඉවුරකට ආසන්නයේ" ඔහු නැන්සි දෙස බලමින් කීවේ ය. "මිනිහා වියරු වැටුණහම හරි ඇඩි ලෙස කලකිරීමකට පත් වූ විට හරි තදින් අඩිය බිම ගහන පුරුද්දක් මිනිහට තියෙනවා කියලා අපිට හිතන්න පුළුවන්. මේ පුද්ගලයා පර්න් කොළ මඩේ ඇලෙන විදිහට පයින් පාගලා දමලා තියෙනවා"

පොලිස් නිලධාරීහු නැවත පිටත් වීමට සූදානම් වූහ. "අපිට වැඩි විස්තර දැන ගන්න ලැබුණොත් ඔබලාට දන්වන්නම්" ඔවුහු පිටත් වන අතරතුර දී පොරොන්දු වූහ.

ටික වේලාවකට පසු අනෙක් භූත දඩයක්කරුවන් ද තානායමට සේන්දු වූ අතර හෝග් මහත්මියට සිදු වූ විපත පිළිබඳ ව අපමණ කම්පාවට පත්වූහ. ඔවුන්ගේ බෑග් මලු පරීක්ෂා කළ ඔවුන් ද සැලකර සිටියේ තමන්ට අයිති කිසිවක් නැති වී නොමැති බවයි.

සිදු වූ දේවල්වල කලබලකාරී බව නිසා ම ආහාර ගැනීමට පවා කාටත් අමතක වී තිබුණේ ය. ගැහැනු ළමෝ ආහාර පිසීමට කැමැත්තෙන් ම ඉදිරිපත් වූහ. මුලින් ම මුදල් ගෙවන අමුත්තන්ට එසේ පිසගෙන කෑමට ඉඩ දීම තමාට මහත් මදි පුංචිකමක් බව කියූ හෝග් මහත්මිය එයට විරුද්ධ වූවත් තරමක පෙරැත්තයකින් පසුව ඊට එකඟ වූවා ය.

ඔවුන් ආහාර ගෙන අවසන් වූ වහා ම දුරකථනය නාද දෙන්නට පටන් ගත්තේ ය. නෙඩ් දුරකථනයට පිළිතුරු දුන්නත් ඒ සැණින් ම නැන්සිට පියා අමතන බව කියමින් දුරකථනය ඈට දුන්නේ ය.

"සෑම දෙයක් ම හොඳින් සිද්ධවෙනව ද?" නැන්සිගේ පියා විමසුවේ ය.

"කිසි ම උදාසීන ගතියක් දැනෙන්නේ නෑ" නැන්සි එසේ කියා මේ වන තුරු අබිරහස විසඳීමේ දී සිදු වුණු සියලු ම දේවල් පියාට කීවේ ය.

"ඔයාට හරි ම ප්‍රබෝධමත් ගවේෂණයක් මට හිතෙන්නේ ලැබිලා තියෙන්නේ. මීට ටික වේලාවකට ඉස්සර වෙලා මගේ දන්නා අඳුනන කෙනෙකු ගෙන් ඇමතුමක් ලැබුණා. ඔහුගේ නම වෝෆීල්ඩ්. ඔහු ජීවත් වෙන්නේ ඔයාගේ භූත දඩයක්කරුවන් පිරිස ඊළඟට යන්න බලාපොරොත්තු වන හොල්මන් බොහෝ වශයෙන් ගැවසෙනවා කියලා හැමෝ ම චෝදනා කරන කඳුකර තානායමේ"

"ඒක අපූරු සිද්ධි ගැළපීමක්" ඩ්‍රිව් මහතා දිගට ම කියා ගෙන යන්නට විය. "වෝෆල්ඩ් මහත්මයා ඇත්තට ම දන්නේ නෑ ඔයාලා ඊළඟට එහෙ එන්න බලාපොරොත්තු වෙන බව. එයා මට කතා කරලා යෝජනා කළේ ඔයාව එහේ එවලා අබිරහස විසඳන්න කියලයි."



මේ ඇසූ නැන්සි සිනාසුණා ය. "මාව බොරුවට වර්ණනා කරලා" ඈ කීවා ය.

"ඔයාලා කවදට ද එහේ යන්න බලාපොරොත්තු වෙන්නේ ?" ඇගේ පියා ඇසුවේ ය.

නැන්සි කීවේ තම කණ්ඩායම තවමත් ඒ ගැන සාකච්ඡා කර නැති බවයි. එහෙත් හෙට දිනයේ කඳුකර තානායම බලා පිටත් වීමට බාධාවක් තමාට නොපෙනන බව ද ඈ කීවා ය.

"මම හිතන්නේ නෑ ආයෙත් අවතාර අශ්වයා මෙහේ දර්ශනය වෙයි කියලා" ඈ කීවා ය. "හැබැයි හොරකම් කරපු ඔප්පුව පාවිච්චි කරලා හෝග් මහත්මියව බය කරලා දේපළ විකුණන්න පොළඹවා ගන්න ප්‍රිට්සර් උත්සාහ කරයි."

"කිසි ම බලපෑමකට යටත් වෙන්න එපා කියලා ඇයට කියන්න" ඩ්‍රිව් මහතා අවශ්‍ය උපදෙස් ලබා දුන්නේ ය.

"තව දුරටත් මම හිතන්නේ ඔයාලා තානායමෙන් පිටත් වුණාට පස්සේ හෝග් මහත්මිය පෞද්ගලික රහස් පරීක්ෂකවරයෙකුගේ සේවය ලබා ගන්න එක හොඳයි."

"මම ඈට එහෙම කරන්ටයි කියලා කියන්නම්" නැන්සි පිළිතුරු දුන්නා ය. ක්‍රැග් මවුන්ටන් තානායමට ළඟාවූ විගස පියාට ඇමතුමක් ලබා දීමට ද ඈ පොරොන්දු වූවා ය.

රිසීවරය තැබූ විගස ම ඈ හෝග් මහත්මිය සොයා ගොස් තම පියා පෞද්ගලික රහස් පරීක්ෂකවරයෙකුගේ සේවය ලබා ගන්නා ලෙස අවවාද කළ බව ඈට කීවා ය. අනතුරුව ඈ විසිත්ත කාමරයේ දී තම පිරිස සමග ඊළඟ චාරිකාව පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා එක් වූවා ය. පොලීසිය රෙඩ්බාන් තානායමේ සොරකම සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු කර ගෙන යන හෙයින් මෙහි තව දුරටත් රැඳී සිටීමේ අවශ්‍යතාවක් නැති බව තීරණය කළ ඔවුහු පසුදා උදෙන් ම පිටත් වීම සුදුසු බව තීරණය කළහ.

"අපි උදේ දහයට මෙහෙන් පිටත් වෙලා දවල් කෑම මඟ දී කමු. මෙහෙ ඉඳලා පැය දෙකක ගමනකින් යා ගන්න පුළුවන්. පොකිරිස්සන් ගැන ප්‍රසිද්ධ අවන්හලක් ගැන මම දන්නවා. අපිට එහෙන් දවල් කෑම ගන්න පුළුවන් වෙයි. මම හිතන්නේ අපිට ක්‍රැග් මවුන්ටන් තානායමට

යන්න එච්චර හදිස්සියක් නෑ කියලයි" නෙඩ් තම අදහස ඉදිරිපත් කළේ ය.

"පොකිරිස්සෝ ගැන කියද්දී මගේ කටට කෙළ උනනවා" බ්‍රෙට් තලු මරමින් කීවේ ය. "මොනවද ඔට්ටු අපේ අය එතන දාලා යන්න බෑ කියන බවට ?"

භූත දඩයක්කරුවෝ සියලු දෙනා ම හෝග් මහත්මියට අතට අත දී ආචාර කර ඇයට වාසනාව පතමින් ඇගෙන් සමු ගත්හ.

යන ගමනේ දී රසවත් පොකිරිස්සන් ආහාර වේලකින් සප්පායම් වුණු ඔවුහු ක්‍රැග් මවුන්ටන් වෙත ළඟා වූහ. තද කළු ගලක් මුදුනේ තානායම පිහිටා තිබුණි. එයට පහළින් වූයේ ඝන වනාන්තරයකි.

වෝෆීල්ඩ් මහතා නැන්සි සහ ඇගේ මිතුරන් පිළිගැනීමට මඟ බලාගෙන සිටියේ ය. ඔහු උණුසුම් සිනහවකින් සැරසී ගත් උස සිරුරක් ඇති දුඹුරු පැහැති කෙස්වලින් යුතු මිනිසෙකි.

"ඔයාලා තම තමන්ගේ කාමර දැක බලා ගත්ත හැටියේ මම ඔයාලට කෙටියෙන් කියන්නම් මේ සිත් ඇදගන්නා පැරණි ස්ථානය ගැනයි එහි අතීත කතාවයි" ඔහු ඔවුන් උණුසුම් ලෙස පිළිගනිමින් කීවේ ය.

පැය බාගයකට පමණ පසුව භූත දඩයක්කරුවෝ නැවත විසිත්ත කාමරයේ දී මුණ ගැසුණු අතර වෝෆීල්ඩ් මහතා ඔවුන් බලාපොරොත්තුවෙන් එහි රැඳී සිටියේ ය.

"මේ තානායම" ඔහු කතාව කියන්නට පටන් ගත්තේ ය. "බොහෝ කාලයකට ඉස්සර සිරකරුවන් විශාල සංඛ්‍යාවක් රඳවලා තිබුණු බළකොටුවක්. කතාවක් තියෙනවා දැඩි දඬුවම් නිසා ම ඒ අයගෙන් බොහෝ දෙනෙක් බළකොටුව තුළ ම මිය ගියා කියලා ඔවුන්ගේ අවතාර ආයාචනා කරන වේදනාවෙන් බෙරිහන් දෙන හඬ පොළොව යට සිර කුටිවලින් ඇහෙනවා. ඊට පස්සෙ ඔවුන් ඒවායින් පිටට ඇවිල්ලා එහෙ මෙහෙ ඇවිදිනවා. මිනිසුන් බියට පත් කරවමින්."

බෙස් උරහිස් අකුළා ඉදිරියට නැමුණා ය. ඇයට කතාව ඇසීමෙන් දැඩි බයක් දැනුණ බවට සලකුණකි ඒ.

"කොච්චර කාලෙකට ඉස්සර වෙලා ද අවසාන වතාවට කවුරු හරි අවතාරයක් දැක්කේ ?" නැන්සි පරීක්ෂාවෙන් ඇසුවා ය.



"පෙරේදා රෑ" ඔහු පිළිතුරු දුන්නේ ය.

ටිකක් රෑ බෝ වෙනකම් එළියේ වාඩිවෙලා හිටිය අමුත්තෙක් කෑගහගෙන ඇතුළට දුව ගෙන ආවා 'හොල්මනක් !' කියා ගෙන ටික වේලාවක් යනකම් ඔහුට කතා කරගන්න බැරි වුණා. ඔහු ටික වේලාවකින් ප්‍රකෘති තත්ත්වයට ආපුවහම අපට විස්තර කළා. "කඩමාලු ඇඳගත් සොල්දාදුවෙකුගේ අවතාරයක් බිම් මහලේ බිත්තිය තුළින් මතුවෙලා ටික වේලාවක් වට පිටාවේ කැරකිලා කැලෑවේ ගස් අතර නොපෙනී ගියා කියලා"

නැන්සිගේ සිතේ සැකයක සේයාවක් මතු විය. "අවතාරය දැක්කේ එක ම එක අමුත්තෙක් විතර ද?" ඇ වෝෆීල්ඩ් මහතාගෙන් ඇසුවා ය.

"ඔව්, ඔහු පමණයි"

නැන්සි තමාගේ සිතේ මතු වී ආ අදහස් සැමදෙනාටම නොකීවා ය. එය තවත් වංචාවක් බව ඇයට හැඟී ගියේ ය. "ඒ අමුත්තා තාමත් මෙහේ නතර වෙලා ඉන්නව ද?"

වෝෆීල්ඩ් මහතා හිස වැනුවේ ය. "තව එක දවසක්වත් මෙහේ නතරවෙලා ඉන්න බැරි බව කිව්ව ඒ මිනිහා පහුවදා උදෙන් ම පිටත් වෙලා ගියා."

නැන්සි මේ සිද්ධිය පිළිබඳ අදහස් දෙකක් මතු කර ගත්තා ය. පළමුවැන්න නම් එක් අයෙකුට බොරු අවතාරයක් මවා පා අන් අය අතර එය ප්‍රචාරය වීමට සලස්වා ඇති බවයි. නැත්නම් මේ අවතාරය දුටුවා යැයි කියන අමුත්තා ප්‍රීට්සර්ගේ කල්ලියේ සාමාජිකයෙක් බවයි. ඔහුව යොදවා ගෙන ප්‍රීට්සර් තානායම පිළිබඳ ව බොරු කතාවක් ප්‍රචාරය කරවා ඇත.

හෙට දිනයේ දී භූත දඩයක්කරුවන් කැඳවා ගෙන ගොස් බළකොටුවේ බිම් මහල හා අනෙකුත් ස්ථාන පෙන්වීමට බලාපොරොත්තු වන බව වෝෆීල්ඩ් මහතා කීවේ ය. "ගබඩා කාමරයයි කුස්සියයි අපි තවමත් පාවිච්චි කරනවා. නමුත් බිම්ගෙයි සිරකුටි වහලා අලයි තියෙන්නේ"

"මම නම් හරි ම කැමතියි ඒ වැඩේට" මෙහි දී බෙස් පැවසුවා ය.

ජෙෆ්රි ඕලොක්කුවට මෙන් සිනාසුණා ය. "යතුරු ඕන දොරවල් වල ම ද තියෙන්නේ. අවතාරවලට දොරවල් ඇරගෙන එළියට එන්න පහසු වෙන්න"

වෝෆීල්ඩ් මහතා සිනාසුණේ ය. "මම හේතුව මොකක් ද කියලා හරියට ම දන්නේ නෑ. නමුත් ඔබ යතුරු ගැන කියපු දේ හරියට ම හරි. ඒවා දොරවල්වල පිට පැත්තේ යතුරු සිල්වලමයි තියෙන්නේ. ඒ යතුරු පැරණි කාලේ හුඟාක් විශාල ඒවා නිසා මේ තානායමේ අයිතිකාරයා හිතනවා ඇති ඒ යතුරු සංචාරකයින්ගේ සිත් ඇදගනී කියලා. ඔබලාට ඒවා උදෙන් ම දකින්ට පුළුවන් වෙයි."

වෝෆීල්ඩ් මහතා යෝජනා කළ "සෝදිසි මෙහෙයුම" පිළිබඳ ව භූත දඩයක්කරුවන් තුළ කුතුහලය මුසු නොසන්සුන්තාවක් ඇති විය. සෑම දෙනෙක් ම පැතුවේ ඉක්මනින් ම රැය පහන් වේවා යනුවෙනි. නැන්සි එම ස්ථානය හොඳින් පරීක්ෂා කර බැලීමට ඉටා ගත්තා ය.

"මම අද රාත්‍රියේ එළියේ වාඩි වෙලා ඉඳගෙන අවතාර එහෙම දකින්න පුළුවන් වෙයි ද කියලා බලනවා" ඈ තමාට ම කියා ගත්තා ය.

ආහාර ගැනීම රාත්‍රී නවය දක්වා ම දික් ගැසුණු අතර සෑම කෙනෙක් ම තමන් ඕනෑවට වඩා කෑම ගත් බව පැවසූහ. අනතුරුව ඔවුහු තානායම ඉදිරිපිට ඇති ගල්තලාව මත වාඩි වූහ.

කණ්ඩායමේ සමහරු පුටුවල වාඩිගත් අතර සමහරු බිම වාඩි ගත්තෝ ය. නැන්සි සහ කිහිප දෙනෙක් ගල් තලාවේ කෙළවර පිහිටි කෙටි කාප්පය මත වාඩි වූහ. අවතාර පිළිබඳ ව උදෙන්ගිමින් විහිළු තහළු රාශියක් හුවමාරු වන්නට පටන් ගත්තේ ය. ඉහළ අහසේ මල්වෙඩි වරුෂාවක් දුටු භූත දඩයක්කරුවෝ ඉන් පුදුමයට පත් ව මුව අයා ගෙන ඒ දෙස බලා සිටින්නට වූහ.

ඒ සමඟ ම ගිනි ගත් මල් වෙඩිල්ලක් නරඹන්නන් වෙත වේගයෙන් ඇදී ආවේ ය. නැන්සිට හැරීමටත් ඉඩක් නොතබා ම මල්වෙඩිල්ල ඇගේ අතේ වේගයෙන් හැප්පුණා ය. ඈ මහත් භීතියෙන් හා වේදනාවෙන් කෑ ගැසුවා ය.



# 17

ඈගේ කෑගැසීමත් සමඟ ම සෑම කෙනෙක් ම නොදැනුවත්ව ම නැගී සිටියෝ ය. බිය උපදවන පිළිස්සුම් කැළල දෙස කවුරුත් තිගැස්සුණු සිතින් යුතු ව බැලූහ.

"මල් වෙඩිල්ල ඔයාට වැදුණා ද?" නෙඩ් ඇසුවේ ය.

"ඔව්"

ඒ වන විටත් ඈ තානායමේ දොර දෙසට ගමන් කරමින් සිටියා ය. ජෙෆ්රි, බෙස් හා නෙඩ් ඈ අසලින් ම වූහ.

"දොස්තර කෙනෙක් මෙහෙ නතර වෙලා ඉන්නව ද දන්නේ නැහැ" එසේ කියූ ඈ විමසීම් කවුන්ටරය දෙසට දිව ගියා ය.

"දොස්තර කෙනෙක් මෙහෙ නැවතිලා ඉන්නවා. මම එයාට පහළට කතා කරන්නම්" ලිපිකරුවා පැවසුවේ ය.

දොස්තර පැමිණ අත පරීක්ෂා කර බලා, "මේක හරි ම දරුණු පිළිස්සුමක්නේ. ඔයාගේ වාසනාවට වැඩිය ඇතුළට පිච්චිලා නෑ. ඒ නිසා කැළලක් හිටින එකක් නෑ. මගේ කාමරයට එන්න මම බෙහෙත් දමන්නම්" යනුවෙන් පැවසී ය.

මෙය ඇසූ නැන්සිටත් ඇගේ මිතුරු මිතුරියන්ටත් දැනුණේ මහත් අස්වැසිල්ලකි. බෙස් සහ නැන්සි ජෙෆ්රි සමඟ වෛද්‍යවරයාගේ කාමරයට ගොස් නැන්සිට වේදනාව නැසීමට ප්‍රථමාධාර ලබා දෙන තුරු බලා සිටියෝ ය.

"ඔයාව කොහොම ද පිච්චුණේ ?" "මට ඉස්සරහා පැත්තෙන් යටි ගිරියෙන් කෑ ගහන ශබ්දයක් ඇහුණා. ඊත් එක්කම 'ඩෝං' ගාලා යමක් පුපුරණ හඬක් ආවා. මගේ කාමරය තියෙන්නේ එහා පැත්තේ" වෛද්‍යවරයා කීවේය.

"ඒ මල් වෙඩි පුපුරණ ශබ්දයක් ඔබට ඇහුණේ" ජෙෆ්රි පිළිතුරු

දීමට ඉදිරිපත් වූවා ය. "කිහිපයක් ම අපේ දිහාවට ඇදිලා ආවත් වාසනාවකට වගේ කාගෙවත් ඇඟේ වැදුණේ නෑ."

බෙස් ඒ අසා කෝපයට පත් වූවා ය. "කාටවත් ඒවා නොවැදුනා නම් තමයි හොඳ. මේ හැම දෙයක් ම ඉතා ම නින්දිත වැඩ"

නැන්සි වෛද්‍යවරයාට ස්තුති කළ පසු ගැහැනු ළමෝ කාමරයෙන් පිටවූහ. අනෙක් දෙදෙනා දෙසට හැරුණු නැන්සි, "නෙඩ් කොහෙද ගියේ?" යනුවෙන් ඇසුවා ය.

ඔහු අනෙක් පිරිමි ළමුන් සමග මල් වෙඩි එව්වේ කවුරුන් දැයි පරීක්ෂා කිරීමට පිටතට ගිය බව ජෝර්ජ් කීවා ය. ඔවුන් පහළ මාලයට පැමිණි විගස ම පිරිමි ළමුන් සොයා ගෙන ඇති කරුණු මොනවා දැයි දැන ගැනීම පිණිස පිටතට යාමට නැන්සි උත්සාහ කළා ය.

"ඔයාට හිතෙන්නේ නැද්ද ඇඳට ගියොත් හොඳයි කියලා" බෙස් කීවා ය.

"තව ම නෑ" නැන්සි මලානික සිනහවක් පාමින් පැවසුවාය. ඇගේ මුහුණේ වේදනාවක සලකුණු තවමත් දැකිය හැකි විය. "අපි මෙහාට ආවේ අබිරහසක් විසඳන්න. ඒකෙන් අයින් වෙලා පැත්තකට වෙලා ඉන්න මට කිසි ම උවමනාවක් නෑ"

මේ වන විට කතා කරමින් ම ඔවුන් ගල් තලාව වෙත ළඟා වී හමාර ය. ඒ වන විටත් වනය දෙසට ගිය පිරිමි ළමයි ආපසු එමින් සිටියෝ ය. ඔවුන්ට මල් වෙඩි එවූ පුද්ගලයා ගැන කිසි ම හෝඩුවාවක් දැන ගැනීමට නොහැකි වී තිබුණි.

"අපි දැඩි සෝදිසියක් කළා. නමුත් කිසි ම කෙනෙක් හැංගිලා හිටපු බවට ලකුණක් නෑ. නැන්සි දැන් ඔයාට කොහොමද?" ජිම් ඇසුවේ ය.

"සැහෙන්න හොඳයි, මම හිතන්නේ කැලේ මැද සුද්ද පවිත්‍ර කරපු තැනක් ඇති මල් වෙඩි විදින යන්ත්‍රයක් ගෙනවිත්, මල් වෙඩි ඉලක්කයට විදින්න පුළුවන් විදිහේ."

"අපි තව දුරටත් හොයලා බලමු" බිල් යෝජනා කළේ ය. "මල් වෙඩි ආවේ පාර පැත්තෙන් නෙමේ. ඒ නිසා අපිට හිතන්න වෙනවා ඒවා විද්දේ කාර් එකක ඉඳලා නෙමෙයි කියලා"



පසු දින උදෑසන දී නැන්සිගේ කණ්ඩායම බිම්ගෙයි සිර කුටි බැලීමට යාමටත් අනෙක් භූත දඩයක්කරුවන් පිරිස මල් වෙඩි එවූ පුද්ගලයා ගැන සොයා බැලීම සඳහා වනය අවට පරීක්ෂා කිරීමටත් තීරණය කර ගත්හ.

සෑම කෙනෙක් ම උදෙන් ම අවදි වී සිටි අතර උදේ කෑමෙන් පසු ව කෙළින් ම පරීක්ෂණ කටයුතු ඇරඹූහ. වෝෆීල්ඩ් මහතා වෙනත් කටයුත්තක නිරත වී සිටි නිසා නැන්සි හා ඇගේ මිතුරෝ විදුලි පන්දම් දල්වා ගෙන තනිව ම පිටත් වූහ.

අල්ලාගත් සොල්දාදුවන් රඳවා තැබුණු පැරණි සිරගෙය ඉතා විශාල එකකි.

දිග කොරිඩෝවක් දෙපැත්තේ බිමට කළුගල් අල්ලන ලද සිරකුටි පේළියක් තිබිණි.

"මොන තරම් නින්දිත විදිහට ද මේ සිරකරුවන්ට සලකළා තියෙන්නේ" බෙස් නහය අකුළවමින් කීවා ය. "මේ ඇතුළේ එළියක්වත් ජනේලවත් නෑ. මට හිතෙන්නේ ඒ අසරණ හිරකරුවන්ට කියවීම ලිවීම තහනම් කරලා තියෙන්න ඇති."

බොහෝ විට එසේ වන්නට ඇති බව නැන්සිගේ ද මතය විය. "ඔවුන්ට කරන්න ඉඩ දීලා තියෙන්නේ එකිනෙකා සමග කතා කිරීම විතරයි."

"මම කල්පනා කරන්නේ කවුරුවත් ම පැනලා ගිහිල්ලා නැතිව ඇද්ද කියලයි."

"සමහර විට," බ්‍රෙට් පිළිතුරු දුන්නේ ය. "හිරකාරයෝ උමඟක් හාරලා ඒකෙන් රිංගලා පැනලා යනවා. නමුත් මෙහෙදී සිරකරුවන්ට සිද්ධවෙනවා තද කළු ගල හාරලා උමඟක් හදන්න. ඒ වගේ වැඩක් අතින් කරන්න ජීවිත කාලයක් ම ගත වෙනවා."

"ඒ වගේ ම සිරකරුවන් ළඟ කිසි ම ආයුධයක් නෑ" වෙනත් සිරකුටිවලට වඩා විශාල සිරකුටියක් වෙත පිරිස පැමිණියෝ ය. එය සිරකරුවන් විසි දෙනෙකු පමණ රඳවා තැබීම සඳහා පාවිච්චි කරන්නට ඇතැයි යන්න ඔවුන්ගේ නිගමනය විය.

"මම කැමතියි ඇතුළ පරීක්ෂා කරල බලන්න" එසේ කියූ ඩේව් දොර විවර කළේ ය.

බෙස් සහ ඔහු විදුලි පන්දම් එල්ල කරමින් සිර කුටිය ඇතුළත පරීක්ෂා කිරීමෙහි යෙදුණෝ ය. බෙස් විස්මයට පත් වූයේ එහි ප්‍රධාන

බිත්ති දෙක ම කළු ගලෙන් නිමවා ඇති බව දැකීමෙනි. තුන්වන බිත්තිය ගඩොලින් බැඳ කළු ගල් බිත්තියට කාවද්දා තිබුණි.

බෙස් කොරිඩෝව දෙසට පසු පස හරවන විට පොඩි විහිළුවක් කළ යුතු යැයි ඩේව්ට සිතුණි. ඔහු හිමින් සීරුවේ පා ඇඟිලි ආධාරයෙන් සිර කුටියෙන් පිටතට පැමිණ කිසි ම ශබ්දයක් නොනැගෙන සේ දොරගුළු ලැවේ ය. ඉක්මන් පියවර නැගූ ඔහු කොරිඩෝව කෙළවරදී අනෙක් පිරිසට එකතු විය.

මේ කිසිවක් නොදන්නා බෙස් ටික වේලාවක් පරීක්ෂා කරමින් සිට "අපි දැන් ආපහු ගිහිල්ලා අනිත් පිරිසට එකතු වුණොත් හොඳයි" යනුවෙන් පැවසුවා ය.

පිළිතුරක් නොනැගුණු හෙයින් ඈ ආපසු හැරී බැලුවා ය. පුදුමයකි! ඩේව් සිර කුටිය තුළ නැත. ඈ ඉක්මනින් ම දොර විවර කිරීම සඳහා වේගයෙන් තල්ලු කළා ය. දොර ඇරුණේ නැත.

මිනිත්තු කිහිපයක් ම ඈ කෝපයෙන් දොර සෙලවූවා ය. තමා බය ගැන්වීම පිළිබඳ ව ඩේව්ගෙන් පළිගන්නා බව දිව්රා ගත්තා ය. ටික වේලාවකින් තරහා නිවී ගොස් ඇගේ මුහුණේ සිනහවක් මතුවිය.

"එයාට දෙන්න පුළුවන් හොඳ ම දඬුවම තමයි මම මේ වැඩේට කිසි ගානක් නෑ කියලා පෙන්වීම" ඈ සිතා ගත්තා ය.

එම සිර කුටියේ මුල්ලකට වන්නට බංකුවක් වශයෙන් පාවිච්චි කරන ලද විශාල ලී කොටයක් තිබුණේය. මිතුරන් නැවත පැමිණෙන තුරු කොටය ඉවත් කර බැලිය යුතුයැයි ඈ සිතා ගත්තාය.

ඇඩි ආයාසයක් දැරීමෙන් පසු විශාල ලී කොටය ඉවත් කර ගැනීමට ඈ සමත් වූවා ය. එය තබා තිබුණු ගල් පොළොව මත විශාල හතරැස් ලෑලි රාමුවක් තිබුණි.

"මට හිතාගන්න බෑ මේ මොකක් ද කියලා. ළිඳක් වෙන්නත් පුළුවන්" ඈ නැවතත් තමාට ම කියා ගත්තා ය.

ඈ ඇඟිලි තුඩුවලින් එම ලෑලි රාමුව ඉවත් කිරීමට උත්සාහ කළත් තදින් පොළොවට තබා ඇණ ගසා තිබුණු නිසා හෝ බර නිසා හෝ ඇයට එය එසවීමට නොහැකි විය.

"මාව සිරකරපු කෙනා මේක දැක්කම පුදුමයට පත් වෙයි එයා නොදැකපු දෙයක් මම හොයා ගත්තා කියලා." ඈ තනිව ම සිනාසුණා ය.



මඳ වේලාවකින් ඇගේ මිතුරෝ නැවත ආහ. "ඩේව් ඔයා භූත දඩයක්කරුවන්ට ලොකු සේවයක් කළේ. දොර අරින්න මම ඔයාලට පුදුම හිතෙන දෙයක් පෙන්වන්නම්. ඔවුන් පුදුමයට පත් කරවමින් ඈ කීවා ය. සෑම දෙනෙක් ම බලාපොරොත්තු වූයේ බෙස් හඬමින් සිටින බව දැකීමට ය.

දොර විවර කළ ඔවුහු කාමරයට ඇතුළු වූ කල පොළොව මත වූ ලෑලි රාමුව දුටුවෝ ය.

"මට හොඳට ම විශ්වාසයි ඒක ඇරියම ඊට යටින් උමගක් තියෙන බවට," ජෝර්ජ් ඒ දෙස බලමින් කීවා ය.

"කොහොම වුණත් ඒක උස්සලා බලමු" නැන්සි කීවා ය.

පිරිමි ළමුන් තිදෙනා ලී දොර ඇද ගැනීමට උත්සාහ කරන අතර දී අනෙක් පිරිස ඒ වටා රොක් වූහ. මුල දී එය සෙලවුණේ මඳ වශයෙනි. ඔවුහු නැවත මුළු වැර යොදමින් එය එසවීමට උත්සාහ කළෝ ය. එක්වර ම දොර ගැලවී ආවේ ය. "ඒ සමග ම පොළොව යටින් 'ඩෝං !' යන හඬක් සමගින් මහා පිපිරුමක් ඇති විය."

පිපිරුම නිසා භූත දඩයක්කරුවෝ විසි වී ගොස් වැටුණෝ ය. ඔවුන්ගේ අතපය දිග හැරී සිර කුටියේ ගල් පොළොව මත විසිරී වැටුණෝ ය. සෑම කෙනෙක් ම ඇඩි කම්පනයකට හසු වී ඇති බවක් පෙනී ගියේ ය.

පළමුවෙන් ම සිහි එළවා ගැනීමට සමත් වූයේ නැන්සි ය. අත් පාවල තැනින් තැන සීරුම් කිහිපයක් ඇති වී තිබෙන බව ඈ දැක්කාය. එමෙන් ම ඇගේ බෙහෙත් දමා තිබුණු පිළිස්සුම් තුවාලයෙන් ලේ ගලමින් තිබුණි.

අනිත් අය ළඟට ගිය ඈ ඔවුන්ට තුවාල සිදුවී ඇත්දැයි විමසුවා ය. ටික වේලාවකින් මතුවී ආ කළුපාට, නිල්පාට තැළීම් පාරවල් කිහිපයක් හා ගෙඩි ගැසුණු තැන් කිහිපයක් හැරෙන්නට වාසනාවකට මෙන් ඔවුන්ට විශාල තුවාල සිදුවී නොතිබිණි.

ඔවුන් අමාරුවෙන් නැගී සිට පහළ බැලූ විට ඔවුන්ගේ සිතේ මතු වූ පළමු පැනය නම් මේ පුපුරණ ද්‍රව්‍ය මෙහි සවිකළේ කවදා ද? ඒ ඇයි ද? යන්නයි. එය පැහැදිලිව ම නිවසේ දී සාදන ලද බෝම්බයක් වූ අතර විශාල එකක් නොවූ නිසා වැඩිමනක් හානියක් සිදු නොවී ය.

නෙඩ් තම විදුලි පන්දම සිදුර තුළට එල්ල කළ විට තද කළු ගලේ කපන ලද පඩි පේළියක් ඇති බව පෙනී ගියේ ය. ඔහු ඊට

ඇතුල් වී මඳ දුරක් ගොස් කෑගසා ඔහු කුඩා උමඟකට පිවිසුණු බව කීවේ ය.

"මේකේ කෙළවරේ ලී දොරක් සවි කරලා තියෙනවා. මම හිතනවා මේක රහසේ ඇතුල් වෙන්නයි, පිට වෙන්නයි පාවිච්චි කරන්න ඇති කියලා"

නැන්සිටත් පහළට බැසීමට සිතක් ඇති වුවත් අනෙක් පිරිස ඈ වළක්වාලූහ. "ඔයාට දැන් ඇති වෙන්න තුවාල වෙලා තියෙනවා. අපි පස්සේ ඇවිත් බලමු" ජෝර්ජ් කීවා ය.

නැන්සි අකමැත්තෙන් එකඟ වූවා ය. "අපි කොහොම හරි ඉක්මනට ඇවිල්ලා බලමු මේ උමඟ අවසන් වෙන්නේ කොහෙන්ද කියලා. මට හොඳට ම විශ්වාසයි මේක පැනලා යන්න හදපු එකක් කියලා"

"ඔයා කියන්නේ ඒක හැරුවේ හිරකාරයෝ කියල ද?"

"සමහර විට. එහෙම නැත්නම් බළකොටුව හදද්දී ම මේ උමඟ කැපුව ද කියන්නත් බෑ. ආක්‍රමණයක දී නිලධාරීන්ටයි, මුරකාරයින්ටයි පැන ගන්න පුළුවන් වෙන්න."

"ඔව්" නෙඩ් කීවේ ය. "සමහර විට මේක සොයා ගත් දක්ෂ සිරකරුවන් කිහිපදෙනෙක් පැනලා යන්නත් ඇති. මුරකරුවන් දැක්කොත් වෙඩි තැබීමෙන් වළක්වා ගන්න ඔවුන් අවතාර විදිහට පෙනෙන්න සුදුපාට රැළි පටි අල්ලපු ඇඳුම් ඇඳගෙන යන්න ඇති. අවතාර වගේ පෙනෙන ඔවුන්ට මුරකාරයෝ වෙඩි තියන්න බයයි. ඔවුන් නියම අවතාර කියලා හිතන නිසා"

"හරිම දක්ෂ උපායක්" ඩේව් කොක්හඬ ලෑවේ ය. "ළඟදි මේ ගැන දැන ගත්ත කවුරි හරි ඒකම රඟ දක්වනවා ඇති තාතායමේ ඉන්න මිනිස්සුන්ව බය කරන්න. "

"මිනිස්සු ඇතුල් වෙන එක වළක්වන්න බෝම්බයක් තියන්න ඇති" බ්‍රෙට් කතාව සම්පූර්ණ කළේ ය.

මේ අතරතුර දී ලෑලි රාමුව නිසි පරිදි සකසා ඊට උඩින් විශාල ලී බංකුව තබා අවසන් විය.

නැන්සි තාතායමේ අයිතිකරුවා වූ හෙසී මහතාට සිදුවූ සියල්ල පැවසුවා ය. ඔහු පුදුමයෙන් හා කුතුහලයෙන් යුතු ව අසා සිටි අතර බෝම්බ සිද්ධි පිළිබඳ ව කම්පාවට පත් විය.

ළමුන් සමඟ නැවත සිරකුටියට පැමිණි ඔහු, "මම පළමුවෙන් යන්නම්" කීවේ ය. "ඔබලා දැනටමත් අනතුරු දෙකකට මුහුණ දීලා



තියෙන්නේ. මම මිත්‍යා දෘෂ්ටිකයෙක් නෙමෙයි. නමුත් දැන් පේන විදිහට හැම විටම සිද්ධි තුන බැගින් සිද්ධ වෙනවා වගේ. කරුණාකරලා ප්‍රවේශම් වෙන්න."

කුඩා කොරිඩෝවක් වැනි කොටසේ සිප්පි කටු විශාල සංඛ්‍යාවක් විසිරී තිබුණි. ඒවා ඉතාම අලංකාර ය. යම් කිසි විදිහකින් ඒවා භූතාවේෂණීය ටැරෙන්ටෙලාට අයත් ඒවා විය හැකි දැයි භූත දඩයක්කරුවෝ කල්පනා කළහ. නැන්සි ඒවායින් කිහිපයක් අහුලා ගෙන එළියට අල්ලා පරීක්ෂා කර බැලුවත් ඒවායේ අයිතිකරුවා කවුදැයි දක්වන සාක්ෂියක් සොයා ගැනීමට ඇයට නොහැකි විය.

එම සිප්පි කටු ඉතා හොඳින් ඔපදමා ඇති බවත්, දූවිලි ඉතා අඩුවෙන් වැදී ඇති බවත් නැන්සිගේ අවධානයට ලක් විය. ඒවා මෙහි සඟවා ඇත්තේ ඉතා ම මෑතක දී බව ඈ සිතා ගත්තා ය. "මේ සිප්පි කටු මෑතක දී සොරකම් කරපුවා වෙන්න පුළුවන්" ඈ තමාට ම මුමුණා ගත්තා ය.

සෑහෙන වෙහෙසකින් පසුව උමඟට ඇතුළු වන ලී දොරටුව විවර කර ගැනීමට පිරිමි ළමයින්ට හැකි විය.

උමඟ කඳුකරය දෙසට යොමු වී ඇති බවක් දක්නට ලැබුණේ ය. එය විහිදී තිබුණු කෝණය අනුව ඉහළට ද පහළට ද යන්න නිගමනය කිරීම අපහසු විය.

"නමුත් අඩු තරමේ මෙහෙ ඉන්න එක මිනිහෙක් ඒක හරියට ම දන්නවා" නැන්සි සිතුවා ය. "මම හොයා ගන්නම් ඒ මිනිහා විල්බට් ප්‍රිට්සර් ද කියලා"

දොර වසා ඇමු පිරිස නැවත සිර කුටිය වෙත ගියෝ ය. තාතායම වෙත පැමිණි ඔවුන්ට අනෙක් පිරිස පැමිණ සිටි බව දක්නට ලැබුණි. අවාසනාවකට මෙන් ඔවුන්ට සොයා ගැනීමට ලැබී තිබුණේ කරුණු කීපයක් පමණකි.

"කැලෑව මැද තියෙන සුද්ද කළ තැනක තිබිලා අපිට පුච්චපු මල් වෙඩි වගේකුයි කඩදාසි වගේකුයි හම්බ වුණා එච්චරයි" ඩොන් තමන් දුටු දේ වාර්තා කළේ ය.

පලා යන සිරකරුවන් අවතාර මෙන් සැරසී පලා යන බවට වූ නෙඩ්ගේ මතය ඇසූ රීටා බලාපොරොත්තු කඩ වූ ආකාරයෙන් මෙසේ කීවා ය. "ඔයාලා දෙන්නා හැම තිස්සේ ම අවතාර භූතයෝ නැහැයි කියලමයි කියන්නේ"

"ඔයා මොනවද මේ කියන්නේ?" බිල් ඇසුවේ ය.

"මේ ලෝකේ තියෙන හැම දෙයකම අවතාරයි භූතයොයි තමයි."

## 18

"ඔයා කියපු කතාව හරි ද?" රීටා නැවත කතාවට එක් වූවා ය. "බිල් ඔයා කිව්වා මේ ලෝකේ තියෙන සෑම දෙයක් ම අවතාරයි භූතයොයි කියලා. එහෙම නේද?"

"ඔව්, එහෙම තමයි" ඔහු පිළිතුරු දුන්නේ ය. සෑම දෙනෙක් ම ඔහුගේ කතාවට අවධානයෙන් සවන් දී සිටියහ. "ඔයාගේ වටා තියෙන මිලියන ගණනක් දේවල් දිහා බලන්න. අපි උදාහරණයකට ගමු බෙල්ලෙකුගේ කටුවක්, ඒක බෙල්ලෙක් බවට පත් කළ හැක්කේ දෙවියන් වහන්සේට විතරයි." ජොයිස් කිල්මර්ගේ කවියක් උපුටා දක්වමින් ඔහු කීවේ ය.

ඔහුගේ අසන්නෝ හිස් වැනූ අතර බිල් දිගට ම කතා කළේ ය. "ඔයා හිතන්නේ බෙල්ලෝ මහ ගොඩක් ඉන්න බවත් සෑම තැනකම ඉන්න බවත් විතරයි. තව සමහර වර්ග ඉන්නවා කලාතුරකින් දකින්න පුළුවන් විදිහේ වර්ගයක්. උදාහරණයකට ගත්තොත් මිනිස්සුන්ව කන බෙල්ලෝ"

"මිනිස්සුන්ව කන බෙල්ලෝ !" බෙස් පුදුමයෙන් ඇසුවා ය.

"උන් කොහේද ඉන්නේ?"

"මහා කොරල් පර බාධකයේ. ඔයා එතන සිප්පි කටු එකතු කරන්න යනවා නම් උස ශක්තිමත් බූට්ස් සපත්තු ජෝඩුවක් දාගෙන යන එක හොඳයි. මොකද 'ට්‍රයි ඩැක්නා ගිගාස්' ඔයාට දරුණු තුවාලයක් කරන්න ඉඩ තියෙන නිසා"

මිනීමස් කන බෙල්ලන් අඩි තුන හතරක් දිග පළලින් වැඩෙන බව බිල් කීවේ ය. "උගේ රැළි වැටුණු විවරය දිගේ දහස් ගණනක් තිත් වගේ ඇස් තියෙනවා. ඌ සමහර විට රාත්තල් පන්සීයක් විතර බරයි."

"අනේ දෙවියනේ !" ඩොන් කීවේ ය. "අපිව අහුවුණොත් ඉවරයි."



ඌ මිනිසුන් කන්නේ කෙසේ දැයි හෙලන් ඇසුවා ය. බිල් සිනාසුණේ ය. "මමත් පෞද්ගලිකව ඒ ගැන විශ්වාස කරන්නේ නෑ. මොකද ඌට කට වහන්න සෑහෙන කාලයක් ගත වෙන නිසා ඕනෑ ම කෙනෙකුට පැන ගන්න සෑහෙන වේලාවක් තියෙනවා"

"හැබැයි මෙහෙම කතාවක් තියෙනවා. මේ කියන 'ට්‍රයි ඩැක්නා ගිගාස්' ළඟ ටෙනිස් බෝලයක් විතර මුතු ඇටයක් තියෙනවා කියලා. කවුරු හරි මෝඩයෙක් ඒක ගන්න උගේ කට ඇතුළට අත දැම්මොත් ඒ මිනිහාගේ අවසානේ තමයි."

හෙලන් වෙව්ලන බවක් දක්වමින් මෙසේ කීවා ය. "මම නම් කවදාවත් මේ සතාව කොරල් පරවල දී දකින්න කැමති නෑ කෞතුකාගාරයක දී මිසක්"

* * * * * * *

පොලිස් නිලධාරීන් පැමිණි විට දී ඔවුන් පිළිගත් හෙසී මහතා නැන්සි සහ පිරිස ඔවුන්ට හඳුන්වා දුන්නේ ය.

"ඔබලාට ස්ටීව් රෝවර් ගැන ආරංචියක් එහෙම ලැබුණ ද?" නැන්සි, කපිතාන් වොට්සන් ගෙන් ඇසුවා ය.

"නැහැ" ඔහුගේ පිළිතුර විය. "ඔහු පැහැරගෙන ගිය මිනිහා ගැනත් ආරංචියක් නෑ. ස්ටීව් ඒ මිනිහා එක්ක කැමැත්තෙන් ම ගියා වෙන්නත් පුළුවන්. මිඩ්ල්බර්ග් පොලිසිය අපිට කිව්වා මේ පිරිමි ළමයා හැම තිස්සේ ම ත්‍රාසජනක වැඩවලට සම්බන්ධ වෙන්න උනන්දුවක් දැක්වූවා කියලා. සමහර විට කොලුවා හිතන්න ඇති ඒ වගේ වැඩක යෙදෙන්න මේ තමයි අවස්ථාව කියලා"

නැන්සි එසේ කල්පනා කළේ නැත. ඈ නිතර ම සිතුවේ පිරිමි ළමයා අපරාධකරුවන්ගේ අත් අඩංගුවේ පසුවන බවත් ඔහුට අනතුරක් සිදුවිය හැකි බවත් ය.

"මේ ගැන අලුත් ම ආරංචිය තමයි" පොලිස් නිලධාරියා විස්තර කළේ ය. "වර්නෝවයිල්වල පිහිටි භූතාවේෂණීය ටැරන්ටෙලාගේ කූඩාරම පෙරේදා රෑ ගිනි ගෙන පිච්චිලා"

"කවුරුහරි උවමනාවෙන් ම කරපු දෙයක් ද?" නැන්සි විමසුවා ය.

"අපි තාම දන්නේ නෑ" පොලිස් නිලධාරියා කීවේ ය. "නමුත්

කතාවේ මේ කොටස භූත දඩයක්කරුවන් වන ඔබලාට ප්‍රයෝජනවත් වෙයි. ගින්නෙන් නැගුණු දුම් අතරින් භූතාවේෂණියගේ අවතාරේ පාවෙනවා දැක්කා කියලා අසල්වාසි මිනිස්සු කියනවා"

ඒ ඇසූ රීටාට ඉහළට ගත් හුස්ම පහතට හෙළීමට අමතක විය. "ඕ ! අහෝ ! ඒ කියන්නේ භූතාවේෂණිය ටැරෙන්ටෙලා මැරිලා"

"නැත්තම් මිනිස්සුන්ට එහෙම හිතන්න සලස්වලා" ජෝර්ජ් සිනාසී කිවා ය. "සමහර විට මුළු සිද්ධිය ම කූට උපායක් වෙන්න පුළුවන්"

පොලිස් නිලධාරීහු ඈ දෙස විමතියෙන් බැලූහ. අනතුරුව චොවිසන්, "ඔබ මේ වගේ විකාර කතා විශ්වාස නොකිරීම ගැන සතුටු වෙනවා" යැයි පැවසුවේ ය.

බිම් මහලේ සිදුවූ බෝම්බ පිපිරීම පිළිබඳව පරීක්ෂා කර බැලූ පරීක්ෂකයින් පිටව ගියේ සිප්පි කටු එකතුවත් රැගෙන ය. සිප්පි කටු එකතුවක් නැති වීම පිළිබඳ ව තමන්ට පැමිණිල්ලක් ලැබී ඇත්දැයි සොයා බලන බවට ඔව්හු පිටත් වන අතරතුරේ දී පැවසූහ.

භූත දඩයක්කරුවෝ දිගට ම ටැරෙන්ටෙලා පිළිබඳ අලුත් ම ආරංචිය ගැන සාකච්ඡා කිරීම කර ගෙන ගියෝ ය. "කුඩාරම ගිනි තියන්න කිසි ම හේතුවක් මට නම් පේන්නේ නෑ" බැබ් කීවේ ය.

ජිම් අවඥාවෙන් හිනැහුණේ ය. "අර අමුතු ගෑනි ආපහු වැඩ පටන් ගන්න උත්සාහ කරනවා වෙන්න පුළුවන්. ඇය පෙන්වන්න හදන්නේ ඈ මළවුන්ගේ ලෝකෙට ගිහිල්ලා එන බව. එතකොට කාටත් විශ්වාසයක් ඇති වෙනවා දැන් ඇයට පෙරටත් වඩා අමුතු ආකාරයේ පණිවිඩ මළවුන්ගේ ලෝකයෙන් දැනගන්න පුළුවන් කියලා" ඔහු විරිත්තුවේ ය. "මළවුන්ගේ ලෝකයෙන් අලුත් පණිවිඩ !"

සිනහව මැකී ගිය පසු භූත දඩයමේ ඊළඟ පියවර කුමක් දැයි පිරිස අතර සාකච්ඡාවක් ඇති විය.

"අපි එන්න එන්න ම අමාරුවේ වැටෙන බවයි මට නම් පෙනෙන්නේ" නෙඩ් පැහැදිලි කළේ ය. "අපිට යන්තම් හැකිවෙලා තියෙන්නේ අවතාර මවන මිනිස්සු කවුද කියලා හඳුනා ගන්න විතරයි."

රීටා ඒ පිළිබඳ ව තමා පැහැදීමට පත් නොවන බව කීවා ය.



"මම විශ්වාස කරන්නේ අවතාර තියෙනවා කියලයි. අමතක කරන්න එපා මේ ලෝකේ කාටවත් පැහැදිලි කරන්න බැරි වුණ අවතාර සිද්ධි හුඟක් තියෙන බව"

නැන්සි කතාවට එක්වෙමින් මාතෘකාව වෙනස් කළා ය. "ඔයාලට තේරුණා ද අපි ඒ ඒ ස්ථානවලට යන්න ඉස්සර වෙලා එතන සිද්ධි ඇති කරලා මිනිස්සුන් බය කරලා තිබුණු බව. මීට ඉස්සර වෙලා හැම තැනක ම සිද්ධවුණේ එහෙමයි. අපි මේ පාර ඊළඟ තැනට ඔවුන්ට කලින් ගිහිල්ලා ඇල එළමු."

"ඔයා ඒකෙන් අදහස් කළේ" නෙඩ් නළල රැළි ගන්වමින් විමසුවේ ය. "අපි මෙහේ ඉන්න බවට සැම තැන ම ආරංචි පතුරලා හොරෙන් ම හිස් කබල් සහ සිප්පි කටු එකතු කරන්නාගේ ගෙදරට යමුයි කියන එක ද?"

"ඔව්"

"ඇත්තෙන් ම ඔයා යෝජනා කරන්නේ භූත දඩයක්කාරයෝ හැමෝ ම මධ්‍යම රාත්‍රියේ මෙහෙන් පිටවෙලා ක්‍රැන්ෂෝ මහත්මයගේ ගෙදරට කඩා වදිමු කියන එක නෙමෙයි නේද?" ජිම් ඇසුවේ ය.

නැන්සි සිනාසුණු අතර ඩේව් විරිත්තීමක් සමග මෙසේ කීවේ ය. "එහෙනම් පත්තරේ මුල් පිටුවේ මෙහෙම වැටෙයි."

"භූත දඩයක්කරුවෝ කඩා වැදෙන්නෝ බවට පත්වෙති."

නැන්සි, හෙලන්, නෙඩ් සහ ජිම් පමණක් ක්‍රැන්ෂෝ මහතාගේ නිවසට යායුතු බවට දීර්ඝ සාකච්ඡාවකින් පසුව තීරණය විය. ඔවුන් ඇඳිරි වැටෙන තුරු එහි රැඳී සිට අවන්හල දක්වා දිවෙන මාර්ගයෙන් ඇතුල් විය යුතු විය.

මේ අතර අනෙක් භූත දඩයක්කරුවන් ගල් තලාව මතට රැස්වී මල් වෙඩි, රොකට් හෝ වෙනත් අන්දමක උපායක් රඟ දක්වේ දැයි පරීක්ෂාවෙන් සිටීමට තීරණය විය.

"අපෙන් කවුරුවත් අඩු නැති බව පෙන්වන්න අපි මොකක් හරි ක්‍රීඩාවක් කළොත් හොඳ නැද්ද?" ජෝර්ජ් යෝජනා කළා ය. "හැබැයි අපි තෝර ගන්න ඕනෑ එහෙ මෙහෙ දුවන පනින ක්‍රීඩාවක්. එතකොට ඈත ඉඳලා බලන කෙනෙකුට අපි කී දෙනෙක් ඉන්නව ද කියලා ගණන් කරගන්න අමාරුයි."

“හොඳ අදහසක්” නැන්සි එය අනුමත කළා ය. “බෙස් ඔයා හිනාවෙලා කෑ ගහලා කතා කරන්න. කට්ටිය ම දුවලා පැනලා ඝෝෂා කරන්න. එතකොට කාටවත් අපේ අඩුව තේරෙන එකක් නැහැ.”

බෙස් තමාට සවස රඟ දැක්වීමට ඇති කොටස පිළිබඳ ව දැඩි සේ සතුටට පත් වූවා ය. “නමුත් නැන්සි ඔයයි, අනිත් තුන්දෙනයි හොඳට පරිස්සම් වෙන්න. අපි ජීවිතේට ඇතිවෙන්න කරදරවලට මුහුණ පෑවා.”

වීරයෝ සතර දෙනා මහ හඬින් සිනාසුණෝ ය. “මායි, ජිමුයි නැන්සිවයි, හෙලන්වයි හොඳින් බලා ගන්නවා” නෙඩ් පොරොන්දු විය.

නැන්සි හෙසී මහතාගේ ට්‍රක් රථය ගෙන යාමට අවසර ඉල්ලූ අතර ඔහු ඊට කැමැත්ත පළ කළත් එය පැදවීමට කිසිවෙක් නොවී ම ගැන කනගාටු විය.

“සමහර විට වෝෆීල්ඩ් මහත්මයා කැමති වෙයි.” නැන්සි කිවා ය.

“එහෙනම් මම ඉතා ම කැමතියි ඔහු එය පදවනවා නම්” හෙසී මහතා කීවේ ය.

මේ ත්‍රාසජනක ක්‍රියාවට සහභාගීවීමට ලැබීම පිළිබඳ ව තමා ඉතා සතුටට පත්වන බව වෝෆීල්ඩ් මහතා කීවේ ය.

රාත්‍රී නවයට පිටුපස ආවරණය කරන ලද ට්‍රක් රථය පෝටිකෝව යට නවත්වන ලදී. ඉක්මනින් ම එහි පිටුපස කොටසට නැගුණු සිව්දෙනා දොර වසා ගත්හ. වෝෆීල්ඩ් මහතා රථය මහා මාර්ගය දෙසට ධාවනය කරන්නට විය.

ඔවුන්ගේ රථය මහ මඟට පිවිසෙනවාත් සමග ම අධික වේගයෙන් මෝටර් රථයක් පැමිණියේ ය. එය “ක්‍රාස්” යන අනුකරණයෙන් තිරිංග හඬ නංවමින් තානායමට ඇතුළු වන පාරට හැරී කඳු අතර නොපෙනී ගියේ ය.

“ඒ කවුද?” නැන්සි ඇසුවා ය.

“කවුරු වුණත් ඒ පදවන කෙනාගේ රියදුරු බලපත්‍රය තහනම් කරන්න ඕනෑ. මිනිහට පිස්සු වගේ” ජිම් පැවසුවේ ය.



ට්‍රක් රථය තුළ සිව්දෙනා හරිබරි ගැසී වාඩි වූයේ ක්‍රැන්ෂෝ වතුයාය දක්වා ඇති සැතපුම් පහක දුර ගෙවා දැමීමට ය.

“කවුරුහරි ඔළුකටුයි, සිප්පි කටුයි එකතු කරනවා කියන්නේ සාමාන්‍ය දෙයක්. නමුත් මිනිස්සුන්ගේ ඇටකටු එකතු කරනවා කියන එක හරි ම පිළිකුල් වැඩක්” හෙලන් අප්පිරියාවෙන් මුහුණ අකුළමින් කීවා ය.

ක්‍රැන්ෂෝ මහතා දැකීමේ මහත් ආසාවකින් තමා පෙළෙන බව නැන්සි කීවා ය. “එයා ගැන මගේ හිතේ මැවෙන්නේ විකාර රූපී චිත්‍රයක්”

මේ අතර වේගයෙන් ඇදී ආ මෝටර් රිය තානායම අසල දී විශාල ශබ්දයක් පිට කරමින් නතර විය. ඒ තුළින් බැසගත් තරුණයෙක් ‘නැන්සි ඩ්‍රිව්ට ලබා දෙන ලෙස’ කියා ලිපියක් පිළිගැනීමේ නිලධාරියාට බාර දී මෝටර් රථයට නැඟී පලා ගියේ ඇසි පිය ගසන තරම් වේගයකිනි. ලිපියේ තැපැල් මුද්‍රාව ලෙස අසල නගරයක නම සටහන් වී තිබුණි.

ලිපිය ඉතා ඉක්මනින් බාර දිය යුතු නිසාත් නැන්සි තානායමෙන් පිටවී ගිය බව දන්නා නිසාත් පිළිගැනීමේ නිලධාරියා ජෝර්ජ් සොයා ගියේ ය. ඈ සිටියේ ගල් තලාව අසල ය.

“ඔයා ලියුම කඩලා බලන එක හොඳයි” ඔහු ඇට යෝජනා කළේ ය. “සමහර විට ඒකේ වැදගත් හදිසි පණිවිඩයක් ඇති”

අනෙක් මිතුරු පිරිසගෙනුත් විමසීමේ දී ඔවුන් පළ කළේ ද ලිපිය කියවීම සුදුසු බවයි. ක්‍රීඩාවන්, සාකච්ඡා සිනහවන් සියල්ල ම නතර වී ගියේ ය. සියලු දෙනා ම ඇස් දල්වා බලා සිටියේ ජෝර්ජ් ලිපිය කියවන තුරු ය.

ඇය ලිපිය කියවා සුසුමක් හෙළුවා ය.

“මොකක්ද ඒකේ තියෙන්නේ ? තරක ආරංචියක් ද?” බෙස් ජෝර්ජ්ට කිට්ටු වී ඇසුවා ය.

ජෝර්ජ් ගල් රුවක් මෙන් නොසෙල්වී මෙසේ කීවා ය. පණිවිඩයෙන් කියවෙන්නේ “පණට ආදරයක් තියෙනවා නම් මහා මාර්ගයට ඇතුල් වෙන්න එපා ! කියලයි”

"ඔ ! අනේ !" බෙස් කෑගැසුවා ය. "නැන්සිට ආපහු කරදරයක්. අපි දැන් මොනවාද කරන්නේ?"

ජෝර්ජ් නිශ්චල ව ගැටලුව විසඳීමට ක්‍රමයක් කල්පනා කරන්නට වූවා ය. ටික වේලාවකින් ඈ මෙසේ කීවා ය.

"නැන්සි මෙහෙන් පිටවෙන්න කලින් මේ ලිපිය ලැබුණේ නැති නිසා නැන්සි මෙහෙන් පිටවෙලා ගිය බව එවපු මිනිහා දන්න බවක් පෙනෙන්නේ නෑ. මට හිතෙන්නේ මේක ඇය අබිරහස පිටු පස්සෙන් පන්නන එකෙන් අයින් කරවන්න එවපු අනතුරු ඇඟවීමක් කියලයි."

අනිත් පිරිස ද ඇගේ මේ අදහසට එකඟ වූ බවක් පෙනෙන්නට තිබුණි. උවමනාවක් තිබුණත් නැන්සිව අල්ලා ගැනීමට තමුන් ප්‍රමාද වැඩි බව ඔවුන්ට තේරුම් ගියේ ය.

කිසිවෙක් කිසිවක් කතා නොකළ අතර ඔවුන් එකිනෙකා තනිව ම නිහඬ ව ඔවුන් රැකදෙන ලෙස යාඥා කළෝ ය. "එයාලව නතර කර ගන්න මොකක් හරි ක්‍රමයක් තිබුණ නම් !" බෙස් තනිව ම සිතුවා ය.

මේ මොහොතේ දී ම ඔවුන් ලුහුබැඳ එන බවක් නැන්සිට හැඟී ගියේ ය. ඈ ට්‍රක් රථයේ පිටුපස තිබුණු පුංචි සිදුරකින් පිටත බැලුවා ය. ට්‍රක් රථයට ආසන්නයේම මෝටර් රථයක් ගමන් කළ අතර එය ට්‍රක් රථයට පිටුපසින් වෙමින් තිබුණි. නැන්සි පරීක්ෂාවෙන් සිටින ලෙස නෙඩ්ට දන්වා ට්‍රක් රථයේ ඉදිරිපසට ගියේ මේ පිළිබඳ ව වෝෆීල්ඩ් මහතාගෙන් විමසීමට ය.

"අපිට ළඟින් ම මෝටර් රථයක් එනවා. ඔබ හිතනව ද ඒක අපේ පස්සෙන් පන්නනවා කියලා ?"

"මමත් ඒක දැක්කා. මටත් සැකයක් තියෙනවා එහෙම දෙයක් සිද්ධ වෙනවා කියලා" ඔහු කීවේ ය.

"ඇයි අපිට පුළුවන් නේද වේගය අඩු වැඩි කරලා ඒ ගැන දැන ගන්න" නෙඩ් යෝජනාවක් ගෙනාවේ ය.

"හොඳ අදහසක්" මෙසේ කිව් වෝෆීල්ඩ් මහතා ඇක්සලේටරයට පය තැබුවේ ය. ඒ සමඟ ම ට්‍රක් රථය වේගයෙන් ධාවනය වන්නට විය. අනිත් වාහනයත් එසේම කළේ ය.



"ඔ ! ඔ !" ජිම් කෑගැවේ ය. "මොකක් හරි හොරයක් තියෙනවා"

එක්වර ම ඉතා වේගයෙන් ඉදිරියට ඇදුණු මෝටර් රථය ට්‍රක් රථයට ළඟා වන්නට විය.

නැන්සිගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය. ඒ කවුරුන් විය හැකිද? ප්‍රීට්සර් සහ ඔහුගේ ගෝල බාලයින් ද?

"මට ඉස්සරහින් ගොවිපළක් පේනවා. මම එතනට හරවනවා" තියුණු වංගුවක් ගනිමින් වෝෆීල්ඩ් මහතා කෑගසා කීවේ ය.

තත්පර කිපයක දී ඔහු ට්‍රක් රථය ගොවිපළට විහිදී ඇති පාරට හරවා විදුලි පහන් නිවා දැම්මේ ය. මෝටර් රථය ඔවුන් පසු කර වේගයෙන් ඇදී ගියේ ය. සැම දෙනෙක් ම සැනසුම් සුසුම් හෙළූහ.

"රියදුරා අපි මෙහාට හරවන බව නොදකින්න ඇති. නැත්තම් ඔවුන් අපි පස්සේ පන්න ගෙන ආවේ නැතිවා වෙන්නත් පුළුවන්" හෙලන් සිත එකඟ කරගත හැකි පළමු අවස්ථාවේ දී ම කීවේ සැකයෙන් පාර දෙස බලමිනි.

ඇයට සිය වචන අවසන් කරන්නටවත් නොහැකි විය. මෝටර් රථය වේගයෙන් පසුපසට ධාවනය වී ගොවිපළට අයත් පාරට හරවා ඔවුන් දෙසට ඇදී එන්නට විය.

## 19

ට්‍රක් රථයේ සැඟවී සිටියෝ බියෙන් තැති ගනිමින් ඊළඟට කුමක් සිදුවේ දැයි බලා සිටියෝ ය. ඔවුන්ගේ පුදුමයට හේතු වන පරිදි වෝෆීල්ඩ් මහතා මෝටර් රථයේ පැමිණි පිරිසට කුලුපග අයුරින් කතා කළේ ය.

"නිලධාරි මහත්මයා, ඔබ මොනව ද මෙහෙ කරන්නේ?"

"ආ ! කොහොමද වෝෆීල්ඩ් මහත්මයා මටත් ඔබෙන් අහන්න තියෙන්නේ ඒ ප්‍රශ්නෙ ම තමයි !" පිළිතුරු කටහඬක් නැඟී ආවේ ය.

"පොලිස් මූලස්ථානයට දැන්වීමක් ලැබිලා තියෙනවා. සොරකම් කරපු ට්‍රක් එකක් මේ මාර්ගය දිහාවට එනවා කියලා. ඉතිං ඔබ ඔය තරම් වේගයෙන් ධාවනය කරලා මෙහාට හැරෙව්වා ම මම හිතුවා ඔබ හැංගෙන්න හදනවා කියලා. මාත් මෙහාට හැරෙව්වේ හොරා අතට ම අල්ල ගන්නයි" පොලිස් නිලධාරියා දිගට ම කියා ගෙන ගියේ ය.

"මම හැංගුණා නම් තමයි" වෝෆීල්ඩ් මහතා සිනාසෙමින් කීවේ ය.

"ඒ ඇයි ?" තවත් නිලධාරියෙක් ඇසී ය.

"මේ ට්‍රක් එක ඇතුළේ ඉන්නවා ළමයි හතර දෙනෙක් පිට අය ඔවුන් අඳුන ගන්නවට අකමැති"

"මම හිතනවා ඔබ ඒ පිළිබඳ ඔක්කොම විස්තරය අපට කියයි කියලා" පළමු පොලිස් නිලධාරියා කීවේ ය.

"ඔක්කෝමල්ලා එළියට එන්න." වෝෆීල්ඩ් මහතා කෑ ගැසුවේ ය.

තෙඩ් අගුල විවර කළ විට දොර දෙපැත්තට විහිදී ඇරුණේ ය. ළමයි සිව්දෙනා ඉන් බැස ගත්හ. නගරයේ දී දැන හඳුනා ගත් පොලිස්



නිලධාරීන් දෙදෙනාට ළමුන් හඳුන්වා දෙනු ලැබී ය. අනතුරුව පොලිස් නිලධාරීහු දෙදෙනා ඔවුන්ගේ ගමනෙහි අරමුණ පැහැදිලි කරන ලෙසට සිව්දෙනාගෙන් ඉල්ලා සිටියෝ ය.

"නැන්සි ඔයා කියන්න" හෙලන් ඉල්ලා සිටියා ය. ඇය නිලධාරීන්ට මෙසේ කීවා ය. "නැන්සි ඩ්‍රිව් ආධුනික රහස් පරීක්ෂිකාවක්. අපි කණ්ඩායම එකතු වෙලා 'භූත දඩයක්කරුවෝ' කියලා සමාජයක් පිහිටුවා ගෙන තියෙනවා. අපි දැන් පොඩි පරීක්ෂණ කිහිපයක නිරත වෙලා ඉන්නේ."

නැන්සි පසු ගිය දින කිහිපයේ දී තමන් මුහුණ පෑ ත්‍රාසජනක අත්දැකීම් වචන කිහිපයකින් විස්තර කළා ය.

"අපේ භූත දඩයක්කරුවෝ කණ්ඩායම සැක කරනවා මේ සිද්ධවෙන අද්භූත සිද්ධි මාලාව තක්කඩි පිරිසකගේ මායාකාරී වැඩ කියලා. ඒ වගේ ම ඔවුන් විවිධ ක්‍රම මඟින් මිනිසුන් බියට පත් කරනවා."

"ආ ! එහෙනම් ඔය කණ්ඩායම තමයි පොලීසියට ආරංචි ලබා දෙන්නේ" පොලිස් නිලධාරියා සිනහවක් පාමින් කීවේ ය. සෑම නගරයක ම බලධාරීන්, ප්‍රීට්සර් කියන ජෝඩුවයි, ටැරෙන්ටෙලා කියන භූතාවේෂණීයයි, පැහැර ගෙන ගිහින් හංගගෙන ඉන්න ස්ටීව් කියන කොලුවයි ගැන ඇස් ඇරගෙන ඉන්නේ. අපිට මේ වෙනකම් ඔවුන් ගැන කිසිම හෝඩුවාවක් ලැබිලා නෑ."

වෝෆීල්ඩ් මහතා සිනාසුණේ ය. "ඔබ කියන්නේ මේ කණ්ඩායම අබිරහස විසඳනකම් පොලීසිය බලා ගෙන ඉන්නවා කියල ද?"

"ඔයාලට තවත් ශක්තිය ලැබෙන්න ඕනෑ" එක් පොලිස් නිලධාරියෙක් කීවේ ය. "හොඳයි, අපි එහෙනම් සොරකමට ලක්වුණු ට්‍රක් එක සොයන්න පිටත් වෙනවා."

යළිත් සිව්දෙනා ට්‍රක් රථයේ පසු පසට රිංගා සැඟවුණු අතර වෝෆීල්ඩ් මහතා එය ධාවනය කරන්නට පටන් ගත්තේ ය. ඔවුන් ක්‍රැන්ෂෝ මහතාගේ නිවසට මඳ දුරකින් ට්‍රක් රථයෙන් බැසීමට කතිකා කර ගෙන තිබුණු අතර වෝෆීල්ඩ් මහතා කෙළින් ම නිවස දක්වා ගමන් කළ යුතු විය. ඒ අතර සිව්දෙනාගේ පිරිස ගස් අතර සැඟවී නොපෙනී යනු ඇති.

"පැය දෙකකින් අපිව ගන්න ආපසු එන්න"

බිමට පතින අතරතුර දී නැන්සි වෝෆීල්ඩ් මහතාට කිවා ය.

"මම එහෙම කරන්නම්"

ඔහුට රිය පදවා ගෙන වැඩි දුරක් යාමට ඉඩ ලැබුණේ නැත. "උඹ ආයේ පැය දෙකකින් මෙහෙ එන්නේ නෑ" යනුවෙන් කියන හඬක් ඇසී ඔහු ආපසු හැරී බැලුවේ ය.

තිගැස්සුණු වෝෆීල්ඩ් මහතා වෙස් මුහුණක් පැළඳ ගත් තරුණයෙක් නැන්සි සහ පිරිස රියෙන් බැස ගත් පසු ඊට ඇතුල් වී සැඟවී ඇති බව වටහා ගත්තේ ය. තරුණයා ඉදිරිපස ආසනයට පැන රියදුරා අසලින් ම වාඩි විය. ලේන්සුවකින් ඔතා ඇති භයානක ආයුධයක් මෙන් පෙනෙන දෙයක් ඔහු අතේ අමෝරා ගෙන සිටියේ ය.

වෝෆීල්ඩ් මහතා සිහි එළවා ගැනීමට හැකි වූ පළමු තත්පරයේ දී ම, "ඔබ කවුද ?" කියා ඇසී ය.

"ප්‍රශ්න එපා. දිගට ම එළවගෙන පලයන්. මම හරවන්න කියපුවහම හරවපන්" තරුණයා තර්ජනාත්මක ස්වරයෙන් කීවේ ය. "උදව් ඉල්ලලා කෑ ගැහැව්වොත් උඹේ අවසානේ තමයි."

මේ නාට්‍යය මෙසේ රඟ දැක්වෙන අතරතුරේ දී නැන්සි, නෙඩ්, ජිම් සහ හෙලන් ක්‍රැන්ෂෝ නිවස කරා ළඟා වෙමින් සිටියහ. එය පාරෙන් බොහෝ ඈතට වන්නට පිහිටා තිබුණි. එහි දල්වා තිබුණේ විදුලි පහන් කිහිපයක් පමණි.

"අපි ගෙදර සීනුව නාද කරන්න ඉස්සරවෙලා ගේ වටේම ඇවිදිලා බලමු" නැන්සි කොඳුරා කීවා ය.

"නෙඩ් ඔය දෙන්නා යන්න. මම හෙලන් එක්ක කවුරුවත් එනව ද කියලා පාර ළඟ ඉඳන් බලන්නම්" ජිම් යෝජනා කළේ ය.

පැරණි මන්දිරයේ ජනේල ඉතා පහළින් පිහිටා තිබූ නිසා ඔවුන් දෙදෙනාට ඒවා තුළින් එබී නිවස ඇතුළත නිරීක්ෂණය කිරීමට හැකි විය. උතුරු පැත්තේ වූ විශාල ජනේලය දක්වා ම විශේෂ දෙයක් දැක ගැනීමට ඔවුන්ට නොහැකි විය. ඒ තුළින් බැලූ ඔවුන්ට ඇති වූ පුදුමය හා තැති ගැන්ම විස්තර කළ නොහැකි ය. ඔවුහු හුස්ම ඉහළ අල්ලා ගෙන ඒ දෙස බලා සිටින්නට වූහ. ඒ ස්ථානය පිරී තිබුණේ ආලෝකමත් කරන ලද මිනිස් හිස් කබල්වලිනි.

"හරිම අද්භූතජනකයි !" නෙඩ් මිමිනුවේ ය. "අර බලන්න ගිනි



උඳුනට ඉහළින් තියන්නේ මොනව ද කියලා"

ඒ මැදට වන්නට විශාල කළු මඩුවෙකුගේ හිසක් එල්ලා තිබුණු අතර එය භයානක යකෙකුගේ ස්වරූපය ගත්තේ ය. උගේ බැබළෙන ඇස් වැසෙමින් ඇරෙමින් තිබුණේ ය. තරු මාලුන්ගේ ස්පර්ශකවල දෙපැත්තේ ම මිනී ඔළු එල්ලා තිබුණි.

දෙදෙනා මේ දර්ශනයෙන් මුසපත් ව බලා සිටින අතර දී පහත් හඬින් කතා කරන හඬක් ඔවුන්ගේ සවනෙහි වැකුණේ ය. කට හඬ හඳුනා ගත නොහැකි ය. කාමරයේ කිසිවෙකු පෙනෙන්නට නොසිටි අතර ඔවුන්ට නොපෙනෙන තැනක සිට මුදු හඬකින් දුරකථනයට පිළිතුරු දෙන සෙයක් ඔවුන්ට හැඟී ගියේ ය.

"මට අර කාමරයට යන්න ආසයි" නැන්සි කෙඳිරුවා ය. "දැන් අපි ගේ වටෙන් ගිහින් ඉදිරිපස දොරේ සීනුව ගහමු."

නැන්සි සහ නෙඩ් හෙලන් සහ ජිම් නැවතී සිටි තැනට ආවෝ ය. ඔවුන් සිව්දෙනා ම ඉදිරිපස පඩි පේළිය අසලට පැමිණි විට නෙඩ් පැරණි තාලයේ සීනුව ඇද්දේ ය. එහි හඬ නිවස පුරා නින්නාද කරවමින් පැතිර ගියේ ය.

ඔවුන්ට පා හඬක් ඇසීමට මඳ වේලාවක් ගත විය. උස, කෙට්ටු, කෝපයෙන් රොස් වූ මුහුණක් ඇති මිනිසෙක් දොර ඇරියේ ය. ඔහු සැරසී සිටියේ ප්‍රධාන සේවකයෙකුගේ ඇඳුමකිනි. ගැටලුකාරී පෙනුමක් ඔහුගේ මුහුණේ මතු වී ආවේ ය. ඔහු ඔවුන්ගේ හිස්වලට ඉහළින් ගේට්ටුව දෙස බැලුවේ ය.

මෝටර් රථයක් නොදුටු ඔහු, "මේ පිරිස කොහොම ද මෙහාට ආවේ ?" යනුවෙන් ප්‍රශ්න කළේ ය. සියලු දෙනා ම මඳ සිනහවක් පෑ අතර නැන්සි මෙසේ කීවා ය. "අපි මෙහේ ඇවිදින්න ආවා. අපට දැන ගන්න ලැබුණා ක්‍රැන්ෂෝ මහත්මයා ළඟ වටිනා සිප්පි කටු හා හිස් කබල් එකතුවක් තියෙනවා කියලා එයා අපිට ඒවා බලන්න ඉඩ දෙයි ද?"

"මම ජෙපර්ස්" මිනිහා පිළිතුරු දුන්නේ ය. "මම ගිහින් ලොකු මහත්මයාගෙන් අහන්නම්" ප්‍රධාන සේවකයා දොර වසා පිටත් විය.

"අපූරු පිළිගැනීමක්" ජිම් සිනහවක් පාමින් කීවේ ය.

"මම ඔහුට දොස් කියන්නේ නෑ. මේ දවස්වල හැම කෙනෙක්වම

ගෙයක් ඇතුළට ගන්න බෑ. මොකද අපි හොරු කණ්ඩායමක් වෙන්නත් පුළුවන්නේ."

ටික වේලාවකින් පසු ප්‍රධාන සේවකයාගේ මුහුණ දොර පියන් අතරින් මතු වී ආවේ ය. "ක්‍රැන්ෂෝ මහත්මයාට දැන ගන්න අවශ්‍යයිලු ඔබලා කවුද කියන එකත්, ඔබලාගේ නම් මොනවා ද කියන එකත්?"

නෙඩ් විස්තර කළේ ය. නැවත වතාවක් දොර වැසී ගියේ ය. ප්‍රධාන සේවකයා පිටත් වී ගියේ ය.

මේ අවස්ථාවේ ඔහු බොහෝ වේලාවකින් පිළිතුරු රැගෙන නොආ නිසා අනිවාර්යයෙන් ම තමන් හරවා යවනු ඇති බවට සිව්දෙනා අතර සැකයක් මතු වී ආවේ ය. නමුත් මිනිත්තු දහයකින් පමණ ජෙපර්ස් නැවත ආවේ ය. මේ අවස්ථාවේ යහපත් පෙනුමක් මුහුණේ දක්වමින් ඔහු දොර විවෘත කළේ සිනහවක් පාමිනි.

"ඇතුළට එන්න" ඔවුන් ඇතුළට කැඳවමින් ඔහු කීවේ ය. "අවාසනාවකට වගේ ක්‍රැන්ෂෝ මහත්මයාට ටිකක් සනීප මදි. නමුත් ඔබලා ඔහුගේ එකතුව නරඹනවට ඔහුගේ විරුද්ධත්වයක් නෑ. ඔයාලට හිතෙයි මෙතන ගෙයක් කියන එකට වඩා නගරයේ කෞතුකාගාරයකට සමානයි කියලා."

නැන්සි සහ නෙඩ් පිටතින් එබිකම් කරන විට දුටු අද්භූත කාමරයට ඔහු ඔවුන් කැඳවා ගෙන ගියේ ය. ළං වී බැලූ කල එම කාමරය පිටතින් බලනවාට වඩා මායාකාරී බවක් ඉසිලී ය. ඒ වන විට කළු මඩුවාගේ ඇස් ඇරීම වැසීම නැවතී තිබුණේ ය.

එක් බිත්තියක් දිගට ම අලංකාර සිප්පි කටු තබා තිබුණු වීදුරු රාක්ක පේළියක් සවිකර තිබුණි. සෑම සිප්පි කටුවක් ඉදිරියෙන් ම ජීව විද්‍යාත්මක නාමය, ජනප්‍රිය නාමය හා පුරාවෘත්තය සඳහන් කාඩ් පතක් එල්ලා තිබුණේ ය.

නැන්සිගේ අවධානය දිනා ගැනීමට සමත් වූයේ "ෂෙනපෝරා" නමින් නම් කර තිබුණු එක්තරා බෙලි කටුවකි. එහි විස්තර දක්වා තිබුණු කාඩ්පතේ සඳහන් ව තිබුණේ ඌට තනි ව ආරක්ෂාව සලසා ගැනීමට නොහැකි නිසා මේ කුඩා ගොළුබෙල්ලා වෙනත් ගොළුබෙලි කටු සොයා ගෙන එහි සැඟවෙන බවයි.

ඌ ඒවා තමාගේ සිරුරට අලවා ගැනීමට ආවරණයෙන් නිකුත් කරන මැලියම් වැනි ද්‍රාවණයක් යොදා ගන්නා බව තව දුරටත් එහි



සඳහන් ව තිබුණි. වැලි සහිත වෙරළක දී හෝ ජලය තුළ දී මේ අමුතු පෙනුමක් සහිත සතා අනෙක් සතෙකුගේ කුසගින්නට සුදුසු ආහාරයක් නොවේ.

"හරි ම විකාර පෙනුමක් ඌට තියෙන්නේ" එසේ සිතූ ඈ සිනාසුණා ය. "ඌ තමයි නියම සිප්පි කටු එකතු කරන්නා"

ඒ මොහොතේ දී ජෙපර්ස් නැවත් කාමරයට ඇතුළු වූයේ ය.

"මට සමාවෙන්න. ආපහු එන්න ප්‍රමාද වුණාට" ඔහු කනගාටුව පළ කළේ ය. "ක්‍රැන්ෂෝ මහත්මයා ගැන ටිකක් අවධානය යොමු කරන්න සිද්ධ වුණා. වයසක මහත්මයා මට කිව්වා ඔබලාට බිම් මහල පෙන්වන්ටයි කියලා. ඔහු එක්තරා කාලෙක ලොකු දඩයක්කාරයෙක් වෙලා හිටියා. ඒ නිසා ඉතා ම සිත් ගන්නාසුලු දේවල් රාශියක් එහි තිබෙනවා."

ඔවුන් කාමරයෙන් කාමරයට යන විට දුටුවේ ඒ සෑම එකක් ම හිස් කබල්වලින් පිරී ඇති බවයි. මෙසේ ගමන් කරන අතරතුර දී මේ ගමනට බෙස් නොපැමිණීම කොතරම් හොඳ දැයි නැන්සි කල්පනා කරන්නට වූවා ය.

"අසරණ කෙල්ල මෙහි ආවා නම් එක දිගට ම වෙව්ලන්න පටන් ගනියි."

"මෙච්චර හිස් කබල් පිරිලා තියෙන නිසා කෙනෙකුට අවතාර ගැන නොහිතා ඉන්න අමාරුයි. ඔබ කවදා හරි අවතාර එහෙම මේ වටපිටාවේ දී දැකලා තියෙනව ද?" නැන්සි ජෙපර්ස්ගෙන් විමසුවා ය.

ප්‍රධාන සේවකයා මහ හඬින් සිනාසුණේ ය. "මට නම් මේ හැම හිස් කබලක් ම අවතාරයක් තමයි. බිම් මහලට මම ඔයාලව එක් කර ගෙන යන්නම්. එහේ තමයි සත්තු වත්ත තියෙන්නේ."

ඔහුගේ සිනා හඬට රාක්කවල තබා තිබුණු හිස් කබල් උඩ නටන්නාක් මෙන් ඒ මේ අත වැනීමට පටන් ගත්තේ ය.

පඩි පේළිය දිගේ පහතට බසිනා අතර මඟ දී ඔවුහු ඇටසැකිලි එකින් එක පසු කරගෙන ගියෝ ය. ඒවායින් බොහෝමයක් බිත්තිවල සැහැල්ලු ආකාරයට කොකුවලින් එල්ලා තිබුණි. නමුත් පඩි පෙළ පාමුල ඇටසැකිලි කිපයක් වීදුරු කුඩු තුළ දමා තිබුණි.

"අපි ඉතා ම වටිනා ඒවා දොරගුල් දමලයි තියෙන්නේ" ජෙපර්ස් පැහැදිලි කළේ ය. "ඔබට දැන් දකින්න පුළුවන් වෙයි ඩයිනෝසරයෙකුගෙයි, වෙන ප්‍රාග් ඓතිහාසික සතුන්ගේ එකතුවකුයි. ඒවා කුඩු ඇතුළේ අලයි තියෙන්නේ. මම ඔබලාට ඇතුළට ගිහිල්ලා ඒ පොසිල හොඳින් ම දැක ගන්න ඉඩ දෙන්නම්."

අමුත්තෝ එකිනෙකාගේ මුහුණු බලා ගත්හ. ඩයිනෝසර පොසිල වීදුරු කුඩුවක රැඳවීමේ අර්ථය කුමක් ද?

"මට හිතෙන්නේ එහෙම කළා ම ඒවා සොරකම් කිරීම අපහසු බවයි" නැන්සි සිතුවා ය. "නමුත් ජෙපර්ස් කිව්වා ඒවා ක්‍රැන්ෂෝ මහත්මයාගේ ඉතා ම වටිනා වස්තු කියලා. එහෙම නම් ඔහු ඒවා එක්ක සෙල්ලම් කරන්න හදන එකක් නැහැ"

මඳ වශයෙන් ආලෝකමත් කරන ලද කොරිඩෝව දිගට ම අති විශාල වීදුරු කුටි තුළ අමුතු ම ආකාරයේ සතුන් රාශියකගේ ඇටසැකිලි තබා ඇත. ඔවුන් ඩයිනෝසර්ගේ කුටිය පසු කර ගෙන ගිය විට ඊට එහායින් ඩිප්ලෝඩෝකස් (diplodocus) සතෙකුගේ කුටියක් හමු විය. ජෙපර්ස් ඒ කුටියේ දොර අගුල විවර කර එහි පිහිටා තිබෙන ඇටසැකිල්ල පරීක්ෂා කර බලන ලෙස ඔවුන්ට ආරාධනා කළේ ය.

හෙලන් හා ජිම් ඇතුළු වූ අතර නෙඩ් ඊළඟට යාමට සූදානම් විය. ඇගේ තියුණු ඉව නැන්සිට කුටිය තුළට නොයෙන ලෙසත් අනිත් අය ඉක්මනින් ම පිටතට කැඳවන ලෙසටත් අවවාද කළේ ය.

ඈ නෙඩ්ගේ කමිසයෙන් ඇද, "ඇතුළට යන්න එපා" යැයි ඔහුගේ කනට කොඳුරා කීවා ය.

නමුත් ඇගේ අනතුරු ඇඟවීම සිදු කිරීමට පමා වූවා වැඩි ය. වේගවත් තල්ලුවක් සමගින් ජෙපර්ස් ඇයව කුටිය තුළට එබුවේ නෙඩ්ව ද පෙරළී යන පරිද්දෙනි. ප්‍රධාන සේවකයා ක්ෂණික ව දොර වසා දමා අගුල් ලෑවේ ය.

ඉණට දෑත් තබා ගත් ජෙපර්ස් මඳ වේලාවක් අමුත්තන් දෙස බලා සිටියේ දැලකට අසු වූ මැස්සන් දෙස බලා සිටින මකුළුවෙකු මෙනි. ඔහුගේ දෑස් ක්‍රෝධයෙන් දිලිසුණේ ය. අනතුරුව ඔහු තම ගොරෝසු හඬින් සිනාසෙන්නට විය. ඊළඟ මොහොතේ දී ප්‍රධාන සේවකයා තරප්පු පෙළ වෙත පිය නඟන්නට වූයේ තම සිරකරුවන් මහත් අසරණ භාවයකට පත් කරමිනි.



# 20

ඩිප්ලෝඩෝකස්ගේ කුටියට රිංගා සිරකරුවන් බවට පත්වීමට තරම් මෝඩ වීම පිළිබඳ ව සිරකරුවන් තමන්ට ම පරිභව කර ගන්නට පටන් ගත් විට ජෙපර්ස් එක්වර ම ආපසු හැරී නැවත සිරකුටිය වෙත ආවේ ය. නැවත වරක් ඔහුගේ දැඩි උපහාසාත්මක එමෙන් ම ඇසූවන් වෙව්ලුම් කවන මහ හඬින් සිනා සෙන්නට වූයේ ය.

"ටික කාලයකින් ම නැන්සි ඩ්‍රිව් සහ ඇගේ මිතුරෝ ඇටසැකිලි බවට පත්වෙයි."

"නමුත් ඒ මොකක් නිසා ද?" නෙඩ් යකඩ පොලු අල්ලාගෙන ඒවා තදින් සොලවමින් ඇසුවේ ය.

ජෙපර්ස් ඔහුගේ ගිනිබෝල වැනි ඇස්වලින් තියුණු බැල්මක් ඔහු වෙත යොමු කර "මොකද උඹලා ඕනෑවට වඩා අපේ සැලසුම්වලට බාධා කළා." යනුවෙන් ගොරෝසු හඬකින් කීවේ ය. ඔහුගේ කටහඬ නිහඬ බවේ ගිලී තිබුණු කොරිඩෝවේ ප්‍රතිරාව දුන්නේ ය.

"ඔබ කවුද? මොනවද ඔබලාගේ සැලසුම් ?" නැන්සි ප්‍රවේශමෙන් ප්‍රශ්න කළා ය.

නමුත් ඔහු ඒ ප්‍රශ්න උවමනාවෙන් ම මඟ හැරියේ ය. ඒ වෙනුවට ඔහු කීවේ "උඹලා වැඩිය දඟලලා ශක්තිය නැති කරගන්න හදන්න එපා. උඹලාට මෙහෙන් කොහොමටවත් ගැලවිලා යන්න ලැබෙන්නේ නෑ" කියා ය.

නැවත කොරිඩෝව දිගේ ඉදිරියට ගිය ඔහු ඔවුන්ගේ දර්ශනයෙන් ඈත් වී ගියේ ය.

"අපි ඉන්න තත්ත්වය නම් හරිම භයානකයි." හෙලන් කීවා ය. "අපි දැන් මොකද කරන්නේ"

"ඔව්" ජිම් කීවේ ය. "අර මෑගයාගේ තර්ජනය බොරුවක් කියලා හිතන්න බැහැ. මේතරම් ඉක්මනට ඇට සැකිල්ලක් වෙන්නත් මං කැමති නෑ."

නැන්සි කල්පනාවේ යෙදුණා ය. "මම කල්පනා කරන්නේ බ්‍රැන්ෂෝ මහත්මයා මේ කල්ලියේ සාමාජිකයෙක් ද, එහෙම නැත්නම් ඔහුත් අපි වගේ ම ප්‍රිට්සර්ලගේ ගොදුරක් වෙලා ද කියලයි."

නෙඩ් පරීක්ෂාවෙන් වටපිට බැලුවේ පලා යා හැකි මාර්ගයක් තිබේ දැයි දැන ගැනීමට ය.

දෙපැත්තේ බිත්ති මහත ඕක් ලෑලි යොදා නිමවා තිබුණි. එක් පැත්තක ලෑලි අතර හිඩැස් තිබේ දැයි පිරිමි ළමුන් දෙදෙනා පරීක්ෂා කරන අතරතුර දී ගැහැනු ළමෝ අනෙක් පැත්තේ ඕක් ලෑලි අතර පරීක්ෂා කළෝ ය. "මම සෙලවෙන ලෑල්ලක් තියෙන තැනක් සොයා ගත්තා" නැන්සිගෙන් ප්‍රීතිමත් හඬක් නැඟී ආවේ ය.

පිරිමි ළමයි ඉදිරියට පැන ආ අතර සුළු මොහොතක දී ලෑල්ල තිබූ තැනින් ඉවත් කෙරුණි."අපි යමු" නෙඩ් කොඳුරා කීවේ ය.

ඔහු පිටතට පය තබනවාත් සමග ම සිරකරුවන්ට පා ගැටෙන ශබ්දයක් ඇසෙන්නට විය.

"අපි දැන් ම නොයන එක හොඳයි" හෙලන් අවවාද කළා ය.

"මම තනිව ම ගිහිල්ලා පරීක්ෂා කරලා බලන්නම්" නෙඩ් කියූ විට අනෙක් තිදෙනා හිස් සලමින් එය අනුමත කළහ. ඔහු එළියට ගිය විට ඔවුහු නැවත ලෑල්ල තිබුණ ආකාරයට ම සවි කළහ.

"ජෙපර්ස් ආපසු එන හැඩයි" නැන්සි කීවා ය. "නෙඩ් මේ කුටිය ඇතුළේ නැති බව දැක්කහම ප්‍රශ්නයක් වෙයි. මම යෝජනා කරනවා අපි ඔහුත් එක්ක පොඩි හොරා පොලිස් සෙල්ලමක් කරමු. අපි මේ ඇට සැකිල්ල පිටිපස්සේ හැංගිලා ඉදිරියට එමින්, පිටුපස හැංගෙමින් ඉමු. ජිම් ඔයා නෙඩ්ගේ කොටසත් රඟපාන්න ඕනෑ. නෙඩ් මෙතන නැති බව ජෙපර්ස්ට නොදැනෙන්න."

එහි පැවති මඳ ආලෝකය නිසා මේ ප්‍රයෝගය හෙළි නොවනු ඇති බවට සියලු දෙනාට පැහැදිලි විය. ජෙපර්ස් එතැනට පැමිණෙන විට නැන්සි ඩිප්ලෝඩෝකස් වෙත ඇස් යොමු කර ගෙන සිටින බවක් ඇඟවූවා ය.

"අනිත් එවුන් කොහේද?" ජෙපර්ස් පුපුරා හැළුණේ ය. නැන්සි කෑගසා කතා කළා ය. "හෙලන් ඔයා කොහේද?" හෙලන් ඇටසැකිල්ල පිටු පස සිට මතු වී ආවා ය.

"අනිත් කොල්ලෝ දෙන්නා?" ජෙපර්ස් ඇසුවේ ය. කිසි ම තිගැස්මක් ඇති බවක් නොදක්වා, "ජිම් ඔයාට කවුදෝ කතා කරනවා"



යනුවෙන් නැන්සි කෑ ගැසුවා ය. ජිම් සුවිශාල පොසිලයේ මුල්ලක සිට ආවේ ය.

"තව එකෙක් හිටියා" ජෙපර්ස් කෝපයෙන් කෑ ගැසුවේ ය. "උඹලා තවමත් මේ කුටියේ ඉන්න බව පැහැදිලිව ම මට පෙන්නපල්ලා. නැත්නම් මෙතන ලොකු ප්‍රශ්නයක් ඇති වේවි."

ජිම් ඒ වන විටත් ඇටසැකිල්ල පසුපසට වී හමාර ය. කමිසය උනා දැමූ ඔහු හිස කෙස් නළලට වැටෙන සේ දමා ගෙන ඉදිරියට පැමිණියේ ය. ඔහු එහි ටික වේලාවක් පෙනෙන්නට සිට ජෙපර්ස් සෑහීමකට පත් වූ බව පෙනුණු විගස ඇටසැකිල්ල පසු පසට දිව ගියේ ය.

"ඔක්කොම හරි" ජෙපර්ස් නිවුණු ස්වරයකින් කීවේ ය. "නමුත් උඹලට හොඳින් කියන්නේ ආයෙත් මේ වගේ විකාර කරන්න ලෑස්ති වෙන්න එපා" ඔවුන් දෙසට ඇඟිල්ල දික් කරමින් කීවේ ය.

ඔහු ඈත කොරිඩෝවෙන් යන්තම් නොපෙනී ගිය වහා ම ජිම් ලෑල්ල ඉවත් කළ අතර ඔවුන් තිදෙනා ම සිර කුටියෙන් පිටතට පැමිණියහ. නෙඩ් පෙනෙන්නට නොසිටියේ ය.

සිරකරුවන් සිටියේ කුටි දෙකක් අතර කුඩා හිඩැසක ය. ඉතා සීරුවෙන් ඉදිරියට පිය නැඟූ ඔවුහු කොරිඩෝවේ එහා මෙහා පරීක්ෂාවෙන් බැලුවෝ ය. එය සම්පූර්ණයෙන් හිස්ව තිබේ.

හෙලන් සහ ජිම් තරප්පු පෙළ දෙසට ඇදුණෝ ය. බිම් මහලේ ඇති දේවල් තවදුරටත් දැක ගැනීමේ කුතුහලයෙන් නැන්සි කොරිඩෝවේ අනෙක් පැත්තට දිව ගියා ය. මඳ වේලාවකින් ඈ දොරක් වෙතට පැමිණ නතර වූවා ය. ඇයට කෙඳිරිලි හඬක් ඒ තුළින් ඇසිනි. ඒ යම් කිසිවෙක් උදව් ඉල්ලා නඟන හඬකි.

නැන්සි දොරෙහි හැඬලය කැරකෙව්වත් එය ඇරුණේ නැත. දොර තදින් අගුලු ලා තිබුණි.

දොර පලු දෙක අතර විවරයට කට තැබූ ඈ "කවුද ඔය ?" යනුවෙන් කොඳුරා ඇසුවා ය.

"ස්ටීව් රෝවර්, මාව එළියට ගන්න !"

"ස්ටීව් !" නැන්සි මහත් පුදුමයකින් කල්පනා කළා ය.

"මම තමයි කැලෑවේ දී සිප්පි කටුව සොයා ගත් ගැහැනු ළමයා,

මම පුළුවන් තරම් ඉක්මනින් ඔයාව බේරා ගන්නම්. ඔයා දන්න දේවල් සේරම මට කියන්න. ඔයා කොහොම ද මෙහෙට ඇතුල් වුණේ ? කවුද ඔයා මෙහාට ගෙනාවේ ?"

"මම කිසි ම දෙයක් දන්නේ නෑ" ස්ටීව් කිව්වේ ය.

"කරුණාකරලා මාව මෙතනින් බේරගන්න"

"මම උත්සාහ කරන්නම් මේ දොරේ යතුරු සොයා ගන්න" නැන්සි පොරොන්දු වූවා ය.

ආපසු හැරුණු ඈ කොරිඩෝව දිගේ ඉදිරියට ගමන් කළා ය. නෙඩ්, හෙලන් සහ ජිම් ආපසු එමින් සිටියෝ ය.

"අපි බිම් මහලට ආපු තරප්පු පේළිය ඇරුණාම ඉහළට යන්න වෙන කිසි ම මාර්ගයක් නෑ" නෙඩ් කීවේ ය.

"මාර වැඩේනේ" නැන්සි කීවා ය. අනතුරුව තමන්ට ස්ටීව් මුණ ගැසුණු ආකාරය ඔවුන්ට පැහැදිලි කළා ය.

"අපි කොහොම හරි එයාව බේර ගන්න ඕනෑ" නැවත ස්ටීව්ට කතා කර මේ කල්ලිය අල්ලා ගැනීමට උපකාර වන යම් තොරතුරක් ඔහු දන්නේ නම් එය අසා ගත යුතු බව නැන්සි යෝජනා කළා ය. සියලු දෙනා ම නැවත ඔහුගේ සිර කුටිය දෙසට පිය නැගුහ.

"ජිම්" නෙඩ් කතා කළේ ය. "ජෙපර්ස් ආයෙත් ආවොත් අපි මිනිහව පෙරළලා අල්ල ගමු"

ඔවුන් කුටියක් පසුකර යනවිට නෙඩ් එහි කොක්කක එල්ලෙමින් තිබුණු රෙදි පටියක් දැක එය ගලවා ගෙන ඉණේ ගසා ගත්තේ ය.

නැන්සි හා හෙලන්, ස්ටීව් සමග කතා කිරීමට ගියෝ ය.

"ඔයාට කොයි වෙලාවක හරි ඇහුණ ද පැහැර ගත් අය හරි, ජෙපර්ස් හරි මොනව හරි අද්භූත දෙයක් ගැන කතා කරනවා" නැන්සි විවරය තුළින් ඇසුවා ය.

ස්ටීව් පිළිතුරු දුන්නේ ය. "එක පාරක් ජෙපර්ස් කෑම අරගෙන ආපු වෙලාවක ඔහු 'නොපෙනී ඇතුළුවන්නා' කියන වචනය මුමුණනවා ඇහුණා."

"ඒක අපිට උදව්වක් වෙයි" නැන්සි කිව්වා ය. "මායි, මගේ යාළුවොයි මෙහෙ හිරකාරයෝ. නමුත් අපි යන්නම් බේරුණා. අපි



දැන් හදන්නේ මේ ගෙදරින් පැන ගන්නයි. එළියට යාගන්න පුළුවන් වුණු හැටියේ අපි පොලිසිය කැඳවා ගෙන එන්නම්" එසේ කියූ ඔවුහු ස්ටීව්ගෙන් සමුගත්තේ ඉක්මනින් නැවත හමුවීමේ බලාපොරොත්තුවෙනි.

ඩිප්ලෝඩෝකස්ගේ කුටියට ළඟා වන විට ඔවුන්ට ජෙපර්ස්ගේ අඩි ශබ්දය ඇසෙන්නට පටන් ගත්තේ ය. සියලු දෙනා ම මුල්ලකට වී සැඟවී ගත්හ. ජෙපර්ස් ළඟා වූ විගස නෙඩ් සහ ජිම් ඔහු මතට පැන්නෝ ය.

ඔහු අරගල කළේ ටික වේලාවකි. ඔහු ඉක්මනින් ම යටත් කර ගැනීමට ඔවුන්ට හැකිවිය. නෙඩ් ඔහුගේ සාක්කුවෙන් යතුරු කැරැල්ල ඉවතට ගත්තේ ය.

"නැන්සි" නෙඩ් යතුරු කැරැල්ල ඇයට දෙමින් කිවේ ය. "මේ යතුරුවලින් ඔය කුටිය අරින්න පුළුවන් ද බලන්න. ඊට පස්සේ අපි මෙයාට දෙමු ඩිප්ලෝඩෝකස්ගේ කාමර සගයා වෙන්න අවස්ථාවක්."

ඇයට නියම යතුර සොයා ගන්නට හැකිවූ අතර, අත් පා බැඳ දමනු ලැබූ ජෙපර්ස් කුටිය තුළට තල්ලු කර දොර අගුළු ලන ලදී.

"සමහර විට මේ යතුරුවලින් එකක් ස්ටීව් හිර කරලා තියෙන කාමරයේ දොරට හරියන්න පුළුවන්" නැන්සි යෝජනාවක් ගෙනාවා ය. ඔවුහු ආපසු ස්ටීව්ගේ සිරකුටිය දෙසට දිව ගියෝ ය.

සුළු වේලාවකින් ම පැහැර ගෙන යනු ලැබූ ළමයා නිදහස් වී එළියට ආවේ ය. ජෙපර්ස් සිරකර ඇති බව ඇසූ ස්ටීව් සන්තුෂ්ට විය. එහෙත් මේ නිවස තුළ සිදු වන දේ පිළිබඳ තමන්ට කිසිදු දැනුමක් නැති බව පළ කළේ ය.

"ජෙපර්ස්සුයි, අනිත් මිනිස්සු දෙන්නයි හැමෝ ම මට කීවේ මාව ටික දවසකට හිරකාරයෙක් විදිහට තියාගන්න සිදුවන බවයි. එතකොට එදා සිද්ධිය ගැන කාටවත් දැන ගන්න ලැබෙන්නේ නැති නිසා මට හිතෙන්නේ ඔවුන් හොරකමක් වගේ විශාල රාජකාරියක් කරලා පැනලා යන්නයි උත්සාහ කරන්නේ."

ඒ ලොකු රාජකාරිය ක්‍රැන්ෂෝ මහතාගේ මුළු සේසත ම සොරකම් කිරීම විය හැකි යයි නැන්සි කල්පනා කළා ය.

"ස්ටීව් ඔයා ඔවුන්ට කිව්ව ද අපි ළඟ සිප්පි කටුව තිබුණා කියලා"

"නෑ, මම ඔවුන්ට මොකුත් කිවේ නෑ" ඔහු දිවුරුවේ ය. භූත දඩයක්කරුවෝ පළමු මහලට පැමිණි විට ජිම් සහ හෙලන් ඉහළ මහලට ගොස් ක්‍රැන්ෂෝ මහතා සමග කතා කළ යුතු බව කීවෝ ය. එහි ගිය ඔවුන්ට ක්‍රැන්ෂෝ මහතා ඇඳ මත වැතිරී පොතක් කියවන ආකාරය දැකීමට හැකි විය. ඔහුගේ කන් ඇසීම ඉතා දුර්වල බව පෙනී ගිය අතර ඔහු ශ්‍රවණාධාර උපකරණ පැළඳ සිටියේ ය.

"ජෙපර්ස් කොහෙද?" නමුත් කවුද? මෙහාට ආවේ මොකටද?" ඔහු ගරුසරු නැති ලීලාවෙන් ප්‍රශ්න කළේ ය. ජිම් පිළිතුරු දීමට ඉදිරිපත් විය. "ජෙපර්ස් තමයි අපිට ගෙදරට ඇතුල් වෙන්න ඉඩ දුන්නේ. ඔහු අපිට කිවා හිස් කබල් හා ඇටකටු එකතුව බැලීම ගැන ඔබගේ කිසි ම විරුද්ධත්වයක් නැති බව."

"මම කිසි ම විටෙක ඔහුට ඒ වගේ දෙයක් කිවේ නැහැ. දැන් කොහේද ජෙපර්ස් ඉන්නේ ? දැන්ම ම එයාව මං ළඟට එවනවා !" ක්‍රැන්ෂෝ මහතා මොරගැවේ ය.

"අපි එයාව බිම් මහලේ හිර කෙරුවා" ජිම් කීවේ ය. "එයා අපිව මුලින් ම හිරකෙරුවා. නමුත් අපි බේරුණා. අපි හිතන්නේ මිනිහා දරුණු අපරාධකාරයෙක්."

"මොකක් !" මහලු මිනිසා පුදුමයෙන් ප්‍රශ්න කළේ ය.

"ජෙපර්ස් ඉතා හොඳ ගෘහ සේවකයෙකුව හිටියා."

"කවදා හරි ඔබගේ මිල කළ නොහැකි සිප්පි කටු එහෙම නැතිවෙලා තියෙනව ද?" හෙලන් ඇසුවා ය.

එසේ නැතිවී ඇති බවත්, මේ සුවිශාල හුදකලා නිවසේ දී ඒවා සොරුන්ගෙන් ප්‍රවේශම් කර ගැනීම ඉතා අසීරු කටයුත්තක් බව කීවේ ය.

"ඒ තරම් ගණන් නොගත යුතුව තිබුණත් මම සෑම විට ම අවතාර ගැන විශ්වාස කරනවා. මම ඒවාට හරි ම බයයි."

"සොරකමට පෙර සෑම රාත්‍රියක ම මගේ කාමරය තුළ අවතාරයක රූපයක් එහා මෙහා ගමන් කරන බව දැනිලා මට ඇහැරෙනවා. ටික වේලාවකින් ඒ අවතාරය කෑලිවලට කැඩිලා බිඳිලා නොපෙනී යනවා."

"ඒකත් අපි හොයන මිනිහගේ උපක්‍රමයක් බවයි මට නම් පෙනෙන්නේ. ඔහුව පොලීසියෙනුත් හොයනවා" ජිම් කීවේ ය.



මේ අතරතුර දී නැන්සි සහ නෙඩ් ස්ටීව් කැඳවා ගෙන ඇස් ඇරෙන වැහෙන කළු මඩුවා සහ ආලෝකමත් කරන ලද හිස් කබල් ඇති කාමරයට ඇතුල් වූහ. කොලුවා ඇස් විශාල කර ගෙන නැන්සිගේ අතින් අල්ලා ගත්තේ ය. "මේවා හරිම භයානකයි ! අර වලිගයක් තියෙන රූපයේ ඇස් නටන්නේ ඇයි ?"

"ඒවා ඇත්තට ම ඇස් නෙමෙයි. ඒවා හැම වෙලාවෙ ම ඇරෙන්නේ වැහෙන්නෙත් නෑ" නැන්සි පිළිතුරු දුන්නා ය.

"ඇහුම්කන් දෙන්න" නෙඩ් එකවර ම කීවේ ය.

මිනිසෙකුගේ කටහඬක් කළු මඩුවා තුළින් ගලා එයි.

නෙඩ් සහ නැන්සි ඒ වෙතට ළං වූහ. ඒ තුළ දෙපසට ම ක්‍රියා කරන ඉතා කුඩා ප්‍රමාණයේ රේඩියෝ සංඥා පද්ධතියක් සවි කර ඇත!

"මට උත්තර දෙනු !" නොපෙනෙන කතිකයා කියමින් සිටියේය.

නැන්සි, නෙඩ්ට අතින් ඇන "ඔයා උත්සාහ කරලා බලන්න" යනුවෙන් කීවා ය.

ඔහු පරීක්ෂාවෙන් කළු මඩුවා දෙස බලා සිට කුඩා බොත්තමක් දැක එය එබුවේ පිණිවිඩය දෙන ස්ථානය මෙය යැයි විශ්වාසයෙනි. ඔහු මයික්‍රෆෝනයට කිට්ටු වී 'ජෙපර්ස්' යනුවෙන් කීවේ ය. ඊළඟට පණිවිඩ ලබා ගන්නා බොත්තම එබුවේ ය.

"රහස් සංඥා සංකේතය ඉදිරිපත් කරනු !" නැවත හඬක් නැඟී ආවේ ය.

නෙඩ් මේ පිළිබඳ ව කුමක් කිවයුතු දැයි නොදැන අසරණ ව උරහිස් හැකිළුවේ ය. "නොපෙනී ඇතුළු වන්නා කියන වචනය ඉදිරිපත් කරන්න" නැන්සි කොඳුරා කීවා ය.

ඔහු එසේ කී විට කටහඬ නැවත නැඟී ආවේ ය. "අපි දොළහට එනවා කෑමයි, තෑගියි ලෑස්ති කරලා තියන්න" කටහඬ නැවතී ගියේය.

නැන්සි සහ නෙඩ් සිත් තුළ මතු වූ එක ම අදහසක් ඇති ව එකිනෙකාගේ මුහුණු බැලූහ. පැහැදිලි ව ම අද්භූත කටහඬ ඇති පුද්ගලයාට දැනුම් දී ඔවුන්ව අල්ලා ගත් බව කියා ඇත්තේ කලිනි. එසේ නම් තෑගි කොහේද? නැත්තම් මෙයත් පැහැර ගැනීමක් ද?

අද්භූත කටහඬ තමන්ට සමීප බවක් නැන්සිට හැඟී ගියා ය. එය විල්බට් ප්‍රිට්සර්ගේ හෝ ඔහුගේ පියාගේ විය නොහැකි ද?

"අපි දැන්ම ම මේ ගැන පොලිසියට දැනුම් දෙන්න ඕනෑ" එසේ කියූ නැන්සි එහා කාමරයේ තිබූ දුරකථනයෙන් පොලිස් මූලස්ථානය අමතා වහා ම පොලිස් නිලධාරීන් කිහිප දෙනෙක් පාළු මන්දිරය වෙත එවන ලෙස ඉල්ලා සිටියා ය.

ඒ මොහොතේ ම ක්‍රැන්ෂෝ මහතා පහළ මාලයට පැමිණි අතර ඔහු පසු පසින් ජිම් හා හෙලන් පැමිණියහ. වැඩ සිද්ධ වී ඇති ආකාරය දුටු ඔහු පුදුමයට පත් විය. "මම පුළුවන් ඕනෑ ම උදව්වක් ඉතා ම කැමැත්තෙන් දෙන්නම්"

පොලිසිය පැමිණි විට ළමයි ඉතා ඉක්මනින් සිද්ධිය කෙටියෙන් ඔවුන්ට පැහැදිලි කළෝ ය. අමුත්තන් පැමිණෙන තුරු සියලු දෙනා ම සැඟවී සිටීම සුදුසු බවට තීරණය විය.

හරියට ම එකොළහයි තිහට ස්ටීව් රෝවර් ද ඇතුළු පිරිස සැඟවීමට සුදුසු තැන් තෝරා ගත්හ. අමුත්තන් කෙළින් ම කළු මඩුවා සිටින කාමරයට යනු ඇති බව පෙනී ගිය හෙයින් නැන්සි හා නෙඩ් ඒ තුළ තිර රෙදි අස්සේ සැඟවී ගත්හ. පොලිස් නිලධාරීන් දෙදෙනා සැඟවුණේ යාබද කාමරයක ය.

ඉදිරිපස දොර විවෘත කර තැබුවේ ජෙපර්ස් පැමිණ තමන් පිළිනොගත්තේ ඇයි දැයි යන සැකය අමුත්තන් තුළ ඇති නොවනු පිණිස ය. නෙඩ් කළු මඩුවාගේ ඇස් ඇරෙන වැහෙන ලෙස ක්‍රියා කරවන ස්විචය නිවා දැමුවේ ය.

දොළහට මිනිත්තු දහයක් තිබිය දී මෝටර් රථයක් නිවස දෙසට ඇදී එන ශබ්දයක් සැඟවී සිටින්නන්ගේ කන වැකිණි. ඒ මොහොතේ දී මහලු ප්‍රීට්සර් කාමරයට ඇතුළු වන බව නැන්සි දුටුවා ය. ඔහු පිටු පසින් ඔහුගේ පුත්‍රයා, ලේලිය හා භූතාවේෂණීය වැරෙන්ටෙලා ඇතුළු වූහ. ඔවුන්ටත් පිටු පසින් තවත් පිරිමි හතර දෙනෙක් පැමිණියහ.

"මම කල්පනා කරන්නේ ජෙපර්ස් කොහෙද කියලයි" විල්බට් ප්‍රීට්සර් කීවේ ය.

"සමහර විට නාකි මිනිහව ඉහළ කාමරයේ හිර කර ගෙන ඉන්නවා වෙන්න ඇති" ඔහුගේ බිරිඳ පැවසුවා ය.

"කොහොම වුණත් අපිට රැස්වීමේ කටයුතු දිගට ම කර ගෙන යන්න කිසි ම බාධාවක් නෑ" භූතාවේෂණීය වැරෙන්ටෙලා කීවා ය.



"එහෙනම් සොහොයුරිය" විල්බට් ප්‍රීට්සර් කීවේ ය. "ඔයා ම පටන් ගන්න"

වැරෙන්ටෙලා මහ හඬින් සිනාසෙන්නට වූවා ය. අනතුරුව තමන්ගේ ප්‍රයෝගකාරී මළවුන්ගේ සභාව පිළිබඳවත්, ඒ තුළින් ඉතා දක්ෂ නැන්සි ඩ්‍රිව් පවා ගොනාට ඇන්ද වීමට ඇය සමත් වූ බවත් කීවා ය. "මගේ යාළුවෙක් කාසන් ඩ්‍රිව්ගේ ඔත්තු බැලුවා. ඔහුට දැන ගන්න ලැබිලා තියෙනවා භූත දඩයම ගැන. මම ඊට පස්සේ පාතාල කණ්ඩායමක සාමාජිකයෙකුව කුලියට අරගෙන ඇගේ අතීත තොරතුරුත් ඇය භූත දඩයමට එකතුවන බවත් දැන ගත්තාම ඇගේ වටේ සිදුවන දේවල්වල විස්තරත් ලබා ගත්තා."

"ඔයා කොච්චර ගෙනාවද?" මහලු ප්‍රීට්සර් කතාවට බාධා කළේ ය.

භූතාවේෂණීය වැරෙන්ටෙලා බෑගයක් විවෘත කර බිල්පත් විශාල සංඛ්‍යාවක් මේසය මත හැලුවා ය.

"ඩොලර් දහස් ගණනක් මෙතන තියෙනවා" ඇ පිළිතුරු දුන්නා ය. "මගේ දයාබර සහෝදරයා විල්බට් ප්‍රීට්සර් සොරකම් කළ සිප්පි කටු විකිණීමෙන් තමයි මුදල්වලින් කොටසක් ලබා ගත්තේ"

ඊළඟට තම විස්තර ඉදිරිපත් කිරීමට විල්බට් ප්‍රීට්සර්ගේ වාරය පැමිණියේ ය. ධනවත් මිනිසුන් කිහිපදෙනෙකු බිය ගන්වා අඩු මිලට දේපළ ලියවා ගෙන ඒවා නැවත විකිණීමෙන් විශාල ධනයක් උපයා ගැනීමට තමන්ට හැකිවූ බව ඔහු වාර්තා කළේ ය. "මං මගේ කිසිදාක නොපැරදුණු අවතාරමය සොයා ගැනීම්වලින් මිනිසුන් බයට පත් කළා. ඒවා තමයි භූතාවේෂ ඔරුව, අවතාර අශ්වයා, අවතාර සොල්දාදුවා, බූවල්ලා, හොල්මන් කාන්තාව සහ වායුමය මිනිහා. මගේ සිප්පිකටුවලට සවි කළ සියුම් රේඩියෝ උපකරණ ඉතා ම අගේට වැඩ කළා. නොපෙනී ඇතුල්වන්නන් හිටියා. කණ්ඩායමේ අභ්‍යන්තර සාමාජිකයින් සමග කතා කරන්න."

එක මිනිසෙක් කතාවට බාධා කළේ ය. "නමුත් තමුසෙට ඒ හැම දෙයක් ම තනිව ම කරන්න බෑ. තමුසෙට මගෙයි, මයික්ගෙයි උදව්ව ඕනෑ කළා. තමුසෙගේ පැහැර ගැනීම් වගේ ජරා වැඩ කරවා ගන්න. ඒ වගේ ම අර කොලුවා පැහැර ගෙන මෙහාට ගේන්න. අපි නෙඩ් කියන හාදයාව පැහැර ගන්නත් කටයුතු කළා "

"නමුත් තමුසෙලා ඌට යන්න ඇරියා" විල්බට් තරමක කෝපයෙන් යුතුව කීවේ ය.

"ගණන් ගන්න එපා" භූතාවේෂණීය ටැරෙන්ටෙලා මැදිහත් වූවා ය. "මම අද රාත්‍රියේ නැන්සිට පණිවිඩයක් ඇරියා පණට ආදරයක් තියෙනවා නම් එළියට බහින්න එපා කියලා. නමුත් ඈ ඒක ඇහුවේ නැහැ. දැන් එයා අපේ හිරකාරියක්"

ඒ මොහොතේ පොලිස් නිලධාරීන් කිහිපදෙනෙක් කාමරයට කඩා වැදුණෝ ය. සොර මුල තිගැස්සී බියට පත් වූවත් ඉක්මනින් ම මහත් අරගලයක් කරමින් පැන යන්නට උත්සාහ දැරුවෝ ය. පොර බැදීම්, බිම පෙරළීම් සමග රාක්කවල ඇති මිනී හිස් කබල් ඇද වැටෙන්නට පටන් ගත්තේ ය. අවසානයේ දී ඔවුන් සියලු දෙනා ම මෙල්ල කර ගැනීමට පොලිස් නිලධාරීහු සමත් වූහ.

"අපිට විරුද්ධව සාක්ෂි මොනවත් නෑ" විල්බට් ප්‍රීට්සර් කෑ ගසා කීවේ ය.

"අපි ඔක්කොම විස්තරය පටිගත කරගෙන තියෙනවා" එක් පොලිස් නිලධාරියෙක් ටේප් රෙකෝඩරයක් පෙන්වමින් කීවේ ය. ඒ ඇරත් අපි ළඟ ඇහින් දුටු සාක්ෂිකාරයෝ කිහිප දෙනෙක්ම ඉන්නවා. තමුන්ට විරුද්ධව සාක්ෂි දෙන්න"

එය එළියට පැමිණෙන ලෙස නැන්සි ඇතුළු පිරිසට දුන් සංඥාවක් බඳු විය. ඔවුන් සමග ක්‍රැන්ෂෝ මහතා ද එළියට පැමිණි විට අපරාධකරුවෝ මහත් බියකින් හා අති මහත් විස්මයෙන් යුතුව ඔවුන් දෙස බැලූහ.

භූතාවේෂණීය ටැරෙන්ටෙලා සිය දබර ඇඟිල්ල නැන්සි වෙත දිගු කළා ය. "උඹ" ඈ බෙරිහන් දුන්නා ය. "උඹයි එහෙනම් මේක කළේ. උඹේ සීයා මළවුන් අතරින් නැගිටලා ඇවිත් උඹේ හිස කුඩු කරලා දාන්න ඕනෑ"

සිතේ වකිතයක් මතුවී ආවත් නැන්සිට සිනහව නතර කරගත නොහැකි විය. "දුරකථනයෙන් කටහඬ වෙනස් කරලා කතා කරන්න ඔබ දක්ෂයි ටැරෙන්ටෙලා. නමුත්, තමුන්ගේ බොරු අනාවැකිවලින් මීට පස්සේ මිනිස්සුන්ව රවට්ටන්න හම්බ වෙන්නේ නැහැ." අනතුරුව නෙඩ් දෙසට හැරුණු ඈ, "දැන් වෝෆීල්ඩ් මහත්මයා කොහේද ඉන්නේ දන්නේ නැහැ" යනුවෙන් කීවා ය.



"මේ මෙතනම" දොර දෙසින් කටහඬක් නැඟී ආවේ ය. "මේ මිනිහා" අත් අඩංගුවේ පසුවන එක් තරුණයෙකු දෙසට ඇඟිල්ල දිගු කරමින් ඔහු කීවේ ය. "මෙයා මට තර්ජනය කරලා වාහනය දිගට ම පදවා ගෙන යන්න සැලැස්සුවා. පොරොන්දු වූ විදිහට පැය දෙකකින් ආපසු එන්න බැරි වෙන්න. නමුත් මේ රැස්වීමට එන්න ඕනෑ නිසා ද කොහේ ද ගම්බද පාරකදී මාව නිදහස් කළා. ඊට පෙර වාහනයේ පෙට්‍රල් ටැංකියේ පෙට්‍රල් ඔක්කොම අයින් කළා. මට රැස්වීම ඉවර වෙලා ඔවුන් මෙහෙ තියෙන වටිනා වස්තුව හොරකම් කරගෙන යනකම් ආපසු එන්න බැරි වෙන්න."

සොරු කණ්ඩායම තව දුරටත් විරෝධතාවක් දැක්වූයේ නැති අතර ටේප් රෙකෝඩරයේ පටිගත වී ඇති කරුණු ප්‍රතික්ෂේප කිරීමේ තේරුමක් නැති බව ප්‍රත්‍යක්ෂ කරගත් ඔවුහු නිහඬ ව බිම බලා ගෙන සිටියහ.

ඔවුන් පිටතට කැඳවා ගෙන එන අතරතුර දී නැන්සි දෙසට හැරුණු ටැරෙන්ටෙලා, "මට උඹව ඇහැට පේන්න බෑ. නමුත් මට පිළිගන්න වෙනවා උඹ අබිරහස් විසඳන්න දක්ෂයි කියලා මගේ ලියකියවිලි කොහේද?"

"ආරක්ෂා සහිතව තියෙනවා. නමුත් තමුන් ඇයි ඒවා මට දුන්නේ?"

"මට මගේ සහෝදරයින් කාවවත් විශ්වාස නෑ. ඒ අය දෙපිටකාට්ටු විදිහට මගේ සල්ලි හොරකම් කළා. නමුත් මගේ රහස් වැඩ නිසා පොලීසියට කියන්නත් බෑ. විල්බට් මගේ කූඩාරමටත් ගිනි තියලා දුම් අතරින් අවතාරයක් මතු කළා. මම හුගක් ඔහුගේ බලයට යටත් වෙලා හිටිය නිසා ඔහුගේ අණට විරුද්ධව කටයුතු කරන්න බෑ. මොකද හුගක් වටිනා සිප්පි කටු බොහොමයක් හොරකම් කරන්න ඔහුට උදව් කළ නිසා. මගේ නමේ මුලකුරු තියෙන සමහර සිප්පි කටුවල ඔහුගේ 'නොපෙනී ඇතුළුවන්නා" සවි කරලා තිබුණා.

"ඔබව, විශ්වාසයට ගන්න පුළුවන් කෙනෙක්. මගේ ලියකියවිලි මං එනතුරු පරිස්සමින් තියාගන්න." නැන්සිගේ පුදුමයට හේතුවන පරිදි ටැරෙන්ටෙලා පිටතට කැඳවා ගෙන යද්දී ඇගේ දෑස්වලින් කඳුළු කඩා හැලෙන ආකාරය පෙනිණි. ඒ මොහොතේ නොපෙනී ඇතුළු වන්නා පිළිබඳ ව අබිරහස විසඳා අවසන් වූ බව නැන්සිට හැඟී ගියා ය.

පොලිස් නිලධාරීහු බිම් මාලයට ගොස් ජෙපර්ස් කැඳවා ගෙන ආවෝ ය. ඔහු ක්‍රැන්ෂෝ මහතා පසුකර ගෙන යන අතරතුර දී හිස ඔසවා ඔහු දෙස බලා, "මම සතුටු වෙනවා උන්ට ඔබගේ වටිනා සම්පත් එකතුව හොරකම් කිරීමට බැරිවීම ගැන" යනුවෙන් සිනහවක් පාමින් කීවේ ය.

ක්‍රැන්ෂෝ මහතා ඔහු දෙස කනගාටුවෙන් යුතු බැල්මක් හෙළුවේ ය. "මේ හැම දෙයක් ම අස්සේ මට ජෙපර්ස් නැතිවුණ එකයි සිද්ධ වුණේ. මම ආයෙත් ප්‍රධාන සේවකයෙක් සොයා ගන්නකම් භූත දඩයක්කරුවෝ මගේ අමුත්තන් විදිහට මේ මන්දිරයේ ටික දවසක් නතර වෙනවා නම් මම හරිම කැමතියි."

නැන්සි සහ පිරිස එකිකොගේ මුහුණු දෙස බැලූ අතර "ඔබ අදහස් කලේ අපි දාහතර දෙනා ම ද?" කියා නැන්සි ඇසුවා  ය.

මහලු මිනිසා සිනාසුණේය. "ඔව් සියලු දෙනා ම"

නැන්සි අවන්හලට කතා කර සොරු කණ්ඩායම අත් අඩංගුවට ගැනීම පිළිබඳ පුවතත්, තමන්ට ලැබුණු ආරාධනය පිළිබඳවත් අනෙක් පිරිසට දැනුම් දුන්නා ය. භූත දඩයක්කරුවෝ අබිරහස විසඳීම පිළිබඳව සතුටටත් උද්දාමයටත් පත් වූහ. සියලු දෙනා ම ක්‍රැන්ෂෝ මහතාගේ ආරාධනය පිළිගැනීමට එක පයින් ම එකඟ වූහ. නෙඩ් සහ ජිම් මේ රාත්‍රියේ දී ක්‍රැන්ෂෝ මහතා සමග නතර වීමටත්, නැන්සි සහ හෙලන් වෝෆීල්ඩ් මහතා සමග අවන්හල වෙත ට්‍රක් රථයෙන් යාමටත් තීරණය කර ගත්හ.

ඔවුන් ඉදිරිපස දොර වෙත යන අතරතුර දී, "මේ පාර අපි යන්නේ ඉදිරිපස ආසනවල" යනුවෙන් පවසා නැන්සි කිංකිණි හඬින් සිනහවක් පෑවා ය. ට්‍රක් රථය ක්‍රැන්ෂෝ මැඳුර පසු කරමින් අන්ධකාරය තුළට ඇතුළු වූයේ ඉදිරිපස ලාම්පුවලින් පරිසරය ආලෝකමත් කරමිනි. තවත් මෙවැනි ම ත්‍රාසජනක අබිරහසක් විසඳීමට ළඟදී ම ඉඩ ලැබේවා! යන පැතුම අවන්හල දක්වා ම නැන්සිගේ සිතේ රැව් දුන්නා ය.

නිමි

*තවත් රසවත් කතාවකින් ඉක්මනින් ම ඔබ හමුවෙන බලාපොරොත්තුවෙන් ආයුබෝවන් !*